79 වන කාණ්ඩය
2 වන කලාපය

සඳුදා
1968 ජූලි 15

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

**ඔඩිටර් ජනරාල්ගේ වාර්තාව [තී. 85]**

**පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් [තී. 87] :**

ලංකා බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත

කාර්මික ආරාවුල් (සංශෝධන) පනත් කෙටුම්පත

කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

**තේරීම් කාරක සභාව [තී. 89]**

**අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව [තී. 90] :**

**ස්තුති යෝජනාව පිළිබඳ විවාදය** [දෙවන දිනය]

විවාදය කල් තබන ලදි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 79
இல. 2

திங்கட்கிழமை
15 ஜூலை 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

கணக்குப் பரிசோதனை அதிபதியினது அறிக்கை [ப. 85]
முதன்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் [ப. 87] :
இலங்கை வங்கி (திருத்த) மசோதா
நிதி (திருத்த) மசோதா
கைத்தொழிற் பிணக்குகள் (திருத்த) மசோதா
கைத்தொழிற் பிணக்குகள் (சிறப்பேற்பாடுகள்) மசோதா
தெரிவுக்குழு [ப. 89]
மகாதேசாதிபதியினது பேச்சு [ப. 90] :
உரைமீதான விவாதம் [இரண்டாம் நாள்]
விவாதம் ஒத்திவைக்கப்பட்டது

---

Volume 79
No. 2

Monday
15th July 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

AUDITOR-GENERAL'S REPORT [Col. 85]
BILLS READ THE FIRST TIME [Col. 87] :
Bank of Ceylon (Amendment) Bill
Finance (Amendment) Bill
Industrial Disputes (Amendment) Bill
Industrial Disputes (Special Provisions) Bill
COMMITTEE OF SELECTION [Col. 89]
GOVERNOR-GENERAL'S SPEECH [Col. 90] :
Debate on the Address [*Second Day*]
Debate adjourned

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

1968 ජූලි 15 වන සඳුදා

திங்கட்கிழமை, 15 ஜூலை 1968

*Monday, 15th July 1968*

---

අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.

சபை பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.

*The House met at 2* P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

## ඔඩිටර්-ජනරාල්ගේ වාර්තාව

### கணக்குப் பரிசோதனையதிபதியினது அறிக்கை

### AUDITOR-GENERAL'S REPORT

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

I present the sixth instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Appropriation Accounts of the Government of Ceylon for the Financial Year 1966-67 (Part II).

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**
*(கௌரவ சி. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)*
(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That the sixth instalment of the Report of the Auditor-General, under Article 71 (2) of the Ceylon (Constitution and Independence) Orders in Council, 1946 and 1947, on the Appropriation Accounts of the Government of Ceylon for the Financial Year 1966-67 (Part II) be printed."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.

அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

*Ordered that the Report be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

### PAPERS PRESENTED

63.4.1 සිට 64.3.31 තෙක් වූ කාල පරිච්ඡේදය සඳහා ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ වාර්තාව.—[ගරු සී. පී. ද සිල්වා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Regulation made under Section 14A of the Tea (Tax and Control of Export) Act No. 16 of 1959.—[*The Hon. Hurulle on behalf of the Minister of Commerce and Trade*].

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

(1) A set of By-laws made under Sections 152 and 156 of the Town Councils Ordinance (Cap. 256).

(2) A By-law made under Sections 153 and 157 of the Urban Councils Ordinance (Cap. 255).

(3) A By-law made under Sections 152 and 156 of the Town Councils Ordinance (Cap. 256).

(4) Rule made under Section 3 of the Public Performances Ordinance (Cap. 176).—[*Mr. Premadasa, Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting*].

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

2—එච 15330—794 (68/7)

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## නොපැමිණීමේ අවසරය: එස්. ඒ. පීරිස් මයා., ඕ. බී. ඊ.

வராதிருக்க அனுமதி

திரு. எஸ். ஏ. பீரிஸ், ஓ. பி. ஈ.

## LEAVE OF ABSENCE
## MR. S. A. PEERIS, O.B.E.

ගරු සී. පී. ද සිල්වා

(கௌரவ சி. பீ. டி சில்வா)

(The Hon. C. P. de Silva)

I move,

That Mr. S. A. Peeris, O.B.E., Member for Passara, be granted leave under Section 24 (1) (*e*) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent from the sittings of the House for a period of three months from 15th July 1968.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## කෙටුම්පත් පණත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

## BILLS PRESENTED

### ලංකා බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත

இலங்கை வங்கி (திருத்த) மசோதா

BANK OF CEYLON (AMENDMENT) BILL

"to amend the Bank of Ceylon Ordinance."

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති වෙනුවට රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම් ගරු ජේ. ආර්. ජයවර්ධන විසිනි.

1968 ජූලි 18 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் சார்பாக, கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும், பிரதம அமைச்சரதும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்—அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 ஜூலை 18, வியாழக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. J. R. Jayewardene, Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs, on behalf of the Minister of Finance ; to be read a Second time upon Thursday, 18th July 1968, and to be printed.*



### මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත

நிதி (திருத்த) மசோதா

FINANCE (AMENDMENT) BILL

"to amend the Finance Act, No. 65 of 1961."

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති වෙනුවට ගරු ජේ. ආර්. ජයවර්ධන විසිනි.

1968 ජූලි 18 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் சார்பாக, கௌரவ ஜே. ஆர். ஜயவர்த்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968, ஜூலை 18, வியாழக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. J. R. Jayewardene on behalf of the Minister of Finance ; to be read a Second time upon Thursday, 18th July 1968, and to be printed.*

### කාර්මික ආරවුල් (සංශෝධන) පනත් කෙටුම්පත

கைத்தொழிற் பிணக்குகள் (திருத்த) மசோதா

INDUSTRIAL DISPUTES (AMENDMENT) BILL

"to amend the Industrial Disputes Act."

පිළිගන්වන ලද්දේ කම්කරු හා රැකීරක්ෂා ඇමති ගරු එම්. එච්. මොහොමඩ් විසිනි.

1968 ජූලි 18 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

தொழில், தொழில் வசதி அமைச்சர் கௌரவ எம். எச். முகம்மது அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 ஜூலை 18, வியாழக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட்ட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. M. H. Mohamed, Minister of Labour and Employment ; to be read a Second time upon Thursday, 18th July, 1968, and to be printed.*

### කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

கைத்தொழிற் பிணக்குகள் (சிறப்பேற்பாடுகள்) மசோதா

INDUSTRIAL DISPUTES (SPECIAL PROVISIONS) BILL

"to provide for the removal of certain difficulties in the settlement of industrial disputes and other matters under the Industrial Disputes Act which has arisen in consequence of decisions made by the Supreme Court and decisions made on

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

appeal to Her Majesty in Council, and to provide for matters connected therewith or incidental thereto."

පිළිගන්වන ලද්දේ කම්කරු හා රැකීරක්ෂා ඇමති ගරු එම්. එච්. මොහොමඩ් විසිනි.

1968 ජූලි 18 වන බ්‍රහස්පතින්දා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

தொழில், தொழில் வசதி அமைச்சர் கௌரவ எம். எச். முகம்மது அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1968 ஜூலை 18, வியாழக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

*Presented by the Hon. M. H. Mohamed Minister of Labour and Employment; to be read a Second time upon Thursday, 18th July 1968, and to be printed.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

## SITTINGS OF THE HOUSE

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Thursday, 18th July 1968, and that the hours of Sitting that day shall be as though it were a Second day from the Poya Day."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## තේරීම් කාරක සභාව

தெரிவுக் குழு

## COMMITTEE OF SELECTION

ගරු සී. පී. ද සිල්වා
*(கௌரவ சி. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

I move,

"That the following seven Members do serve on the Committee of Selection in terms of Standing Order No. 122 during the current Session :

The Hon. C. P. de Silva
The Hon. M. D. Banda
Mr. P. G. B Keuneman
Mr. S. J. V. Chelvanayakam, Q.C.
Dr. N. M. Perera
Mr. G. G. Ponnambalam, Q.C.
Mr. Maithripala Senanayeke"

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*



## අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව : ස්තුති යෝජනාව පිළිබඳ විවාදය
[දෙවන දිනය]

மகாதேசாதிபதியினது பேச்சு
உரைமீதான விவாதம்

[இரண்டாம் நாள்]

## GOVERNOR-GENERAL'S SPEECH: DEBATE ON THE ADDRESS
[*SECOND DAY*]

කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදි. ඊට අදාළ ප්‍රශ්නය [ජූලි 7]

ஜூலை 27 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Question*—[*7th July*].

"අතිගරු අග්‍රාණ්ඩුකාරතුමන් විසින් පවත්වන ලද කථාවට පිළිතුරු වශයෙන් මෙම මන්ත්‍රී මණ්ඩලය පහත දැක්වෙන ස්තුති යෝජනාව ඉදිරිපත් කළ යුතුය :

'අතිගරු උතුමාණනි,

පාර්ලිමේන්තුව විවෘත කිරීමේදී ඔබතුමාණන් විසින් පවත්වන්නට යෙදුණු කථාව වෙනුවෙන් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයෝ වන අපි ඔබතුමාණන්ට ස්තුති කරමු. අප වෙත ඉදිරිපත් කරන ලද සියලුම කරුණුවලට අපගේ අවධානය යොමු කරන බව අපි ඔබතුමාට සවිර ලෙස ප්‍රකාශ කරමු.' "—[විජේසිරි මයා.]

"மேன்மை தங்கிய மகா தேசாதிபதி அவர்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு மறுமொழியாக இச்சபை பின்வரும் நன்றியுரையைச் சமர்ப்பிப்பதாக :

'மேன்மை தங்கிய உத்தம,

பாராளுமன்றத் திறப்பின்போது மேன்மைதங்கிய தங்களால் நிகழ்த்தப்பட்ட பேச்சுக்கு, பிரதிநிதிகள் சபை அங்கத்தினராம் நாம் எங்களது நன்றியைத் தெரிவிக்கின்றோம். மேன்மை தங்கிய தங்களால் என்முன் சமர்ப்பிக்கப்பட்ட எல்லா விடயங்கள் மீதும் எம் கவனத்தைச் செலுத்துவோம் என உறுதி பகர்கிறோம்.' "—[திரு. விஜேசிறி]

"That this House do present the following Address to His Excellency the Governor-General in reply to his Speech :

'May it please Your Excellency,

We, the Members of the House of Representatives, thank Your Excellency for the Speech with which you have been pleased to open Parliament. We

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

assure Your Excellency that we shall give our attention to all matters placed before us.' "—[*Mr. Wijesiri*].

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

In regard to the Amendments, what I propose to do is to ask those Members proposing Amendments to move their Amendments first, and have them seconded.

The Amendments need not be read out. The Member moving the Amendment can say : I move Amendment numbered so and so. I think the House will agree to that.

I think Amendment No. 1 and Amendment No. 2 will be moved by the same Member.

I shall then call upon the hon. Member for Gampaha (Mr. S. D. Bandaranayake) to move his Amendment and have it seconded, and then the hon. Member for Dambadeniya (Mr. R. G. Senanayake) to move his Amendments and have them seconded.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)

*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*

(Mr. T. B. Ilangaratne—Kolonnawa)

**නැඟ සිටියේ ය.**

*எழுந்தார்.*

*rose.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Who is your seconder ?

අ. භා. 2.5

**ඉලංගරත්න මයා.**

*(திரு இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු මිනුවන්ගොඩ මන්ත්‍රීතුමා (ද සොයිසා සිරිවර්ධන මයා.) මගේ යෝජනාව ස්ථිර කරනවා.

ගරු කථානායකතුමනි, රාජාසන කථාව සම්බන්ධයෙන් කරන ලද ස්තුති යෝජනාවට විපක්ෂයේ සමාජවාදී සමගි පෙරමුණ මගින් ඉදිරිපත් කර තිබෙන සංශෝධන තුන යෝජනා කිරීමටයි මා නැඟී සිටින්නේ.

අප ඉදිරියේ අද තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ සහ ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ ආණ්ඩුවේ 4 වැනි රාජාසන කථාවයි. මේ ආණ්ඩුවට දැන් වයස අවුරුදු 3 කුත් මාස 4 ක් වී තිබෙනවා. නීත්‍යනුකූලව මේ ආණ්ඩුවට තවත් වයස තියෙන්නේ අවුරුදු 1 කුත් මාස 8 යි. ඒ අනුව තව ඉඩ තිබෙන්නේ එක රාජාසන කථාවකට පමණයි. නීත්‍යනුකූලව තව අවුරුද්දකුත් මාස 8 ක් මේ රජයට වයස තිබුණත් ප්‍රජාතන්ත්‍රවාදීව නම් මේ ආණ්ඩුව මෙතෙක් කල් බලයේ සිටින්නට තබා උපදින්නටවත් කිසිම කුසලක් තිබුණේ නැහැ. ලංකාවාසීන්ගේ පරණ පවක් නිසා උපත ලැබුවත්, මේ ආණ්ඩුවට ආත්ම ගෞරවය ටිකක්වත් තිබෙනවා නම් මෙය ඉල්ලා අස්වන්නට තිබුණේ මීට බොහොම ඉස්සරයි. මා මෙසේ කියන්නේ, ආණ්ඩුවට සරදමක් කිරීමේ වාචාල කියමනක් විධියට නොවෙයි, සාධක ඇතිවයි. මෙම ආණ්ඩුව බලයට පත් වුණේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන බව කියාගෙනයි. විශේෂයෙන්ම රටට ප්‍රකාශ කරනු ලැබුවේ ඒ පිරුළයි. මීට ඉස්සරද මා කියා තිබෙන අන්දමට ප්‍රජාතන්ත්‍රවාදය යනු ඡන්ද බලයෙන් ආණ්ඩුවක් හදා ගැනීම පමණක් නොවෙයි. මැතිවරණ කාලයේදී රටට යම් යම් පොරොන්දු දී, ඒ පොරොන්දු උඩ මහජනයා විසින් දෙනු ලබන ඡන්දයෙන් ආණ්ඩුව හදා ගත්තායින් පසු, දෙන ලද ඒ පොරොන්දු ඉෂ්ට කොට ජනතාව සනසන්නට පුළුවන් වන ආණ්ඩුවක් පමණයි ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් වශයෙන් හඳුන්වන්නට පුළුවන් වන්නේ. මැතිවරණ කාලයේදී යම් යම් පොරොන්දු රටට දී ඡන්ද බලයෙන් ආණ්ඩුව හදාගත්තාට පසු දෙන ලද පොරොන්දු ඉෂ්ට කරන්නට යම් ආණ්ඩුවකට පුළුවන්කමක් නැත්නම් එවැනි ආණ්ඩුවක් ඉල්ලා අස්වීම යුතුකමක්. එවැනි රජයකත් ප්‍රජාතන්ත්‍රවාදී රජයක් හැටියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හඳුන්වන්නට පුළුවනි. අවාසනාවකට වගේ මේ ආණ්ඩුව හැදුනේත් රට පාලනය කරගෙන යන්නේත්, බලයේ සිටින්නට උත්සාහ ගන්නේත්, ප්‍රජාතන්ත්‍ර විරෝධීවමයි. ඒ අතින් බලන විට, ප්‍රජාතන්ත්‍රවාදය මේ තරම් නින්දාවට පත් කළ ආණ්ඩුවක් 1947 න් පසු කිසිම කලක ඇති වී නැහැ. ඒ නිසා, අද ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි විශ්වාසයක් නැති තරමට මහජනතාව තුළ කලකිරීමක් ඇති වී තිබෙනවා.

මා කියන මේ කථාවේ සත්‍යතාව කුමක්දැයි දැන් සොයා බලමු. ඊනියා රටසභා ධවල පත්‍රිකාව පිළිබඳ සාකච්ඡාවේදී කයිට්ස්හි ගරු මන්ත්‍රීතුමා (වී. නවරත්නම් මයා.) අගමැතිතුමාගේ මූණටම ප්‍රජාතන්ත්‍ර විරෝධී රහස් ගිවිසුම ගැන කියන්නට යෙදුණා. රට දෙකට කඩන, රාජ්‍ය භාෂාව අඩපණ කරන, දෙමළ නොවන අයට උතුරු නැගෙනහිර පළාත්වල ඉඩම් නොදෙන රටසභා පිහිටුවීමේ ජාති ද්‍රෝහී රහස් ගිවිසුම ඒ මන්ත්‍රීතුමා අතින්ම සකස් කරන ලද බවත්, අගමැතිතුමාත් ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයත් ඊට අත්සන් කළ බවත් එතුමා කිව්වා. ඒ අවස්ථාවේදී අගමැතිතුමා කෙළේ මොකද? ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ ලේකම් දෙස රවා බැලීම පමණයි. රහස් ගිවිසුමක් ගැසූ බව කීමටවත් අවංක භාවයක් අගමැතිතුමාට තිබුණේ නැහැ.

ගරු කථානායකතුමනි, 1968 ජූනි මස 11 වැනිදා **හැන්සාඩ්** වාර්තාවේ 2779 වැනි තීරුවෙහි මෙසේ සඳහන් වෙනවා :

"I will come to that. As you know, the original agreement as we formulated it was in my handwriting. It was written down by me. At the conclusion of the agreement it was typed by me. I think the Hon. Minister of State will bear me out on that. But in the manuscript document, if ever it sees the light of day—I do not know whether it will—towards the tail-end, there is this statement :

'In regard to the public servants Mr. Senanayake emphasized that the policy of his party was that public servants of certain categories should know both languages and that public servants who have...'—and it stopped. We should remember that the discussions were carried on under great tension."—[OFFICIAL REPORT, 11th June 1968 ; Vol. 78, c. 2785.]

තවත් තැනක මෙහෙම සඳහන් කර තිබෙනවා :

"..it was suggested that the agreements we had arrived at could be implemented by administrative directions and that they need not form part of the agreement. Therefore it was dropped."—[OFFICIAL REPORT, 11th June 1968 ; Vol. 78, c. 2786.]

මේ කියන්නේ, "රජයේ සේවකයන් සම්බන්ධව අප සාකච්ඡා කළ දේ ගිවිසුමට ඇතුළත් කරන්නට වුවමනා නැත; පරිපාලන නීති මාර්ගයෙන් අප ඒ ගැන ක්‍රියා කරන්නට පොරොන්දු වුණා" කියලයි. මේ කයිට්ස්හී ගරු මන්ත්‍රීතුමාගේ (වී. නවරත්නම් මයා.) කථාවේ එක් කොටසක්.

ගරු කථානායකතුමනි, මේ රහස් ගිවිසුම ඇති කර තිබෙන්නේ පොරොන්දු හතරක් ඉෂ්ට කිරීම සඳහායි. ඒ පොරොන්දු මොනවාදැයි දැන් මුළු රටම දන්නවා. සමහර විට වෙනත් රටවල උදවියත් ඒ ගැන දන්නවා ඇති. ඒ පොරොන්දු පිළිබඳව මෙම ගරු සභාවේදී කීප වරක්ම සඳහන් වුණා.

රටසභා ඇති කිරීමෙන් කිසිම කෙනකුට කිසිම අවාසියක් ඇති නොවන බව රටසභා ධවල පත්‍රිකාව පිළිබඳව සාකච්ඡාවේදී ගරු අගමැතිතුමා විසින් කියන්නට යෙදුණා. හොඳයි, මා මේ අවස්ථාවේදී එක්තරා වැදගත් කාරණයක් මතක් කරන්නට කැමතියි. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායක චෙල්වනායගම් මහතායි, ඔය රහස් ගිවිසුමට ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය වෙනුවෙන් අත්සන් කෙළේ. ඔහුගේ අදහස් මොනවාදැයි මේ අවස්ථාවේදී පෙන්වා දීම කාලෝචිතයි. ඔහු 1957 ජූනි මාසයේ 17 වැනිදා මේ විධියට කියන්නට යෙදුණා. මෙය ඉතා වැදගත් ප්‍රකාශයක් :

"The second factor that controls or influences the existence of a race or nation, or a sub-nation if I may use the term, is the territory they occupy. The people

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

of this country occupy Ceylon and if they had no separate country to live in their identity would be lost. For centuries together the Jews had no country of their own to live in. They were therefore wandering Jews. Ultimately with the help of other governments they were able to plant themselves in a portion of Palestine and they have become a nation. It is an essential requirement for the existence, or the continued existence, of a nation or sub-nation that it should possess a territory. In countries which are populated by various races, in many of them each race occupies separatable territory or portion of a territory. In Ceylon we have used the term Tamil provinces as applicable to the Northern and Eastern Provinces. The near million people who live in those two provinces will have no political power but for the fact that they live in them as a majority people. In the other seven provinces we find a large section of Muslims and Tamils but they are so dispersed amongst the Sinhalese people that they find it difficult to elect representatives of their race or group in proportion to their numbers. If the one million Tamil people who live in the Northern and Eastern Provinces get scattered amongst the Sinhalese people in the other seven provinces or if the Sinhalese people could be put into the Northern and Eastern Provinces in large numbers, the day might dawn when the Tamil people will have no area which they can call their majority area. —[OFFICIAL REPORT, 17th June, 1957 ; Vol. 78, c. 2779.]

මෙන්න ෆෙඩරල් නායකයාගේ අදහස. මෙන්න ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය හැදී මේ පරමාර්ථය. ද්‍රවිඩ රාජ්‍ය පක්ෂය හැදී මේ පරමාර්ථය සම්බන්ධයෙන් ඇති පසු බිම තමා මෙයින් පෙනී යන්නේ.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

ඔය කොයි අවුරුද්දේ කියා තිබෙන දෙයක්ද ?

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

1957 අවුරුද්දේ. තවමත් ඒ අදහස් වෙනස් වී නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

Then you joined hands with them in July 1960.

**ගරු හුරුල්ලේ**

*(கௌரவ ஹுருல்ல)*

(The Hon. Hurulle)

You signed the B-C Pact in 1958.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

I shall come to that. I am quoting from HANSARD, Volume 28.

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

Was it before the B-C Pact ?

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

The date of the HANSARD is 17th June 1957.

තවමත් ෆෙඩරල් පක්ෂයට තිබෙන්නේ මේ අදහසමයි. මේ අදහස පොඩ්ඩක්වත් වෙනස් වී නැහැ. සමහර විට 1957 ට පෙර වුණත් මේ අදහස තිබෙන්නට ඇති. තවමත් මේ අදහස වෙනස් නොවුණා පමණක් නොව අගමැතිතුමා යාපනයට ගිය අවස්ථාවේදී එතුමාගේ මුහුණටමත් මේ අදහස ප්‍රකාශ කර තිබෙනවා. එම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා ඒ පිළිබඳව හිත වෙනස් කිරීමක් කර නැහැ. එපමණක් නොවෙයි, මේ සභා ගර්භය ඇතුළත කී වරක් ප්‍රකාශ කර තිබෙනවාද අපේ පරමාර්ථය අබමල් රේණුවකින් පමණවත් වෙනස් කර නැත කියා. [බාධාකිරීම්] ඊයේ සෙනෙට් හැන්සාඩ් වාර්තාවෙත් තිබෙනවා. මට එය තවම ලකුණු කර ගන්න බැරි වුණා. සෑම තැන කම කියාගෙන ගියේ මොකක්ද? මම අහන්න කැමතියි, අගමැතිතුමාගෙන් ඒ අය ඒ අදහස ඉල්ලා අස් කරගෙන තිබෙනවාද කියා. ෆෙඩරල් රාජ්‍යයක් නොහොත් දෙමළ රාජ්‍යයක් මේ ලංකාවේ ඇති කිරීමට ඒ ගොල්ලන් ප්‍රයත්නයක් දරනවාය කියන අදහස ඒ ගොල්ලෝ අත හැර දමා තිබෙනවාද කියා මා අහන්න කැමතියි. අපේ ආරංචියේ හැටියට නම් නැහැ.

එපමණක් නොවෙයි, මේ සම්බන්ධයෙන් ඒ කාලේ සාකච්ඡා කරන අවස්ථාවකදී අපේ වර්තමාන ආහාර ඇමතිතුමා කී අදහස්ද මට සිහිපත් වෙනවා. එතුමා කිව්වෙ මොකක්ද? බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුමට අප විරුද්ධ නැහැ, මෙන්න මෙහෙම නම්. කොහොමද? එයින් පමණක් ප්‍රශ්න ඔක්කොම ඉවර වෙනවා නම්. එදා කිව්වෙ එහෙමයි.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රචාරක හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலி பரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

නැහැ. නැහැ.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ඇයි නැහැ කියන්නේ? හැන්සාඩ් වාර්තාවෙ පවා තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

පෙන්වන්න. පෙන්වන්න.

**ඉලංගරත්න මයා.**

*(திரு இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

දැනට මා එය ලකුණු කරගෙන නැහැ. මම පෙන්වන්නම්.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

මා හිතන්නෙ නැහැ කවදාවත්—

**ඉලංගරත්න මයා.**

*(திரு இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

මගේ ඇහින් මා දැක තිබෙනවා. මේ ගිවිසුම ක්‍රියාත්මක කරනවාට අපි විරුද්ධ නැහැ, යම් කිසි අන්දමකින් මෙයින් ම මේ ප්‍රශ්න ඉවර වෙනවා නම් කියන එකයි එතුමා කිව්වෙ. එතුමාගෙ අදහස වුයේ, ටිකක් ගන්නවා, ආයෙත් තව ටිකක් ඉල්ලනවා, තව ටිකක් අරගෙන ඊට පසු තව ටිකක් ඉල්ලනවා, ඒ නිසා තමන් එයට විරුද්ධ බවයි.

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

ඒ දඹදෙණියේ මන්ත්‍රීතුමා වෙන්න ඇති.

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

නැහැ, නැහැ. සම්පූර්ණයෙන්ම මෙතුමාගේ අදහසයි. මා දැන් ස්වල්ප වේලාවකට කලින් කියවූ චෙල්වනායගම් ප්‍රකාශය ඉතාම වැදගත් නිසා එහි සිංහල පරිවර්තනය මා කියන්න කැමතියි. මේ එහි සාමාන්‍ය පරිවර්තනයයි :

"මිනිස් වර්ගයාගේ ජාතියකට හෝ උප ජාතියකට බල පාන දෙවැනි කරුණ නම් ඔවුන් වාසය කරන ප්‍රදේශයයි. අපේ රටේ සිටින අය පදිංචිව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
සිටින්නේ ලංකාවේයි. ඒ අයට වෙන් වශයෙන් රටක් නැත්නම් ඒ අය හඳුනාගන්නට බැරි වෙයි. ශත වර්ෂ ගණනාවක් තුළම යුදෙව්වන්ට තමන්ගේම රටක් පදිංචියට තිබුණේ නැහැ. ඒ නිසා ඔවුන් දඩාවතේ යන යුදෙව්වන් වශයෙන් හිට්යා. අන්තිමේදී වෙන ආණ්ඩුවල ආධාරයෙන් පලස්තීනයේ කොටසකට කඩා වැදී දූන් ජාතියක් බවට පත් වී තිබෙනවා."

වෙන ආණ්ඩුවල ආධාරෙන් කඩා වැදී දූන් ජාතියක් බවට පත් වී සිටිනවාලු. කොයි ආණ්ඩුවල ආධාරයෙන් ද ? එහෙම නම් වෙන ආණ්ඩුවල ආධාරෙන් ලංකාවට කඩා වැදී එක්තරා තැනක් අත්පත් කරගෙන ද්‍රවිඩ රාජ්‍යයක් හැදීමේ පරමාර්ථයෙන් අර ඊශ්‍රායලය කළ දෙයම අනුගමනය කරන්නයි ෆෙඩරල් පක්ෂයේ නායකතුමාගේ අදහස. ඊළඟට :

"ජාතියක හෝ උප ජාතියක පැවැත්මට හෝ ජීවත් වීමට අවශ්‍ය වුවමනාවක් තමයි ඒ ජාතියට භූමියක් තිබීම. වර්ග කීපයක් වාසය කරන භූමිවලින් බොහෝමයකම ඒ ඒ වර්ගය වෙන් වෙන් වශයෙන් රටක් හෝ එයින් කොටසක් හෝ ස්වකීය රට කරගෙන ජීවත් වෙනවා. ලංකාවේ ද්‍රවිඩ පළාත් යනුවෙන් අප සඳහන් කරන්නේ උතුර හා නැගෙනහිර යන පළාත් දෙකයි. එහි සිටින දස ලක්ෂ සංඛ්‍යාත ද්‍රවිඩ ජනතාවට දේශපාලන බලයක් ලැබෙන්නේ නැහැ, මේ පළාත්වල විශාලම කොටස වශයෙන් ජීවත් නුණොත්. අනික් පළාත් හතේ ද්‍රවිඩ හා මුස්ලිම් ජනතා විශාල කොටස් ඉන්නවා. එහෙත් ඒ අය සිංහලයන් සමග විසිරී සිටින නිසා ඒ වර්ගයේ නායකවරුන් ඒ සංඛ්‍යා අනුපාතය අනුව පත් කර ගැනීමට හැකියාවක් නැහැ. දැනට උතුර හා නැගෙනහිර පළාත්වල සිටින ද්‍රවිඩයන් දස ලක්ෂය අනික් පළාත්වල සිටින සිංහලයන් අතරට පත් වුව හොත් එසේම උතුර හා නැගෙනහිර පළාත්වලට බහුල වශයෙන් සිංහලයන් පත් කළහොත් තමන්ගේ වර්ගයාගේ බහු ප්‍රදේශයක් යයි දෙමළ ජනතාවට කියා ගන්නට බැරි දවසක් උදා වෙයි."

ඔන්න ඔය විධියට සම්පූර්ණයෙන්ම ලංකාවේ ද්‍රවිඩ රාජ්‍යයක් හැදීමේ ප්‍රතිඥාවක් ඇතුව ඉදිරිපත් කළ පොරොන්දුවක් පිටයි මේ දේශද්‍රෝහී ආණ්ඩුව එදා රහසේ ක්‍රියා කරන්න පටන්ගත්තේ. මේ ආණ්ඩුවට වුවමනා කරන්නෙ ප්‍රශ්න විසඳන්නට නොවන බව අප කවුරුත් දන්නව. මේ ආණ්ඩුව ඇති කර ගත්තෙ කොහොම හරි බලයේ රැඳී සිටීමට ප්‍රයත්නයක් දරන්නටත්, තමන්ගේ කට්ටියට පුළුවන් තරම් සේවය කර ගන්නටත් විතරයි. එම නිසා මේ අගමැතිතුමාගේ නායක ප්‍රජා-

තන්ත්‍ර නාශකයා වශයෙන් ලංකා ඉතිහාසයේ කළු අකුරින් ලියවෙන බවට කිසිම අනුමානයක් නැහැ.

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
අපි අනාගතයේදී බලමු.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
1965 මේ රජයේ පළමුවෙනි රාජාසන කථාවෙන් මොකක්ද කිව්වෙ ? මැතිවරණ ප්‍රකාශන ගැන කිසිම සැලකිල්ලක් නොදක්වා රහස් ගිවිසුමක් ඇති කරගෙන ප්‍රජාතන්ත්‍ර විරෝධි ලෙස හදා ගත් මේ ආණ්ඩුවේ පළමුවෙනි රාජාසන කථාව පටන් ගත්තෙ කොහොම ද ? මෙන්න මෙහෙමයි :

"ප්‍රජාතන්ත්‍රීය ක්‍රම ගරුක ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී ක්‍රමයේ ප්‍රතිපත්තිවලට අනුකූලව රට සෞභාග්‍යය කරා ගෙන යන රජයකට මහජනයා කැමති බව මහා මැතිවරණයේදී නිදහස්ව දුන් ඡන්දය මාර්ගයෙන් ඔවුන් ස්ථිරව ප්‍රකාශ කර ඇත. මහාජනයාගේ එම අභිලාෂය සපුරාලනු වස් සෑම ප්‍රයත්නයක්ම මාගේ ආණ්ඩුව විසින් දරණු ලැබේ."—[**නිල වාර්තාව,** 1965 අප්‍රේල් 9 ; කා. 60 ; තී. 76.]

පටන් ගත්තෙම අසත්‍ය ප්‍රකාශයකින්. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් සඳහා බලය ලබාගෙන සමාජවාදී ප්‍රජාතන්ත්‍රවාදය පිළිගෙන "අපි සෞභාග්‍යය කරා ගමන් කරනවා" යයි කිව්වා. එම නිසා එදා චාටු වෙන් හදාගත් ප්‍රජාතන්ත්‍ර විරෝධී එක්සත් ජාතික—ද්‍රවිඩ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වන්නට පුළුවන්කම තිබෙන්නෙ ප්‍රෝඩා විතරයි. කෙරෙන තරමක් කෙරෙන්නෙ අවැඩයි. එම නිසා මේ ආණ්ඩුව බලයේ රැඳෙන්ට හැම අවැඩක්ම කිරීම, හැම අසත්‍යයක්ම ප්‍රකාශ කිරීම පුදුමයක් නොවෙයි.

මේ ආණ්ඩුව බලයට පත්වීමෙන් පසුව අතුරු මැතිවරණ ගණනාවක්ම පැවැත් වුණා. එහෙත් සිද්ධ වුණේ මොකක් ද ? දෙකකින් හැර අනෙක් හැම එකකින්ම ආණ්ඩු පක්ෂය පරාදයි. නියම ප්‍රජාතන්ත්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාදි ආණ්ඩුවක් නම් ඒ කාලයේම පිබි දෙන්ට ඕනෑ. ඇයි මෙහෙම අපි පරදින්නෙ කියා සොයා බලන්න තිබුණ. මැතිවරණයේදී අපි දුන් පොරොන්දු ඉෂ්ට නොකළ නිසා මහජනතාව කිපිල මේ විධියට ඡන්දය දෙනවා වෙන්න ඇති කියා කල්පනා කර බලන්න තිබුණ. ඒ නිසා මේ ආණ්ඩුවට තිබුණෙ ඉල්ලා අස් වෙන්නටයි. එහෙත් අස් වුණේ නැහැ.

ඊළඟට 1966 ජනවාරි 8 වැනිද ගැන අපි හිතමු. එද සිද්ධ වුණේ මොකක් ද ? මහ මැතිවරණ සමයේදී අගමැතිතුමා පොරොන්දු දුන්නා, තමා බලයට පත් වුණොත් දැන් තිබෙන ආණ්ඩුවට වඩා විශාල සේවයක් බුද්ධාගමටත්, සිංහල භාෂාවටත් කරනවා කියා. ඒ වගේම සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම දැනට වඩා සර්ව සම්පූර්ණ ලෙස කරනවාය කිව්වා. එහෙත් 1966 ජනවාරි 8 වෙනිදා මොකක්ද සිද්ධ වුණේ ? සවාමින් වහන්සේලා සමූහයකුත්, ජාති මාමක පිරිසකුත් අගමැතිතුමාට පෙත්සමක් දෙන්නට ඉදිරිපත් වුණා. මොකක්ද ඒ පෙත්සම ? "ඔය තමුන්නාන්සේ ඉදිරිපත් කරන්ට යන ද්‍රවිඩ භාෂා විශේෂ විධිවිධාන රෙගුලාසි වලින් සිංහල භාෂා ප්‍රතිපත්තියට විශාල හානියක් වන නිසා කරුණා කර ඒ ගැන නැවත සලකා බලන්න" කියන කාරණයයි පෙත්සමේ සඳහන් වුණේ. පෙත්සම ඉදිරිපත් කරන්ට ආව පිරිසට මොකක්ද සිද්ධ වුණේ ? දඹරාවේ සවාමීන් වහන්සේට වෙඩි තිබ්බ. තවත් කී දෙනෙකුට තුවාල වුණාද, කී දෙනෙකු මළාද කියා ලේඛනගත වෙලා නැහැ. තත්ත්වය එහෙම තිබෙද්දි 1966 ජූලි මාසයේ 8 වැනිදා පැවැත්වූ රාජාසන කථාව පටන් ගත්තෙ කොහොමද ? මෙහෙමයි :

"ප්‍රජාතන්ත්‍රීය ක්‍රමය කෙරෙහි සිය විශ්වාසය සහ ප්‍රජාතන්ත්‍රීය සමාජවාදී ක්‍රමයේ ප්‍රතිපත්ති වලට අනුකූලව දියුණුව කරා යෑමට සිය අභිලාෂය මෙරට මහාජනයා යළිත් ප්‍රකාශ කළ තැන් සිට වසරක් දැනට ඉකුත් වී තිබේ. මාගේ ආණ්ඩුව පසුගිය වර්ෂය තුළ මේ ප්‍රතිපත්ති රකිමින් මහා ජනයාගේ බලාපොරොත්තු සපුරාලීමට ඉවහල් වන පියවර ගෙන ඇත."— [නිල වාර්තාව, 1966 ජූලි 8 ; කා. 67 ; තී. 7.]

ප්‍රජාතන්ත්‍රවාදීය කියා ආණ්ඩුව ලබා ගෙන, ඒ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම කාබාසිනියා කර දමා, හාමුදුරු නමක් මරා දමා, ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පෙත්සමක් ඉදිරිපත් කරන්ට ආව පිරිස විසුරුවා හැර අන්තිමේදී කිව්වෙ, "ගිය අවුරුද්දේ අපි හොඳට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කළා" කියායි. එදා පැනැවූ හදිසි නීතිය තවමත් තිබෙනවා. හදිසි නීතිය යටතේ දැනටමත් දවස් 981 ක් පමණ පාලනය ගෙන ගොස් තිබෙනවා. තවමත් ඒ අනුව රට පාලනය කරගෙන යනවා. එසේ කර ගෙන යන අතර ඒ මුවාවෙන් හිත වතුන්ට දේශපාලන අල්ලස් දීමත්, දේශ පාලන විරුද්ධවාදීන්ගෙන් පලිගැනීමත්, ඥාතිසංග්‍රහ වැනි දේත් ඊට සම්බන්ධ වෙනත් දූෂණ ආදියත් කෙලවරක් නැතිව කරගෙන යමින් තවමත් මේ ආණ්ඩුව පවත්වාගෙන යනවා. ඒ සම්බන්ධයෙන් විස්තරයක් කරන්නට මේ අවස්ථාවේදී මා අදහස් කරන්නේ නැහැ. ඒවා අනෙකුත් කථික මන්ත්‍රීන්ගෙන් හොඳ හැටි ඉදිරිපත් වෙනවා ඇති.

අද ඉදිරිපත් කර තිබෙන මේ ස්තුති යෝජනාව ගැන බලමු. රාජාසන කථාවක් සම්බන්ධයෙන් ස්තුති යෝජනාවක් ඉදිරිපත් කරන සහ ස්ථිර කරන ගරු මන්ත්‍රීන් දෙදෙනාට ප්‍රශංසාකිරීම සාමාන්‍ය සිරිතක් වෙතත් මේ අවධියේදී නම් ඒකවත් අපට හෘද සාක්ෂියට අනුව කරන්නට බැරි වීම ගැන මා කණගාටු වෙනවා. ස්තුති යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා සහ එය ස්ථිර කළ මන්ත්‍රීතුමාත් අවස්ථාවට අනුරූපව නොවෙයි කථා කළේ. නොයෙක් විධියේ අසත්‍ය ප්‍රකාශ ආදියෙන් ඒ කථා පිරී තිබුණා. මේ ගැන අපට පුදුම වන්නට වුවමනාවක් නැහැ. ඇයි ? ව්‍යාජයෙන් හදාගත්, ව්‍යාජයෙන් ගෙන යන ආණ්ඩුවකින් ඊට වඩා යමක් බලාපොරොත්තු වන්නට බැහැ. ඒ වාගේම දිරච්ච වැටකට හේත්තු වන්නට අදහස් කරන්නෝ මෝඩයෝයි. ඥානවන්ත අය එසේ කරන්නේ නැහැ.

මේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව පිහිටුවා ගැනීමට ඉස්සරවෙලා 1965 අවුරුද්දේදී රටට දුන් පොරොන්දු මොන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
වාදැයි අපි කල්පනා කර බලමු. ඒවා දැන් අපි ටිකක් පරීක්ෂා කර බලමු. ඔක්කොම පොරොන්දු විස්තර කරන්නට ගියොත් කෙළවරක් කරන්නට පුළුවන්කමක් ඇති නොවන බව පෙනී යන නිසා මට තිබෙන කාලය තුළ එයින් එකක් දෙකක් පමණක් ගැන මතක් කරන්නට කැම තියි. මා ළඟ ලිතක් තිබෙනවා. එය ලංකාව හැම තැනම ප්‍රසිද්ධ කරන ලද ලිතක්. 1965 දී මුද්‍රණය කර බෙදා හරින ලද මේ ලිතේ මැද එක්සත් ජාතික පක්ෂයේ නායක, දැන් ඉන්න ගරු අගමැතිතුමාගේ පින්තූරයක් තිබෙනවා. මොන වාද දුන් පොරොන්දු? ඒවා මෙහි තිබෙනවා. පොරොන්දු විසි එකක් තිබෙනවා. දෙන ලද පොරොන්දු 21න් ඉෂ්ට කර තිබෙන්නේ එකයි. මොකක්ද ඒක? හැම පොහොයම නිවාඩු දවසක් කළ එක පමණයි.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க— நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)
ඒක ලොකු වැඩක්.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
ඒක ලොකු වැඩක් බව පිළිගන්නවා.

මොනවාද දුන් පොරොන්දු? මම ඒවා කියවන්නම්. මෙන්න පොරොන්දු:—

"(1) මහජනතාව රටේ ස්වාමිත්වයට පැමිණීම."

1966 ජනවාරි 8 වැනිදා කළ දෙයින් ඒ බව පෙනෙනවා.

"(2) සිංහලයින්ගේ සාහිත්‍යය, සංස්කෘතිය සහ ශිෂ්ටාචාරයෙහි ජීවනය බුද්ධ ධර්මය බව පිළිගැනීම."

කොයි විධියට මේ කාර්යය කරගෙන යනවාදැයි යසට ඔප්පු වෙනවා. බුද්ධාගමට දුන් තැන මොකක්දැයි මෙතෙක් කර තිබෙන දේවලින් ඔප්පු වෙනවා. ත්‍රෛනිකායික සංඝ පෙරමුණටත්, නොයෙක් විධියේ ඇම්බැට්ටකම් කළ එදිරිය ටත් නම් නොයෙක් විධියේ දේවල් දී තිබෙනවා. දෙන ලද ඒ පොරොන්දුව කොයි අන්දමට ක්‍රියාත්මක කරගෙන යනවාදැයි අපට ඒ අනුව පෙනී යනවා.

"(3) පොහොය සතර නිවාඩු දවස් කිරීම.

(4) බෞද්ධයින්ගේ නැති වී ගිය අයිතිවාසිකම් ලබා දීම සහ ජාතික සංස්කෘතිය දියුණු කරන අතර අන්‍ය භක්තිකයින්ට සහ ජාතිකයින්ට හිංසා නොකිරීම."

මෙහිදී එකක් මතක් කරන්නට කැමතියි. 1964 දී සභාග ආණ්ඩුව තිබුණු කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පද්ධතියට සංශෝධන ඇති කරන්නටත් ඒ මගින් යථා ස්ථානය දෙන්නටත් ගිය අවස්ථාවේ මොකද කෙළේ? මේ තරම් ප්‍රමාද වී මේ කාර්යය ගැන කල්පනා කරන්නට හේතුව මොකක්දැයි එදා ප්‍රශ්න කළා. එතෙක් ප්‍රමාද කළ නිසා එය ප්‍රෝඩාවකැයි කිව්වා. අප සමග සිටි අයගෙන් කීප දෙනෙක් එදා පිටුපසින් පැමිණ පිහියෙන් ඇන ගියා. ඒ අතර අන්‍ය ජාතිකයින්ට සහ භක්තිකයින්ට හිංසා නොකිරීම යනුවෙන් සඳහන් කර තිබෙනවා.

"(5) අධිරාජ්‍යවාදීන් විසින් නැති කර දමන ලද ගිහි පැවිදි සම්බන්ධය නැවත ඇති කිරීම."

මේ රටේ ගිහි පැවිදි අසම්බන්ධයක් කවදාවත් සිද්ධවෙලා තිබුණායයි මා හිතන්නේ නැහැ.

"(6) සිංහල භාෂාව රජයේ භාෂාව කිරීම."

දඹරාවේ හාමුදුරුවෝ කවදා හෝ කියාවී, ඒ සම්බන්ධයෙන් එදා මොන විධියේ අනවරයක් සිදු වුණාද යන්න ගැන.

"(7) ගුරුවරයාට රජයේ අනෙක් සේවකයනට මෙන් සම්පූර්ණ විශ්‍රාම වැටුප් අයිතිය ලබා දීම සහ ඉංග්‍රීසි-සිංහල ගුරුවරුන් අතර ඇති පරතරය නැති කිරීම."

අධ්‍යාපන කටයුතු භාර ගරු ඇමතිතුමා දැන් මෙතැන නැහැ. එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා පමණක් මෙහි සිටිනවා. තමන්ගේ හෘදය සාක්ෂියට තට්ටු කර ඇසුවොත්, නැත්නම් බැලුවොත්, ඒ සම්බන්ධයෙන් කළ දේ ගැන තේරුම් යනු ඇති. ගුරුවරුන් තරම් මේ ආණ්ඩුවෙන් අසහනයක් ලත් වෙනත් සේවක කොට්ඨාශයක් මේ රටේ නැති බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පැහැදිලියි. ඒ වාගේම මේ ආණ්ඩුව තරම් ගුරුවරුන්ට අසහනයක් ඇති කළ ආණ්ඩුවක් මේ රටේ කවදාවත් පහළවෙලා නැහැ.

**ලෙසලි ගුණවර්ධන මයා.** (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

ඒ වුණාට ගුරුවරුන් සියේට සියයක් සහයෝගය දෙනවාලු!

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

" (8) ආයුර්වේදය දියුණු කොට ආයුර්වේද වෛද්‍ය වරයාගේ තත්ත්වය උසස් කිරීම.

(9) ජාතික වෙළෙන්දාට සහ ජාතික කර්මාන්ත හිමියාට නියම තැන ලබා දීම.

(10) මහජනයාට නියම ප්‍රයෝජනය ලැබෙන සේ කර්මාන්ත ක්‍රමය සකස් කරන අතර හවුල් රජයෙන් කෙරෙන නාස්තිය නැති කිරීම."

මේ කාරණා සම්බන්ධයෙන් සොයා බැලුවොත් මේ ආණ්ඩුව ජාතික ප්‍රශ්න විසඳන්නේ කෙසේද කියා සාධක සහිතව පෙන්වා දෙන්න පුළුවනි. මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම ඒ ප්‍රශ්න විසඳන්නේ විජාතිකයින්ටත් අධිරාජ්‍යවාදී ධනපතියන්ටත් වාසි වන අන්දමට බව මා පසුව පෙන්වා දෙන්නම්.

" (11) ජීවන වියදම අඩු කිරීම."

එය නම් හොඳට කර තිබෙනවා. අපේ කාලයේ ජීවන වියදම් අංකය 112 යි. දැන් 120.3 යි. ඔය ගණන එන්නේ හාල් ගණන් ගන්නෙත් නැතුවයි. හාල් දෙන්නේ නොමිලේ නිසා ඒවා ගණන් ගන්නේ නැහැ.

" (12) ජාතික ධනය ටික දෙනෙකු අතරේ පමණක් රැඳීමට ඉඩ නොදීම."

මේ කරුණ විස්තර කරන්නට ගියොත් නමුන්නාන්සේලාටම හිනහ යන්න පුළුවනි. දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද? ජනසතු සෙවාවන් ඥතීන් සතු කරනවා; සහෝදරයන් සතු කරනවා; මිත්‍රයන් සතු කරනවා; එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන් සතු කරනවා. ඒකයි දැන් වෙන්නෙ.

" (13) රට වැස්සනට තමාට අයිති ගෙයක් තිබීමේ වාසනාව අත් කර දීම.

(14) ගොවියාට පහසු අන්දමට ණය ලබා ගැනීමේ ක්‍රම ඇති කිරීම."

ඉස්සර අපි ඉන්න කාලයේ ගොවියාට පොලිය සියයට 4 ටත් 6 ටත් අතරේ ගණනකට ණය ලබා දුන්නා. අද සියයට 12 පොලියට ණය දෙනවා. ඔන්න ගොවියාට කරන ලද පහසුකම.

" (15) ජනසතු ව්‍යාපාර කලින් හිමිව තිබූ අයට ආපසු නොදීම."

මෙය තමයි ලක්ෂණම කරුණ. මීට කලින් කියා තිබෙන්නේ හැම දෙයක්ම දෙනවයි කියායි. මෙතන පමණක් කියනවා ජනසතු ව්‍යාපාර කලින් හිමිව තිබූ අයට ආපසු නොදෙනවාය කියා. දැන් සී.ඩබ්ලිව්.ඊ. එකේ කොටස් වෙළඳුන්ට දී තිබෙනවා. මේ රාජාසන කථාවෙන් රාජ්‍ය ඇමතිතුමා කියනවා තවත් ඒ වගේ සමාගම් කිහිපයක් පිහිටුවන්න යනවාය කියා. ඒ අපට පෙනෙන්ට තිබෙන දේවලුයි. ඊළඟට ජපන් කාර් ගෙන්වීමට පර්මිට් දී තිබෙනවා. ට්‍රැක්ටර් ගෙන්වීමට පර්මිට් දී තිබෙනවා. ඒවා දී තිබෙන්නෙ ඥතිවරුන්ටයි. ඒ විධියට කරන ගමන්ම කියනවා "ජනසතු ව්‍යාපාර කලින් හිමිව තිබූ අයට ආපසු නොදෙනවාය" කියා.

" (16) ස්වාමියාගේත් සේවකයාගේත් අතර තිබෙන දුරස්තරය නැති කොට කිට්ටු සම්බන්ධයක් ඇති කිරීම."

අපේ කම්කරු ඇමතිතුමාට තමන්ගේ අමාත්‍යාංශයේම තිබෙන වෘත්තීය සමිති අරගලය පවා නැති කරන්න බැරි වුණා. දැන් අවුරුදු 30 ක 40 ක කාලයක් තිස්සේ මේ කම්කරු දෙපාර්තමේන්තුව පවතිනවා. මා හිතන අන්දමට මීට කලින් කිසිම දවසක කම්කරු නිලධාරීන් ඔය විධියේ වැඩ නැවැත්වීමක් කර නැහැ. මේ කම්කරු ඇමතිතුමාගේ කාලයේදී තමයි මේ තත්ත්වය ඇති වුණේ.

" (17) ව්‍යාපාරවල යෙදී සිටින සේවකයින් ඒවායේ පාලනයේත් ඒවායින් ලැබෙන ප්‍රයෝජණයේත් හවුල් කාරයන් කිරීම."

මීට කලින් රාජාසන කථා කිහිපයකින්ම කියන්නයෙදුනා මේ ලාභ බෙදීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනවාය කියා. නමුත් මේ රාජාසන කථාවේ පමණක් එය සඳහන් වන්නේ නැහැ. මේ ආණ්ඩුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

පිහිටෙවූ ද සිටම කම්කරු ඇමතිතුමාගේ ලොකුම හොරනෑව තමයි, පෞද්ගලික ආයතනවල ලාභ කොටස් වශයෙන් සේවකයන්ට බෙදා දෙනවාය කියන කියමන. එය කීප වරක්ම කියා තිබෙනවා. නමුත් මේ රාජාසන කථාවේ නම් එය සඳහන් වන්නේ නැහැ. ජනසතු ව්‍යපාර වල යෙදී සිටින සේවකයින් කී දෙනෙක් ඒවායේ පාලන මණ්ඩලවලට සම්බන්ධ කර ගෙන තිබෙනවාද ? එක් කෙනෙක් පමණක් පාලන මණ්ඩලයක හවුල් කාරයෙක් කර තිබෙනවා. කව්ද ඒ ? දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ පින්තූරය පොළොවේ ගැසූ සේවකයා පමණක් ලංගම පාලනයේ හවුල්කාරයෙක් කර තිබෙනවා; ලංගමයේ අධ්‍යක්ෂ තනතුරකට පත් කර තිබෙනවා. ඔහුට තිබෙන ලොකුම සුදුසුකම තමයි අර පින්තූරය පොළොවේ ගැසීම.

" (18) මහජනයා රවටා දූෂණ ක්‍රියාවල යෙදෙන අය නෙරපා දැමීම. "

ලංගමයේ සිටි එක මිනිහෙක් එළවා ගන්න කොයි තරම් අපහසු වුණාද ? කොයි තරම් කරදර වුණාද ? විශ්වාස භංග යෝජනාවන් ගෙනැවිත්, රට මැදට ගොස් කෑ ගැසීමෙන් පසුව තමයි එය කරවා ගන්න පුළුවන් වුණේ. නමුත් කොහොමද කියා තිබෙන්නේ ? " මහජනයා රවටා දූෂණ ක්‍රියාවල යෙදෙන අය නෙරපා දැමීම ". කව්ද දූෂණ ක්‍රියාවල යෙදුනේ ? කව්ද නෙරපා දමා තිබෙන්නේ ? මේ දූෂණ ගැන තමුන්නාන්සේලාගේ ප්‍රචාරයන් කොයි තරම් තිබුණාද ? මේ දූෂණ නැති කිරීම සඳහා ඒ කාලයේදී කොමිෂන් සභා පවා පත් කරන්න යෙදුනා. නමුත් මොකද වුණේ ? දේශපාලන එහෙයියන් ඇටර්නි-ජෙනරල් තනතුර වැනි තනතුරුවලටත් පත් කර ගෙනයි තමුන්නාන්සේලා වැඩ කළේ. නමුත් තමුන්නාන්සේලාගේ දේශපාලන චේතනා උඩ ඒ අයට දඬුවම් කිරීමට තමුන්නාන්සේලාට සාධක සොයා ගන්න බැරි වුණා.

" (19) කිසිම අධිරාජ්‍යයකට මේ රට වහල් නොකිරීම. "

අධිරාජ්‍යයකට නම් රට වහල් වුණේ නැහැ. නමුත් ලෝක බැංකුවටත්, ජාත්‍යන්තර මූල්‍ය මණ්ඩලයටත්, තවත් නොපෙනෙන පෙනෙන සංවිධානවලටත් කොයි තරම් දුරට යට වී තිබෙනවාද කියා විදේශ ආධාර වව්වෝරුවෙන් අපට පෙනී යනවා.

(20) " කාටත් සෞඛ්‍ය ආරක්ෂා ක්‍රමයක් හා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඇති කිරීම."

තවම නම් එය කර ඇත්තේ නැහැ. නමුත් සමහරුන්ට නම් යම්කිසි දෙයක් සිදු කර දී තිබෙනවා. සෞඛ්‍ය ආරක්ෂාව හා විශ්‍රාම වැටුප් ක්‍රමය කෙසේ වෙතත් සමහරුන්ට පෞද්ගලික ආරක්ෂාව නම් හුඟක් දුරට ලැබී තිබෙනවා. සංස්ථාවල අධ්‍යක්ෂවරුන් වශයෙන් බොහෝ දෙනෙක් සිටිනවා ; ඔවුන් එමගින් සුරක්ෂිත වී සිටිනවා.

අන්තිම කාරණය, "පලි නොගැනීම" සහ පලිගත් අයට සමාව දීම" යි.

ගරු කථානායකතුමනි, දේශපාලන විරුද්ධවාදීන්ට ගහන්න එපායයි අගමැතිතුමා ලවා පොලීසියට දන්වන්න මාස තුනක් ගත වුණා. කොයිතරම් උද්ඝෝෂණයක් ගෙන යන්න සිද්ධ වුණාද නවත්වන්න ; ඒත් නැවැත්වූයේ නැහැ. අද මොකක්ද සිදු වී තිබෙන්නෙ ? අද සම්ප්‍රදායයක් වී තිබෙන්නෙ මොකක්ද ? රැකියාවක් ලබාගන්න වුවමනා නම් මන්ත්‍රීතුමාගෙන් ලියමනක් ගෙන යන්න ඕනැ. ඉහළට යන්න ඕනැ නම් මන්ත්‍රීතුමාගෙන් සහතිකයක් ලබාගන්න ඕනැ. විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය සම්පූර්ණයෙන්ම දූෂණය වී තිබෙනවා. ඥාති සංග්‍රහවලින්, දේශපාලන සංග්‍රහවලින් පිරී ඉතිරී ගොස් තිබෙනවා. කොතරම් දුරට පිරිහී තිබෙනවාද කියනවා නම් ලොකු අයත් පුංචි අයත් අතරේ "බ්ලැක් මේලිං" පවා තිබෙනවා. එකා අනිකාගේ රහස් එළිවෙනවාට බියෙන් කට වහ ගෙන ඉන්නවා. එමනිසා රජයේ සියලුම සංස්ථාවල වැඩ කටයුතු ගැන පරීක්ෂා කර බැලීම සඳහා සතොසේ කොමිසම වාගේ, ඒ කොන්දේසි හා බලතල සහිතව, කොමිෂන් සභාවක් පත් කරන ලෙස මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මේ විධියට දුන් පොරොන්දු විසි එකෙන් එක් පොරොන්දුවක් පමණයි ඉටු කර තිබෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නෙ. එනම්, සතර පෝය නිවාඩු දින කිරීම පමණයි. අනික් සියල්ල වසා ගැනීම පිණිස එය කර තිබෙනවා. කොහොම වුණත් සමහර ස්වාමීන් වහන්සේලාත් උපාසක මහත්වරුත් කියනවා, පෝය නිවාඩුව දෙන දවසට නොවෙයි, නියම පෝය යෙදෙන්නෙ කියා ; පෝය දිනය බලා ගන්න ඕනැ නම්, සිල් ගන්න ඕනැ නම්, ආණ්ඩුවෙන් දෙන දින දර්ශනය බලා වැඩක් නැත, ලිතක්ම බලන්න ඕනැය කියා. දැන් නිවාඩු දෙන්නෙ, පෝය දිනට කලින් දවසෙ. එහෙම නැති නම් පෝය දිනට පසුවදා.

ගරු කථානායකතුමනි, දැනට කර තිබෙන රාජාසන කථා හතරම ගෙන ඒවායේ අඩංගු කර ඇති කාරණා ගැන බැලුවොත් අපට පෙනී යනවා, මැතිවරණ කාලයේදී කළ ප්‍රකාශනවලට වඩා වැඩි වෙනසක් නැති බව. කොයි අන්දමේ යෝජනා රාජාසන කථාවට ඇතුළත් කළත් එයින් ඉටු කරන්නෙ බොහොම ටිකයි. අප දැන් ගෙන බලමු මෙවර ඉදිරිපත් කර ඇති රාජාසන කථාවෙ අඩංගු දේවල් ගැන. මෙම රාජාසන කථාව පටන් ගෙන තිබෙන්නෙ එක්තරා ස්වරයකින්.

"මෙරට මුහුණ පා ඇති ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීමේ කටයුතු සඳහා මාගේ ආණ්ඩුවට වැඩි වැඩියෙන් පරිශ්‍රම දරන්නට සිදු විය."

එසේ කීවාට අපට කමක් නැහැ. නමුත් ලජ්ජා නැතුව මෙහෙමත් කියනවා :

"1965 දී එය බලයට පත් වන විටත් ආර්ථික අතින් දුෂ්කර තත්ත්වයක් ඇති වී තිබුණි."

මෙය අමතක නොකරම බැහැ. රාජාසන කථා තුනකදීම මතක් වුණේ නැහැ ; මේවර මතක් වී තිබෙනවා, රාජාසන කථාවට ඇතුළත් කරන්න. එපමණක් නොවෙයි, එකම ඇමතිවරයකුට වත්, ප්‍රචාරක කටයුතුවල යෙදෙන මන්ත්‍රීවරුන්ටවත්, '1965 දී මැතිණිය යන විට භාණ්ඩාගාරය හිස්කර ගියාය, එම නිසා අපට මොකුත් කරන්න බැරිය' කියා නොකියාම බැහැ. හැම තැනකදීම කියන්නෙ ඔකයි. එහෙමත් කියා මදිවී රාජාසන කථාවටත් ඇතුළත් කර තිබෙනවා.

මොන අන්දමේ ප්‍රචාර ගෙන ගියත් මහ ජනතාව පිළිගන්නෙ නැති නිසායි, රාජාසන කථාවටත් ඇතුළත් කර තිබෙන්නෙ ඒ කාලයේ ආර්ථික අර්බුදයක් තිබුණාය කියා. එබඳු තත්ත්වයක් තිබුණු බව අප පිළිගන්නවා, නැතැයි කිසි විටෙක කියන්නෙ නැහැ. එහෙම නම් අපි දැන් බලමු එදා තත්ත්වයත් අද තත්ත්වයත් ගැන. ඒ වාගේම ආර්ථික ප්‍රශ්නයත් විසඳන්න මේ ආණ්ඩුව කර තිබෙන්නෙ මොනවාද කියාත් බලමු. ජනතාවට සලසා තිබෙන ආර්ථික සහනයන් මොනවාද? ගරු කථානායකතුමනි, පසුගිය අවුරුදු තුන තුළ ඇති වාර්තාවන් ගෙන බැලුවොත් මෙන්න මේ විධියෙ සටහනක් අපට හදන්න පුළුවනි. ලොකු අයට සලසා තිබෙන සහනයන් මොනවාද, පුංචි අපට සලසා තිබෙන සහනයන් මොනවාදැයි දැන් වෙන වෙනම ගෙන බලමු. ලොකු අයට සහන : 1966 දී තෙල් වන්දි ලක්ෂ 550 යි. 1965-66 යේ සිට මේ වනතෙක් අවුරුද්දකට අයබදු සහන ලක්ෂ 511.4 යි ; බූදල් බදු සහන ලක්ෂ 1.5 යි. එකතුව ලක්ෂ 1,062.9 යි.

අපි ඊළඟට බලමු පුංචි අයට දී තිබෙන සහන මොනවාද කියා.

1965-66 දී තීරු බදු සහන ලක්ෂ 184 ක් දීලා ලක්ෂ 250 ක් ඔවුන් පිට පැටෙව්වා. එතකොට 1965-66 දී පුංචි මිනිහා පිට පැටවූ තීරු බදු බර ලක්ෂ 66 යි. 1966-67 දී හාල් කැපීමේ බර ලක්ෂ 1,400 යි—මා මේවා ලබාගත්තේ සංඛ්‍යා ලේඛනවලිනුයි—ඒ අවුරුද්දේ තීරු බදු බර ලක්ෂ 1,000 යි. 1967-68 අවුරුද්දේදී රජයේ සේවකයන්ට ලක්ෂ 600 ක් දී තීරු බදුවලින් ලක්ෂ 950 ක් ගත්තා. ඒ අනුව පුංචි මිනිහා පිට එම අවුරුද්දේ පැටවූ බර ලක්ෂ 350 යි. ඒ අනුව පුංචි මිනිහාට ලක්ෂ 2,416 ක ශුද්ධ බරක් පටවා ලක්ෂ 1,062.9 ක් කෙලින්ම ලොකු අයගේ සාක්කුවට දමා ගත්තා. ඔන්න ආර්ථිකය අතින් මේ රටේ තිබෙන වාර්තාව.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේලා අපි කවුරුත් දන්න පරිදි, මේ ආණ්ඩුව විශාල වශයෙන් ප්‍රචාරය කළේ ජීවන වියදම පහළ දමනවාය කියලයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

එහෙත් අද සිදු වී තිබෙන්නේ කුමක්ද? මා කලිනුත් සඳහන් කළ අන්දමට ජීවන වියදම පහළ බස්සනවා වෙනුවට 112 ක්ව තිබුණු ජීවන අංකය 120.3 කට ඉහළ නැඟ තිබෙනවා. මේ රාජාසන කථාවේ මුලින්ම මෙන්න මේ අන්දමටත් සඳහන් කර තිබෙනවා :

"ලංකාවෙන් පිටරට යවන ප්‍රධාන ද්‍රව්‍යවල ලෝක වෙළඳපොළෙ මිළ ගණන් බෙහෙවින් පහළ ගිය නිසා—විශේෂයෙන්ම 1966 සහ 1967 වර්ෂ වලදී එකී මිළ ගණන් පහළ ගිය නිසා—මෙම තත්ත්වය තවත් උග්‍ර විය."

මේ අමාරුවේ වැටුණේ කාගේ ආර්ථික ප්‍රශ්න විසඳන්නට ගිහින්ද කියා මා අහන්නට කැමතියි. ධනපති අයට කොයි තරම් දී තිබුණාද, දුප්පත් අයට කොයි තරම් දී තිබුණාද කියා මා විසින් පෙන්වන්නට යෙදුණා. එසේ කර එයිනුත් අයවැය පියවා ගන්නට බැරිව 1967 නොවැම්බර් 22 වැනිදා රුපියලේ වටිනාකමත් සත 20 කින් අඩු කළා. එහෙම කරලා මිනිසුන්ට කීවේ රන් පවුම වෙනස් කළ නිසා රුපිය ලත් වෙනස් කරන්නට සිදු වුණාය කිය ලයි. නැවත වරක් ගරු අගමැතිතුමාට චෝදනාවක් වශයෙන් නොවෙයි සරද මක් වශයෙන් මෙන්න මේක කියන්නට ඕනෑ. අපි බලයේ සිටින කාලයේ රුපියලේ වටිනාකම සත 10 යි කියා කිව්වා. ගරු අගමැතිතුමා විසින් 1967 නොවැම්බර් 22 දා එහි වටිනාකම තවත් සත 20 කින් අඩු කළා. එහෙනම් දැන් රුපියලක් තිබෙනවා නම් සත 10 ක් අතින් පාඩුයි.

එහෙම කරලත් බැරිව, ඊළඟට රට සල්ලි කුපන් ක්‍රමයක් ඇති කළා. එයට ඉංග්‍රීසි යෙන් කියන්නේ FEECs. කියලයි. සිංහ ලෙන් කියන්නේ විදේශ විනිමය සහතික පත්‍ර නැත්නම් "වී. වී. පත්" කියලයි. ඒවා ඇති කිරීමෙන් සිදු වුණේ කුමක්ද? කලින් රුපියල් 100 ක් දී වෙළෙන්දා ගෙන්වූ රට බඩුවට දැන් රුපියල් 145 ක් දෙන්නට සිදු වී තිබෙනවා. ඒත් මහ බැංකුවෙන් සල්ලි ගන්නට පුළුවන් වුණොත් පමණයි. එසේ නැතිව කළුකඩ යට ගියොත් තවත් සියයට 35 ක් දෙන් නට ඕනෑ. රුපියල් 100 ක් වටිනා සහතික යක් කළුකඩයෙන් ගන්නට රුපියල් 180 ක් දෙන්නට සිදු වෙනවා. එතනින් 180 යි, කැපූ සියයට 20 යි. ඒ අනුව අඩු වශයෙන් සාධාරණ වෙළෙන්දෙක් ලාභ වශයෙන් සියයට 10 ක් තබා ගන්නට නම් බඩුව රුපියල් 210 කට විකුණන්නට ඕනෑ. ඒ අනුව බලන විට, සාධාරණ වෙළෙන්දන්ගේ වෙළදාමෙන්ම ජීවන වියදම සියයට 110 කින් ඉහළ නැඟ නවා.

රට බඩුවල මිළ අඩු ගණනේ සියයට 110 කින් ඉහළ නැඟ තිබෙන බව අප දන්නවා. "FEECs" ක්‍රමය යටතේ ගෙන් වන බඩුවලත් "FEECs" ක්‍රමයට යටත් නොවී ගෙන්වන බඩුවලත් යන දෙවර්ග යේම බඩු සියයට 110 කින් ඉහළ නැඟ තිබෙනවා. මේ බඩු ගෙන්වා ඇත්තේ රට සල්ලි කුපන් ක්‍රමය උඩයි, මේ බඩු ගෙන්වා ඇත්තේ ඒ ක්‍රමය උඩ නොවෙයි කියා වෙළෙන්දන් පෙන්නුම් කරන්නේ නැහැ. පිටරටින් ගෙන්වන බඩුවලින් යම් කිසි වර්ගයක මිළ අනිවාර්යයෙන් ඉහළ ගියාම, පිටරටින් ගෙන්වනු ලබන අනෙක් බඩුවල මිළත් ඉහළ යනවා. එම නිසා, රට බඩු හැම එකකම පාහේ මිළ අද සියයට 110 කින් ඉහළ නැඟ තිබෙනවා.

අද බඩුවල මිළ කොහොමද කියා බලමු. මා ඒවායින් කිහිපයක් පමණක් ලියා ගෙන තිබෙනවා. එදා—අපේ කාලයේ—බොම්බයි ලූනු රාත්තලක් සත 14 යි. එක්සත් ජාතික ද්‍රවිඩ රාජ්‍ය පක්ෂ ආණ්ඩුව පටන් ගැනීමේදී ඒවා රාත්තලක මිළ සත 32 යි. ඊට පස්සේ, සත 60 දක්වා නැග්ගා. ඉන් පසු, කාලයක් දකින්නට වත් තිබුණේ නැහැ. දැන් බොම්බයි ලූනු රාත්තලක් සත 48 යි. අපේ කාලයේ අල රාත්තලක් සත 16 යි. මේ ආණ්ඩුව ඇවිත් ටික කාලයක් ගියාට පස්සේ සත 32 වුණා. ඊටත් ටික කාලයකට පස්සේ සත 80 වී, ඊටත් පසුව රුපියල් 1.30 දක්වා ඉහළ නැග්ගා. ටික කාලයක් අල දකින් නවත් තිබුණේ නැහැ. ඊටත් පස්සේ අල රාතත්ලක් සත 90 වුණා. වියළි මිරිස් රාත්තලක් අපේ කාලයේ තිබුණේ රුපියල් 1.10-1.20 අතරේයි. මේ ආණ්ඩුව ආවාට පස්සේ එය රුපියල් 1.40 වුණා. ඊට පස්සේ 1.80 වුණා. ඉන් පසු සලාක ක්‍රමය යටතේ දුන්නා. ඒ කාලයේ වියළි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිරිස් රාත්තලක් රු. 3.05-4.50 දක්වා නැග තිබුණා. සමහර පළාත්වල වියළි මිරිස් රාත්තලක් රුපියල් 8.00 දක්වා ඉහළ නැග්ගා.

ඊළඟට අරගෙන බලමු, කරවල. තෝර කරවල රාත්තලක් අපේ කාලයේ රුපියල් 1.40 යි.—මේ ගැසට් පත්‍රයේ සඳහන් මිළ ගණන්—මේ ආණ්ඩුව ආවාට පස්සේ 2.40-2.80 දක්වා ඉහළ නැග්ගා. ඉන්පසු කරවල හිඟයක් තිබුණා. අද තෝර කරවල රාත්තලක් රුපියල් 3.40 යි. අපේ කාලයේ බල කරවල රාත්තලක් රුපියල් 1.20 ටයි තිබුණේ. මේ ආණ්ඩුව ආවාට පස්සේ එය 2.60 වුණා. අද බල කරවල රාත්තලක් රුපියල් 3.00 යි. අපේ කාලයේ හාල්මැස්සන් රාත්තලක් සත 80 යි. මේ ආණ්ඩුව ආවාට පස්සේ රුපියල් 1.60-1.80 ත් අතර වුණා. ඉන් පසු හාල්මැස්සන් හිඟයක් ඇති වුණා. ඊටත් පස්සේ හාල්මැස්සන් රාත්තල රුපියල් 3.00 වුණා. දැන් රාත්තලක් රුපියල් 3.60 යි.

සීනිවලින් හුඟක් ලාබ තිබෙනවා. අපේ කාලයේ සීනි රාත්තලක් සත 62 යි. මේ ආණ්ඩුව පටන් ගත් කාලයේත් ඒ මිළ යි. අද සීනි රාත්තලක් සත 72 යි. ඒ අනුව අපට හිතන්නට පුළුවනි, මේ ආණ්ඩුව සීනිවලින් කොයි තරම් ලාබයක් ලබනවාද කියා. මම ඒ ගැන තව පොඩ්ඩකින් විස්තර කරන්නම්. අපේ කාලයේ සව් රාත්තලක් සත 60 යි. මේ ආණ්ඩුව ආවාට පස්සේ එය සත 80 වුණා. අද සව් රාත්තලක් රුපියල් 2.20 යි. දැන් තිබෙන්නේ සව් නොවේ, අසව්. අපේ කාලයේ පිටි රාත්තලක් සත 23 ටයි තිබුණේ, මේ ආණ්ඩුව ආවාට පස්සේ එය සත 26 කළා. ඉන්පසු සත 29 දක්වා ඉහළ ගියා. අද පිටි රාත්තලක් සත 35 යි.

ඊළඟට බලමු, එළවළු. ඉස්සර පතෝල රාත්තලක් සත 15 යි. මේ ආණ්ඩුව ආවාට පස්සේ සත 30 වුණා. අද පතෝල රාත්තලක් සත 60 යි. එහෙත් ඒ මුදල කෙළින්ම නිෂ්පාදකයාට ලැබෙන්නේ නැහැ. මතුරටින් සත 2 1/2 ගණනේ ගන්නා බීට් රාත්තල මහනුවර විකුණන්නේ සත 40 ගණනේයි. වැටකොළු රාත්තලක් අපේ කාලයේ සත 15 යි. මේ ආණ්ඩුව ආවාට පස්සේ එය සත 25 ක් වුණා. දැන් වැටකොළු රාත්තලක් සත 60-75 අතර වෙනවා. බෝංචි අපේ කාලයේ රාත්තලක් සත 30 යි. මේ ආණ්ඩුව ආවාට පස්සේ සත 80 දක්වා ඉහළ නැග්ගා. අපේ කාලයේ ගෝවා රාත්තලක් සත 15 යි. දැන් සත 60 යි. අපේ කාලයේ සත 25 ක් වූ බීට් රාත්තල දැන් සත 60 දක්වා ඉහළ නැග තිබෙනවා. සත 30 කට අපේ කාලයේ ගන්නට පුළුවන් වුණු අමු මිරිස් රාත්තල දැන් රුපියල දක්වා ඉහළ නැග තිබෙනවා. අපේ කාලයේ මාළු මිරිස් රාත්තලක් සත 40 යි. දැන් රුපියල් 1.20 යි. අපේ කාලයේ පාන් රාත්තලක් මිළ වුණේ සත 25 ක් පමණයි. එහෙත් දැන් පාන් රාත්තලක් සත 34-35 ක් වෙනවා. ටෝච් බැටරි ආදී අනෙකුත් දේවල් ගැන විපරම් කරන්නට මට බැරි වුණා.

ඔන්න, අද තිබෙන තත්ත්වය. හොඳයි, අපි ජීවන අංකයත් අරගෙන බලමු. 1965 සිට 1968 දක්වා ජීවන අංකය ගෙන බැලූ වාම අපට හොඳින්ම පෙනෙනවා, එය එන්න එන්නට වැඩි වී තිබෙන බව. 1965 —අපේ කාලයේ—ජීවන අංකය 112.5 යි. 1966 යේ 112.3 යි. 1967 තේ 114.8 යි. 1968 ජූනි වන විට ජීවන අංකය 120.3 යි. මේ පිළිබඳ නිවේදනවලම සඳහන් කර තිබෙනවා, 1966 දෙසැම්බරයේ සිට ජීවන අංකය ගණන් ගැනීමේදී හාල් මිළ ඇතුළත් කරන්නේ නැති බව. හාල් සේරුවක් නොමිළයේ දෙන නිසා, මේ ගණන් හදන කන්තෝරුව—ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව—ජීවන අංකය ගණන් ගැනීමේදී හාල් මිළ අත් හරිනවා.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

හරිම ගණන්කාරයෙක්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்காரத்ன)
(Mr. Ilangaratne)

හාල් මිළත් ඇතුළත් කළොත් ජීවන අංකය කොහොමට හිටීවිද? එය හිතා ගැනීම තමුන්නාන්සේලාටම භාරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ගරු කථානායකතුමනි, අපේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා රටේ සැම තැනක දීම කියන කථාවක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. අපේ ගරු අගමැතිතුමා වර්තමාන වෙස්සන්තර රජතුමාය කියමින් එතුමා රට හැම තැනම යනවා. ඒක කියන කොට ජූතකයාත් නිකම්ම මතක් වෙනවා. අමුඩය පමණයි නැත්තෙ. තව හැරමිටිය කුත් ගත්තොත් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා තමයි ඒ කථාව කියන්නට හොඳම සුදුස්සා. මේ ආණ්ඩුව හාල් සේරු වක් කපා අනික් හාල් සේරුව නිකම් දෙනවාය කියා රට හැම තැනම පුරසාරම් දොඩනවා. නමුත් ඔය ජාවාරම නිසා ආණ්ඩු වට පෙරට වඩා හුඟක් ලාභ බව මා පෙන්වා දෙන්නට සතුටුයි. අපේ ආණ්ඩුව කාලයේ හාල්වලට පිහිටාධාරයක් දුන්නා. නමුත් මේ වෙස්සන්තර යුගයේ ආණ්ඩුවට නිකම් හාල් සේරුවක් දීමෙන් ඊට වඩා වාසියි. හාල් මිල ගැන බලමු. ටොන් එකක් කීයද? ටොන් එකක් රුපියල් 640.80 යි. එතකොට රාත්තලක් ගන්න මිළ කීයද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
කොහෙන්ද ඔය ගණන්?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මේ පිටරටින් ගෙන්වන හාල්වල මිළ ගණන්.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
පිටරටින් ගෙන්වන හාල් මිළ පෙරට වඩා දෙගුණයකින් වැඩිවී තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මේ 1967 මිළ. ටොන් එකක් රුපියල් 640.80 යි. මහ බැංකුවේ වාර්තාවෙන් ගත් සංඛ්‍යා ලේඛනයි මා ඉදිරිපත් කරන්නෙ. වැරදි නම් වැරදියි කියන්න. අපිත් ඕව වැඩිය විශ්වාස කරන්නෙ නැහැ. නමුත් සමහර කරුණු පිළිගන්නවා.

හාල් ටොන් එකක් රුපියල් 640.80 යි. එතකොට රාත්තලක් ශත 28 යි. සේරු වක් ශත 56 යි. අපේ කාලෙ 1.12 ට අර ගෙන ශත 50 බැගින් සේරු දෙකක් දුන්නා. එමනිසා ශත 62 ක් ආණ්ඩුව පාඩු වින්දා. මේ ආණ්ඩුව මොකක්ද කරන්නෙ? 1.12 ට හාල් සේරු දෙකක් අරගෙන එකක් නිකම් දෙනවා. අනික් සේරුව 1.25 යි. එතකොට ශත 13 ක් ලාභයි. නමුත් අපේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා, "මේ තමයි වෙස්සන්තර යුගය" කියා රට හැම තැනම කියාගෙන යනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම නම් ඇයි වැය ශීර්ෂයෙ පිහිටාධාර මුදල තිබෙන්නෙ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
පිහිටාධාර මුදල තිබෙනවා. ඒක ගැන නොවෙයි මා කියන්නෙ.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
එහෙම නම් ලාභය කියන්නෙ කොහොමද?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මේ ජාවාරමෙන් ගිය ආණ්ඩුවට වඩා මේ ආණ්ඩුවට ලාභයි. ගිය ආණ්ඩුව ශත 62 ක පාඩුවක් වින්දා. නමුත් මේ ආණ්ඩුව ශත 13 ක ලාභයක් විඳිනවා. ගිය ආණ්ඩුව 1.12 ට අරගෙන ශත 50 බැගින් සේරු දෙකක් දුන්නා. එම නිසා වූ ශත 62 ක පාඩුව ආණ්ඩුව දැරුවා. මේ ආණ්ඩුව 1.12 ට අරගෙන එක සේරුවක් 1.25 කට විකුණනවා. අනික් සේරුව නිකම් දෙනවා. එතකොට ශත 13ක් ලාභයි. 62යි 13 යි එකතු කළාම ශත 75 ක් ලාභයි. අපේ කාලයේදී වාගේ නොවෙයි වෙස්සන්තර යුගයය කියන මේ කාලයේ හාල් සේරුවක් නිකම් දීමෙන් තමුන්නාන්සේලාට ශත 75 ක් ලාභයි. ඒකයි මා කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට ලංකාවේ හාල් කීයටද ගන්නෙ ? බුසලක් රුපියල් 14 යි. එතකොට සේරුවක් 1.16 යි. කෙටීමට ශත 4 ක් එකතු කළාම රුපියල් 1.20 යි. ඒ ගත් මිළ. විකුණන මිළ සේරුවක් රුපියල් 1.40 යි. අපි සේරු දෙකක් 2.40 ට අරගෙන එකක් ශත 50 කට දුන්නා. එතකොට 1.90 ක් පාඩු වුණා. මේ ආණ්ඩුව 2.40 ට අරගෙන එකක් 1.40 ට දෙනවා. අනෙක නිකම් දෙනවා. එතැන රුපියලයි වෙනස. මේ සංඛ්‍යා ලේඛන අනුව වෙස්සන්තර යුගය පහළ වුණේ ජනතාවට නොවෙයි. මේ ආණ්ඩුවටයි. අන්න ඒ කාරණයයි මා ඔප්පු කරන්නට උත්සාහ කරන්නෙ.

අපට එල්ල කළ ලොකුම චෝදනාවක් තමයි අප භාණ්ඩාගාරය හිස් කර ගියාය යන්න. අපේ පාලන කාලයේදී වාගේ නොවෙයි මේ ආණ්ඩුව දැන් ජනතාවට විශාල සේවයක් කරනවාය කියා රටේ සෑම තැනකදීම පුරසාරම් දොඩනවා. ඔය දෙකටම මා සංඛ්‍යා ලේඛනවලින් පිළිතුරු දෙන්නම්. අප බලයට පත්වන්නට ප්‍රථමයෙන් මේ රටේ කර්මාන්ත ඉතාම දුර්වල තත්ත්වයකයි තිබුණේ. නමුත් 1966 වන විට අපේ රටේ කර්මාන්ත කොයි තරම් දියුණු වුණාද කියා බලන්න. 1966 වර්ෂයේදී මේ රටෙන් අපනයනය කළ කාර්මික භාණ්ඩවලින් ලත් විදේශ විනිමය ආදායම රුපියල් 13,19,903 යි. අප ඒ කාලයේ ඇති කළ කර්මාන්තවලින් වාසියක් වුනේ නැත කියා ගරු කර්මාන්ත ඇමතිතුමා කියාවියයි මා හිතන්නේ නැහැ. 1967 තත්ත්වය කොහොමද ? රුපියල් 30,93,343.75 යි. භාණ්ඩාගාරය කාලා ගියා නම් මේ විධියට අවුරුදුපතා මුදල් ලැබෙන්නට ක්‍රම යෙදුනේ කොහොමද ? කර්මාන්ත පිළිබඳ විස්තර සම්පූර්ණයෙන් කියන්නට මා අදහස් කරන්නෙ නැහැ. ශ්‍රී ලංකා මහා බැංකුවේ 77 වැනි පිටුවේ රාජ්‍ය කර්මාන්තවල විකුණුම්හි වටිනාකම සඳහන් කර තිබෙනවා. වානේ කර්මාන්ත ශාලාවෙන් පමණක් රුපියල් දස ලක්ෂ 8,800 යි. ලංකා ටයර් සංස්ථාවෙන් දස ලක්ෂ 4,460 යි. ලංකා ලෝහ කර්මාන්ත ශාලාවෙන් දස ලක්ෂ 1,804 යි. ලංකා පෝර කර්මාන්ත ශාලාවෙන් දස ලක්ෂ 58,673 යි. ලංකා ධීවර සංස්ථාවෙන් දස ලක්ෂ 10,746 යි. 1967 වන විට නිෂ්පාදනය ආරම්භ කර නැති තවත් සංස්ථා තවත් කර්මාන්ත ශාලා තියෙනවා. රාජ්‍ය පිටි ඇඹරුම් කර්මාන්ත ශාලාව, රාජ්‍ය පොහොර නිෂ්පාදන කර්මාන්ත ශාලාව, ජාතික කිරි මණ්ඩලයේ උකු කිරි කර්මාන්ත ශාලාව, ලංකා තෙල් පිරි පහදුව ආදියෙන් 1967 වන විට නිෂ්පාදනය ඇති වී නැහැ. මේ ආණ්ඩුවට මුදල් උණන මුදල් උල්පත් වැනි මේවා ඇති කළ අපට මේ ආණ්ඩුව කියන්නෙ මොනවාද ? ඔය වගේ බොරු කියන විට, ගමේ ගෑණුන් නම් කියන්නේ කටේ ගෙඩි දමන්නට ඕනැය කියායි. අප නම් එහෙම කියන්නෙ නැහැ. භාණ්ඩාගාරයට මෙවැනි උල්පත් හදා දී ගියාට පසුත්, මැතිණිය භාණ්ඩාගාරය හිස් කර ගියාය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජයේත්, සභාග රජයේත් මුදල් ඇමතිවරු මේ රටේ මුදල් කාබාසිනියා කර දමා ගියාය කියනවා නම් ඒ කියන්නේ කොයි තරම් චේතිය මුසාවාදයක්ද ?

ගරු කථානායකතුමනි, ඔපමණක් නොවෙයි. පෙට්රල් සංස්ථාවෙන් කොපමණ ලාභ ලැබී තිබෙනවාද කියා අපි බලමු. 1963 දී ලක්ෂ 98 යි. 1964 දී ලක්ෂ 303 යි. 1965 දී ලක්ෂ 197 යි. එහෙම අඩු වුණේ ලක්ෂ 550 ක් වන්දි වශයෙන් දුන් නිසයි. 1966 දී ලක්ෂ 216 යි. 1967 දී ලක්ෂ 220 යි. 1968 ඇස්තමේන්තුව ලක්ෂ 220 යි. එහෙම නම් භාණ්ඩාගාරය කාලා දාලා ගියාය කියා අපට බනින්නෙ ඇයි ? මීට කලින් මේවා නිකම්ම සුදු මහත්වරුන්ගේ සාක්කුවලට ගිය සල්ලි නේද ? එපමණක්ද ? අපි ආදායම් බදු ගෙවා මිළ පහළ දැමී මෙනුත් රටට සේවයක් සැලසුවා. ආදායම් බදුත් ගෙවා මේ තරම් මුදලක් භාණ්ඩාගාරයට ලැබෙන්නට සලස්වා ගිය නිසා තමයි, මුදල් ඇමතිතුමාට නිදා ගන්නට පුළුවන් වී තියෙන්නෙ.

ඊ ළඟට සේවක අර්ථසාධක අරමුදල ගැන බලමු. මා මේ විස්තර ඉදිරිපත් කරන්නේ ශ්‍රී ලංකා මහා බැංකුවේ වාර්තාවෙන්. මා පුදුම වෙනවා, ශ්‍රී ලංකා යන වචන මේ පොතෙන් තවමත් නොකැපීම ගැන. තවමත් ශ්‍රී ලංකා මහා බැංකුව කියායි කියන්නෙ. ගුවන් විදුලි සංස්ථාවෙ කපන්නා වගේ ඒකත් කැපුවා නම් හොඳයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

1961-62 දී ලක්ෂ 576 යි. 1962-63 දී ලක්ෂ 584 යි. 1963-64 දී ලක්ෂ 578 යි. 1964-65 දී ලක්ෂ 623 යි. 1965-66 දී ලක්ෂ 698 යි. 1966-67 දී ලක්ෂ 770 යි. මේ මොනවාද? සේවක අර්ථසාධක අර මුදලින් රජයේ සුරැකුම්පත්වලට ගත්ත මුදල්. මුළු ආදායම නොවෙයි; ගෙවිය යුතු මුළු ගණන නොවෙයි.

ඊළඟට අපි රක්ෂණ සංස්ථාව ගැන සලකා බලමු. 1963-64 වර්ෂයේ ලාභය රුපියල් ලක්ෂ 290; 1964-65 වර්ෂයේ ලක්ෂ 452; 1965-66 ලක්ෂ 462; 1966-67 ලක්ෂ 699. අප ආණ්ඩු කරන කාල යේදී භාණ්ඩාගාරය කාලා දැම්මායයි ගරු අගමැතිතුමා කියන කථාව දැන්වත් කරුණා කර නවත්වනවාද?

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

නවත්වන්නේ නෑ. ඒ කථාව ඇත්ත බව මගේ කථාවේදී මම ඔප්පු කරන්නම්.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

අගමැතිතුමා රහස් ගිවිසුම් ගැනුවත්, ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන දේ ඇත්ත හැටි යට පිළිගන්නේ නැහැ.

අපේ රජය කර්මාන්ත කීයක් ආරම්භ කළාද? ඒ එක් එක් කර්මාන්තය ගැන වත්, ඒවායින් ලැබුණු ලාභ ප්‍රමාණයන් ගැනවත්, විස්තර කියන්නට මා අදහස් කරන්නේ නැහැ. මේ ආණ්ඩුව බලයට පත් වන විට රටේ තිබුණු තත්ත්වය එයයි.

"ෆේපාරින් ඇසට්ස්" හෙවත් විදේශ වත්කම් සම්බන්ධයෙන් මේ රජය කෙළ වරක් නැතිව අපට දොස් කියනවා. 1965 දී තිබුණු විදේශ වත්කම ලක්ෂ 4,076 යි. 1967 අප්‍රේල් මාසය වන විට එය ලක්ෂ 3,617 ට බැස්සා. මොකද ඒකට වුණේ? අප භාණ්ඩාගාරය කාලා ගියායයි කියන අවුරුද්දේ ලක්ෂ 4,076 ක්ව තිබුණු විදේශ වත්කම 1967 අප්‍රේල් මාසය වන විට ලක්ෂ 3,617 දක්වා අඩු වුණේ කොහො මද? 1954 දී විදේශ වත්කම ලක්ෂ 8,765 ක්ව තිබුණු බව අප පිළිගන්නවා. 1955 වන විට එය ලක්ෂ 11,545 දක්වා වැඩි වුණු බවත් අප පිළිගන්නවා. ඉන් පසු එය අඩු වන්නට හේතුව කුමක්ද? මා පෙන්වා දුන් පරිදි, නොයෙක් විධියේ කම්හල් හා සංස්ථා ඇති කිරීමට අවශ්‍ය යන්ත්‍ර සූත්‍රාදිය මෙහි ගෙන්වීමයි. අපේ විදේශ වත්කම් එක් එක් රටවල ධනපති ආයතනවලට ලැබෙන අන්දමට ඒ රට වලින් ණය ලබාගෙන කර්මාන්ත ඇති කිරීමෙන් අපට කිසිම වාසියක් නැහැ. එයින් වාසි ලැබෙන්නේ ඒ ආයතනවල ඒජන්තවරුන්ට පමණයි. එම නිසා, අපේ ආණ්ඩුව විදේශ වත්කම් මුදලින් නැන් පත් වන්නට ඉඩ නොදී මෙහි කර්මාන්ත ඇති කිරීම සඳහා වුවමනා කරන නො යෙක් යන්ත්‍රසූත්‍ර මෙහි ගෙනැවිත් කර් මාන්ත 420 ක් මේ රටේ ඇති කොට කර් මාන්ත විප්ලවයක් කළා. එහෙත්, 1965 දී ලක්ෂ 4,076 ක්ව තිබුණු විදේශ වත්කම 1967 අප්‍රේල් මාසය වන විට ලක්ෂ 3,617 දක්වා අඩු වුණේ කෙසේදැයි මා අහන් නට කැමතියි. ඒ කාලය තුළ ඇති කරන ලද කර්මාන්ත මොනවාද?

මේ රාජාසන කථාව පටන් ගන්න විටම කියන්නේ, කරුමෙට ලෝක වෙළඳ පො ළේ මිළ ගණන් බැස්ස බවයි.

> "ලංකාවෙන් පිටරට යවන ප්‍රධාන ද්‍රව්‍යවල ලෝක වෙළඳපොළේ මිළ ගණන් බෙහෙවින් පහළ ගිය නිසා—විශේෂයෙන්ම 1966 සහ 1967 වර්ෂවලදී එකී මිළ ගණන් පහළ ගිය නිසා—මෙම තත්ත්වය තවත් උග්‍ර විය."——

යනුවෙන් රාජාසන කථාවෙහි සඳහන් වෙනවා. අවුරුදු තුනක් තිස්සේම මේ ආණ්ඩුව කියන්නේ ඒ කථාවයි. මම ඒ පිළිබඳවත් වාර්තාවක් ඉදිරිපත් කරන් නම්. 1964 වර්ෂය සම්පූර්ණයෙන්ම අප බලයෙහි සිටි නිසා ඒ අවුරුද්දේ සිටම බලමු. 1964 දී අපනයන ආදායම ලක්ෂ 1,876, ආනයන වියදම ලක්ෂ 1,975. වෙ ළඳ ශේෂය ලක්ෂ 99 ක් පාඩුයි. 1965 අපනයන ආදායම ලක්ෂ 1,949, ආනයන වියදම ලක්ෂ 1,474. ලාභය ලක්ෂ 475.

අප යන විට කා දමා ගියා යයි කියන භාණ්ඩාගාරයේ එදා තත්ත්වය ඔන්න ඔහොමයි. හැබැයි, මොන කරුමයක් නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඇයි කියන්නට බැරි බැස්මක් 1966 සිට පටන් ගත්තා. 1965 තිබුණු අපනයන ආදායම 1,949 යි. එය 1966 දී 1,700 ට බැස්සා. 1967 වන විට 1,690 ට බැස්සා. හැබැයි, අනෙක් පැත්ත ඉහළ ගියා. අප ඉන්න කාලයේ ආනයන වියදම 1,774 යි. එහෙත් 1966 වන විට එය 2,028 දක්වා වැඩි වුණා. මීට හේතුව මේ ආණ්ඩුව ජය පානය බීම සඳහා විශාල මුදලක් වියදම් කිරීමයි. විදේශීය හා දේශීය ධනපතියන් ද, එහෙයියන්ද අල්ලස් දී නම්මා ගත් සමාජවාදී විප්ලව කළ අයද සමග මේ ජය ග්‍රහණයෙන් උදම් වී උත්සව පවත්වා ජය පානය බීම නිසා 1966 අවුරුද්දේ ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 2,2028 ක් වුණා. ඒ අවුරුද්දේ පාඩුව ලක්ෂ 328 යි. 1967 වන විට වෙළඳ පාඩුව ලක්ෂ 48 යි.

හොඳයි, 1968 දී තත්ත්වය මොකක්ද ? 1968 ජනවාරි මාසයේ අපනයනය 133 යි, ආනයනය 103 යි. වෙළඳ වාසිය 30 යි. පෙබරවාරි මාසයේදී අපනයනය 170 යි, ආනයනය 263 යි. අවාසිය 91 යි. මාර්තු මාසයේදී අපනයනය 168 යි, ආනයනය 231 යි. පාඩුව 63 යි. අප්‍රේල් මාසයේදී අපනයනය 61 යි, ආනයනය 147 යි. වෙළඳ අවාසිය 86 යි. මේ වියදම් මොනවා සඳහාද ? වාහන අටදාස් ගණනක් මේ රටට ගෙන්වා තිබෙන බවක් තමන් දන්නේ නැතැයි ගරු අගමැතිතුමා කියා ඇති බව දවස් හතරකට පහකට පෙර " ඩේලි නිව්ස් " පත්‍රයේ සඳහන් වුණා. ඒවා ගෙන්වා ඇත්තේ කෙසේදැයි ගරු අගමැතිතුමා ප්‍රශ්න කරනවා.

ඇත්තෙන්ම මේ අන්දමට වෙළඳ අනුපාතය පහළට වැටෙන්නට හේතු වී තිබෙන්නේ විශේෂයෙන්ම අගමැතිතුමාගේ තිබෙන විදේශ ප්‍රතිපත්තියයි. චීනුන්ට බණිනවා, කොමියුනිස්ට්කාරයන්ට බණිනවා ; සමාජවාදයට බණිනවා, මාක්ස්වාදයට බණිනවා. මේ බැණුම් නිසා අද සිදු වී තිබෙන්නේ මොකක්ද ? තමන්ට හොඳ චක්ගෝලයකු ලැබී තිබෙන නිසා තමන්ගේ බඩු වුවමනා මිළකට විකුණා ගන්නට පුළුවනැයි අද ධනපති අධිරාජ්‍යවාදී රටවල් කල්පනා කරනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
මම කවදාද චීනුන්ට බැන්නේ ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
නොබැන්නේ කවදාදැයි මට මතක නැ. කෙසේ වුණත් මැතිවරණ කාලයේදී නම් බැන්නා [බාධාකිරීමක්]. ආණ්ඩුව පිහිටෙව්වාට පසුව නම් කෙළින්ම බැණලා නැහැ. එහෙත් " ඩේලි නිව්ස් " පත්‍රයේ මාර්ගයෙන් නම් කෙළවරක් නැති ප්‍රචාර ගෙන ගොස් තිබෙනවා. මේ නිසා ලංකාව කොතරම් අපකීර්තියකට පත් වී තිබේදැයි කිවහොත්, මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) විරුද්ධ පාර්ශ්වයේ සිටියත් අවශ්‍ය කට යුත්තේදී මේ ආණ්ඩුවට සහයෝගය දෙමින් ක්‍රියා කළ නිසා—රෙකමදාරුවක් දුන් නිසා—චීනෙන් හාල් ටික ලබා ගන්නට පුළුවන් වුණා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ආ !

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මේ ආණ්ඩුව සමාජවාදී රටවලට විරුද්ධ රටවල් සමග කිට්ටු සම්බන්ධකම් පවත්වාගෙන යනවා. පසුගියදා තායිවානයට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් කී දෙනකු ගියාදැයි ගරු අගමැතිතුමා දන්නවා ඇති. ඒ වාගේම මේ ආණ්ඩුව දකුණු කොරියාව සමග මිත්‍රකම් පවත්වනවා. අප පාලන බලයේ සිටි කාලයේ කිසි කලෙක දකුණු කොරියාවේ කොඩියක් දකින්නට ලැබුණේ නැහැ. එහෙත් මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසු මෝටර් රථවල දකුණු කොරියාවේ කොඩිය ගසාගෙන යනවා මා දැක්කා. මේ අතර උතුරු කොරියාවත් සමග නොයෙකුත් වෙළඳ ගණුදෙනු තිබෙනවා. එහෙත් මූණටම උතුරු කොරියාවේ ප්‍රතිවිරුද්ධ වාදියා වූ අධිරාජ්‍යවාදී අතකොළුවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

තැනක් දීගෙන යනවා. ඒ වාගේම මේ ආණ්ඩුව ඊශ්‍රායෙල් රටට කොතරම් කිට්ටුවෙන් ඉන්නවාද ? විශේෂයෙන්ම අපේ කම්කරු ඇමතිතුමා ඊශ්‍රායලයට කොතරම් කිට්ටු වෙලාද ? හැබැයි, ළඟදී, සමාව ඉල්ලන්නට මිසරයට ගියාලු. ඒ සම්බන්ධයෙන් මොනවා වුණාදැයි මා දන්නේ නැහැ. ගරු අගමැතිතුමාගේ විදේශ ප්‍රතිපත්තිය මධ්‍යස්ථ යයි කොතරම් කිවත්, ක්‍රියාවට නැඟීමේදී අධි රාජ්‍යවාදීන්ගේ පැත්ත ගන්නවා පමණක් නොව සමාජවාදය සඳහාත් ජාතික විමුක්තිය සඳහාත් සටන් කරන රටවලට විරුද්ධ වන රටවල පැත්ත ගෙන ඔවුන් සමඟ කිට්ටු සම්බන්ධකම් පවත්වාගෙන යනවා. මේ වෙළඳ ක්‍රමය නිසා සිද්ධ වී තිබෙන්නේ කුමක්ද ? පෞද්ගලික ආයතනවල සිටින දේශපාලන නායකයන්ගේ මඩිවලට කොමිස් පිරී තර වීමයි. ඒ නිසයි 1966 සිට මේ තත්ත්වයට පහළ බැස්සේ.

අප ආදායම් ලබන වෙළඳ භාණ්ඩවලින් තේ රබර් සහ පොල් ප්‍රධානයි. ඒවායේ නිපදවීමද පහළ බැස තිබෙනවා. රටට ගොස් අපට කියන්න පුළුවන් මේ ද්‍රව්‍යවලට නියම මිලක් අපට ගන්න බැරි නිසා අපේ ආර්ථික තත්ත්වය බැස තිබෙනවාය කියා. එහෙත් අපි රටට ගිහින් කියන්නෙ කොහොමද තේ නිෂ්පාදනය පහත බැස තිබෙනවාය කියා ? අගමැතිතුමා දන්නවා ඇති 1964 දී අපි තේ රාත්තල් දශලක්ෂ 482 ක් පිටරට යවා තිබෙන බව. 1965 දී දශලක්ෂ 503 ක් යවා තිබෙනවා. 1966 දී දශලක්ෂ 490 කට එය බැස්සා. 1967 දී දශලක්ෂ 487 යි. ඇයි මෙහෙම වෙන්නෙ ? මෙහෙම වෙන්නෙ විශෙෂයෙන් අප ඇති කරගෙන තිබෙන වෙළඳ හුවමාරු ගිවිසුම් අඩපණ කර තිබෙන නිසයි. ට්‍රැක්ටර් ගෙන්වාගන්න පුළුවන්කම තිබෙනවා. තමුන්නාන්සේලාට වුවමනා නම් මේ වෙළඳ හුවමාරු ක්‍රමය උඩ නොයෙකුත් සමාජවාදී රටවලින් කාර් ගෙන්වාගන්න පුළුවන්. එහෙත් කරන්නේ නැහැ. ඒ නිසයි මෙවැනි භාණ්ඩවල අපනයන ප්‍රමාණය මේ විධියට පහත බැස තිබෙන්නේ. හැබැයි, මේ ක්‍රමයෙන් කොමිස් ඒජන්තවරුන්ට වාසියි. වෙළඳ හුවමාරු ක්‍රමයට බඩු ගෙන්වන විට කොමිස් නැහැ. වෙළඳ හුවමාරු ක්‍රමයට පිටින් ධනපති රටවලින් බඩු වෙන්වන විට කොමිස් තිබෙනවා. විදේශ ආධාරවලින් හෝ ණය ආධාරවලින් හෝ වෙළඳාම් වශයෙන් හෝ බඩු හුවමාරු ක්‍රමයට පිටින්, ධනපති රටවලින් බඩු ගෙන්වන විට කොමිස් වාසියක් කොමිස් ඒජන්තවරුන්ට ලැබෙනවා. ඒ නිසයි අද මේ තත්ත්වයට වැටී තිබෙන්නේ.

පොල් අපනයනයත් පහත බැස තිබෙනවා. 1964 දී දශලක්ෂ 3,000 යි. 1965 දී දශලක්ෂ 2,681 යි. 1966 දී දශලක්ෂ 2,468 යි. 1967 දී දශලක්ෂ 2,421 යි. හැබැයි රබර් පමණක් නැග තිබෙනවා. ඒකත් සිදු වී තිබෙන්නේ අර පරණ වෙළඳ ගිවිසුම්වලට පින් සිද්ද වෙන්න ඒවා අඩපණ කරන්න බැරි නිසයි.

මා කනගාටු වෙනවා රාජ්‍ය ඇමතිතුමා දැන් මෙහි නොසිටීම ගැන. මුලදීම රාජ්‍ය ඇමතිතුමා කල්පනා කළා සංචාරක කටයුතුවලින්ම තමයි අපේ ආර්ථික තත්ත්වය ආරක්ෂා කරගන්න පුළුවන් වන්නේ කියා. මුල සිටම කෑ කෝ ගහන්න පටන්ගත්තා, අපේ ආර්ථික තත්ත්වය රැක ගැනීමට නම් අපේ සංචාරක කටයුතු දියුණු කරන්න ඕනෑය කියා. ඒ වාගේම එදා පටන් කියන්න පටන්ගත්තා තේ අපනයනයටත් වඩා වැඩි ලාබයක් අපේ සංචාරක කටයුතුවලින් ලබා ගන්නට මා කෙටුම්පත් කර තිබෙනවාය කියා. එහෙත් මොකක්ද සිද්ධ වුණේ ? ඒ අභිමතාර්ථය සාර්ථක වුණේ නැහැ. ඊට පසුව කිව්වා, වෙළඳ ශේෂයෙන් වන අඩු පාඩු මේ සංචාරක කටයුතුවලින් පිරිමසා ගන්න පුළුවන්ය කියා. ඒ අනුව ආදායම් බදු සහන දීමට, නොයෙකුත් විදේශ ආධාර ලබා දීමට කල්පනා කළා. එහෙත් මොකක්ද සිද්ධ වුණේ ? 1952 දී—මෙතුමන්ලාගේ ආණ්ඩුව තිබුණ කාලයේම—ඔය කිසිම සෝෂාවක් නැති කාලේ මේ රටට පැමිණි සංචාරකයින්ගෙන් ලැබුණ ආදායම් ප්‍රමාණය ලක්ෂ 110 යි. 1954 දී ලක්ෂ 100 යි. රාජ්‍ය ඇමතිතුමා ඔය තරම් සෝෂාවක් කළාට පසු 1967 දී ලැබුණ ආදායම ලක්ෂ 75 යි. ඒ කියන්නේ මුළු ආදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යම; සුද්ධ ආදායම නොවෙයි. මෙපමණ ඝෝෂා කරලත් 1952-54 කාලේ තිබුණ තත්ත්වයවත් නැහැ.

ඒ වාගේම මෙහි සංඛ්‍යා ලේඛන තිබෙනවා, මෙන්න මෙපමණ සංඛ්‍යාවක් පිටරටවලින් පැමිණ තිබෙනවාය කියා. මාල දිවයිනෙන් පැමිණි පිරිස් මීට කලින් කවදාවත් ගණන් ගන්න සිරිතක් තිබුණේ නැහැ. එහෙත් මේ වර මාල දිවයිනෙන් මෙන්න මෙපමණ දෙනෙක් ආවාය කියා සඳහන් කර තිබෙනවා. ඔය විධියට යන විට අනාගතයේදී මේ රටට ඇතුළු වන කල්ලතෝනිනුත් ගණන් ගෙන ඒ සංඛ්‍යාවත් ඇතුළත් කරාවි. සංචාරක මණ්ඩලයටත්, හෝටල් සංස්ථාවටත් ආණ්ඩුව යොදා තිබෙනව ලක්ෂ 180 ක්. ආණ්ඩුවෙන් රුපියල් ලක්ෂ 150 කුත්, ලංකා බැංකුවෙන් රුපියල් ලක්ෂ 30 කුත් යොදා තිබෙනවා. කොටස්කරුවන් 8,000 ක් තවත් රුපියල් ලක්ෂ 30 ක් යොදා තිබෙනව. ඇයි මේ? රොයිස් ද මෙල් මහත්මයාට රුපියල් 4,000 ක මාසික වැටුපක් ගෙවන්ටයි. ඔහු කරල තිබෙන සේවය මොකක්ද? ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පිහිටුවාගත් ආණ්ඩුවක් කුමන්ත්‍රණ බලයෙන්, තුවක්කු බලයෙන් විනාශ කරන්ට යාමයි. කොහොමද, ප්‍රජාතන්ත්‍රයේ ආරක්ෂකයාගෙ හැටි? මොකක්ද ඔහුට තිබෙන සුදුසුකම? ඔහුට තිබෙන එකම සුදුසුකම ප්‍රජාතන්ත්‍ර විරෝධි අන්දමට කුමන්ත්‍රණය කර රජයක් පෙරළන්ට තැත් කිරීම විතරයි. කොමිෂන් සභාවක් පත් කළොත් සුදුසුකම් හොඳ හැටි පෙනෙයි. තමන්ගේ මිත්‍ර නෝනලාට පෞද්ගලිකව ලියුම් යවල ගෙන්වාගෙන වැඩ දීල තිබෙනව. ඒව අපට එළි කරන්ට විධියක් නැහැ. මේ පිළිබඳව ඝෝෂාවක් කළොත් ලියුම් ඉරාදමයි. දැන් ගිහින් ලිපි ගොනු අරන් බැලුවොත් පෙනෙනවා ඇති, කොයිතරම් ප්‍රේම හසුන් සමහර සේවිකාවන් සහ රොයිස් ද මෙල් අතරේ ඇති වී ඒ රක්ෂා ලබාගෙන තිබෙනවාද කියා. අපි මේ දේශපාලන ද්වේෂයකින් කෑ ගහනවා නොවෙයි. අපෙත් තිබෙනව, හෘදය සාක්ෂිය කියා එකක්. මනුෂ්‍ය අයිතිවාසිකම් කියන දේවල් අපටත් තිබෙනව. එහෙත් මේ විධියේ කෙනෙකුට රුපියල් 4,000 ක වැටුපක් දෙන්ට ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන කෙනෙකුගේ හෘදය සාක්ෂිය කොහොම නිතු කර ගන්න පුළුවන්ද?

මධ්‍යම බැංකුවේ වාර්තාව අනුව හෝටල් සංස්ථාවේ හා සංචාරක මණ්ඩලයේ ලාභ අලාභ කොහොමද? 1966 දී ශුද්ධ පාඩුව රුපියල් ලක්ෂ 189 යි. 1967 දී ශුද්ධ පාඩුව රුපියල් ලක්ෂ 190 යි.

මම මේ උත්තර සපයන්නෙ එක ප්‍රශ්නයකට පමණයි. "පසුගිය ආණ්ඩුව භාණ්ඩාගාරය කාල ගියා; මේ ආණ්ඩුව ආර්ථික අතින් රටට විශාල සේවයක් කර තිබෙනවා" කියන කාරණය ගැනයි මා කථා කරන්නෙ. විදේශ ණය තත්ත්වය කොහොමද? 1965 දී විදේශ ණය වශයෙන් තිබුණෙ රුපියල් ලක්ෂ 4,446 යි. 1967 වන විට විදේශ ණය ප්‍රමාණය රුපියල් ලක්ෂ 9,372 දක්වා නැග්ග. මේ මුදල්වලට මොකද වුණේ?

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
සංවර්ධන කටයුතුවල යෙදෙව්ව.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මොනවද ඒ සංවර්ධන වැඩ? දේශීය ණය තත්ත්වය කොහොමද? අපි ඉන්න කාලයේ රුපියල් ලක්ෂ 33,253 යි. 1968 රුපියල් ලක්ෂ 44,367 යි. එතකොට දේශීය හා විදේශීය ණයවල එකතුව 1965 දී රුපියල් ලක්ෂ 37,699 යි. 1968 දී අද රුපියල් ලක්ෂ 53,739 යි. මේ ණය මුදල් ලබාගෙන කර්මාන්ත කීයක් පිහිටෙව්වාද? මොන ආර්ථික සංවර්ධන කටයුතු වලටද යොදා තිබෙන්නෙ? ඒවායේ ප්‍රතිඵල මොනවාද? මුල සිටම තිබුණු තත්ත්වය ඕකයි. මොනවද මේ විදේශ ණය කියා මම ටිකක් විග්‍රහ කරන්ට කැමතියි. 1966 දී භාණ්ඩ ආධාර ණය කියා ක්‍රමයක් පටන් ගත්ත. ඒ පිළිබඳව මධ්‍යම බැංකුවේ වාර්තාවේ 131 වෙනි පිටුවේ මේ විධියට සඳහන් වෙනව:

"භාණ්ඩ ණය වශයෙන් සපයනු ලබන විදේශාධාර ප්‍රථම වරට ලැබුණේ 1965/66 වර්ෂයේදීය. එය, යෝජනා ක්‍රම ණය වලින් වෙනස් වන්නේ, පෞද්ගලික අංශයට සපයනු ලබන ආධාර වලින් ප්‍රධාන වශයෙන් සැකසෙන හෙයිනි. 1965/66 මුදල් වර්ෂයේ දී වූ විදේශීය වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 35.2ක් විය. එම වර්ෂයේ විදේශාධාර, ප්‍රධාන වශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

යෙන්ම එක්සත් රාජධානියෙන් පැමිණි (රුපියල් දශ ලක්ෂ 18.9) පොහොර, වාහන හා අමතර කොටස් සහ මූලික ලෝහවලින් ද, ජපානයෙන් (රුපියල් දශ ලක්ෂ 10.3) පොහොර, රෙදිපිළි, මෝටර් රථ, ටයර් සහ ටියුබ්වලින් සහ ඉන්දියාවෙන් (රුපියල් දශ ලක්ෂ 2.6) වියලි මිරිස් හා රෙදිපිළිවලින් ද සැකසුනි."

මේ ආණ්ඩුව අලුතින් පටන් ගත් දෙයක් තිබෙනවා. ඒ මොකක්ද? භාණ්ඩ ආධාර ක්‍රමයයි ඒ. මීට පෙර කවදාවත් භාණ්ඩ ආධාර ක්‍රමයක් තිබුණේ නැහැ. මේ ආණ්ඩුව ආවාට පස්සේ තමයි එය පටන් ගත්තේ. ඇයි මේ ආණ්ඩුව එවැන්නක් පටන් ගත්තේ? පෞද්ගලික අයට කොමිස් හම්බ කර ගන්නටයි එය පටන් ගත්තේ. ඉස්සර තිබුණ යෝජනා ක්‍රම ණය කියා දෙයක්. එය අප ඉන්න කාලයේදීත් තිබුණා. 1955 සිට එය තිබුණා. ජාත්‍යන්තර සංවර්ධන මණ්ඩලයෙන් ණය ගත්තා. ඒ වාගේම යෝජනා ක්‍රම සම්බන්ධයෙන් ණය ගත්තා. මේ ආණ්ඩුව ආවාට පස්සේ පටන් ගත්තා භාණ්ඩ ආධාර. කොහොමද?

1965 දී රන් පවුම් ණය තිබුණේ ලක්ෂ 652 යි. එය 542ට බැහැලා තිබෙනවා. එහෙත් අනෙක් ඒවා වැඩිවෙලා තිබෙනවා. 1965 වන විට සම්පූර්ණ විදේශ ණය තිබුණේ ලක්ෂ 4,466 යි. 1968 වන විට එය 9,372ක් වුණා. එයින් රන් පවුම් ලක්ෂ 550 යි. 1966දී, සංවර්ධන බැංකුවෙන් ලක්ෂ 1,392 යි. යෝජනා ක්‍රම අනුව ලක්ෂ 3,005 යි. භාණ්ඩ ආධාර ලක්ෂ 814යි. 1967 දී රන් පවුම් 555යි. යෝජනා ක්‍රම ණය 1,701 යි. අනෙක් යෝජනා ක්‍රම ණය 3,477 යි. ඉස්සරවෙලා සංවර්ධන බැංකුවෙන් භාණ්ඩ ආධාර ලක්ෂ 3,029 යි. 1968 දී රන් පවුම් ලක්ෂ 542 යි. යෝජනා ක්‍රම ණය සංවර්ධන බැංකුවෙන්, 1,685 යි. අනෙක් යෝජනා ක්‍රමවලින් ලක්ෂ 3,392 යි. භාණ්ඩ ආධාර 3,753 යි. මේ භාණ්ඩ ආධාර ණයවල විස්තරයක් තිබුණොත් එය කාටත් ප්‍රයෝජනවත් වෙතැයි මා හිතනවා. භාණ්ඩ ආධාර යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි එතකොට තේරුම් ගන්නට පුළුවනි. ඒ කොටසත් මේ වාර්තාවේ තිබෙනවා :

"භාණ්ඩ ණය වශයෙන් සපයනු ලබන විදේශාධාර ප්‍රථම වරට ලැබුණේ 1965/66 වර්ෂයේදීය. එය, යෝජනා ක්‍රම ණයවලින් වෙනස් වන්නේ, පෞද්ගලික අංශයට සපයනු ලබන ආධාරවලින් ප්‍රධාන වශයෙන් සැකසෙන හෙයිනි. 1965/66 මුදල් වර්ෂයේදී වූ විදේශීය වගකීම් ප්‍රමාණය (රුපියල් දශ ලක්ෂ 35.2ක් විය. එම වර්ෂයේ විදේශාධාර ප්‍රධාන වශයෙන්ම එක්සත් රාජධානියෙන් පැමිණි (රුපියල් දශලක්ෂ 18.9) පොහොර, වාහන හා අමතර කොටස් සහ මූලික ලෝහවලින් ද, ජපානයෙන් (රුපියල් දශලක්ෂ 10.3) පොහොර, රෙදිපිළි, මෝටර් රථ, ටයර් සහ ටියුබ්වලින් සහ ඉන්දියාවෙන් (රුපියල් දශලක්ෂ 2.6) වියලි මිරිස් හා රෙදිපිළිවලින් ද සැකසුනි."

පාරිභෝගික භාණ්ඩ ගෙන්වා තිබෙන ආකාරය මෙයින් පෙනෙනවා. අපේ කාලයේදී කවදාවත් විදේශාධාර වශයෙන් සහ ණය වශයෙන් පාරිභෝගික භාණ්ඩ ගත්තේ නැහැ. මොකක්ද දැන් කර තිබෙන්නේ? අවුරුදු විසිපහකට මේ ජාතිය ණයට යට කර තිබෙනවා. වෙන හුඟක් දේවල් ගෙන්වන්නේ කොහොමද? ආණ්ඩුව විසින් ගෙන්වා ගනු ලැබීමේ තේරුමක් තිබෙන්නට පුළුවනි. එහෙත් පෞද්ගලික වෙළෙන්දන්ට කොමිස් ලැබෙන ආකාරයට ගෙන්වීම ගැන කියන්නේ මොකක්ද? ආණ්ඩුව ගෙන්වනවා නම් කමක් නැහැ. තත්ත්වය මෙහෙම තිබුණාට මොකද, විශාල වාර්තාවක් ලංකාව ඇති කර තිබෙනවායයි විදේශ රටවල පළ වෙලා තියෙනවා.

ගරු කථානායකතුමනි, හුඟක් කාලයකට පසු මේ ආණ්ඩුවට අවබෝධයක් ඇති වී තිබෙන බව මේ රාජාසන කථාවේ සඳහන් වෙනවා. මීට කලින් ඒ අවබෝධය ඇති වුණේ නැහැ. ඒ අබබෝධය මොකක් ද?

"රටේ ඇති මූලික ගැටලු කිහිපයක් සඳහා ඇති නියමාකාර විසඳුම ආර්ථික සංවර්ධනය බැව් මාගේ ආණ්ඩුවට අවබෝධ වී ඇති හෙයින්..."

ආණ්ඩුවට අවබෝධ වී තිබෙන්නේ දැනුයි. මේ ගැටලු විසඳීමට ආර්ථික සංවර්ධනය වුවමනා කරන බව අවබෝධ කර ගෙන තිබෙන්නේ දැනුයි. මීට කලින් වන වනා වෙඩි තිබ්බා. සමහර විට අපට වාසි වන විධියටත් නැත්නම් නැඇයින්ට වාසි වන විධියටත් වෙඩි තිබ්බා. එසේ කළේ අවබෝධයක් ඇති කර ගෙන නොවෙයි. දැන් තමයි අවබෝධ කර ගෙන තිබෙන්නෙ. කර්මාන්ත ඇමතිතුමා හිටියත් අවබෝධ කර ගන්න බොහොම ප්‍රමාද වුණා. අපට නම් මේ අවබෝධය ඇතිවුණේ හුඟක් කලින්. ඒ නිසා තමයි කර්මාන්ත යුගයක් ඇති කළ ආණ්ඩුවක් හැටියට 1960 න් පසුව තිබුණ ආණ්ඩුව ප්‍රසිද්ධ වුණේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට දැන් අනික් හොරනෑව මොකක්ද? වී නිෂ්පාදනයයි. මේ වී නිෂ්පාදනය ගැනත් මා වචන දෙක තුනක් කියන්නට ඕනෑ. හැම තැනම දැන් කියන්නේ මොකක්ද? කන්දොස්කිරියාවේ ඉන්න විධියක් නැහැ. දැන් අපට බත් ඕනෑ නැහැ. ගුවන් විදුලිය ළඟට ගිය විට වගා ව්‍යාපාරය ගැන ඇසීමෙන්ම බඩ කට පිරෙනවා. ඇමතිතුමෙකුගේ කථාවක් අහන්න ගියත් අහන්න ලැබෙන්නේ වගා ව්‍යාපාරය ගැනමයි. ඒ නිසා දැන් බත් කන්න වුවමනාවක් නැහැ. ඔන්න ඔය විධියේ කතා තමයි අහන්න ලැබෙන්නෙ. මේ අතින් නම් විශාල කීර්තියක් මේ ආණ්ඩුවට අයත් වෙලා තිබෙනවා. මේ ගැන මේ තරම් ආණ්ඩුව කෑගසන්නේ ඇයි? රාජාසන කථාවේත් එය සඳහන් වෙනවා.

"1967 දී නිපදවන ලද සහල් ප්‍රමාණය, මීට පෙර සෑම වතාවකම නිපදවූ ප්‍රමාණයට වඩා වැඩිය."

මේක තමයි මේ විශාල විධියට කියන්නෙ. තව දුරටත් මේ විධියට කියනවා :

"1968 දී සහ ඉදිරි වර්ෂවලදීද එසේම පවත්වා ගෙන යා හැකි යයි සිතීමට හේතු තිබේ."

අපි බලමු මේ කෑගැසීමට ඇත්ත වශයෙන්ම සාධක තිබෙනවාද කියා. 1967 මහ බැංකු වාර්තාවේ 15 වැනි පිටේ මෙන්න මේ විධියට සඳහන් වෙනවා :

"......පොහොර වැඩියෙන් යෙදීමටත්, වඩා හොඳ බිත්තර වී යෙදීමටත්, අක්කර ප්‍රමාණය පුළුල් කිරීමටත්, පොදුවේ වඩා හොඳ වගා ක්‍රම අනුගමනය කිරීමටත් ගොවියන් උනන්දු කරවීම සඳහා රජය ආහාර නිෂ්පාදන ව්‍යාපාරයක් ගෙන යන ලදී. මෙම දිරිගන්වන සුළු විධිවිධානවල හා සතුටුදායක කාල ගුණ තත්ත්වයේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් 1967 දී වී අස්වැන්න අන් කවර කාලයකටත් වඩා ඉහළ නැග බුසල් දශ ලක්ෂ 55.1 කට හෙවත් දිගුවොන් 7,69,000 කට පැමිණියේ ය."

මහ බැංකු වාර්තාවේ ඔය විධියට සඳහන් වෙනවා. අපි මේ වී නිෂ්පාදනය සම්බන්ධයෙන් තවත් ටිකක් දුරට සොයා බලමු. 1959 දී වී නිෂ්පාදනය බුසල් ලක්ෂ 365 යි. 1960 දී බුසල් ලක්ෂ 431 යි. 1961 දී බුසල් ලක්ෂ 432 යි. 1962 දී බුසල් ලක්ෂ 481 යි. 1963 දී බුසල් ලක්ෂ 492 යි. 1964 දී බුසල් ලක්ෂ 505 යි. 1965 දී බුසල් ලක්ෂ 363 යි. 1966 දී බුසල් ලක්ෂ 457 යි. 1967 දී බුසල් ලක්ෂ 551 යි.

මේ ආණ්ඩුව මේ වී නිෂ්පාදන පිළිබඳ සංඛ්‍යා ලේඛන සංසන්දනය කරන්නේ කොහොමද? ගත වූ 10 අවුරුද්දම තුළ ඉතාම පහළම අස්වැන්න ලැබුණ අවුරුද්දත් සමගයි. ඔවුන්ගේ වගා වාර්තාවේ පළමුවැනි දිරවීව ලනුව තමයි ඒ. 1965 දී තිබුණේ වී බුසල් ලක්ෂ 363 යි. අන්න ඒ අවුරුද්ද සමගයි ඔවුන්ගේ නිෂ්පාදනය සසඳන්නෙ, 1965 අවුරුද්දේ මෙපමණයි, 1967 අවුරුද්දේ මෙපමණයි කියා. 1964 දී වී බුසල් ලක්ෂ 505 ක් ලැබී තිබෙනවා. එයත් සමග 1967 ලැබුණ වී ප්‍රමාණය සංසන්දනය කර බැලුවොත් වැඩි වී තිබෙන්නේ වී බුසල් 46 ක් පමණයි. මේ වැඩි වුණ වී බුසල් 46 ට තමයි මේ තරම් කෑගහන්නෙ. මේ නැගීම ගැන අපි අසතුටු නැහැ. අපි ඒ ගැන බොහොම සතුටු වෙනවා. නමුත් මේ ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා පෝර කොයි තරම් යෙදෙව්වාද? ඒ වෙනුවෙන් ට්‍රැක්ටර් කොයි තරම් ගෙන්වුවාද? කෘමිනාශක බෙහෙත් ද්‍රව්‍ය කොයිතරම් ගෙන්වූවාද? වගා ජීප් කොයි තරමක් ගෙන්වූවාද? විශේෂ බදු ක්‍රමය අනුව කොයි තරම් ප්‍රමාණයක් අලුතෙන් වගා කළාද? මෙන්න මේ විධියට කටයුතු කිරීමෙන් තමයි මේ ප්‍රමාණය වැඩි කර ගෙන තිබෙන්නේ. විශාල වැඩක් කළ විධියට කෑ ගසන්නේ මේ අන්දමට කටයුතු කරලයි. කොහොමද සසඳා බලා තිබෙන්නෙ? 1965-66 අවුරුද්දෙ මහට අස්වැන්න අක්කරයකට බුසල් 35.9 යි. ඉතාම අඩු අස්වැන්න ලැබුණු අවුරුදුවලින් එකක් තමයි 1965-66 අවුරුද්ද. අස්වැන්න අඩුම අවුරුද්ද ගෙන සසඳා බලා කියනවා, අස්වැන්න මෙපමණ ප්‍රමාණයක් වැඩි වී තිබෙනවාය කියා. 1966-67 මහට අක්කරයකට බුසල් 40.85 යි. 1965-66 යලට අක්කරයකට බුසල් 35.4 යි; 1966-67 යලට බුසල් 42.3 යි. මේ අන්දමට සසඳා බලා තමයි සින්දු හදන්නෙත්, කවි හදන්නෙත්, කථා කරන්නෙත්. මේ ආකාරයට එක්තරා විධියක ප්‍රෝඩාවක්, ප්‍රචාරයක්, මේ ආණ්ඩුව දැන් ගෙන යනවා.

අනික් කාරණය, අප අසා බැලුවා ගණන් ගන්නෙ කොහොමද කියා. උඩුනුවර ගොවියෙකුගෙන් නැත්නම් හේවාහැට ගොවියෙකුගෙන් ඇසුවොත් ගණන් ගන්නෙ කොහොමද කියා, මෙන්න මේ අන්දමට විස්තරයක් කරනවා. ඒ ප්‍රදේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා]
ශයේ ඉතාමත්ම සරුසාර කුඹුර මොකක් දැයි සොයා බලනවා. ඊළඟට ඒ කුඹුරේ පෝර දමා හොඳට වැඩුණු ලියද්ද මොකක් දැයි බලනවා. එම ලියද්දෙන් හොඳට වැඩුණු පඳුරකින් වී කරලක් කඩා ගන්නවා. එම කරලෙ ඇට ගණන් කර බලනවා. එසේ ගණන් කර බලා, එය වැඩි කර බලා මුළු දිස්ත්‍රික්කයේම වගාව මෙපමණයයි ගණන් හදනවා. ඔන්න ඔය ආකාරයටයි ගණන් දෙන්නෙ. ගොවියන් කියන හැටියට ඉතාමත් සශ්‍රික ඉඩම්වල 1965 මට්ට මෙන් ගෙන බැලුවාම සියයට දහයක පමණ අස්වැන්න වැඩි වීමක් තිබෙනවා. නමුත් ඒ ගොවියන්ම කියනවා, වියදම අතින් සියයට පණහක් පමණ වැඩිවී තිබෙනවාය කියා. ඔන්න ගොවියාට ලැබී තිබෙන ලාභය. යම් කිසි විධියකින් දමන පෝර නැවැත්වුවොත් අර වැඩි වී තිබෙන අස්වැන්න ප්‍රමාණය පහත වැටෙනවා. අපට දැන ගන්න ලැබී ඇති හැටියට සහල් පිට රටින් ගෙන්වීම සඳහා වුවමනා කරන මුදල රුපියල් කෝටි 30 යි. නමුත් දෙපාර්තමේන්තුවෙ ගණන් හිලව්වල හැටියට අස්වැන්න වැඩි කර ගැනීමට වුවමනා කරන පෝර ප්‍රමාණය ගෙන්වන්න රුපියල් කෝටි 40 ක් වැය වෙනවා. එම නිසා ජාතික ආර්ථික ක්‍රමයට මෙයින් සැලසෙන වාසියක් නැති බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති.

ගරු කථානායකතුමනි, අප ඉතාමත්ම කනගාටු වෙනවා මේ ආණ්ඩුවෙන් නිකුත් කර ඇති වාර්තාවෙ අඩංගු කාරණා ගැන. මේ ආණ්ඩුව, ජාතික ව්‍යාපාර පෞද්ගලික ව්‍යාපාර කිරීමට විශාල ප්‍රයත්නයක් දරනවා. තමුන්නාන්සෙ දන්නවා ඇති විශේෂයෙන්ම ලක්සල ගැන. අද අපට දැනගන්න ලැබෙනවා එහි කරගෙන ආ නොයෙක් නොයෙක් වෙළඳාම් ප්‍රසිද්ධියේ මෙන්ම අප්‍රසිද්ධියෙන් නොයෙකුත් අයට දෙන බව. මා විශේෂයෙන්ම කර්මාන්ත ඇමතිතුමාගෙ වර්තමාන ක්‍රියා කලාපය ගැන කනගාටු වන්නෙ, එතුමා තුළ එදා තිබුණු ප්‍රතිපත්ති ඒ මට්ටමෙන් වත් දිගටම තබාගෙන යාවිය, අඩු වශයෙන් ජනසතු සේවාවන් ඒ අන්දමට පවත්වාගෙන යාවිය කියන විශ්වාසයක් මා තුළ තිබුණ නිසයි. නමුත් එතුමා අද කියා තිබෙන්නෙ මොනවද? මා දන්නෙ නැහැ පත්‍රවල පළ වන දේවල් ඇත්තද බොරුද කියන්න. කොහොම වුණත් මෙන්න මේ අන්දමට පළ වෙනවා :

"There are six industrial undertakings in which the Government has invested share capital amounting to over one million rupees. These private companies with the Government's share value are as follows."

මෙන්න මේවා පෞද්ගලික ව්‍යාපාරිකයින්ට භාර දෙන්න යනවාලු :

Asbestos Cement Industries Ltd., Ceylon Glass Company Ltd., Elephant Lite Corporation Ltd., Taos Ltd., Ceylon Cycle Industries Ltd., Ceylon Bulbs and Electricals Ltd.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ දන්නවා ආණ්ඩුවෙනුත් මුදලක් යොදා පෞද්ගලික ව්‍යාපාරකයින්ගෙනුත් මුදල් යොදා අපි මේවා මේ විධියට ආරම්භ කළේ ජාතියට වුවමනා කරන භාණ්ඩ සම්පාදනය සඳහා බව. එහෙත් දැන් සිදු වී තිබෙන්නේ කුමක්ද? ඒ වගකීම සම්පූර්ණයෙන්ම පැහැරහැර ඥාති සංග්‍රහ හා දේශපාලන මිත්‍ර සංග්‍රහ ආදිය කිරීමට මේ දූෂණ නීතිගත කර අප ඉදිරියට පැමිණෙනවා. ජනසතු සේවාවන් ආපසු දීම බොහොම දෙනෙකුට වාසි බව අපි දන්නවා. එසේ වාසි සැලසෙන්නේ කාටද කියන එකයි, අපි සොයා බලන්නට ඕනෑ. මහජනතාව අපට කියා හිටියේ, පුළුවන් තරම් ජාතික සේවාවන් ජාතික මට්ටමෙන් පවත්වාගෙන යෑමට මිස, පෞද්ගලික ව්‍යාපාර බවට පත් කර නොයෙක් අයට පෞද්ගලික ලාභ ලබා ගන්නට සැලැස්වීමට නොවෙයි. ගරු කර්මාන්ත ඇමතිතුමාත් මේ නගින දෙහින කාලයේ තමන්ගේ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම පාවා දී ජනසතු ව්‍යාපාර මේ විධියට කාබාසිනියා කර දැමීම ගැන අපි කණගාටු වෙනවා. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවට තවත් බලයේ ඉන්නට ඉඩ දුන්නොත් ජාතියක් වශයෙන්, රටක් වශයෙන්, ජනතාවක් වශයෙන් අපට සැන සෙන්නට බැහැ. ජාතිද්‍රෝහී, භාෂාද්‍රෝහී, ජනතාද්‍රෝහී, ආගම්ද්‍රෝහී මේ ආණ්ඩුව මහජන මතයට විරුද්ධව මේ තරම් කටයුතු කරන නිසාත්, මැතිවරණ පොරොන්දු ඉටු කරනවා වෙනුවට හැම ප්‍රශ්නයකින්ම මහජනයාට පහර ගැසීමේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ප්‍රතිපත්තියක් අනුගමනය කරන නිසාත් අප මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන වලට පක්ෂව ඡන්දය දී මේ ආණ්ඩුව හැකිතරම් ඉක්මනින් පල්ලම් බස්ස වන්නය කියා මුළු මන්ත්‍රී මණ්ඩලයෙන්ම අපි ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Are you moving all three Amendments ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔව් කථානායකතුමනි, අපේ නමින් ඇති සංශෝධන තුනම මා ඉදිරිපත් කර නවා.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.**
(මිනුවන්ගොඩ)
*(திரு. எம். பி. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

විසින් ස්ථිර කරන ලදී.
*அனுவதித்தார்.*
*seconded.*

**සංශොධන මෙසේ ය :**
*திருத்தங்கள் வருமாறு:*
The Amendments are as follows :

I

" සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

' එතෙකුදුවුවත්, උතුමාණන් වහන්සේගේ රජයේ ප්‍රතිපත්ති කෙරෙහි මහජන විරෝධය බුර බුරා නැග එන අතර රජයේ පරමාර්ථයන් කෙරෙහි පවත්නා මහජන අවිශ්වාසය පාර්ලිමේන්තු අතුරු මැතිවරණ ප්‍රතිඵල සහ පළාත් පාලන ඡන්ද ප්‍රතිඵල ඇතුළුව විවිධාකාරයට මනාව පැහැදිලි වන හෙයින් ද, රජය බලයට පැමිණි අවස්ථාවේ පටන් දිගටම ගෙන යන ප්‍රජාතන්ත්‍ර විරෝධී ප්‍රතිගාමී ප්‍රතිපත්ති කිසියම් අන්දමකට හෝ වෙනස් කිරීමට උනන්දුවක් නැති බව පෙනෙන හෙයින් ද, එහි ප්‍රතිඵලයක් වශයෙන් ලක්වැසි බහු ජනතාවගේ අයිතිවාසිකම් විදේශීය අධිරාජ්‍ය වාදීන්ටත්, ඔවුන්ගේ දේශීය ඒජන්ත වරුන්ටත්, ආධාරකරුවන්ටත් පාවාදී ඇති හෙයින් ද ;

නැගී එන ආර්ථික අර්බුද සහ ජනතා ප්‍රශ්න ක්‍රියාශීලීවූද අංග සම්පූර්ණවූද ප්‍රතිපත්ති සහිත ක්‍රියා මාර්ගයකින් විසඳීමට රජය මුළුමනින්ම අසමත් නිසා එම අදක්ෂතාවය විවිධ පරිපාලන විස්තර රූසකින් වසන් කිරීමට දරන ප්‍රයත්නය උතුමාණන් වහන්සේගේ කථාවෙන් පැහැදිලිව පෙනෙන හෙයින් ද ;

රජය දුන් පොරොන්දු ඉටු නොකිරීමෙන් හා අවස්ථාවාදී උපක්‍රම සහ ප්‍රතිගාමී ප්‍රතිපත්ති හේතු කොට ගෙන රජය වෙත එල්ල වෙන විපාක මග හරින්ට උත්සාහ කරමින් දිගින් දිගටම හැකිතාක් කල් බලයේ එල්ලී සිටීමට උත්සාහ දැරීම උතුමාණන් වහන්සේගේ ආණ්ඩුවේ ප්‍රධාන අරමුණ බව පෙනෙන අතර, වැදගත් ජාතික ප්‍රශ්න බොහොමයක්ම මග හරිමින් ප්‍රකාශවන දේශපාලන දෙබිඩි කථා වලින් උතුමාණන් වහන්සේගේ කථාව පිරී ඇති බැවින් ද ;

උතුමාණන් වහන්සේගේ කථාවෙහි විශේෂ වශයෙන් :—

(අ) එදිනෙදා ජීවිතයට උවමනා කරන අවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ නැගීම හා හිඟකම නිසා ජනතාවට මුහුණ පාන්නට සිදුවී තිබෙන කරදර දුක් ගැහැට මග හැරවීම පිණිස කිසිම පියවරක් යෝජනා කරනු නොබා බඩුවල අධික මිල හා බඩු හිඟය පිළිබඳව වචන මාත්‍රයක්වත් සඳහන් නොකර ඇති හෙයින් ද ;

(ආ) වැඩිවී යන රක්ෂා හිඟය නිසා අනාථව බලාපොරොත්තු සුන්ව හා කලකිරී මෙන් යුතුව සිටින ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වූවන් හා විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ලබා ගත් දස දහස් දෙනා ඇතුළු ලක්ෂ සංඛ්‍යාත තරුණ තරුණියන්ගේ රැකිරක්ෂා ප්‍රශ්නය ගැන සඳහනක්වත් නැති හෙයින් ද ;

(ඉ) දේශපාලන හා පෞද්ගලික විරුද්ධවාදීන්ගෙන් විවිධ ලෙස පළිගැනීම පිණිස පාවිච්චි කරමින් මේ රජයේ කාලසීමාව තුළ අවුරුදු දෙකහමාරකටත් වැඩි කාලයක් මුළුල්ලේ අයුක්ති සහගතව පවත්වාගෙන යන හදිසි තත්ත්වය අහෝසි කිරීම ගැන අදහසක්වත් සඳහන් නො කිරීමෙන් ද ;

(ඊ) ලංකාවේ සමගිතාවය හා අඛණ්ඩභාවයට තර්ජනයක්වූ, රාජ්‍ය භාෂාවේ තත්ත්වය අඩපණ කරන්නාවූ, උතුරු නැගෙනහිර පළාත් හැර ලංකාවේ අනික් පළාත්වල වාසය කරන, දෙමළ නොවන, රටවැසියන්ට එම පළාත් දෙක තුළ රජය විසින් දෙනු ලබන ඉඩම් ගැනීමට ඇති අයිතිවාසිකම් තහනම් කරන්නාවූ කොන්දේසි ඇතුළත් කරමින්, එක්සත් ජාතික පක්ෂයේ හා ලංකා ද්‍රවිඩ රාජ්‍ය පක්ෂයේ නායකයන් විසින් 1965 මාර්තුවේදී රහසේ ඇතිකරගත් අධම ගිවිසුම ක්‍රියාත්මක කිරීම පිණිස ගන්නා ලද අලුත්ම පියවර වූ දිස්ත්‍රික් සභා පිහිටුවීමට විරුද්ධව පැන නැගුණ මහජන උද්ඝෝෂණ නොතකා එම රහස් ගිවිසුම ක්‍රියාත්මක කිරීමට දරන ප්‍රයත්නය අත්හැරීමට ආණ්ඩුව අදහස් නොකරන බව පෙනී යන හෙයින් ද ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(උ) නොයෙකුත් පරිපාලන සංශෝධන මඟින් නිදහස් අධ්‍යාපනය සීමා කිරීම හා අඩපණ කිරීම නිසා මේ ආණ්ඩුව විශ්ව විද්‍යාලයේ සිට පහළට අධ්‍යාපන ක්‍රමය අවුල් කිරීම අත් හැර දමන අදහසක් එළි නොකරන හෙයින් ද;

(ඌ) විදේශ කටයුතුවලදී මධ්‍යස්ථ ප්‍රතිපත්තියෙන් බැහැරව නිතර නිතර ගුප්ත ක්‍රියා කිරීම නැවැත්වීමට රජය අදහස් කරන බවක් නොදක්වන හෙයින් ද;

(එ) රාජ්‍ය භාෂාව උසාවි භාෂාව කිරීමට පටන් ගැනීමටවත් යෝජනාවක් අඩංගු නොවන හෙයින් ද;

(ඒ) තමන් අයිති කුලය නිසා සමාජයේ සමානාත්මතාවය නොලැබෙන අයගේ අයිතිවාසිකම් තහවුරු කිරීමටත්, විශේෂයෙන්ම සුළු ද්‍රවිඩ ජනතා නැමැති අයට ඔවුන්ගේ වර්තමාන උද්ඝෝෂණය පරිදි දැනට විඳින්ට වී ඇති විෂමතා හා අවමාන අස් කිරීම පිණිසත්, 1957 සමාජ දුබලතා වැළැක්වීමේ පනත ප්‍රාණවත් කිරීමට අවශ්‍ය සංශෝධන යෝජනා කර නොමැති හෙයින් ද;

(ඔ) රජයේ වෘත්තීය සංගම් විරෝධි ප්‍රතිපත්තියට අනුකූලවන පරිදි, ලංකාවේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ වැඩි කොටස හෙළා දකින, ජයවර්ධන කාරක සභාවේ පක්ෂග්‍රාහී හා ප්‍රතිගාමී වාර්තාව අනුව වෘත්තීය සංගම් ආඥාපනත සංශෝධනය කිරීමට අදහස් කරන හෙයින් ද;

(ඕ) මෙරට නිපදවන ආහාර ද්‍රව්‍ය පාරිභෝගිකයාට සැපයීමේ දෘශ්‍යමාන වැඩිවීමක් හෝ එහි මිල අඩුවීමක් හෝ පෙනෙන්නට නැති බැවින් ඊනියා ආහාර වගාවේ සාර්ථකත්වය සත්‍ය වශයෙන්ම පුහු ඝෝෂාවක් බව පිළිගෙන නැති හෙයින් ද;

(ඖ) ඔබගේ රජයේ කැපී පෙනෙන නිර්ලජ්ජා සහගත අංගයන් වන දේශපාලන හිතවත්කම උඩ වැඩි සැළකීම, දූෂණවලට ඉඩ තැබීම, දේශපාලනමය සහ පෞද්ගලික විරුද්ධවාදීන් පෙලීමට රාජ්‍ය තන්ත්‍රය යෙදීම යනාදී දේ අත් හැර දැමීමට උත්සාහ දරන බව පෙනෙන්නට නැති හෙයින් ද;

උතුමාණන් වහන්සේගේ ආණ්ඩුව කෙරෙහි අපගේ විශ්වාසයක් නොමැත'."

"நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும் :

'எனினும்,

பாராளுமன்ற உப தேர்தல் முடிவுகள், உள்ளூராட்சிச் சபைத் தேர்தல் முடிவுகள் உட்படப் பல்வேறு வழிகளில் அரசாங்கத்தின் நோக்கங்கள் மீது அவநம்பிக்கையையும், அதன் கொள்கைகள் மீது என்றும் வளர்ந்துவரும் எதிர்ப்பையும், பொதுமக்கள் வெளிக்காட்டியிருந்துங்கூட மேன்மைதங்கிய தங்கள் அரசாங்கம் பதவியேற்ற காலம் தொடக்கம் பின்பற்றி வந்துள்ளதும், அந்நிய ஏகாதிபத்தியத்துக்கும், அதன் உள்ளூர் ஆதரவாளர்களுக்கும், முகவர்களுக்கும் இலங்கை மக்களின் சீவாதார உரிமைகளைத் தியாகம் செய்யும் விளைவை யேற்படுத்திவிட்டதுமான ஜனநாயக விரோதமானதும் பிற்போக்கானதுமான அடிப்படைக் கொள்கைகளை மாற்றும் நோக்கம் எதற்குமான அறிகுறிகளைத் தெரிவிக்காதபடியாலும்,

வளர்ந்துவரும் பொருளாதாரப் பிரச்சினைகளையும் மக்களின் ஏனைய பிரச்சினைகளையும் கையாள்வதற்குத் திட்டவட்டமான, விசாலமான கொள்கையை வகுத்துக் கொள்வதில் அடிப்படையிலான இயலாமையை நானுவித நிர்வாக விபரங்களின் பின்னல் அரசாங்கம் மறைக்க முயலுவதாக சிம்மாசனப் பிரசங்கம் எடுத்துக்காட்டுவதாலும்,

மேலும், அவசர தேசிய முக்கியத்துவமான பிரச்சினைகளில் தங்கள் பிரசங்கம் இரட்டைப் பேச்சுக்களும் அரசியல் நேர்ப்பதிலின்மைகளும் மலிந்ததாயிருப்பதுடன், பிற்போக்குக் கொள்கைகள், சந்தர்ப்பவாதச் சூழ்ச்சிகள், நிறைவேற்றுத வாக்குறுதிகள் ஆகியவற்றின் தவிர்க்க முடியா விளைவுகளிலிருந்து, ஒரு புறத்தில், தப்பிவிட முயல்வதுடன் மறு புறத்தில் இயன்றளவு காலம் பதவியில் ஒட்டிப் பிடித்துக் கொண்டிப்பதற்கான வழிவகைகளைக் காண்பதே தங்கள் அரசாங்கத்தின் பிரதான தூண்டுதலாக இருக்கின்றதாக தங்கள் பிரசங்கம் எடுத்துக்காட்டுவதாலும்,

மேலும் குறிப்பாகத் தங்கள் பிரசங்கம்—

(அ) மக்களுக்குக் கஷ்டங்களையும் தொந்தரவுகளையும் ஏற்படுத்திவிட்ட நிலைமைக்குப் பரிகாரம் தேடும் நடவடிக்கைகளுக்கான உத்தேசங்களைத் தெரிவிப்பது ஒருபுறமிருக்க, நாளாந்த வாழ்க்கையின் அத்தியாவசியப் பொருட்களில் இவ்வாறன உயர்ந்த விலைவாசிகள், பற்றாக் குறைகள் என்ற நிலைமை பற்றிக் குறிப்பிடத்தானுமில்லை என்பதாலும்,

(ஆ) பல்லாயிரக் கணக்கான சிரேட்ட தராதரப் பத்திரம் பெற்றவர்கள் பல்கலைக்கழகப் பட்டதாரிகள் உட்பட பல இலட்ச மக்களுக்கு மனச்சோர்வும், மனச் சலிப்பும் ஏற்படுத்திச் சோம்பல் நிறைந்த வாழ்க்கைக்கு அவர்களைத் தீர்த்திருக்கும் வளர்ந்துவரும் வேலையின்மைப் பிரச்சினை பற்றித் தொடு கூற்று ஒன்றுதானும் கூறத் தவறிவிட்டபடியாலும்,

(இ) பல்வேறு வழிகளில் தனிப்பட்ட எதிரிகள் மீதும் அரசியல் எதிரிகள் மீதும் பழிவாங்குவதற்குப் பயன்படுத்தப்பட்டு வருவதும் இந்த அரசாங்கத்தின் பதவிக்காலத்தின் இரண்டரை வருடங்களுக்கும் மேலாக நீடித்திருப்பதும் நியாயமற்றதுமான அவசர கால நிலையை அகற்றுவதற்கான நோக்க மெதையும் அரசாங்கம் கொண்டிருக்கவில்லை என்பதை எடுத்துக் காட்டுவதாலும்,

(ஈ) ஐக்கிய தேசியக் கட்சியினதும் இலங்கைத் தமிழ் அரசுக் கட்சியினதும் தலைவர்களிடையே 1965, மார்ச் மாதம் இரகசியமாக ஏற்பட்ட ஒப்பந்தத்தின் நிபந்தனை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

களை நிறைவேற்றுவதைக் கைவிடும் உத்தேசம் அரசாங்கத்திற்கு இல்லையென்றும் இத்தகைய நடவடிக்கைகளில் மிகப்பிந்தியதான மாவட்ட சபை நிறுவும் முயற்சிக்குப் பொது மக்கள் பரந்த அளவில் எதிர்ப்பு காட்டியுங்கூட மேலும் இத்தகைய துரோகமான ஒப்பந்தத்தை நிறைவேற்றுவது இலங்கையின் ஒற்றுமையையும் தேசிய ஒருமைப்பாட்டையும் பயமுறுத்தியும் அரசகரும மொழியின் நிலையைப் பலவீனப்படுத்தியும், வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு வெளியேயுள்ள தமிழரல்லாத குடி மக்கள் இம்மாகாணங்களில் அரசாங்கம் வழங்கும் காணிகள் பெறும் உரிமையை மறுத்து வருவதாயிருந்துங்கூட இம் முயற்சியைக் கைவிடும் நோக்கமில்லையென்றுங் காட்டுவதாலும்,

(உ) பல்வேறு நிருவாகப் புனரமைப்புக்கள் மூலம் பல்கலைக்கழகம் தொட்டு கீழ்ப்படிகள் வரையிலான கல்வித் திட்டத்தில் குழப்ப நிலையை ஏற்படுத்துவதன் மூலம் இலவச கல்வித் திட்டத்தைக் கட்டுப்படுத்திப் பலவீனப்படுத்தும் முயற்சியைக் கைவிடும் நோக்கத்தை வெளிப்படுத்தாததாலும்,

(ஊ) வெளிநாட்டு விவகாரங்களில் கட்சி சேராக் கொள்கையிலிருந்து அடிக்கடி கள்ளத்தனமாக விலகி நடப்பதை நிறுத்திக் கொள்ளும் நோக்கம் அரசாங்கத்துக்கு உண்டென்பதைக் காட்டாததாலும்,

(எ) நீதி மன்றங்களில் அரசகரும மொழியைப் புகுத்துவதை ஆரம்பிப்பதற்கான எந்தவொரு உத்தேசத்தைத்தானும் கொண்டிருக்காதபடியாலும்,

(ஏ) தமக்கு இழைக்கப்படும் பல்வேறு விதமான பாரபட்சமும் அவமரியாதையும் நிறுத்தப்பட வேண்டுமென்று கோரிக்கொண்டிருக்கும் சிறுபான்மைத் தமிழரைக் குறிப்பாக உள்ளடக்கி, சாதியின் அடிப்படையில் சமூக சமத்துவம் மறுக்கப்பட்டிருப்பவர்களைப் பாதுகாப்பதற்கு வலு மிகுந்ததும் கூடிய பயன்பயப்பதுமான வகையில் 1957 ஆம் ஆண்டின் சமூகக் குறைபாட்டுச் தடுப்புச் சட்டத்தை திருத்தும் உத்தேசம் கொண்டிருக்காதபடியாலும்,

(ஐ) இலங்கையின் தொழிற் சங்க இயக்கத்தின் மிகப்பரவலானபகுதியினரால் கண்டிக்கப்பட்ட ஜயவர்தனக் குழுவின் பிற்போக்கானதும், பக்கச் சார்ந்ததுமான அறிக்கையின் அடிப்படையில், அரசாங்கம் தனது பொதுவான தொழிற் சங்க எதிர்ப்புக் கொள்கைக்கு இணங்க, தொழிற் சங்கக் கட்டளைச் சட்டத்துக்குத் திருத்தங்கள் கொண்டுவர உத்தேசித்திருப்பதாகக் காட்டுவதாலும்,

(ஒ) உணவு உற்பத்தி இயக்கத்தில் அரசாங்கம் பெரிதுபடுத்திக்காட்டும் தனது வெற்றிகளை நுகர்வாளர்க்குக் கிடைக்கும் உள்ளூரில் விளைந்த உணவுப் பொருட்களின் தொகை அதிகரிப்பின் மூலமோ அவற்றின் விலைகளில் குறிப்பிடக்கூடிய இறக்கத்தின் மூலமோ காணக்கூடியதாயில்லை என்ற உண்மையை கணக்கிற் கொள்ளத் தவறுவதாலும்,

(ஓ) இந்த அரசாங்கத்தின் குறிப்பான, அபகீர்த்தி நிறைந்த அம்சமாயிருக்கும் அரசியற் பாரபட்சம், ஊழலைச் சகித்தல், அரசியல் எதிரிகளையும் தனிப்பட்ட எதிரிகளையும் உத்தியோக தோரணையில் துன்புறுத்தல் ஆகியவற்றைக் கைவிடும் நோக்கமுண்டென்று காட்டாதிருப்பதாலும்,

மேன்மைதங்கிய தங்கள் அரசாங்கத்தில் எமக்கு நம்பிக்கையில்லை.' "

" As an Amendment to the Address at the end add the words :

'but inasmuch as Your Excellency's Government, despite the ever-growing public opposition to its policies and distrust of its intentions that have been manifested in various ways including in the results of parliamentary by-elections and local government elections, has given no indication that it intends to change in any way the basic anti-democratic and reactionary policy that it has followed since it assumed office and which has resulted in the sacrifice of the vital interests of the people of Ceylon to those of foreign imperialism and its local agents and supporters,

and as the Address shows that the Government seeks to hide behind a collection of miscellaneous administrative details its fundamental inability to evolve a positive and comprehensive policy to deal wih the growing economic crisis and other problems of the people,

and moreover as the Address is full of political evasions and double-talk on most matters of urgent national importance and indicates that the main consideration that animates Your Excellency's Government is to find ways and means to cling on to office for as long as possible, while seeking to escape from the inevitable consequences of its own broken promises, opportunistic manoeuvres and reactionary policies, and in particular as the Address—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(a) does not even mention the high prices and scarcities of essential goods in everyday use, let alone propose any steps to remedy this situation which has brought about great difficulties and hardships for the people ;

(b) fails to make even a passing reference to the ever-growing problem of unemployment, which condemns several lakhs of persons including tens of thousands of S. S. C. qualified and university-educated young people, to a life of idleness, frustration and despair ;

(c) reveals no intention on the part of the Government to end the unjustified State of Emergency which has existed for over two and a half years of this Government's term of office and has also been used by the Government to inflict vengeance on political and personal opponents in various ways ;

(d) shows that the Government does not intend to abandon its efforts to implement the terms of the agreement drawn up in secret in March 1965 between the leaders of the United National Party and the Ilankai Thamil Arasu Kadchi, despite the overwhelming public opposition to the latest of these efforts, namely the attempt to establish District Councils and also despite the fact that the implementation of this nefarious agreement threatens the unity and state integrity of Ceylon, undermines the position of the Official Language, and denies non-Tamil citizens resident outside the Northern and Eastern Provinces any right to obtain land distributed by the State in these provinces ;

(e) does not disclose any intention by the Government to abandon its efforts to restrict and undermine the fre education scheme by various administrative re-arrangements, thereby creating a chaotic situation in the educational system from the universities downwards ;

(f) does not show that the Government intends to put a stop to its repeated furtive attempts to depart in practice from the policy of non-alignment in external affairs ;

(g) does not contain any proposal even to begin the introduction of the official language into the courts ;



(h) does not propose to amend the Prevention of Social Disabilities Act of 1957 in order to make it a stronger and more effective instrument to protect those who are denied social equality on the grounds of the caste to which they belong, and, in particular, the so-called Minority Tamils who are at the moment demanding that the various discriminations and indignities to which they are subject should be ended ;

(i) indicates that the Government in line with its general anti-trade union policy intends to base its proposals to effect amendments to the Trade Unions Ordinance on the biassed and reactionary report of the Jayawardene Committee which has been condemned by the widest sections of the trade union movement in Ceylon ;

(j) fails to take account of the fact that the tall claims made by the Government about the success of its so-called food drive are not reflected in any reduction in the prices or any noticeable increase in the supply to the consumer of locally-grown foodstuffs ; and

(k) does not show that the Government intends to give up the political favouritism, tolerance of corruption, and official persecution of political and personal opponents which are a marked and scandalous feature of its regime ;

we have no confidence in Your Excellency's Government'".

II

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එසේනමුදුවුවත්, දිස්ත්‍රික් සභා පිහිටුවීම පිණිස ව්‍යවස්ථා ඉදිරිපත් නොකරන ලෙස අපි උතුමාණන් වහන්සේගේ රජයෙන් ඉල්ලා සිටිමු' "

"நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும்:

'எனினும், மாவட்ட சபைகள் அமைப்பதற்குச் சட்டம் கொண்டு வரவேண்டாமென மேன்மை தங்கிய தங்கள் அரசாங் கத்தைக் கேட்டுக்கொள்கிறோம்.'"

"As an Amendments to the Address at the end add the words :

'but we request Your Excellency's Government not to present legislation to establish District Councils'".

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

III

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එනොකුදුවුවත්, දැනට ප්‍රංශයෙහි වියට්නාම් යුද්ධය සමථය කිරීමට පවත්වන සාම සාකච්ඡාවල සතුටුදායක ප්‍රතිඵල ලැබිය හැක්කේ පළමුකොට අමෙරිකානු එක්සත් ජනපදය වියට්නාම් ප්‍රජාතන්ත්‍රවාදී ජන රජයට බෝම්බ දැමීම ආදී ආක්‍රමණික ක්‍රියා වහාම නවතා දකුණු වියට්නාමයෙන් තම සන්නාහ සන්නද්ධ හමුදා අස්කර ගැනීමට සතුට ප්‍රකාශ කළහොත් පමණක් බව අපගේ හැඟීමයි.' "

"நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும் :

'ஆனால், ஐக்கிய அமெரிக்க இராச்சிய அரசாங்கம் வியட்நாம் ஜனநாயகக் குடியரசுக்கு எதிராகக் குண்டு வீசுவதையும், ஏனைய பகைமை நடவடிக்கைகள் மேற்கொள்வதையும் முதலில் நிறுத்தி, தென் வியட்நாமிலிருந்து ஆயுதப் படைகளை வாபஸ் பெறுவதற்கு அது ஆயத்தமாக இருக்கிறதென்பதையும் தெரிவிக்குமேயானால் வியட்நாம் யுத்தம் பற்றி இப்பொழுது பிரான்சில் நடைபெறுகின்ற பேச்சுவார்த்தைகளில் மிக திருப்திகரமான முன்னேற்றம் காணமுடியுமென்பது எமது அபிப்பிராயமாகும்.' "

"As an Amendment to the Address at the end add the words :

'but it is our view that the talks now taking place in France in regard to the war in Vietnam can make most satisfactory progress if in the first instance the Government of the United States of America stops its bombing and other hostile acts against the Democratic Republic of Vietnam and also expresses its readiness to withdraw its armed forces from South Vietnam' ".

**"එම වචන එතැනට එකතු කළ යුතුය," යන ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**

"அச்சொற்கள் அங்கு சேர்க்கப்படுமாக" என விஞ எடுத்தியம்பப் பெற்றது.

*Question proposed, "That those words be there added."*

අ. භා. 3.40

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.** (ගම්පහ)

*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க—கம்பஹ)*

(Mr. S. D. Bandaranayake—Gampaha)

ගරු කථානායකතුමනි, ලංකා කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙන් රාජාසන කථාවට සංශෝධනයක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. විශේෂයෙන්ම

අද මේ රටේ ජනතාව අපට මතක ඇති කාලයක නොතිබුණු ආකාරයට ආර්ථික පරිහානියකට මුහුණ දී සිටිනවා. එවැනි තත්ත්වයකයි අද අපි ජීවත් වන්නේ. මේ ආණ්ඩුවම පසුගිය සතියේ රාජාසන කථාවෙන් ඉදිරිපත් කළා, අවුරුදු 20 කට පසුවත් අධිරාජ්‍යවාදීන්ගේ ගසාකෑම නිසා ලෝක වෙළඳපොළේ තේ, රබර් හා පොල් මිල ක්‍රම ක්‍රමයෙන් බැහැගෙන යනවාය කියා. එමෙන්ම පිටරටින් ගෙන්වනු ලබන අපට අවශ්‍ය පාරිභෝගික භාණ්ඩවල මිලත් ක්‍රම ක්‍රමයෙන් වැඩි වේගෙන යනවා. 1966 දී කෝටි 24 ක හිඟයක් ඇති වුණා. ගිය අවුරුද්දේ කෝටි 28½ ක හිඟයක් ඇති වුණා. එය මේ අවස්ථාවේදී මතක් කළ යුතු කරුණක්. අප නිදහසක් කියා එකක් ලබාගෙන අවුරුදු 20 ක් ගත වුණා. අවුරුදු 20 කට පසුව අද අපට පෙනෙනවා, පනස් ලක්ෂයක් පමණ වූ ගොවි ජනතාව නාමයෙන් ඉඩම් අඟලක්වත් නැති බව. එහෙත් මේ හත් හවුල් ආණ්ඩුව විශේෂයෙන්ම විදේශීය කොම්පැනිවලට නම් අක්කර දාහ, දෙදාහ, තුන්දාහ වශයෙන් දී තිබෙනවා. ඒ වාගේම, මධ්‍යම පන්තියේ ගොවියන් දෙස බැලුවත්, සුළු වශයෙන් ගොවිතැන් කරන දුප්පත් ගොවියන් දෙස බැලුවත් අපට පෙනෙනවා, ඔවුන් සියයට සියයක්ම ණය බරින් මිරිකෙන බව. එසේම, 15 ලක්ෂයක් පමණ වන කම්කරු ජනතාවක් මේ රටේ ඉන්නවා. ඒ ජනතාවත් අද ජීවත් වන්නේ, නොයෙක් අන්දමින් පීඩා විඳිමින් ණය බරින් මිරිකෙමිනුයි. ඊළඟට 92,000 ක් පමණ වන අද ගොවියන් දෙස බලමු. කුඹුරු පනත ඉදිරිපත් කොට අවුරුදු 10 ක් ගත වූවාට පසුවත්, අදත් ඔවුන් අතරමං වී ඉන්නවා. ඔවුන් පිළිබඳව වූ නඩු රාශියක් තවමත් උසාවිවලින් තීරණයක් නොලැබ තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

මේ හැරෙන්නට අපේ වර්තමාන තරුණ පරම්පරාව, දස ලක්ෂයකට වැඩි හරියක් ජ්‍යෙෂ්ඨ සමතුන්ගෙන් සමන්විත වූ, රටේ නැත්නම් ජාතියේ කොඳු ඇටය බඳු වූ තරුණ පරම්පරාව අද අතරමං වී ඉන්නවා. මේ තරුණ පරම්පරාව අද මේ පවතින සමාජ ක්‍රමය යටතේ නිකමුන් බවට පරිවර්තනය වී තිබෙනවා. රක්ෂා නැති උපාධිධරයන් 15,000 ක් පමණ මේ රටේ ඉන්නවා. පසුගිය අවුරුද්දේ 15,000 ක් පමණ වන විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් අතුරින් කොටසක් දෙසැම්බර් මාසයේ 16 වැනි දා නියෝජිත මන්ත්‍රී මණ්ඩල ගොඩනැගිල්ලට පැමිණ ; සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් යන හැම ජාතියකටම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් හය දහසක් තම ලෙයින් අත්සන් කළ පෙත්සමක් ගරු අගමැතිතුමාට ඉදිරිපත් කළා නේද? ඒ ළමයින්ගේ, ශිෂ්‍යයන්ගේ, තරුණයන්ගේ ඉවසීම ඉක්මවන තැනට ඇවිත්, අධිරාජ්‍යවාදීන් විසින් අටවා තිබෙන "පාර්ලිමේන්තුව" නමැති මේ හොර ගුහාව පොඩිපට්ටම් කර—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Please withdraw the words "*hora guhawa.*"

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

කථානායකතුමනි, "හොර ගුහාව" යනුවෙන් ඒ ළමයින් කීවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

ඒ ළමයි ඒ විධියට කීම වෙන දෙයක්. මේ ගරු සභාවේ ඒ වචන පාවිච්චි කරන්න බැ.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

තමුන්නාන්සේ කියනවා නම් මම ඒ වචන ඉල්ලා අස් කර ගන්නම්. ඒ ළමයින් නම් ඒ ආකාරයට කීවා. මේවා පොඩිපට්ටම් කර දමා, විප්ලවීය ආකල්පයක් ඔස්සේ ඉදිරියට යන්නට සිදු වන බව, මේ ස්ථානයට ආ ඒ ළමයින් කීවා.

ඒ හැරෙන්නට, පාඨශාලා ශිෂ්‍යයන් වන අපේ බාල පරම්පරාව 22 ලක්ෂයක් පමණ වනවා. ඒ කුඩා ළමයින්ට කිසිම අනාගතයක් නැහැ. ඒ හැරෙන්නට, අවුරුදුපතා 2,50,000 ක් අළුතින් උපදිනවා.

එම නිසා "නිදහසය" කියන දේ ලැබී අවුරුදු 20කට පමණ පස්සේ, අද දේශපාලන අතින් වැදගත් මං සන්ධියකට පැමිණ සිටින මේ අවස්ථාවේ අපට සිදු වෙනවා, අප මෙතෙක් ගමන් කර ඇති පාර මොකක් දැයි හැරී බලන්න. අප ඉල්ලන්නේවත් නැතිව සුද්දන් අපට සර්වජන ඡන්ද බලය දී අවුරුදු 36ක් පමණ වෙනවා. ජාති භේදය අවුස්සා, කුල භේදය අවුස්සා, ආගම් භේදය අවුස්සා, හොර ඡන්ද පාවිච්චි කර, කසිප්පු පාවිච්චි කර, අවුරුදු 5කට වරක් මන්ත්‍රීවරුන් තෝරා ගෙන එමගින් අළුත් ආණ්ඩුවක් ඇති කිරීමට පුළුවන් වීම "නිදහස" හැටියට කල්පනා කරනවා ද? මේ "නිදහස" කියන එක ලැබී දැන් අවුරුදු 20ක් පමණ වෙනවා. මට අද වගේ මතකයි, මේ "නිදහස" කියන එක අපට ලැබුණු දවසේ දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා කළ ප්‍රකාශය. "මේ රටේ ජනතාවට ආර්ථික නිදහස ලැබෙන තුරු, අපට මේ ලැබුණු නිදහසෙන් කිසිම වැඩක් නැතැයි" එදා එක්සත් ජාතික පක්ෂයේ සිටි දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කීවා. නිදහස ලැබී අවුරුදු තුනක් ගත වුණේ නැහැ. නමුත් මේ නිදහසින් වැඩක් නැති බව වටහා ගත් දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා 1951 ජූලි 14 වන දින එක්සත් ජාතික පක්ෂයෙන් අස්වී 1951 සැප්තැම්බර් 29 වන දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තා.

ඇත්ත වශයෙන්ම බණ්ඩාරනායක අගමැතිතුමා අවංක, ඍජු චේතනාවක් අනුව, එදා වාරියපොළ හාමුදුරුවෝ, පුරන් අප්පු, ගොංගාලේගොඩ බණ්ඩා, කැප්පෙටිපොළ ආදී වීරයින් අධිරාජ්‍යවාදීන්ට විරුද්ධව අරගල කළාක් මෙන් මේ පාර්ලිමේන්තුව තුළින් අරගලයක් කර නිදහසක් ලබා ගන්නට පුළුවන්ය කියා කල්පනා කළා. ඔක්ස්ෆඩ් විශ්ව විද්‍යාලයේ ඉගෙන ගනිමින් පාර්ලිමේන්තු ක්‍රමය, පාර්ලිමේන්තු සම්ප්‍රදාය සුද්දන්ගෙන් ඉගෙන ගත් බණ්ඩාරනායක අගමැතිතුමා අවංකවම මේ පාර්ලිමේන්තුව තුළින් අරගලයක් කර නිදහසක් ලබා ගන්නට පුළුවන්ය කියා එදා කල්පනා කිරීම පුදුමයක් නොවෙයි. සියලුම අධිරාජ්‍ය විරෝධී කොටස් එකතු කර එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තේ ඒ චේතනාව මුල් කරගෙනයි. අවුරුදු 17කට පෙර දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා ගත්තේ මේ රටේ ස්වාධීනත්වය ලබා ගැනීම පිණිසයි; මේ රටේත් ජනතාවගේත් විමුක්තිය ලබා ගැනීම පිණිසයි. කුමක් ද සිදු වුණේ ? 1952 වන විට එතුමාගේ මන්ත්‍රීවරු නව දෙනෙකු පාර්ලිමේන්තුවේ සිටියා. 1956 වන විට එනම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා අවුරුදු පහකට පසු මේ රටේ සියලුම අධිරාජ්‍ය විරෝධී, යූ. එන්. පී. විරෝධී සියලුම කොටස් එකතු කර ආණ්ඩුවක් පිහිටුවන්නට එතුමාට පුළුවන් වුණා. හැබැයි, එදා බණ්ඩාරනායක අගමැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වර්තමාන නායකයින් කියන ආකාරයට තමන්ගේ පක්ෂවල ප්‍රතිපත්ති වෙනස් කර සම්බන්ධ වෙන්නය කියා ලංකා සම සමාජ පක්ෂයටවත් ලංකා කොමියුනිස්ට් පක්ෂයටවත් කිව්වේ නැහැ. භාෂා ප්‍රශ්නය පිළිබඳව එදා ලංකා සමසමාජ පක්ෂයත් ලංකා කොමියුනිස්ට් පක්ෂයත් සම නැන දිය යුතුය යන මතයයි, දැරුවේ. ඒ සියලුම කොටස් එකතු කර බණ්ඩාරනායක අගමැතිතුමා පෙරමුණක් සාදා ගත්තා. ගොවීන් පවා ඒ පෙරමුණට ගත්තා. ඒ ආකාරයටයි පෙරමුණක් සාදා තරඟ වැළැක්වීමේ ගිවිසුම් ඇති කරගෙන එක්සත් ජාතික පක්ෂයේ ආසන ගණන අටට බස්වන්නට එතුමාට පුළුවන් වුණේ. එදා——

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
(දොම්පෙ)
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க— தொம்பே)*
(Mr. F. R. Dias Bandaranaike—Dompe)

Mr. Speaker, there is no Quorum.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබුයෙන්—**

*சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப் பட்டது.*

*பிறகு நிறைவெண், இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Banadarnayake)

ගරු කථානායකතුමනි, 1956 අප්‍රේල් 12 වන දින කම්කරුවන් සහ ගොවීන් මේ සභා ගර්භයටත් ආවා. ඇවිත් අගමැතිතුමාගේ ඔය ආසනයේත් කථානායක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ආසනයේත් වාඩිවී නැවත වරක් එක්සත් ජාතික පක්ෂය නම් හිස ඔසවන්නේ නැත කියා කල්පනා කළා.

1956 මැතිවරණ කාලයේදී බණ්ඩාරනායක අගමැතිතුමාත් අපත් ඔය අතික් උදවියත් කඳුකර ප්‍රදේශවලට ගොස් සුදු අධිරාජ්‍යවාදීන්ගේ තේ වතුවලට ඇඟිල්ල දික් කර කළ ප්‍රකාශයක් මට මතකයි. අවුරුදු 150 කට පෙර මුඩු බිම් පනත යට තේ අක්කරය ශත 25 ට 50 ට අපේ මහ පොළවෙන් මංකොල්ලකාගත් අපේ ඒ ඉඩම් පැය 24 න් ජනසතු කර කඳුකර ප්‍රදේශවල අතරමං වී සිටින ඒ ජනතාව අතර බෙදා දෙනවාය කියා එදා කිව්වා. නමුත් කුමක් ද වුණේ ?

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් එක පැත්ත කින් සිටිනවා. ඇමරිකන් අධිරාජ්‍යවාදීන් අනික් පැත්තෙන් සිටිනවා. ඔවුන් බණ්ඩාරනායක ආණ්ඩුවට විරුද්ධව පත්‍ර මාර්ගයෙන් විශාල ව්‍යාපාරයක් ගෙන යන්නට පටන් ගත්තා. මේ රටේ දේශීය ප්‍රතිගාමී පත්‍රත් ඒ ක්‍රියා මාර්ගයට සම්බන්ධ වී කටයුතු කළා. එක් අවුරුද්දක් තුළ දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාට මේ සභා ගර්භය තුළදී ඔය ආසනයේ සිටගෙන ප්‍රකාශයක් කරන්නට සිද්ධ වුණා. පැය 24 න් ජනසතු කරනවාය කී බණ්ඩාරනායක අගමැතිතුමා තව අවුරුදු දහයක් ගත වන තුරු සුද්දන්ගේ ඒ වතුවලට අත තබන්නේ නැත කියා ඔය ආසනයේ සිටගෙන ප්‍රකාශනයක් කරන්නට සිද්ධ වුණා. මොකක්ද මේකට හේතුව ? ගරු බණ්ඩාරනායක අගමැතිතුමා අවංකව, ඍජු ලෙස ප්‍රකාශ කළා, පැය 24 ක් තුළ මේවා ජනසතු කරනවාය කියා. යටත් විජිත ජාතියක් වශයෙන් අවුරුදු 450 ක් තිස්සේ පෑගී සිටි ජනතාව නගා සිටුවීම සඳහා පියවරක් ගන්නට එතුමා අවංකව අදහස් කළා. එසේ නම්, එක්සත් ජාතික පක්ෂයේ ආසන ගණන 8 ට බස්වා පාර්ලිමේන්තු මැතිවරණයක් මගින් බලයට ආ එතුමාට, තව අවුරුදු 10 කට මේ වතුවලට අත තියන්නේ නැත කියා ප්‍රකාශ කිරීමට සිදු වුණේ ඇයි ? ප්‍රතිගාමී බලවේගය පැනනැගී ආ නිසයි, පාර්ලිමේන්තුව තුළ එතුමාට ඒ ප්‍රකාශය කරන්නට සිදු වුනේ. පාර්ලිමේන්තුව මගින්—පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව එය කරන්නට බැරි බව එතුමාට අවබෝධ වුනා.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்சா சிறிவர்தன)*
**(Mr. de Zoysa Siriwardena)**
ජනසතු කරනවාය කියා නැහැ.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
**(Mr. S. D. Banadaranayake)**
තමුන්නාන්සේ ඒ කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සිටියෙත් නැහැ.

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න ගැන අපට කල්පනා කරන්නට සිදු වී තිබෙන්නේ මේ ආකාරයටයි. ගරු බණ්ඩාරනායක අගමැතිතුමා බලයට පැමිණ අවුරුද්දක් ඇතුළත කැබිනට් මණ්ඩලයේ සිටි ඇමතිවරුන් 13 දෙනා අතර කඹ ඇදීමක් ඇති වුනා. එක කොටසක් එක පැත්තකට ඇද්දා. තවත් කොටසක් තවත් පැත්තකට ඇද්දා. බණ්ඩාරනායක අගමැතිතුමා ඊට මැදි වුනාම, අධිරාජ්‍යවාදීන් සහ දේශීය ප්‍රතිගාමී ධනපති කොටස් එකතු වී සෝමාරාම නමැති ස්වාමීන් වහන්සේ නමක් ඉස්සරහට දමා, රටත්, ජාතියත් අහෝසි කිරීම පිණිස, අධිරාජ්‍යවාදී මධ්‍යම රහස් ප්‍රවෘත්ති සංවිධානය — ඇමෙරිකන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සී. අයි. ඒ. නමැති රහස් ප්‍රවෘත්ති සංවිධානය—ක්‍රියා කර බණ්ඩාරනායක අගමැතිතුමා අමු අමුවේ මරා දැම්මා.

බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව කාලයේදී මොකද වුණේ? මේ රටේ මහ ජනයා, රටට නිදහස ලබා ගැනීම සඳහා, බණ්ඩාරනායක ප්‍රතිපත්ති කෙරෙහි විශ්වාසය තබා, බණ්ඩාරනායක ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය බලයට පත් කළා, 1960 ජූලි මාසයෙදී. මොකද වුණේ? ගරු දෙම්පේ මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) එම ආණ්ඩුවේ පළමු වැනි මුදල් ඇමති වී අවංකව කියා සිටියා, අද මේ රටට විශාල ආර්ථික පරිහාණියකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවාය, මේ ප්‍රශ්න මේ ආකාරයට විසඳන්නට බැරිය කියා. එහෙත් මේ ප්‍රශ්නවලට පැලැස්තර දැමීමක් වශයෙන් හාල් ප්‍රමාණයක් කපන්නට එතුමා යෝජනා කළා. එහෙත් අගේ තුවකට, කැබිනට් මණ්ඩලයේ ඇති වූ කඹ ඇදීමක් අනුව එතුමාට ඉල්ලා අස් වන්නට සිදු වුනා. ඊට පසුව සී. පී. ද සිල්වා ඇමතිතුමා මුදල් ඇමති හැටියට පත් වුණා. මේ ප්‍රශ්නය මට නම් විසඳන්නට බැරිය කියා එතුමාත් ඉල්ලා අස් වුණා. ඊ ළඟට කලුගල්ල ඇමතිතුමා මුදල් ඇමති හැටියට පත් වුණා. එතුමාත් මේ ප්‍රශ්නය මට විසඳන්නට බැරිය කියා ඉල්ලා අස් වුණා. ඊ ළඟට ටී. බී. ඉලංගරත්න ඇමතිතුමා මුදල් ඇමති හැටියට පත් වුණා. උන්නැහෙටත් ඒ ප්‍රශ්නය විසඳන්නට බැරිය කිව්වා. ඊ ළඟට ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති හැටියට පත් වුණා. ඒ අවස්ථාවේදී මේ ප්‍රශ්නවලට යම් කිසි විසඳුමක් ඇති වේය කියා කව්රුත් කල්පනා කළා. මාක්ස්-ලෙනින් වාදීන් හැටියට අපත් කල්පනා කළා මේ ප්‍රශ්න විසඳන්නට එතුමා සුදුසු පියවරක් ගනීවිය කියා. බ්‍රිතාන්‍යයන්ගේ සහ ඇමෙරිකානු කාරයන්ගේ තෙල් කොම්පැණි ජනසතු කිරීම සඳහා වන්දි වශයෙන් කෝටි 4½ ක් දෙන්නට එතුමා යෝජනා කළා. තෙල් කොම්පැණි කාරයන් කෝටි 5½ ක් ඉල්ලුම් කළා. මාක්ස්වාදීන් හැටියට අප ඉගෙනගෙන තිබෙන්නේ සුද්දන් පන්නා දමා, සුද්දන්ගේ දේ බලහත්කාරයෙන් ගැනීමටයි. එහෙත් තෙල් කොම්පැණි ජනසතු කරන අවස්ථාවේදී කෝටි 4½ ක් ගෙවන්නට කැමති වුණා නම්, අක්කරයට ශත 25, 50 බැගින් ගෙවා සුද්දන් අයිති කර ගත්, අපේ මුතුන්මිත්තන්ට අයිතිව කඳුකර ප්‍රදේශයේ තිබුණු සාරවත් ඉඩම් ජනසතු කරන්නට යන විට අක්කරයකට රුපියල් 8,000, 9,000, 10,000 බැගින් ගෙවන්නට සිදු වෙනවා නේද කියා මා අහන්නට කැමතියි. ඒ අනුව සුද්දන්ට අයිතිව කොළඹ තියෙන fපැක්ටරින්, කොළඹ තියෙන බැංකුත් ජනසතු කරන්නට ගියොත් සල්ලි හොයන්නෙ කොහෙන්ද? නව අවුරුදු 100 ක් ගියත් මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව නම්, මේ පාර්ලිමේන්තුව තුළින් නම්, මේ හොර ගුවාව තුළින් නම්—

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

You are also a Member of this House. Please withdraw that word.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

මා එය ඉල්ලා අස් කර ගන්නවා. ගරු කථානායකතුමනි, අපට මේවා කියන්නට සිදු වෙනවා. පර සුද්දන් අටවා තිබෙන සැලැස්මක් මේක. අද මේ ප්‍රශ්නය තියෙන්නේ ඔය ආකාරයටයි. ඒ නිසා මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය නව අවුරුදු සිය


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ගණනක් මේ අන්දමට තිබුණත්, මේ රටේ නිර්ධන පන්තියේ ගොවීන්, කම්කරුවන් බලාපොරොත්තු වූ විමුක්තිය, පාර්ලිමේන්තුව තුළින් නම් ලබා ගන්නට බැරි බවයි, අප මතක් කරන්නේ.

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.**
*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க)*
(Mr. F. R. Dias Bandaranaike)

ගරු කථානායකතුමනි, අපි දැන් තේ බොන්න යමු.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

We agreed to dispense with the tea interval. The hon. Member can go on.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

දෙවැනි බණ්ඩාරනායක ආණ්ඩුවට මොකද වුනේ ? පත්තර පණතක් 13 වතාවක් ඉදිරිපත් කළා. දොම්පේ ගරු මන්ත්‍රීතුමාත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) දෙතුන් වතාවක් පත්තර පණත් ඉදිරිපත් කළා. 13 වැනි වතාවේදී මොකද වුණේ ? අධිරාජ්‍යවාදීනුත් දේශීය ප්‍රතිගාමී ධනපති පන්තියත් එකතු වී ආණ්ඩුව පැත්තේ සිටි මන්ත්‍රීවරුන් කීප දෙනකු කිසියම් මාර්ගයකින්—අල්ලස් මාර්ගයෙන්ද වෙනත් කිසියම් මාර්ගයකින්දැයි මා දන්නේ නැහැ—අනෙක් පැත්තට ගෙන ආණ්ඩුවත් පෙරළා දැම්මා. බණ්ඩාරනායක අගමැතිතුමා අධිරාජ්‍යවාදීන් විසින් අමු අමුවේ මරා දමනු ලැබුවා. දෙවැනි බණ්ඩාරනායක රජය පිටිපස්සෙන් පිහියෙන් ඇන පෙරළා දමනු ලැබුවා.

මේකද පාර්ලිමේන්තු සම්ප්‍රදාය ? මේකද ප්‍රජාතන්ත්‍රවාදය ? මෙයින් අවුරුදු 20 කට පෙර අප ලැබූ නිදහස මේකද ? මහජන ඡන්දයෙන් රජයක් බලයට පත් වෙනවා. අද තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය අනුව ඒකට පිටිපස්සෙන් පිහියෙන් අනිනවා. අද අප අදහන ප්‍රජාතන්ත්‍රවාදයේ හැටි එහෙමයි. එම නිසා ගරු කථානායකතුමනි, මෙයින් අවුරුදු 20 කට පෙර අප ලැබූ නිදහස මේකද, මෙ රටේ ජනතාවට හිමි වී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය මේකද, වාරියපොල හාමුදුරුවෝත්, කැප්පෙටිපොල, පුරංඅප්පු, ගොන්ගාලේගොඩ බණ්ඩා, වැනි වීරයන් මේ රටේ විමුක්තිය සඳහා ජීවිත පූජා කොට ලබා ගත් ප්‍රජාතන්ත්‍රවාදී නිදහස මේකද යන වග නැවතත් අවුරුදු 20 කට පසු කල්පනා කර බලන්නට අපට අද සිදු වී තිබෙනවා.

මේ රටේ ආර්ථික පරිහාණිය අද තිබෙන තත්ත්වයට මුදුන්පත් වී තිබියදී එය යටපත් කිරීමට මේ හත් හවුල් ආණ්ඩුව විසින්, 1965 මාර්තු මාසයේදී පෙඩරල් පක්ෂයත් සමග ඇති කර ගන්නා ලද රහස් ගිවිසුම අනුව, රටසභා පණතක් ඉදිරියට ගෙනැවිත් තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ රටසභාවකට ගම්සභාවකට තරම්වත් බලතල නැහැ. එහෙත්, රජයට වුවමනා වී තිබෙන්නේ, පෙඩරල් පක්ෂයට යම් කිසි දෙයක් දුන් බව පෙන්නුම් කරන්නටයි. අනෙක් පැත්තෙන් පෙඩරල් පක්ෂයට වුවමනා වී තිබෙන්නේ යම් කිසි දෙයක් රජයෙන් ලබා ගත් බව ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවට පෙන්වන්නටයි. ඒ හැර මේ රටසභාවල වෙන කිසිවක් නැහැ. සිංහල ජනතාවට හානියක්වත් ද්‍රවිඩ ජනතාවට ප්‍රයෝජනයක්වත් මෙයින් සිදු වන්නේ නැහැ. රජයේත් පෙඩරල් පක්ෂයේත් ප්‍රධාන ඕනෑකම වී තිබෙන්නේ රටේ ආර්ථික ප්‍රශ්න යටපත් කිරීමයි. ඒ අතර තවත් පිරිසක් රට දෙකට බෙදීමක් ගැන කෑගහනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අපි මේ රටසභා ගැන ටිකක් කල්පනා කර බලමු. බණ්ඩාරනායක අගමැතිතුමා රටසභාවලින් අදහස් කෙළේ කුමක්ද? එක්සත් ජාතික පක්ෂය ආසන අටට බැස්සීමත් සමගම, මේ රටේ විමුක්තියත් නිදහසත් ලබා ගැනීම සඳහා දෙමළ භාෂාව කථා කරන ජනතාවගේ සහයෝගය ලබා ගැනීමට බණ්ඩාරනායක අගමැතිතුමා ගත් මූලික පියවර බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම සකස් කිරීමයි. දැන් සිටින අගමැතිතුමා එදා දේශපාලන භූමියෙන් අයින් වී සිටියා. නැවත වරක් දේශපාලන භූමියට නො එන අදහසයි එදා එතුමාට තිබුණේ. එහෙත්, බණ්ඩාරනායක අගමැතිතුමාගෙන් රට බේරා ගන්නට ඕනෑය කියා නැවත වරක් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය ගෙන 1957 ඔක්තෝබර් මස 3 වන දා උදේ පාන්දර අගමැතිතුමා දැන් සිටින රාජ්‍ය ඇමතිතුමාත් සමග මහනුවරට පයින් ගමනක් ආරම්භ කළ හැටි අපට මතකයි. ඊට පසු 1960 මාර්තු හා ජූලි මැතිවරණවලදී ඩඩ්ලි සේනානායක මහතාත්, ජේ. ආර්. ජයවර්ධන මහතාත් රට දෙකට කැඩෙන බව පෙන්වන සිතියමක් අරගෙන රට පුරාම ගියා. සිරිමා බණ්ඩාරනායක මැතිනිය රට පාවා දෙන්නට යනවා යයි කියමින් මහජනයාට ඒ සිතියම ඉදිරිපත් කළා. ඊළඟට 1960 ජූලි මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මහජනයාට ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයේ රටසභා දෙන බව සඳහන් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එම මැතිවරණයෙන් බලයට පත් වුණාට පසු 1963 සහ 1964 අවුරුදුවල පවත්වන ලද රාජාසන කථාවලදී රටසභා දෙන බව සඳහන් කළා. රටසභා ක්‍රියාත්මක කිරීම ගැන කරුණු සොයා බැලීම සඳහා ඒ රජය 1964 දී මහ තන්තිල කොමිසමද පත් කළා. 1965 මාර්තු මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණා. 1968 දී ඒ අය රටසභා පනතක් ඉදිරිපත් කර තිබෙනවා. ඉතින් දැන් මොකක්ද තත්ත්වය? 1960 මාර්තු සහ ජූලි මැතිවරණවලදී එක්සත් ජාතික පක්ෂය විසින් රට පුරා ගෙන යන ලද ඒ සිතියම දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රට පුරා ගෙන යනවා. ලංකා සම සමාජ පක්ෂයත් ඒකට හවුල් වෙලා. සංශෝධනවාදීනුත් ඒකට හවුල් වෙලා. ඩඩ්ලි සේනානායක රට දෙකට කඩන්න යනවා යයි ඒ අය කියනවා. මේවා මොන තරම් විහිළුද?

දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා රටසභා ක්‍රමයක් යෝජනා කෙළේ ඇයි? අවුරුදු විසි ගණනක් තිස්සේ පළාත් පාලන ඇමතිවරයා වශයෙන් තමන් ලත් අත්දැකීම් අනුව පර සුද්දන් ඇටවූ යටත් විජිතවාදි ආණ්ඩු ක්‍රමය යටතේ ප්‍රතිගාමී නිලධාරි පැලැන්තියට සහ කච්චේරිවලට තිබෙන බලය මහජන නියෝජිතයන් අතට පත් කර දීමේ බලාපොරොත්තුව ඇතිවයි, එතුමා රටසභා යෝජනා කෙළේ. මෙය ප්‍රගතිශීලී පියවරක්. ප්‍රතිගාමී නිලධාරී පැලැන්තිය මීට එරෙහිව කුමන්ත්‍රණයක් අටවන්නට උත්සාහ කළා. ඔවුන් මේ රට දෙකට බෙදන සිතියමක් ඇන්දා. ජාතීන් භේද කරවන්නට ක්‍රියා කළා. නාගදීපය සහ සේරුවාවිල යන ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන දෙමළ රාජ්‍යයට හිමි වෙනවායයි කියන්නට පටන් ගත්තා. සත්‍යග්‍රහ ව්‍යාපාර පටන් ගත්තා. නුවරට පයින් යන්නට පටන් ගත්තා. මේ නිසා බණ්ඩාරනායක මහතාට රොස්මීඩ් පෙදෙසේ කටු කම්බි අදින්නට පවා සිදු වුණා. එදා රට සභා යෝජනාවට විරුද්ධ වූ ඇතැම් හාමුදුරුවරුන් අද ඉන්නේ කොහේදැයි මා ප්‍රශ්න කරනවා. අද ඒ අයගෙන් සමහරුන්ට කොළඹ හතේ ඉඩම් පවා ලැබී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

ගරු කථානායකතුමනි, ආර්ථික හා ජාතික ප්‍රශ්න උග්‍ර වෙමින් පවතින කාලයක පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව යමින් අපේ ඒ ආර්ථික හා ජාතික ප්‍රශ්න විසදන්නට පුළුවන් වන්නේ නැහැ. මේ රටේ ඉන්න සිංහල හා දෙමළ ජනතාව හප්පන මේ සම්ප්‍රදාය අනුව මහා මැතිවරණයක් කිට්ටු වන කාලයේදී එක් කට්ටියක් අනෙක් කට්ටියට විරුද්ධව සිංහල ප්‍රදේශවලදී දෙමළ උදවියට විරුද්ධව සිංහල උදවිය උසිගන්වනවා. ඒ වාගේම උතුරු නැගෙනහිර ප්‍රදේශවලදී සිංහල ජනතාවට විරුද්ධව දෙමළ ජනතාව ෆේඩරල් පක්‍ෂයත් දෙමළ සංගමයත් විසින්, උසිගන්වනවා. එදා එක්සත් ජාතික පක්‍ෂය සිංහල හා දෙමළ ජනතාව හප්පන්නට ගෙන ගිය ව්‍යාපාරය අද ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය ගෙන යනවා. උතුරේත් දකුණේත් ගෙන යන මේ හැප්පිලි ව්‍යාපාරයෙන් පසු මහජනයාගේ ඡන්ද ලබාගෙන පාර්ලිමේන්තුවට එනවා. එසේ අවුත් ධනපති මට්ටමෙන් රහස් ගිවිසුම් හෝ එළිපිට ගිවිසුම් ඇති කර ගෙන ආණ්ඩුවක් පිහිටුවනවා. මේ හත් හවුල් ආණ්ඩුව පවා ඇති වී තිබෙන්නේ ඔය ආකාරයටයි. ඒ වාගේම දැන් එන්නට එන්නටම මේ නිසා මේ රටේ ප්‍රශ්න උග්‍ර වී තිබෙනවා. අප ඒ නිසා තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට මතක් කරන්නේ බණ්ඩාරනායක ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදීමට නම් එය විප්ලවයකින් තොරව කිරීමට බැරි බව. දැනට උග්‍ර වී තිබෙන මේ මහජන ප්‍රශ්න විසඳීමට නම් විප්ලවයකින් තොරව මේ පිළිවෙත අනුගමනය කිරීමෙන් පමණක් පුළුවන් වෙන්නේ නැහැ. මේක සෙල්ලම් මඩුවක්. කෝලම් මඩුවක්. මෙය අධිරාජ්‍යවාදීන් ඇටවූ එකක්. අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියි මේ රටේ තිබෙන්නේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)

You must set an example.

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)

තමුන්නාන්සේ නම් බොහෝම අගේට සියයට 101 ක්ම මෙම පාර්ලිමේන්තු ක්‍රමය අදහන පුද්ගලයෙක් බව අප පිළිගන්නවා. මේ ප්‍රශ්න උග්‍රවී තිබෙන්නේ ඔය ආකාරයටයි. ටිකක් කල්පනා කර බලන්න, පසුගිය මාසේ මේ ආණ්ඩුවට විරුද්ධව විරුද්ධ පක්ෂය විසින් විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කළා, විදේශීය කොම්පැනිවලට අක්කර දාහ, දෙදාහ, තුන්දාහ දුන්නාය කියා. අගමැතිතුමා ඒ අවස්ථාවේ නැගිට කියා සිටියා: ඔව්, ඇත්ත, අපි බලාපොරොත්තු වන්නේ ඒ ක්‍රමය අනුගමනය කර මේ රට ස්වයම් පෝෂිත කිරීමටයි, ඒ නිසා කොම්පැනිවලට දුන්නාය, කියා. ඒ වාගේම එතුමා විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරුන්ට ඇඟිල්ල දිගු කර ඇසුවා, අසුවල් මන්ත්‍රීතුමා අසුවල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේදී අක්කර 500ක් ගත්තේ නැද්ද, අසුවල් මන්ත්‍රීතුමා අසුවල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ දී අක්කර සියයක් ගත්තේ නැද්ද, අසුවල් මන්ත්‍රීවරයා අසුවල් ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ භාර්යාවට අක්කර 50ක් අරගෙන දුන්නේ නැද්ද කියා. එම නිසා කථානායකතුමනි, මා කියන්නේ මේ පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව දෙපැත්තම ගැන සිතා බලන විට දෙපැත්ත විසින්ම එකම වල්ලේ වැඩ පිළිවෙළක් ගෙන යන බවයි. මෙය අධිරාජ්‍යවාදීන් අටවා ඇති සම්ප්‍රදායක්. හත් හවුලෙන් ආවත්, තුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හවුලෙන් ආවත්, මොන හවුලකින් ආවත්, මේ සම්ප්‍රදාය අනුව පොහොසතා එන්න එන්නම පොහොසත් වෙනවා. දුප්පත් නිර්ධන පංක්තිය, ගොවි කම්කරු මධ්‍යම පංක්තිය, ක්‍රම ක්‍රමයෙන් දුප්පත් වේගන යනවා. ඔවැනි සම්ප්‍රදායකුයි මේ රටේ තිබෙන්නේ.

හැබැයි ඇතැම් නායක හාමුදුරුවරු, ඇතැම් ධනපති කොටස් කියන්නේ, මේවා සිද්ධ වෙන්නේ කර්මය නිසා බවයි. මොනවා කරන්නද, ඔය කර්මෙ කියන එකයි, ඒ අය කියන්නේ. දස ලක්ෂයකට රක්ෂා නැත්තෙ මොකද? කර්මය නිසා. ඉඩම් නැහැ, කම්ය! වතුර නැහැ, කම්ය! ඇයි කථානායකතුමනි, මේ කර්මය ගැන කථා කරන්නෙ? ටිකක් කල්පනා කර බලන්න, චීනය වැනි රටක් දියුණු වුණේ කොහොමද කියා. අවුරුදු 18 කට පෙර සියයට 80 ක් බෞද්ධයන් සිටින චීනය 1949 දී මාක්ස්-ලෙනින්වාදී ආයුධ සන්නද්ධ විප්ලවයකින් කර්මය අහෝසි කරගෙන රටේ ස්වාධීනත්වය, විමුක්තිය ලබාගෙන අවුරුදු තුනක් ඇතුළත මුළු මහත් ලෝකයේ හතරෙන් පංගුවක් ජනගහනයට මහ පොළොව බෙදා දී තමන්ගේ රටත් සවයම් පෝෂිත කරගෙන වැඩිපුර සහල් ලංකාව වැනි රටවලට 1952 සිට එවන්නට පුළුවන්කම ලැබුවා නොවේද? අද චීනයේ, බෞඩ ප්‍රතිපත්ති ජනතාවගේ එදිනෙදා ජීවිතයේ දී ක්‍රියාත්මක වෙනවා. එම නිසා අප රට දුප්පත් ජනතාවට "කම්ය" වී තිබෙන්නේ සුද්දන් විසින් අටවා තිබෙන මේ පාර්ලිමේන්තු සම්ප්‍රදායයි. එපමණක් නොවෙයි, අද මුළු මහත් අධිරාජ්‍යවාදීන් හා සෝවියට් සංශෝධනවාදීන් චීනයට බයේ ඉන්නවා. ඊට හේතුව මොකක්ද? ලෝක ඉතිහාසයේ පළමු වරට කොමියුනිස්ට් රටක් පසු ගිය අවුරුද්දේ ඇති වූ චීන සංස්කෘතික විප්ලවය අනුව ගොවි කම්කරු ජනතාව මාක්ස්-ලෙනින්වාදය අනුව නිර්ධන පන්තියේ ආඥාදායකත්වය තව තවත් තහවුරු කර සභාපති මාඕ සේතුං සහෝදරයාගේ චින්තනය අනුව ඉදිරියට යැමයි. චීනයට අවුරුදු 18 කින් ඔය තත්ත්වයට එන්ට පුළුවන් වුණා. අපි නිදහස ලබාගෙන අවුරුදු 20 කින් පසුව බැලුවාමත් අපේ රටේ ප්‍රශ්න අහස දක්වා උග්‍ර වෙලා. ප්‍රංශයේ තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලක්ෂ ගණනක් ගෙන ගිය සටනට ප්‍රංශයේ කම්කරුවන් කෝටි එකහමාරක් වැඩ වර්ජනයකින් සහයෝගය දුන්න. ඒ උදවිය තුවක්කු අතට අරගෙන විප්ලවීය ආකල්පයක් ඔස්සේ ඉදිරියට ගියා. ජර්මනිය, එංගලන්තය, ඉතාලිය, ආදී රටවල තත්ත්වයත් එහෙමමයි. ඇමෙරිකාව දෙස බලන්න. වියට්නාමයේ විමුක්ති හටයන් ගෙන යන සටන නිසා පසුගිය අවුරුද්දේ ඇමෙරිකාවේ ඩොලර් කෝටි 3,500 ක අය වැය හිඟයක් ඇති වුණා. අද ඇමෙරිකාව තුළම කෝටි 2½ ක් තරම කළු අප්‍රිකානු ජනතාව වර්ණ භේදයට විරුද්ධව මනුෂ්‍ය අයිතිවාසිකම් සඳහා විප්ලවීය ආකල්පයකින් සටන් කරගෙන ඉදිරියට යනව. විශේෂයෙන්ම රොබට් කෙනඩි මහත්මයා මරා දැමීමෙන් පසු, මෙතෙක් කල් ප්‍රජාතන්ත්‍රවාදය ඔස්සේ ගමන් කළ රටවල තරුණ තරුණියන් අධිරාජ්‍යවාදීන්ගෙන් ප්‍රශ්න කරනව, "මේකද ප්‍රජාතන්ත්‍රවාදය" කියා. ඒ උදවිය අළුත් සමාජයක් ඉල්ලුම් කරනව. ඔවුන් ඉල්ලා සිටින්නේ පැලැස්තර දැමීමක් නොවෙයි; අළුත් සමාජයක්.

ගරු කථානායකතුමනි, ප්‍රශ්න උග්‍ර වී තිබෙන්නෙ මේ ආකාරයටයි. මේ හත් හවුල් ආණ්ඩුව විසින් මාඕ සේතුං සභාපතිතුමාගේ පදක්කම් නැවත වරක් තහනම් කර තිබෙනව. මේ රටේ සිටින අධිරාජ්‍යවාදී ප්‍රතිගාමී ධනපති පන්තිය පදක්කම් වලට මේ තරම් භය නම්, මේ රටේ ගොවි-

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අග්‍රාණ්ඩුකාරතුමාගේ කථාව :

[එස්. ඩී. බණ්ඩාරනායක මයා.]

කම්කරුවන් හා අතරමං වී සිටින තරුණ තරුණියන් මාක්ස්-ලෙනින් වාදී මාඕ සේතුං සහෝදරයාගේ චින්තනය අතට ගත් විට ඒ අදහස් සන්නද්ධ කර ගත් විට, රටේ මොන විධියේ තත්ත්වයක් ඇති වෙයිද කියා කල්පනා කර බලන්න. වැඩි කල් යන්ට පෙර මේ රටේ පමණක් නොව මුළු ලෝකයේම ඒ තත්ත්වය උද්ගත වෙනව.

මේ බංකොලොත් පාර්ලිමේන්තු ක්‍රමය ගැන අපේ කිසිම විශ්වාසයක් නැහැ. පර සුද්දන් මේ රටේ පාර්ලිමේන්තු ක්‍රමය අටවල දැන් අවුරුදු 20 ක් වෙනව. අපේ එකම පරමාර්ථය අධිරාජ්‍ය විරෝධි, යූ. එන්. පී. විරෝධි, රදළ විරෝධි කොටස් විප්ලවීය ආකල්පයක් අනුව එක්සත් කර බණ්ඩාරනායක අගමැතිතුමාට පාර්ලිමේන්තු ක්‍රමය තුළින් කරන්ට බැරි වුණු ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කිරීමයි. වාරියපොළ හාමුදුරුවො, පුරන් අප්පු, ගොන්ගාලේ ගොඩ බණ්ඩා, කැප්පෙටිපොළ, වැනි ජාතික වීරයන්ගේ ලේවලින් තෙත් කර තිබෙන මේ මහ පොළොව නිදහස් කර ගන්ට නම් ලේ සෙලවීමේ විප්ලවයකින් තොරව මේ පාර්ලිමේන්තු ක්‍රමයෙන් ඒක කරන්නට බැහැ. කවදාවත් එසේ නොමැතිව විමුක්ති යක් ලබා ගන්ට පුළුවන්කමක් නැහැ. බණ්ඩාරනායක අගමැතිතුමාත්, අපේ අනිකුත් ජාතික වීරයිනුත් නොයෙක් අන්දමට මරා දැම්ම. කැප්පෙටිපොළගේ හිස පවා අපට ලැබුණෙ ඊයෙ-පෙරේදයි. එංගලන්තයේ සුද්දන්ගේ කවුගෙයක තිබ් එය අපට දුන්නෙ මේ ළඟදීයි. එම නිසා ආයුධ සන්නද්ධ විප්ලවයකින් තොරව අපේ විමුක්තිය ලබා ගන්නට බැරි බව ප්‍රකාශ කරමින් මගේ සංශෝධනය මා ඉදිරිපත් කරනව.

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

(*திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய*)

(Mr. M. Tennakoon—Nikaweratiya)

**විසින් ස්ථිර කරන ලදී.**

*அனுவதித்தார்.*

*seconded.*

ස්තුති යෝජනාව පිළිබඳ විවාදය

**සංශෝධනය මෙසේ ය :**

*திருத்தம் வருமாறு :*

*The Amendment is as follows :*

IV

" සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

' එසේ වුවද, හය වෙනි පාර්ලිමේන්තුවේ හතර වැනි සැසි වාරය විවෘත කරමින් අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් කරන ලද කථාව පිළිබඳව පහත දැක්වෙන කරුණු නිසා මගේ කණගාටුව පළ කරමි :—

(අ) ඊනියා නිදහස ලැබී විසි වසරක් ගත වීත් අපේ ආර්ථිකය මත අද මේ වනතුරුත් විදේශික අධිරාජ්‍යවාදයේ ඇති ග්‍රහණය පිළිබඳවත්, මෙම ආණ්ඩුව විසින් අපේ ආර්ථිකය විදේශික අධිරාජ්‍යවාදයේ විය ගසට වඩා තදින් බැඳීමට දිගින් දිගටම ගත් පියවරවල් ගැනවත්, කිසිවක් සඳහන් නොවීම ;

(ආ) පසුගිය අවුරුද්දේ හාල් සලාකයෙන් අඩක් කපා දැමීමටද, දෙවරෙක රුපියලේ අගය අඩු කිරීමටද, හේතුවූ, දැනට පවත්නා මහ ආර්ථික අර්බුදය එනම් 1929-31 අර්බුදයෙන් පසුව ඇතිවූ බරපතලම අර්බුදය ගැන හා ඉහත කී පියවරවල් ගැන්ම නිසා ජීවන වියදම අහස උසට නැගීම හා ඇතිවූ පාරිභෝගික භාණ්ඩ හිඟය ගැන නිවැරදි විග්‍රහයක් එහි නොමැතිවීම ;

(ඇ) ජීවන වියදම පහළ බස්වා ජන සමූහයන්ට සහනය සැලසීමට හෝ බරපතල ප්‍රමාණයන්ට වැඩි ඇති උග්‍රවන රැකියා ප්‍රශ්නය විසඳීමට හෝ කිසිදු යෝජනාවක් එහි නොවීම ;

(ඈ) දරිය නොහැකි අන්දමින් ජීවන වියදම ඉහළ යැමත්, ඒ හේතුවෙන් ජීවන තත්ත්වයන් පහළ වැටීමත් නිසා අසීරු තත්ත්වයකට මුහුණ පා සිටින කම්කරුවන්ට, ගොවීන්ට හා මැද පංතීන්ට සහනය සැලසීම සඳහා කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(ඉ) 1967 හා 1968 වාර්තා බිඳ හෙලන අස්වැන්න ලැබුවායයි කයිවාරු කීවද, ආහාර වගාව දියුණු කිරීම සඳහා වන ආණ්ඩුවේ ව්‍යාපාරය සාර්ථක බව කියා පෑවද, කැපූ හාල් සලාකය නැවත ලබාදීමට කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඊ) මෙම ආණ්ඩුව බලයේ සිටි මාස 39කින්, මාස 30ක් තිස්සේම පවත්වා ගෙන යන හදිසි අවස්ථාව ඉවත් කිරීමට හා ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් නැවත ලබාදීමට කිසිදු යෝජනාවක් අඩංගු නොවීම ;

(උ) අප නිර්යාත වැවිලි එකක් දෙකක් මත සම්පූර්ණයෙන්ම යැපීමෙන් මුදාගනු වස්, අපේ ආර්ථිකය විවිධාකාර කිරීම උදෙසා මේ රට වේගවත් කර්මාන්තමය කිරීමකට භාජන කිරීම සඳහා කිසිදු ක්‍රමානුකූල සැලැස්මක් ඒ තුළ නොවීම ;

(ඌ) ලංකාව ආහාර අතින් ස්වයංපෝෂිත වීමේ ප්‍රගති මාර්ගයට එකම විශාලතම බාධකය වී ඇති කෘෂිකර්මය සඳහා වාරිමාර්ග පහසුකම් හීනවීමේ ප්‍රශ්නය විසඳාලීම උදෙසා විදේශීන් සතු තේ වතු පවරාගෙන, කඳු මුදුන් නැවත වනගත කිරීමෙන් පස සෝදා යෑමේ ප්‍රශ්නය විසඳාලීමටද, තැනිතලා බිම්වල ගොවිතැන් කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා, නාස්තියකින් තොරව වැහි ජලය ගෙන යෑම පිණිස අපේ ගංගා භාරා ගැඹුරු කිරීමටද, කිසිදු යෝජනාවක් එහි අඩංගු නොවීම ;

(එ) සමාජ අවහිර වැළැක්වීමේ පනත ක්‍රියාවේ යෙදවීමට හෝ උතුරු ලංකාවේ පවත්නා ස්පර්ශ නොකිරීමේ නින්දිත තත්වය හා කුල පීඩනය මුලිනුපුටා දැමීමට ආණ්ඩුව ඕනෑකමක් දක්වන බවක්වත් එයින් ප්‍රකාශ නොවීම ;

(ඒ) මේ රටෙ අධ්‍යාපනය හා සමාජ ක්‍රමයේ මූලික වෙනසක් ඇති කිරීමට ශිෂ්‍යයින්ගේ සිත් යොමු කර ඇති, ඔවුන් තුළ ඇති කල කිරීමට හේතු භූත වූ ප්‍රශ්නයන් වන, දේශන ශාලා නැතිකම, ප්‍රමාණවත් ආචාර්ය මණ්ඩලයක් නොවීම, ප්‍රමාණවත් පුස්තකාල පහසුකම් හා දුප්පත් සිසුන්ට අවශ්‍ය ශිෂ්‍ය ආධාර නොගෙවීම, විනාශ ශාස්තු වැඩි කිරීම, විශ්ව විද්‍යාලවල උප කුලපතිවරුන් ලෙස ශාස්ත්‍රීය අංශයෙන් සුදුසුකම් නැති පරිපාලකයින් පත් කිරීම ආදී ප්‍රශ්නවලට කිසිදු සහනයක් එහි අඩංගු නොවීම ;

(ඔ) මෙම ආණ්ඩුව විසින් ඇති කළේය කියන බොරු ජාතික සමගිය—එනම් ඇත්ත වශයෙන්ම දෙමළ සිංහල දෙජාතීන්ගේ ජන සමූහයන් අතර නොව, ඔවුන් අතර ප්‍රතිගාමී බල වේගයන්ගේ සමගියක් පමණක් ප්‍රතිගාමී පෙඩරල් පක්ෂය සමග ඇති කර ගත් රහස් ගිවිසුම, ගරු කිරීමට යාමෙන් රටේ ඇති වූ අසමගිය ගැන සඳහනක් වන සමගිය හෙළිදරව් කළාවූ, ආණ්ඩුව වත් එහි නොවීම ;

(ඕ) පසුගිය අවුරුදු 37 තිස්සේම පැවතියද, අදත් මේ රට මත ඇති අධිරාජ්‍යවාදී—ධනවාදී සූරාකෑමේ ක්‍රමය මදකුදු වෙනස් නොකළාවූද, කපටි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් අප මත බලහත්කාරයෙන් පටවන ලද්දා වූද, ධනේශ්වර පාර්ලිමේන්තු ක්‍රමයේ බංකොළොත් භාවය පෙන්නුම් කර දීම නොසලකා හැරීම ;

(ක) එක්සත් ජනපද අධිරාජ්‍යවාදය, වියට්නාම ජනතාවට එරෙහිව කරන ආක්‍රමණය ගැන මේ රටේ ජනතාව දරන මතය වන, එක්සත් ජනපද හා ඔවුන්ගේ පරිවාර හමුදා සම්පූර්ණයෙන්ම වියට්නාමයෙන් ඉවත් විය යුතුය ; ඔවුන්ගේ සියලු කඳවුරු දකුණු වියටනාමයෙන් ඉවත් කළ යුතුය ; ප්‍රජාතන්ත්‍රවාදී උතුරු වියට්නාම් ජනතාවට එරෙහිව කරන බෝම්බ දැමීම සම්පූර්ණයෙන් අත් හිටුවිය යුතුය ; තම අනාගතය තීරණය කිරීමට වියට්නාම් ජනතාවටම බාර දිය යුතුය ; යන ඉල්ලීම් එයින් කිසිදු අයුරකින් ප්‍රකාශ නොවීම ;

(ග) අමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ඔත්තු සේවාවේ (සී.අයි.ඒ) අංශයක් ලෙස එළිදරව් වී ඇති දුර්ජන සාම හමුදාවට මේ රටට නැවත පැමිණෙන්නට අවසර දීමෙනුත්, අපගේ ජනතාවට එරෙහිව යටිකූට්වූ වැඩවල යෙදීම සඳහා අමෙරිකන් අධිරාජ්‍යවාදීන්ගේ "හෝප් නැවට" කොළඹ වරායේ නැංගුරම් දමාගෙන සිටීමට අවසර දීමෙනුත් පෙන්වා දෙන පරිදි, එම ආණ්ඩුව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අණ පරිදි ක්‍රියා කරන්නේය යන සත්‍ය තත්වය පැහැදිළි කිරීමට අපොහොසත් වීම ආදිය.

එම නිසා මෙම සභාව ඔබේ ආණ්ඩුව කෙරෙහි කිසිදු විශ්වාසයක් නැති බව ප්‍රකාශ කර සිටින්නීය.' "

" நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க் காணுஞ் சொற்களைச் சேர்க்க வேண்டும் :

' எனினும் ஆறுவது பாராளுமன்றத்தின் நான்காவது கூட்டத் தொடரின் ஆரம்பத்தின்போது மேன்மை தங்கியதாங்கள் நிகழ்த்திய உரையில்—

(1) இருபது வருடங்களாகச் சுதந்திரம் அடைந்திருக்கின்றோம் என்று கூறப்பட்ட போதிலும், எமது பொருளாதாரத்தில் அந்நிய ஏகாதிபத்தியம் தொடர்ச்சியாக வசித்துவரும் இறுக்கமான பிடிப்பைப்பற்றியோ அந்நிய ஏகாதிபத்தியத்தின் தேர்ச்சில்லில் எமது நாட்டுப்பொருளாதாரத்தை விலகமுடியாத படி இறுக்கமாக இணைப்பதற்கு இவ்வரசாங்கத்தால் அடுத்தடுத்து எடுக்கப்பட்ட நடவடிக்கைகள்பற்றியோ குறிப்பிடாத்தையிட்டும்,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(2) எமது பங்கீட்டரிசியைப் பாதியாக குறைத்துள்ளதற்கும், சென்ற ஆண்டு இரு முறைகள் ரூபாவின் மதிப்பைக் குறைந்துள்ளதற்கும் அதன் காரணமாக வாழ்க்கைச் செலவு வானளாவ உயர்ந்துள்ளதற்கும், அத்தியாவசியப் பொருட்களுக்குத் தட்டுப்பாடு ஏற்பட்டுள்ளதற்கும் காரணமான, குறிப்பாக, 1929–31 ஆம் ஆண்டு முதல் எமது நாட்டை எதிர்நோக்கியுள்ள மிகவும் மோசமான பொருளாதார நெருக்கடிபற்றித் தெளிவான ஆராய்வு இடம் பெறாததையிட்டும்,

(3) வாழ்க்கைச் செலவைக் குறைத்து அதன் மூலம் மக்களின் துயரைத் தீர்ப்பதற்கும் மிகவும் உச்சக்கட்டத்தை அடைந்துள்ள வேலையில்லாத் திண்டாட்டத்தைத் தீர்ப்பதற்கும் எத்தகைய ஆலோசனைகளும் இடம் பெறாததையிட்டும்,

(4) விலைவாசியின் தாங்கமுடியாத உயர்வு காரணமாக வாழ்க்கைத் தரம் பாதிக்கப்பட்டுள்ள தொழிலாளர்கள், விவசாயிகள், நடுத்தர வர்க்கத்தினர் ஆகியோருக்கு நிவாரணமளிப்பதற்குகான எத்தகைய ஆலோசனைகளையும் குறிப்பிடாததையிட்டும்,

(5) 1967, 1968 ஆம் ஆண்டுகளில் அதிக விளைச்சல் எனத் தம்பட்டமடித்த போதிலும் உணவு உற்பத்திப் பெருக்கத்துக்கான அரசாங்கத்தின் நடவடிக்கைகள் பூரணமாக வெற்றியளித்துள்ளது என்று பெருமையடித்துக் கொள்ளும் அதே நிலையிலும் வெட்டிய அரிசியை மீண்டும் மக்களுக்குக் கொடுப்பது சம்பந்தமாக எதுவும் குறிப்பிடாததையிட்டும்,

(6) இந்த அரசாங்கம் பதவியிலிருந்த முப்பத்து ஒன்பது மாதங்களில், முப்பது மாதங்களாக இருந்து வருகின்ற அவசரகால நிலைமையை அகற்றி மக்களுடைய ஜனநாயக உரிமைகளை மீண்டும் பெறச்செய்வதற்கான எத்தகைய திட்டத்தையும் குறிப்பிடாததையிட்டும்,

(7) இரண்டொரு ஏற்றுமதிப் பொருட்களில் மாத்திரம் தங்கியிருக்கும் எமது பொருளாதாரத்தைப் பலவகைப்பட்ட பொருளாதாரமாக மாற்றுவதற் கேதுவாகத் துரிதமான கைத்தொழில் வளர்ச்சியை ஏற்படுத்துவதற்கான சரியான திட்டமிடப்பட்ட பொருளாதாரத்தை நிறைவேற்றுவதற்கான பிரேரணை எதையும் குறிப்பிடாததையிட்டும்,

(8) எமது நாட்டுச் சமதரைகளில் வாழ்கின்ற விவசாயிகளுக்குப் பயன்தரத்தக்கதாக விலைமதிப்பற்ற மழை நீரைக் கொண்டுசெல்லக்கூடிய விதத்தில் எமது ஆறுகளை அவற்றிலுள்ள சேறுகளை அகற்றி ஆழமாக்கி, அந்நியர்களுக்குச் சொந்தமான தேயிலைத் தோட்டங்களைத் தேசியமயமாக்கி, மலை உச்சிகளில் காடுவளர்த்து மண் அரிவைத் தடுத்து, எமது நாட்டு உணவுத் தேவையைப் பூர்த்தி செய்வதற்கான வளர்ச்சிக்கு பெருந்தடையாயிருக்கக்கூடிய நீர்ப்பாசன வசதியின்மையை இல்லாமல்செய்து எமது விவசாயப் பிரச்சினையைத் தீர்ப்பதற்கான எத்தகைய திட்டத்தையும் குறிப்பிடாததையிட்டும்,

(9) சமூகக் குறைபாட்டுத் தடுப்புச் சட்டத்தை அமுல் செய்வதற்கோ, வட இலங்கையில் நிலவி வருகின்ற இழிவான தீண்டாமைக் குறையை ஒழிப்பதற்கோ அரசாங்கம் சற்றேனும் உறுதி கொண்டிருப்பதாக எடுத்துக்காட்டத் தவறியதையிட்டும்,

(10) விரிவுரை அறைகள் போதாமை, போதிய ஆசிரியர்கள் இல்லாமை, போதிய நூல் நிலைய வசதிகள் இல்லாமை, உதவிப்பணம் தேவையான மாணவர்களுக்கு அது போதியளவு இல்லாமை, பரீட்சைக் கட்டணத்தை உயர்த்தியமை, பல்கலைக் கழகத் துறையில் அனுபவமில்லாத நிருவாகிகளைப் பல்கலைக் கழகங்களில் துணைவேந்தர்களாக நியமித்தமை ஆகிய காரணங்களினால் பெரிதும் ஏமாற்றமடைந்து இந்நாட்டின் கல்வித்துறையிலும் சமூக அமைப்பிலும் பூரணமான, தீவிரமான ஒரு மாற்றத்தை ஏற்படுத்த வேண்டுமென்ற எண்ணத்தைக் கொண்டுள்ள மாணவர்களை எதிர்நோக்கியுள்ள பிரச்சினைகளுக்கு எவ்விததீர்வையும் காட்டத் தவறியதையிட்டும்,

(11) இந்நாட்டின் சிங்கள, தமிழ் மக்களிடையே ஐக்கியத்தை ஏற்படுத்தாது சிங்களவர், தமிழர் மத்தியிலுள்ள பிற்போக்குச் சக்திகளிடையே மாத்திரம் ஐக்கியத்தை ஏற்படுத்தி இவ்வரசாங்கம் தம்பட்டமடிக்கின்ற போலித் தேசிய ஐக்கியத்தை அம்பலப்படுத்துகின்ற விதத்தில் பிற்போக்குத் தமிழரசுக் கட்சிக்கு அரசாங்கத்தாலளிக்கப்பட்ட இரகசிய வாக்குறுதிகளை நிறைவேற்றும் முயற்சியில் இந்நாட்டில் ஏற்படுத்திய ஐக்கியமின்மையைப் பற்றிக் குறிப்பிடாததையிட்டும்,

(12) தந்திரசாலியான பிரித்தானிய ஏகாதிபத்தியம் எம்மீது திணித்துள்ள திறனற்ற முதலாளித்துவபாராளுமன்ற ஜனநாயகம் கடந்த முப்பத்தேழு வருடகாலமாக இருந்துங்கூட எமது நாட்டில் இன்றுவரை சிறிதும் குறையாது தொடர்ந்து இருந்துவரும் ஏகாதிபத்திய முதலாளித்துவ சுரண்டல் முறையைப் பற்றி எதுவும் குறிப்பிடாததையிட்டும்,

(13) வியட்நாம் மக்கள் தமது எதிர்காலத்தைத் தாமே தீர்மானித்துக்கொள்வதற்கு அனுமதிப்பது, அமெரிக்க ஏகாதிபத்தியம் வியட்நாம் மக்கள்மீது தேவையற்ற ஆக்கிரமிப்பு நடத்துவது, அமெரிக்காவின் கூலிப்படைகளை வாபஸ் வாங்குவது, தென் வியட்நாமிலிருந்து அவர்களின் தளங்களை அகற்றுவது வட வியட்நாம் ஜனநாயகக் குடியரசுமீது நடத்தும் குண்டு

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வீச்சைப் பூரணமாக நிறுத்துவது ஆகிய பிரச்சினைகள் சம்பந்தமாய் எமது நாட்டு மக்களின் விருப்பத்தைப் பிரதிபலிக்கத் தவறியதையிட்டும்,

(14) அமெரிக்காவின் மத்திய உளவு ஸ்தாபனத்தின் ஓர் அங்கமாக அம்பலப்படுத்தப்பட்ட பிரசித்தி பெற்ற அமெரிக்க சமாதானப் படையை மீண்டும் எமது நாட்டுக்கு வருவதற்கு அனுமதியளித்ததாலும், எமது நாட்டு மக்களுக்கு எதிராக நாசகார வேலையில் ஈடுபடுவதற்கு அமெரிக்க ஏகாதிபத்தியத்தின் "ஹோப்" கப்பலைக் கொழும்புத் துறைமுகத்துக்கு வர அனுமதியளித்ததாலும் அமெரிக்க ஏகாதிபத்திய உத்தரவுகளுக்கு இந்த அரசாங்கம் அடிமைப்பட்டிருக்கின்றதென்றும் உண்மையைக் குறிப்பிடத் தவறியதையிட்டும் வருந்துகிறோம்.

எனவே இச்சபைக்கு தங்கள் அரசாங்கத்தில் நம்பிக்கையில்லை'."

"As an amendment to the Address at the end add the words :

'but regret that Your Excellency's Address at the opening of the Fourth Session of the Sixth Parliament—

(*a*) does not contain any reference to the continued stranglehold exercised on our economy by foreign imperialism despite twenty years of socalled independence ; nor to the successive steps taken by this Government to chain our economy ever more securely to the chariot wheels of foreign imperialism ;

(*b*) does not contain a correct analysis of the economic crisis—the most serious since 1929-31—that has overtaken our country and that has led to halving of the rice ration and the devaluation of the rupee on two occasions during the last year and to the consequent fantastic rise in the cost of living and the non-availability of many essential consumer goods ;

(*c*) does not contain any proposals to bring down the cost of living and afford relief to the masses or to solve the mounting problem of unemployment which has assumed serious proportions ;

(*d*) does not contain any proposals to afford relief to the workers and peasants and to the middle classes who have been badly affected by the unbearable rise in the cost of living and whose standards of living have been lowered as a consequence ;

(*e*) does not contain any proposal for the restoration of the rice-cut despite the boast of repeated record harvests for 1967 and 1968 and alleged successes of the Government's campaign to increase food production ;

(*f*) does not contain any proposal to lift the state of emergency, which has now lasted for thirty months out of the thirty-nine months during which this Government has been in power, and to restore the democratic rights of the people ;

(*g*) does not contain any systematic plan for the rapid industrialization of our country, with a view to diversifying our economy and free us from complete dependence on one or two export crops ;

(*h*) does not contain any proposals for solving the problem of lack of irrigation facilities for agriculture, which is the single biggest stumbling block in the path of Ceylon's progress to self-sufficiency in food, by nationalizing the foreign owned tea estates, re-foresting the hill-tops and solving the problem of soil erosion, dredging and deepening our rivers and enabling our rivers to carry the precious rain water, without waste, to the cultivators in the plains ;

(*i*) does not reflect any determination on the part o the Government to enforce the Prevention of Social Disabilities Act or to help in the eradication of the obnoxious system of untouchability and caste oppression that prevails in North Ceylon ;

(*j*) does not contain any relief to the problems facing the students, such as lack of lecture rooms, inadequate tutorial staff, insufficient library facilities, inadequate bursaries for needy students, the imposition of higher examination fees, appointment of non-academic administrators as vice-chancellors of universities, all of which have combined to create a sense of frustration among the students who have expressed a desire for a complete and radical change in the educational and social structure of this country ;

(*k*) does not refer to the disunity caused in the country by the attempt of the Government to honour its secret pledges to the reactionary Federal Party and which exposed the sham national unity that this Government claimed to have built—which unity was in fact only a unity between the reactionary forces among the Sinhalese and Tamils and not between the masses of both peoples ;

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

(*l*) neglects to point out the bankruptcy of bourgeois parliamentary democracy which was imposed on us by the cunning British imperialists and which, during the past 37 years, has brought no change in the system of imperialist-capitalist exploitation which continues unabated to this day ;

(*m*) does not reflect the wishes of the people of this country on the question of the unwarranted aggression of U. S. imperialism against the people of Vietnam by demanding the immediate withdrawal of U. S. and satellite troops and the disbandment and removal of their bases from South Vietnam, the complete cessation of all bombings of the Democratic Republic of Vietnam and allowing the Vietnamese people to decide their future by themselves ;

(*n*) does not reflect the truth of the subjection of this Government to the dictates of U. S. imperialism which was demonstrated by the permission given to the notorious U. S. Peace Corps, which has been exposed as an arm of the Central Intelligence Agency of the U.S.A. to return to Ceylon and the permission granted to the U.S. imperialist ship "Hope" to dock in Colombo harbour and engage in subversive activities against our people ;

and therefore this House has no confidence in your Government'".

අ. භා. 4.19

**ආර්. ජී. සේනානායක මයා.** (දඹදෙණිය)
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க—தம்பதெனிய)*
(Mr. R. G. Senanayake—Dambadeniya)

ගරු කථානායකතුමනි, මා විසින් කල් දෙන ලද සංශෝධන යෝජනා තුනක් තිබෙනවා. ඒවා සියල්ලක්ම එක පිට එක විධියට යෝජනා කරන්නට අදහස් කරනවා. යෝජනා තුනම ගැන දැන් කථා කරනවා. ඒවා ස්ථිර කරන්නට වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (සමරවීර මයා.) එකඟ වී සිටිනවා. මට මේ සංශෝධන යෝජනා තුන සම්බන්ධයෙන් එතුමාගේ සහයෝගය ලැබෙන බව කියා තිබෙනවා.

මේ රාජාසන කථාවේ විශේෂයෙන්ම කැපී පෙනෙන්නේ රටසභා ප්‍රශ්නයයි. රාජාසන කථාවේ වෙනත් ප්‍රශ්නත් තිබෙන නමුත් මුළු රටම බලාගෙන ඉන්න, මුළු රටෙහිම දැවෙන ප්‍රශ්නය රටසභා ප්‍රශ්නයයි. මේ ප්‍රශ්නය මොන ආකාරයට මතු වේදැයි මුළු රටම බලාගෙන ඉන්නවා. මුල් වතාවට මේ රටසභා ප්‍රශ්නය ගැන ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළ විට ඒ සම්බන්ධ සටන ගෙන යෑමට මෙහි සිටියේ මාත්, නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාත්, වැලිමඩ ගරු මන්ත්‍රීතුමාත් (එම්. තෙන්නකෝන් මයා.) තුමාත්, (සමරවීර මයා.) පමණයි.

රටසභා ප්‍රශ්නය ගෙන එන විට විරුද්ධ පාර්ශ්වය දුවන සිරිතක් තිබෙන බව පෙනී යනවා. මොකද මේ හොරේ? මොකද මේ පැනල යන්නේ ? යකාට දුම් මල ගැහැව්වාම දුවන්නා වාගේ පැනල යන්නේ ඇයි ? රටසභා කිව්වොත් මෙතැන විරුද්ධ පාර්ශ්වයෙන් කවුරුවත් ඉන්නේ නැහැ. පිට්ටනිවල නම් වීරයෝ, වීර සිංහයෝ. අදත් පාර්ලිමේන්තුවේ කවුරුවත් නැහැ.

මෙවැනි සංශෝධනයක් ඉදිරිපත් කර ඊට ඡන්දයක් ලබා ගන්න බලාපොරොත්තුවෙන් මා සිටියා. මේ සංශෝධන යෝජනාවට පක්ෂව ඡන්දය දෙනවාදැයි දැන ගන්නට කැමතියි. යම් යම් දැවෙන ප්‍රශ්න සම්බන්ධයෙන් සංශෝධන තුනක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. ඒවා ඉදිරිපත් කරන්නට මා අදහස් කෙළේ ඇයි ? මේ ප්‍රශ්නවලදී මට විරුද්ධ පාර්ශ්වයේ සම්පූර්ණ සහයෝගය ලැබේය යන විශ්වාසය ඇතිව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේදිකාවල මා සටන් කළා. රටසභා ප්‍රශ්නයත් ඒවායින් එකක්. මැතිවරණ කාලයේදීත්, අතුරු මැතිවරණ කාලයේදීත්, නගරසභා මැතිවරණ කාලයේදීත් යනාදි හැම අවස්ථාවකදීම පාහේ විරුද්ධ පාර්ශ්වය ඒ රැස්වීම්වලට පැමිණ සිටි ජනතාව අමතා කියා සිටියේ, "දැන් ආර්. ජී. සේනානායක මැතිතුමා රටසභා ප්‍රශ්නය, ජාතික ප්‍රශ්නය ගැන කථා කරනු ඇත" ආදි වශයෙනුයි. ඒ අනුවයි මා ඒ අවස්ථාවල කථා කෙළේ. මගේ කථාවලදී මා ඉදිරිපත් කරන ප්‍රතිපත්තිවලට මගේ පක්ෂය මට සම්පූර්ණ යන්ම සහයෝගය දෙනු ඇතැයි මා විශ්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාස කළා. ඒ විශ්වාසය හැම විටම මට තිබුණා. එයින් මට ධෛර්යයක් ලැබුණු බව මතක් කරන්නට කැමතියි.

ඔය ආකාරයට ඒ කාලයේදී කටයුතු කරගෙන ආවේ වී නමුත්, මේ ගැන මට ඒ කාලයේදීමත් එක්තරා ප්‍රමාණයක අවිශ්වාසයක්, අවිනිශ්චිත තත්ත්වයක හැඟීමක් ඇති වන්නට පටන් ගත්තා. ඇයි? මේ ප්‍රශ්නය ගැන මා පමණක් කථා කරන්නේ මොන කාරණයක් නිසාදැයි විමතියක් මා තුළ පහළ වන්නට එක්තරා අවස්ථාවක සිට පටන් ගත්තා. ඇයි, අනෙක් කවිකයන් මේ ගැන කථා කරන්නට ඉදිරිපත් නොවන්නේ ? මේ තත්ත්වය නිසා එක්තරා අවිශ්වාසයක් මට තිබුණා. අද නම් ඒ අවිශ්වාසය තහවුරු වන්නට කරුණු රාශියක් තිබෙන බව මට පෙනී යනවා. රටසභා කිව්වොත් යකාට දුම්මල වාගේ වෙනවා නේද? මේ අය එතකොටම දුවනවා මිස එන්නේ නැහැ. ටික දෙනයි දැනුත් මෙහි ඉන්නේ. මෙවැනි අවස්ථාවක වැදගත්, ප්‍රධාන පෙළේ උදවිය මෙතැන සිටිය යුතුයි නේද? මේ ප්‍රශ්නය උඩ මේ රටේ අද විශාල බලවේගයක් ඇතිවෙලා තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මේ බලවේගය ඇති කළේ, මේ සම්බන්ධයෙන් මහජනතාවගේ අදහස් අවුස්සා ගත්තේ මොන වීරයන්ද? එය කළේ මේ පුටුවල නැති වීරයන් විසින්ද කියා මා අසන්න කැමතියි. මහජනතාව අතර එවැනි මතයක් ඇති කරන්න නම් ඒ සම්බන්ධයෙන් එක්තරා සාකච්ඡාවක් මේ සභාව තුළ ඇති වෙන අවස්ථාවේදී මේ පුටු පිරී තිබෙන්න ඕනෑ නේද? නමුත් එසේ පුටු පිරී තිබුනේ නැහැ. ඒ අය මොකක්ද කළේ ? මේ සම්බන්ධයෙන් සාකච්ඡා වන අවස්ථාවේදී ඔවුන් අපට දකින්න ලැබුනේ නැහැ. ඒ අය මෙහි සිටියේ නැහැ. පිට්ටනිවලට රැස් වී විරුද්ධත්වය ප්‍රකාශ කළා මිසක් මේ ස්ථානයට පැමිණියේ නැහැ. මෙහි අපට යම්කිසි සැකයක් තිබෙනවා. උඩින් සිංහල, යටින් දෙමළද කියා අවිශ්වාසයක් අපට ඇති වී තිබෙන බව මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ රටේ රට සභා ප්‍රශ්නය මතු වීමට හේතු තිබෙනවා. මේ රටින් එක්තරා ප්‍රදේශයක පාලනය අපට ඕනෑ කියන අදහස එක්තරා කොටසකට ඇති වී තිබෙනවා. ඒ අදහස ඇති වී තිබෙන්නේ පිට උදවියගේ උසි ගැන්වීමක් උඩ බව මා ගිය වර විස්තර සහිතව කියා තිබෙනවා. යම් රටක යම් විජාතික පක්ෂයක් විසින් මේ රටේ යම් බලපෑමක් ඇති කරන්න උත්සාහ දරන වා නම්, එයට ඉඩ දෙන්න හොඳ නැහැ. ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය විසින් එවැනි උත්සාහයක් දරනවා. එවැනි පක්ෂ වල වැඩපිළිවෙලවල් සීමා කරන්න, තහනම් කරන්න, ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. ද්‍රවිඩ වර්ගයාගේ මූලික ස්ථානය වන මදුරාසියේ එවැනි පක්ෂයක් ඇති කළා. ඒ අය සම්පූර්ණයෙන්ම ජාතිවාදය උඩ දෙවරක් සටන් කර මෙවර ආණ්ඩු බලය අරගෙන තිබෙනවා. ඒ පක්ෂයේ ලැදියාව තිබෙන්නේ හැම විටම තමන්ගේ මව් රට වන ඉන්දියාවටයි, විශේෂයෙන් මදුරාසියටයි. එවැනි පක්ෂයක් විසින් මේ රටේ ශාඛා සමිති ඇති කිරීමේ කිසිම යුක්තියක් තිබෙනවාද කියා මා තමුන්නාන්සේගෙන් අහන්න කැමතියි.

අපේ දේශපාලනය අපි කරන්නේ අපේ රටේ ජනතාවටයි, අපේ රටේ ශුභසිද්ධිය සඳහායි. මේ රටේ දුක් විඳින අයගේ දුක් මකාලීමටයි අපේ දේශපාලනය කරගෙන යන්නෙ. අපේ රටේ තිබෙන ප්‍රශ්න විසඳා ගෙන කරදර නැති කිරීමටයි අපි උත්සාහ කරන්නෙ.අපි කවුරුත් මේ රටට ලැදියාවක් ඇතුවයි දේශපාලනය කරන්නෙ. අපේ මේ ප්‍රශ්න තිබෙන්නේ මේ රටේයි. අපේ ලැදියාව, බැඳීම, මේ රටටයි. ඒ නිසා අපේ රටේ දේශපාලනයට බහින හැම දෙනාගේම අදහස අපේ රටට යහපතක් කිරීමයි. අපි යම් යම් දේශපාලන මත අනුව වැඩ කරන්නේ ඒ සඳහායි.

පිටින් එන ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයකට—වෙන රටකට ලැදියාව දක්වන පිරිසකට—මේ රටේ සමිති පිහිටුවන්නට ඉඩ දෙන්න බැහැ. මේ රටේ ද්‍රවිඩ පිරිස උසිගන්වන්නේ ඒ අය විසිනුයි. තුඹලාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

රට එක්තරා විධියකට කොටස් කර ගනිල්ලා, අපේ ද්‍රවිඩ වර්ගයා සමග සම්බන්ධ වන්නට රට වෙන් කර ගැනීමට, ඉර ගසා ගැනීමට, මහන්සි ගනිල්ලා කියන අදහස දෙන්නේ ඒ අය විසිනුයි. එවැනි අදහසක් ඇතිව වැඩ කරන දේශපාලන පක්ෂයක් තිබෙනවා නම් වහාම එය තහනම් කරන්නට ඕනෑ. පෙඩරල් පක්‍ෂයට ඉණිමං තබන පක්ෂය ඒ පක්ෂයයි. ද්‍රවිඩ වර්ගයාගේ නැගීම ගැන විශේෂයෙන්ම වැඩ කරන ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයේ ශාඛා තහනම් කිරීම ඉතාමත් අවශ්‍ය දෙයක්.

ගරු කථානායකතුමනි, ඔය විධියේ ද්‍රවිඩ කම මතු කරගෙන ඉන්දියාවේ ප්‍රාන්ති ආණ්ඩුවක් වශයෙන් සිටින ද්‍රවිඩ වර්ගයා දකුණු ඉන්දියාවේ ආණ්ඩුව—ඉන්දියාවෙන් වෙන් වන්න එක්තරා අවස්ථාවකදී සූදා නම් වුණා. ඔවුන් එසේ වෙන් වන්න සිතුවේ ද්‍රවිඩකම උඩමයි. සම්පූර්ණයෙන්ම වෙනම රාජ්‍යයක් ඇති කිරීමේ අදහස උඩ එම පක්ෂය ඉන්දියාවේ මහ ආණ්ඩුවට විරුද්ධව ව්‍යාපාරයක් ගෙන ගියා. "අපි වෙන් වෙමු" කියන හැඟීමෙන් මේ ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය කටයුතු කළා. ඒ අවස්ථාවේ නේරු තුමා මොකක්ද කළේ? වහාම එතුමා විසින් නීතියක් පැනෙව්වා. රට බෙදන්න යම්කිසි පක්ෂයක් ධෛර්‍ය්‍ය දරනවා නම්, රටේ තිබෙණ ආණ්ඩු ක්‍රමය වෙනස් කර වෙනස් අන්දමක අමුතු රාජ්‍යයක් ඇති කිරීමට උත්සාහ කරනවා නම්, එය රාජ්‍ය ද්‍රෝහි වැඩක් හැටියට සලකා දඬුවම් දීම පිණිස "Unlawful Activities Act" නමැති පනතක් සම්මත කළා. ඒ පනත අනුව නීති සම්මත වුණා. ඉන් පසුව ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය, වෙන්වීමේ අදහස අත්හැර දමා ඉන්දියාවෙ ප්‍රාන්තීය ආණ්ඩුවක් ඇතුළත කරන්න තිබෙන ද්‍රවිඩ සංවර්ධනය කරන්න ඕනෑය කියන අදහස අනුව කටයුතු කර ගෙන යනවා. එසේ වුණත් අපේ රටේ තත්ත්වය මොකක්ද? අපේ රටේ ශාඛා පිහිටුවා ගෙන යන මෙම පක්‍ෂය, තමන්ගෙ මව්රට බෙදනවාය යන චේතනාව් අනුව ව්‍යාපාරයක් ගෙන ගිය විට ඒ රටේ අග මැතිවරයා කුමක්ද කළේ? එම ව්‍යාපාර යෙහි යෙදීම රාජද්‍රෝහි වරදක් වශයෙන් සලකා එම වරදකරුවන්ට දඬුවම් දීම සඳහා පනතක් ගෙනැවිත් එම පක්ෂයෙ ව්‍යාපාර නවත්වා දැමුවා. නමුත් අපේ රටේ කර තිබෙන්නේ මොකක්ද?

ෆෙඩරල් කියන නමක් මතු කරගෙන, ද්‍රවිඩ මුන්නෙත්‍ර කසාගම් කියන පක්ෂය සමග සම්බන්ධකමක් ඇතුව ප්‍රාන්තීය ආණ්ඩුවක් පිහිටුවා ගැනීම පිණිස ද්‍රවිඩ වර්ගයා එක්සත් විය යුතුය කියන හඬ නගමින් මෙම පක්ෂය ව්‍යාපාරයක් ගෙන යන අවස්ථාවේදී, අපි ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයට තැනක් දෙනවා නම්—එය දියුණුකරන්න උපකාර කරන පෙඩරල් පක්ෂයට, තමිල් අරසු කච්චි කියන පක්ෂයට තැනක් දීමට ක්‍රියා කරනවා නම්—අප අතින් නියම ජාතික යුතුකම ඉටු වනවාද කියා අහන්න කැමතියි. එම නිසා පෙඩරල් පක්ෂය ඉල්ලන ආකාරයට පෙඩරල් ක්‍රමයේ පාලනයක් දෙන්න අදහසක් නැති නම්, පෙඩරල් පක්ෂයට උල්පන්දම් දෙන, උදව් උපකාර කරන, ඉණිමං බඳින ද්‍රවිඩ මුනනේත්‍ර කසාගම් පක්ෂය—අපේ රටට අයත් නැති පක්ෂයක් නිසා—වහාම තහනම් කළ යුතුය කියා මේ අවස්ථාවේදී මා තරයේ ප්‍රකාශ කර සිටිනවා. නමුත් ඒ පියවර මේ ආණ්ඩුව ගන්නවාද? අද වන තුරු කිසිම පියවරක් ගෙන නැහැ. ඒ වෙනුවට එහි සිටින ද්‍රවිඩ නායකයන් මෙරටට එන විට ඔවුන් ආණ්ඩුවේ ප්‍රධාන අමුත්තන් වශයෙන් පිළිගන්නවා.

ඉන්දියාවෙන් මෑතකදී පැමිණි රාම චන්ද්‍රන් නැමති නළුවාට ආණ්ඩුව විශේෂ තැනක් දී, විශාල ගෞරවයකින් පිළිගනු ලැබුවා. ඔය අන්දමට රජයෙන් පවා සංග්‍රහ විඳින විට, ඔය අන්දමට තැන දෙන විට, ගෞරව පුද කරන කොට—රාම චන්ද්‍රන් වැනි අයට චිත්‍රපටි මගින් දින පතා මේ රටේ විශාල බලවේගයක් ගොඩ නංවන්න ඉඩ ලබා දෙන විට—ද්‍රවිඩ මතය දියුණු කරන්න එය ඉඩ ලබාදීමක් නොවේද, එය උදව් උපකාර කිරීමක් නොවේද කියා ප්‍රශ්න කරන්න කැමතියි. එහෙනම් අපේ ජාතිය සමග හැප්පෙන ආකාරයට, ජාතිභේද ඇති වන ආකාරයට, වර්ගයන් අතරෙ ලේ වැගිරීම් ඇති වන තැනට කටයුතු යෙදී යන බව පෙනෙනවා නම්, එක් එක් අය ගැටී මැරෙනතුරු බලා සිටින්නෙ නැතුව ඉක්මනින් පියවර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැනීම රජයේ යුතුකමක් නොවේද? නමුත් සිදු වන්නෙ මොකක්ද? ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂය තහනම් කරනවා වෙනුවට ආණ්ඩුවත් ඒ අයගේ පැත්තට ගොස් ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයෙ නායකයන් වන රාමචන්ද්‍රන් වැනි අයට විශේෂ තැනක් ලබාදෙනවා; ඔහුගේ යුදකාමී, රණකාමී මත චිත්‍ර පට මගින් පතුරුවා හැරීමට, ද්‍රවිඩ මතය ලංකාව තුළ පතුරුවා හැරීමට අවසථාවක් දෙනවා පමණක් නොව එබඳු තැනැත්තන් උසස් ලෙස, රාජගෞරවය ඇතුව පිළිගන්නවා. එය ආණ්ඩුවක යුතුකමක්ද කියා මා ප්‍රශ්න කරන්න කැමතියි. ඒ අය එබඳු ආකාරයකට පිළිගන්නවා නම් වෙනම පාලනයක් ඕනෑය, "තමිල් අරසු කච්චි" ඕනෑය කියා මතයක් ඇති වීම පුදුමයක් නොවෙයි.

ගරු කථානායකතුමනි, මේ අන්දමට සීමාවක් නැතුව, ද්‍රවිඩ වර්ගයා වෙනුවෙන් කැපවුණු ද්‍රවිඩ චිත්‍රපටි, ඔවුන්ගේ රණකාමිත්වය දැක්වෙන චිත්‍රපටි, ඔවුන්ගේ සාහිත්‍යය, කලාව පතුරුවා හරින චිත්‍රපටි, පොත්පත් මේ රටට ගලා එන්න ඉඩ දෙනවා. ඒ උදවියගේ චිත්‍ර පටි ඕනෑ තරම්, සීමාවක් නැතුව මේ රටට ගෙන්වන්න පුළුවන්කම ඇතත් අපේ රටේ නිෂ්පාදනය කරන චිත්‍රපටි පිටපත් හයකට වඩා වැඩියෙන් නිපදවීමට බැරි වන අන්දමට රජය කටයුතු යොදා තිබෙනවා. ඒ අන්දමින් රටේ ජනතාවගේ දියුණුව පුළුවන්තරම් අඩු කිරීමට වීරිය කරන බව පෙනෙනවා. මදුරාසියෙන් එන ද්‍රවිඩ බල වේග සීමාවක් නැතිව දියුණු කරන්නට ඉඩදීම යුතුද? හැප්පීම්වලට තුඩුදෙන ව්‍යාපාරවලට ඉඩ දීම පමණක් නොවෙයි ප්‍රශ්නය. දේශීය කර්මාන්තයක නැඟීමට වදින පහර මැඩලීමට මේ අවස්ථාවේදී විශේෂ උත්සාහයක් ගන්නට ඕනෑ නේද? අප මේ අන්දමට විදේශීය ද්‍රවිඩ මතයට සලකන නමුත් අපේ යම්කිසි සංස්කෘතික බලපෑමක් හෝ අපේ යම් අදහසක් ඉන්දියාවට යනවා නම් එයින් තමන්ගේ සංස්කෘතිය රැක ගන්නට ඉන්දියාව ගන්නා පියවර ගැන ටිකක් බලන්න. ඉන්දියාවේ ගුවන් විදුලිය භාරව කේෂ්කර් කියා ඇමති කෙනෙක් හිටියා. මේ රටේ අපේ වෙළඳ ගුවන් විදුලියෙන් ප්‍රචාරය කළ වාදන හා සිංදු ආදියෙන් ඉන්දියාවට අයහපතක් වෙනවාය කියා ඔහු කළේ කුමක්ද? ඒ මගින් අපට යම් ආදායමක් ඉන්දියාවෙන් ලැබුණා. කේෂ්කර් කියා හිටියා අපේ ඒ ගුවන් විදුලි ප්‍රචාරයට ඔවුන් සම්පූර්ණයෙන්ම විරුද්ධය, එයට හේතුව ඔවුන්ගේ සංස්කෘතියට විරුද්ධ සිංදු ලංකා වෙළඳ ගුවන් විදුලියෙන් ප්‍රචාරය වීමය කියා. ඒ රට කිළිටි වන අන්දමේ, බටහිර ශිෂ්ටාචාරයට ඔබින ආකාරයේ වාදන හා සින්දු ප්‍රචාරය වෙනවාය, එම නිසා වෙළඳ ගුවන් විදුලි ප්‍රචාරයන් සඳහා ලංකාවට සතයක්වත් එවීම සම්පූර්ණයෙන්ම තහනම් කරනවාය කියා ඉන්දියා ආණ්ඩුව එසේ කළා. අපේ ගුවන් විදුලියෙන් සංගීත හෝ වාදන ප්‍රචාරය වන විට එය ලංකාව ඇතුළේ පමණක් නොවෙයි මුළු ලෝකයේ සෑම තැනකටම යන බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ ප්‍රචාරය මගින් යම් යම් වෙළඳ දැන්වීම් ප්‍රසිද්ධ කර අපි ඉන්දියාවෙන් මුදලක් ලබා ගත්තා. අපේ වෙළඳ දැන්වීම් සඳහා මුදල් එවීමට ඉන්දියාවේ ඇතැම් අය සූදානම්ව සිටියා. එහෙත් කේෂ්කර් කිව්වා නුඹලාගේ සිංදු අපේ රටේ රේඩියෝ මගින් ප්‍රචාරය වන විට අපේ සංස්කෘතියට පහර වදින නිසා නුඹලාගේ ඔය ගුවන් විදුලි ප්‍රචාර සඳහා අපේ රටෙන් තුට්ටුවක්වත් ලබාගන්නට නොහැකිවන අන්දමට නීති සකස් කරනවාය කියා. එමෙන්ම ඔවුන් එසේ කළා. ඒ මගින් කේෂ්කර් තමන්ගේ ඉන්දියානු ගතිය රැක ගන්නට උත්සාහ කළා. එහෙත් අපේ රටේ තිබෙන ජාතික සංස්කෘතිය ගිල ගන්නට මේ රජය ඉන්දියාවට සම්පූර්ණයෙන්ම ඉඩ දී තිබෙන බව මා මතක් කරන්නට කැමතියි. කේෂ්කර් තම රටේ සංස්කෘතිය රැක ගන්නට යම් පියවරක් ගත්තා නම් අපත් ඒ ආකාරයටම අපේ සංස්කෘතිය රැක ගන්නට යම් ක්‍රියාමාර්ගයක් ගන්නට ඕනෑ නේද? ඉන්දියානු බලවේගයෙන් අපේ සංස්කෘතියත්, අපේ ජාතියත්, අපේ භාෂාවත් කිළිටි නොවන තත්ත්වයක් ඇති කරන්නට පියවර ගන්නා හැටියට මා මේ ආණ්ඩුවෙන් තරයේ ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

ගරු කථානායකතුමනි, මේ රටසභා ක්‍රමයට යටින් තිබෙන බලපෑම ගැන මා තමුන්නාන්සේට මතක් කළා. එපමණක් නොවෙයි, මේ රටසභා ක්‍රමය අනුව දැන් කරන්නට උත්සාහ කරන දේ ගැන බලන විට අපට පෙනී යන්නේ කුමක්ද? වෙනම රාජ්‍යයක් වශයෙන් යම් දවසක උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ ලබා ගැනීමට ඔවුන් දරන තැත එසේම තිබෙන බව මේ ගරු සභාවේදීත් කියන්නට යෙදුණා. එදා රටසභා ධවල පත්‍රිකාව ගැන පැවැති විවාදයේදී ෆේඩරල් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් තම කථාවේදී කිව්වා—තමුන්නාන්සේටත් ඇහෙන්න ඇති—ඔවුන් පතන්නේ ප්‍රාන්තීය ආණ්ඩුවක්ය, අමෙරිකාවේ තිබෙන අන්දමේ ප්‍රාන්තීය ආණ්ඩුවක්ය කියා. ගම්සභාවක තරම්වත් බලතල නැති එකක්ය කියා ගරු අගමැතිතුමා කිවත් එවැන්නකින් සතුටට පත් වන අය නොවෙයි, ෆේඩරල් පක්ෂයේ සිටින්නේ. තමන්ගේ අරමුණ ප්‍රාන්තීය ආණ්ඩු ක්‍රමයක් ලබා ගැනීම බව ඔවුන් මේ ගරු සභාවේදීම ප්‍රකාශ කර තිබෙනවා. ඒ ප්‍රකාශ හැන්සාඩ් වාර්තා ගත වී තිබෙනවා. එසේ ඔවුන් ප්‍රාන්තීය ආණ්ඩු ලබා ගන්නා අවස්ථාවේදී, ඒවායේ ඉඩම් ප්‍රමාණයට අයත් වන වෙරළ දෙසත් අප බලන්නට ඕනෑ. ගොවිතැන සඳහා පාවිච්චි කරන්නට පුළුවන් විශාල ඉඩම් කොටසක් තිබුණත්, දෙමළ තර්ජනය නිසා අද ඒ සංවර්ධනය නවත්වා තිබෙනවා.

මා කලින් සඳහන් කළ වෙරළ දිගේ තිබෙන මුහුද "දෙමළ මුහුද" යනුවෙන් හිමි කරගෙන, එය දෙමළ ධීවර කාර්මික යන්ටම සීමා කර ගන්නට මේ දිසා සභා අනුව පුළුවන්කම ලැබෙන බව මතක් කරන්නට කැමැතියි. ගම් සභාවකට තරම් වත් බලතල නැතැයි කියන මේ දිසා සභා වලට විශේෂයෙන් පවරා දී තිබෙන බල තල දිහා බලමු:

Loans to fishermen for purchase of mechanical boats and for mechanizing local crafts.

Establishment and maintenance of ice plants and salt stores.

Establishment and maintenance of fisheries training centres.

Development of inland fisheries.

Construction of fisheries roads, navigational aids and removal of obstructions.

Housing schemes for fishermen.

කොයි තරම් දුරට ඒ පළාත්වල දෙමළ ධීවර කාර්මිකයන්ට උපකාර වන ආකාර යට මේ දිසා සභාවලට, ඉතාමත් දුප්පත්, දිළිඳු, සීමිත දිසා සභාවලට බලතල පවරා දී තිබෙනවාදැයි පෙනෙනවා නේද?

කථානායකතුමනි, තමුන්නාන්සේ හලාවත ගරු මන්ත්‍රීතුමා වශයෙන් දන්නවා ඇති, අපේ ධීවර කාර්මිකයන් ලංකාව වටාම වාගේ මුහුද දිගේ ගොස් ධීවර කර්මාන්තයෙන් ජීවත් වන බව. මේ ළඟකදී, මීගමුව ආදී පළාත්වල ධීවර කාර්මිකයන් පැරණි පුරුද්දට මන්නාරම් මූදට ගිය විට, එතැන ඉන්නා "පාම් බට්ටයා" කියන මාළු මුදලාලි අර අයගේ දැල් සේරම කපා ඔවුන් පන්නා ගත් හැටි තමුන්නාන්සේත් දන්නවා ඇති. මන්නාරම් මුහුද "දෙමළ මුහුද" කියා, ඒ මුහුදට එන්න එපාය කියා අර අය පන්නා ගෙන තිබෙනවා. තවම ඉරි ගසා, රට බෙදා නැහැ. දිසා සභා පනත තවම ක්‍රියාත්මක කර නැහැ. එවැනි තත්ත්වයක් තිබියදීත් අපේ ධීවර කාර්මිකයන්ට මන්නාරම් මුහුද තහනම් කළා නම්, දිසා සභා ක්‍රියාත්මක කළොත්, ඒ ප්‍රදේශය ඔවුන්ටම භාර දුන්නොත්, කච්චදූවේ සිට මුළු යාපනය වටාම ගිහින් ත්‍රිකුණාමලය මඩකලපුව හා කිරින්ද දක්වා මුළු වෙරළම ඒ බෙදිල්ලට අහු වෙනවා නේද? රටේ වෙරළෙන් තුනෙන් දෙපංගුවක්ම අයිති වන්නේ "යාපනයේ මුහුදට" නැත්නම් "දෙමළ මුහුදට" නේද?

එතකොට කුමක් වේවිද? අපේ සිංහල යන් මඩකලපුවට ගිහින් මාළු වාඩි ගහන්නට උත්සාහ කරන විට එයට අවසරය ලැබෙයිද? ඒ අය අල්ලන මාළු අයිස් දමන්න වෙනවා. දිසා සභා ධවල පත්‍රිකාව අනුව, ඒ සේරම කටයුතු පවරා දී තිබෙන්නේ දිසා සභාවලටයි. එහෙම නම් අපේ සිංහලයන්ට ඒ අයගෙන් අයිස් ලැබෙයිද? ඒ වාගේම, ලුණු ගබඩා ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමේ බලයත් දිසා සභාවලට පැවරී තිබෙනවා. එහෙම නම් අපේ සිංහලයන්ට ඒ අයගෙන් ලුණු ලබා ගන්නට පුළුවන් වෙයිද ? මේ හැම දෙයක්ම පිළිබඳ පාලනය දිසා සභාවලට දී මහ ආණ්ඩුව ඒ වගකීම් වලින් ඉවත් වෙන්නට යනවා. දැනට මත් තිබෙන තත්ත්වය අප දන්නා නිසා, දිසා සභා ක්‍රියාත්මක වූ පසු අපේ සිංහලයන් දෙමළ පළාත්වලට ගිහින් " මට අර ලුණු ගබඩාවෙන් මෙපමණ ලුණු ඕනෑ, මේ අයිස් ගබඩාවෙන් මෙපමණ අයිස් ඕනෑ, මට අතන වාඩිය ගසාගන්න ඕනෑ " කීවාම, ඔවුන්ගේ ඒ ඉල්ලීම් ඉෂ්ට කර ගන්න පුළුවන්කම ලැබෙයිද ? අවසරයක් ඕනෑ නම් වාඩියක් ගහගන්නට කවුද ඒ අවසරය දෙන්නෙ ? ලුණු වුවමනා කරනවා නම් ලුණු ගබඩා කා යටතේද තිබෙන්නෙ ? මාලු ටික කොළඹට එවන්න අයිස් දැමිය යුතු නම්, අයිස් වුවමනා නම් ඒ අයිස් ගබඩා කා යටතේද පාලනය වෙන්නෙ ? එම නිසා රටසභා ඇති කළොත් ධීවර කාර්මිකයන්ටත් විශාල පහරක් වදින බව මා පෙන්වා දෙන්නට සතුටුයි.

අවුරුද්දේ එක් කාලයකදී එනම් වාරකං කාලයේදී මුහුදු යන්නට බැහැ. දූන් එක් පැත්තක වාරකං කාලය නම් අනික් පැත්තේ මුහුද නිශ්චල බව කවුරුත් දන්නවා. එම නිසා බස්නාහිර පළාතේ, දකුණේ, වාරකං තිබෙන විට අපේ ධීවර කාර්මිකයින් උතුරු නැගෙනහිර පළාත් වලට යන සිරිතක් තිබෙනවා. ධීවර කාර්මිකයාට අවුරුද්ද මුළුල්ලේම රක්ෂාව තිබෙන්නේ එම නිසයි. මෙහෙ මුහුද නිශ්චල කාලයේදී මෙහෙ මාලු අල්ලනවා. මෙහෙ වාරකං නම්, මෙහෙ මුහුදු යෑම දුෂ්කර නම්, අනික් පැත්තට ගොස් එහෙ මාලු අල්ලනවා. නමුත් දැන් මා කියන විධියේ තහනමක් ඇති වුණොත් සිංහල ධීවර කාර්මිකයන්ට තිබෙන්නේ ලංකාවේ එක පැත්තක මුහුද පමණයි. පුත්තලමේ සිට දෙවුන්දර, කිරින්ද දක්වා වූ මුහුද පමණයි අපේ සිංහල වගීයාට ලැබෙන්නෙ. එතැනින් එහාට දෙමළ මුහුදයි. එතැනින් එහාට තිබෙන මුහුදේ මාලු ඇල්ලීම දෙමළ ධීවර කාර්මිකයන්ට පමණයි. යම් හෙයකින් රටසභා ඇති කළොත් එවැනි තත්ත්වයක් ඇති වන බව ස්ථිරයි. එවැනි තත්ත්වයක් ඇති වුණත් දෙමළ ධීවර කාර්මිකයන්ට අමාරුවක් නැහැ. අමාරුව සිංහල ධීවර කාර්මිකයන්ටයි. මක්නිසාද ? මන්නාරමේ වාරකං නම් කිරින්දෙන් එහා හරියට එනවා. කිරින්ද හරියේ වාරකං නම් මන්නාරමට යනවා. එම නිසා තහනමක් ඇති වුණත් දෙමළ ධීවර කාර්මිකයාට අවුරුද්ද මුළුල්ලේම තම කර්මාන්තයේ යෙදෙන්නට අවසථාව තිබෙනවා. නමුත් සිංහල ධීවර කාර්මිකයාට තිබෙන්නේ පුත්තලමේ සිට කිරින්ද දක්වා වූ මුහුද පමණයි. වාරකං කාලයේදී වාරකං නැති ප්‍රදේශයකට ගොස් මාලු ඇල්ලීමට ඔහුට අවසථාවක් නැහැ. එතකොට මෙහෙ වාරකං කාලයේදී අපේ ධීවර කාර්මිකයාට බඩගින්නෙ මැරෙන්නට සිද්ධ වෙනවා.

දැන් සමහර විට අපේ සහෝදර ජනතාවක් එහෙම කරයිද කියා තමුන්නාන්සේ කල්පනා කරන්නට පුළුවනි. මුහුද කාටත් පොදු වස්තුවක්, එහෙම කරයිද, කියා කල්පනා කරන්නට පුළුවනි. ඒකටත් මා පිළිතුරු දෙන්නට සතුටුයි. මේ වගා නොකළ කැලෑ ඉඩම් ගැන බලන්න. උතුරු නැගෙනහිර ප්‍රදේශයේ වගා නොකළ කැලෑ ඉඩම් අක්කර දහස් ගණන් තිබෙනවා. නමුත් ඒ ඉඩම්වල අපේ උදවිය නැහැ. ගොවි ජනපද නැහැ. අපගේ ඉල්ලීම උඩ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයේ ගොවි ජනපද ඇති නොකළාය, ඒ ගැන අප ස්තුති කරනවාය කියා මේ ගරු සභාවේදී මන්ත්‍රීවරුන් දෙදෙනෙකු කථා කළා. කැලෑ පෙදෙස් හැටියට තිබුණත් ඒවා මහජනයාට දෙන්න එපාය කියා කළ දෙමළ තර්ජනයක් උඩ ආණ්ඩු දෙකක්ම ක්‍රියා කළාය කියා ඒ මන්ත්‍රීවරුන් ස්තුති කළා. උතුරු සහ නැගෙනහිර පළාත්වල ගොවි ජනපද ඇති නොකරන්නේ මක්නිසාද යන ප්‍රශ්නය මා දැනුත් ඉදිරිපත් කරනවා. නමුත් දෙමළ තර්ජනය නිසා ඒ ප්‍රදේශවල ගොවි ජනපද ඇති කරන්නේ නැහැ. ඒ ප්‍රදේශවල තිබෙන කැලෑ ඉඩම්වත් වගාවට ගන්නට බැරි නම් මුහුද ගැනත් අපට ඒ ආකාරයටම නොසලකයිද ? මුහුද ගැනත් එවැනිම තත්ත්වයක් ඇති වෙනවා. මුහුදටත් ඒ තහනම එනවා.

මේ ඉඩම් නිකම් කැලෑවට තිබුණත් කමක් නැත, නමුත් සිංහලයින්ට එන්නට ඉඩ හරින්නට එපාය කියා කළ තර්

[ආර්. ජී. සේනානායක මයා.]

ජනය උඩ ආණ්ඩු දෙකක්ම අද වන තුරු ක්‍රියා නොකළා නම්, අනික් දේවල් ගැන කුමට කියනවාද? මට මතක හැටියට ඒ ස්තුති කළ මන්ත්‍රීවරුන්ගෙන් වඩ්ඩුක් කොඩ්ඩයිහි ගරු මන්ත්‍රීතුමා (අමිර්ත ලිංගම් මයා.) එක් කෙනෙක්. බලන්න, මේක විශාල අසාධාරණයක් නේද? සිංහලයින් සිටින ප්‍රදේශවලින් හෝ වේවා, වෙනත් ජාතීන් සිටින ප්‍රදේශ වලින් හෝ වේවා, ජනගහනය තදබද ප්‍රදේශවලින් තෝරා ගන්න අය නේද මේ ගොවි ජනපදවලට යවන්නෙ? ජන ගහනය තදබද ප්‍රදේශවලින් පවුල් යවන්නේ ඒ තදබද ප්‍රදේශයේ ජන ගහනය තුනී කරන අතරම යවන උදවිය ටත් යහපතක් කිරීම සඳහා නේද? එය පොදුවේ මනුෂ්‍ය වර්ගයාට කරන යහ පතක් නේද? රවේත් ජාතියේත් යහ පතට කරන වැඩක් නේද? නමුත් ඒකට වත් ඉඩක් දෙනවාද? කැලෑ ඉඩම් කැලෑ හැටියටම තිබුණාවේ, සිංහලයින් එපාය කියනවා. ඒ කීමට කීකරුව ආණ්ඩු දෙකක්ම ක්‍රියා කර තිබෙන බව මා දැන ගත්තේ ඊයෙ පෙරේදායි. එම නිසා මෙහි තිබෙන භයානකකම තමුන්නාන්සේලාට දැන්වත් පෙනෙනවා ඇති. ගරු අගමැති තුමාගේ සිතේ නම් මේ ගැන කිසි කරදර යක් නැති බව මා දන්නවා. මේක ඉතා මත්ම සුළු දෙයක් බවයි, නගර සභාවකට තිබෙන බලතලවත් මේකට නැති බවයි එතුමා නිතර කියන්නේ. තවත් කෙනෙක් මේක හිස් බෝතලයක් කියනවා. හිස් බෝතලයක් නිසා මේකෙන් පලක් නැත කියනවා. එහෙත් මේ හිස් බෝතලය පිරෙන හැටි මම කියන්නම්. හිස් බෝතලය පුරවා ගැනීම බොහොම ලේසියි. එක දෙමළ මන්ත්‍රීවර යකුවත් කට අරින්නෙ නැතුව බෝතලය පුරවා ගන්නට පුළුවන්. ඒ කොහොමද?

රට සභා ඇති කරන විට ඇති කරන්නෙ උතුරු සහ නැගෙනහිර පළාත්වල පම ණක් නොවෙයි. අපේ පළාත්වලත් රට සභා ඇති කරනවා. ගාල්ල, මාතර පළාත් වලත් රට සභා ඇති කරනවා. ගරු අගමැති තුමා රට සභා දෙන්නට යන්නේ, පෙට්ටියේ දමා තද කරලා මිරිකලයි. ඕක පළල් කරන් නට බැහැ. නිකම් ඒ විධියටම තබා ගනීවිය කියන විශ්වාසය උඩ දියුණු කරන්නට බැරි ආකාරයටයි දෙන්නේ. එහෙත් ගාල්ලේ තිබෙන රට සභාව ගැන සීමාව දකින විට ගාල්ලේ උදවිය සතුටු වෙයිද? මාතර තිබෙන රට සභාව ගැන සීමාව දකින විට මාතර උදවිය සතුටු වෙයිද? මේ හිස් බෝතලය අපට මොන වාටද කියා ඒ අය වැඩිපුර බලතල ඉල්ල නවා නේද? අපට අසවල් බලතලය වැඩි පුර දෙන්නය, අසවල් ආකාරයට පාසල් ටික අපට භාර දෙන්නය කියා ඉල්ලන් නට පුළුවන් නේද? ඔය ආකාරයට රට සභාවල බලතල පළල් කර ගැනීමට සිංහල රට සභාවලින් උත්සාහ දැරීම සිකුරු බව මා මතක් කරන්නට සතුටුයි. සිංහල පළාත්වල රට සභා පුළුල් කරන්නට, පුළුල් කරන්නට යාපනයේ බෝතලේ නිකම්ම පිරෙනවා; මඩකලපුවේ බෝතලේ නිකම්ම පිරෙනවා. අන්න ඒක අප හිතේ තබා ගන්නට ඕනෑ. අප මහි නුයි, මේක පළල් වන්නේ. බෝතලය පුරවන්නට අපට හඬ නගන්නට සිදු වන බව කව්රුත් පිළිගන්නට ඕනෑ. ඒ නිසා ඒ උදවියගේ ඉලක්කය අනුව ක්‍රියා කරන්නට ඒ උදවියට ඉඩ ලැබෙන බව තමුන්නාන්සේට පෙන්වා දෙන්නට ඕනෑ. මේක මෙතැනින් නවතින දෙයක් නොවෙයි. ඒ බෝතල් පුරවා ගන්නට ඒ උදවියට මාර්ගය සැලසෙනවා, මේක සම්මත කර දුන්නොත්. ඒ නිසා ඒ කාරණය ගැන මා විශේෂයෙන් මතක් කරන්නට කැමතියි.

රට සභා යටතේ එහි සංස්කෘතික අංශයට උතුරු නැගෙනහිර ප්‍රදේශවල ආගමික කටයුතු සියල්ලත් පැවරෙනවා. ඒ ප්‍රදේශයෙහි තිබෙන්නේ පුදුම විධියේ සංස්කෘතියක්. එහි හරිජනයන්ට දෙනු ලබන දඬුවම තමුන්නාන්සේ දන්නවා. ඒ පළාතේ හරිජන වර්ගයා අතර "කෝවියාර්" නමින් හැඳින්වෙන කොට සක් සිටිනවා.

ඒ. අමිර්තලින්ගම් මයා. (වඩ්ඩුක් කොඩෙයි)

(திரு. எ. அமிர்தலிங்கம்—வட்டுக் கோட்டை)

(Mr. A. Amirthalingam—Vaddukoddai)

Koviars are not Harijans. They are with the people who are actually suppressing the Harijans. They are also high-caste people.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)

Then you are suppressing the Koviars and the Koviars are suppressing the Harijans. කෝවියාර්වරුන්ගේ කතන්දරය මම තමුන්නාන්සේට කියන්නම්. මේ උදවිය කවුද, කොහෙන් පැමිණි අයද යනාදී විස්තර මා ඒ ප්‍රදේශවල මන්ත්‍රීවරුන්ගෙන් ඇහුවා. මට පිළිතුරු ලැබුණේ මේ විධියටයි : "කෝවියාර්වරුන්, දෙමළ රජවරුන් ඒ පළාත් අල්ලා ගන්නා කාලයේදී එහි සිටි ජනතාවයි ; ඒ උදවිය අපේ 'සර්ෆ්ස්" හෙවත් වහල්ලුයි ; අපේ රජවරුන්ගේ පයට පැගුණු පිරිසයි." ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මේ පිරිස කවුද ? ඒ කාලයේදී එහි සිටි සිංහල ගැමියන් හෙවත් සිංහල ගොවියනුයි. සිංහල ගොවියාට ගිය කල දසාව පෙනෙනවා නේද ? දෙමළ පාලනය යටතේ අපේ සිංහල ගොවියා "කෝවියාර්" යනුවෙන් නම් කොට පෑගෙන සුළු ජන කොටසක් බවට පත් වුණා. රටසභාවලින් ලැබෙන බලතල යටතේ යම් දවසක මේ දෙමළ තර්ජනය මුළු රටේම පැතුරුණොත් අපත් "කෝවියාර්" වරුන් වෙනවාට කිසිම සැකයක් නැහැ නේද ?

ඒ පළාතේ තිබෙන්නේ පුදුම විධියේ සංස්කෘතියක්. හරිජන කොටස්වලට අයත් මිනිහකුට අනෙක් අය වතුර ටිකක් වත් නොදෙන බව මට දැනගන්නට ලැබුණා. මොන තරම් අශීලාචාරකමක්ද ? යම් කෙනකු හරකකු ඇති කරනොත් ඌටත් වතුර ටික වුවමනා වේලාවට බොන්නට දෙන සිරිතක් සිංහල ප්‍රදේශවල තිබෙනවා. එහෙත් මේ මිනිසුන්ට තිබෙන්නේ තමන්ට බලය ලැබෙන විට සුළු ජන කොටස් පාගන සංස්කෘතියක්. මුස්ලිම් ජනතාව රටසභාවලට විරුද්ධ වීමේ හේතුව කුමක්ද ? ඔය පෑගීමේ ප්‍රතිපත්තියයි. සිංහල ගොවියා ඊට විරුද්ධ වන්නේ මොන හේතුවක් නිසාදැයි ඔවුන්ගෙන් අහන්න. දෙමළ පාලනයක් යටතේ ඔවුන්ට සැපසේ ජීවත් වන්නට පුළුවන්ද ? මෙහි තිබෙන භයානකකම මෙකී කරුණු අනුව තමුන්නාන්සේට පෙනෙනවා නේද ? මනුෂ්‍ය යුතුකම් මේ උදවියට ගැළපෙන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තිබියදී, අපේ නාගදීපයත් සේරුවාවිලත් රට සභා යටතේ ඇති වන සංස්කෘතික ආයතනවලට බාර දිය හැකිද ? බෞද්ධ විහාරස්ථාන වශයෙන් ඒ ප්‍රදේශයෙහි දැනට අපට ඉතිරිව තිබෙන්නේ නාගදීපයත් සේරුවාවිලත් පමණයි.

තිරියාය පන්සලට මා ඊයේ පෙරෙයිදා ගියා. තපස්සු, භල්ලුක යන වෙළඳ සහෝදරයන් දෙදෙනා විසින් සාදන ලද ඒ පන්සල අනුරාධපුරයටත් වඩා පැරණියි. එහි පැරණි ගල් කණු තවම තිබෙනවා. මගේ ඇසින් දුටු දේ කියනවා මිස කිසි යම් ඇවිස්සීමක් කිරීමේ අදහසක් මෙහි නැහැ. පන්සලේ තිබෙන ගල් කණු ඒ අසළ තිබෙන කෝවිලේත් තිබෙනවා. මේ පන්සල තපස්සු භල්ලුක සහෝදරයන් දෙදෙනා විසින් සෑදූ බව ඉතිහාසයෙහි සඳහන් වෙනවා. පන්සලේ තිබුණ ගල් කණු කෝවිලට ගියේ කොහොමද ? කෝවිලත් තපස්සු භල්ලුක දෙදෙනා විසින් සෑදූ එකක්යයි කෙනකුට එයින් සැකයක් ඇති වෙනවා. කථානායකතුමනි, ඔය ප්‍රදේශයේ පන්සල් තිබුණේ ඔපමණක් නොවෙයි. අපේ ශිලා ලේඛනවල සඳහන් වන කරුණු බැලුවොත් තමුන්නාන්සේ පුදුමයට පත් වෙයි. හැතැප්ම තුනෙන් තුනට එහි පන්සල් තිබුණු බව ශිලා ලේඛනවල සඳහන් වෙනවා. ඒ කාලයේදී එහි සිංහල බෞද්ධ රාජ්‍යයක් පැවතුණා. එහෙත් අද එහි තත්ත්වය කොහොමද ? බෞද්ධයන් වෙනුවෙන් අද ඉතිරි වී තිබෙන්නේ නාගදීපයත් සේරුවාවිලත් පමණයි. ඒ දෙකත්, මනුෂ්‍ය යුතුකම් නොදන්නා පිරිසකට බාර දෙන්නට පුළුවන්ද ? මනුෂ්‍යයකුට වතුර ටිකක් දෙන්නේ නැති උදවියට අපේ සංස්කෘතිය, අපේ බෞද්ධ ආයතන භාර දිය හැකිදැයි මා අහන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්නට පෙර මා තව කාරණයක් මතක් කරන්නට ඕනෑ. සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා වර්තමාන ගරු අගමැතිතුමා විසින් පනතක් මෙම ගරු සභාවට ඉදිරිපත් කොට සාකච්ඡා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

කරන ලද අවස්ථාවේදී වර්තමාන අගමැතිතුමාත්, බණ්ඩාරනායක මැතිනියත් යන දෙදෙනාම කියා සිටියේ අලුතෙන් රටවැසිකම දෙන ඉන්දියානුවන් සඳහා වෙනම ඡන්ද ලේඛනයක් සකස් කරන බවයි. උඩරට ජනතාව බේරා ගැනීම සඳහා දෙවැනි ඡන්ද ලේඛනයක් ඇති කළ යුතු බවට මේ දෙදෙනාම එකඟ වුණා. ඒ අය දුන් පොරොන්දු හැන්සාඩ් වාර්තාවේ සටහන් වී තිබෙනවා. එහෙත් ඒ දෙවැනි ලේඛනයක් ගැන සඳහන් වගන්තියක් මෙම රාජාසන කථාවේ අඩංගු නොවීම ගැන මා කනගාටු වෙනවා. එදා ඉන්දියානු ප්‍රශ්නය සම්බන්ධයෙන් මෙම ගරු සභාවේදී ඉතාමත්ම දීර්ඝ සාකච්ඡාවක් ඇති වුණා. මුළු දවල් දවස තිස්සේත් රෑ තිස්සේත් රැස්වී ඒ ප්‍රශ්නය ගැන සාකච්ඡා කළා. ඒ තරම් දිග හැන්සාඩ් වාර්තාවක් වෙනත් නැතැයි මා කල්පනා කරනවා. එහෙත් මේ රාජාසන කථාවේ ඒ ප්‍රශ්නය ගැනවත්, ඒ ඉහතින් සඳහන් කළ දෙදෙනා පොරොන්දු වූ කාරණය ගැනවත් වචනයක්වත් සඳහන් වන්නේ නැහැ. දැන් තිබෙන්නේ මොකක්ද ? සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමද ? ඩඩ්ලි-තොන්ඩමන් ගිවිසුමද ? කෙසේ වුණත් ඩඩ්ලි, සිරිමා යන මේ දෙදෙනාම දෙවැනි ඡන්ද ලේඛනයක් ඇති කරන බවට පොරොන්දු වුණා. එහෙත් ඇයි ඒ ගැන වචනයක්වත් මේ රාජාසන කථාවේ සඳහන් නොකෙළේ ? තමන් එක්සත් ජාතික පක්ෂයට මේ වර ආසන 14 ක් ලබා දුන්නා යයි මගේ මිත්‍ර පත් කරන ලද මන්ත්‍රී තොන්ඩමන් මහතා කීවා. 1,35,000 ක් වූ පුරවැසිකම් ලැබූ ඉන්දියානුවන් නිසා එතුමාට ආසන 14 ක් ලබා ගන්නට පුළුවන් වුණේ සිංහලයන් දෙකට බෙදෙන විට මැද සිටින පිරිසගේ තීරණය ලැබෙන පැත්තට ආසන දිනා ගැනීමට හැකි වීමේ ක්‍රමය අනුවයි. සිංහල මිනිසුන් දෙකට බෙදෙන කොට මැද ඉන්න මිනිහාගේ තීරණය අනුව ආසන තීන්දු වෙනවා. එහෙම නම් තවත් 3,00,000 කට පුරවැසිකම් දී අපේ ඡන්ද ලැයිස්තුවලට ඒ අයගේ නම් දමා ගත්තොත් එය උඩරට ඡන්ද කොට්ඨාශවලට දැඩි විධියට බලපාන ලොකුම බලවේගයක් වෙනවා නේද ?

ගරු කථානායකතුමනි, උඩරට සිංහලයන් දැඩි දුක් විඳ තිබෙනවා. ඔවුන් සුද්දාගෙන් බැට කෑවා. සුද්දන් ඔවුන්ගේ ඉඩම් පීනි කොල්ල කෑවා. ඔවුන්ගේ ගොවිතැන් විනාශ කොට ඔවුන්ගේ ඉඩම්වල තේ වගා කළා. හොඳයි, දැන් නිදහස් රාජ්‍යයක් ලැබී තිබෙන වේලාවේවත් ඔවුන්ට සහනයක් ලැබෙනවා වෙනුවට ඉන්දියානු ද්‍රවිඩයන්ගේ තීරණයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් නිගමනය කිරීමට කටයුතු සලසා දීම සාධාරණද ? යාපනය ප්‍රදේශයේ සිටින ද්‍රවිඩ සහෝදරයන් නම් අවුරුදු දාහක් විතර තිස්සේ ජීවත් වන නිසා ඒ අයට නම් යම් අයිතියක් ලබා ගැනීමට සාධාරණ යුතුකමක් තිබෙනවා. එහෙත් සුද්දාගේ වාල් කමට ගෙන්වා ගත් ඉන්දියානු ද්‍රවිඩයන්ට උඩරට ප්‍රදේශයේ අයිතිවාසිකම් අයත් කර දීමට කිසිම යුතුකමක් නැහැ· එහෙම නම් ප්‍රධාන පක්ෂ දෙකේ නායකයන් දෙදෙනා එදා දුන් පොරොන්දුව ගැන දැන් මතක් කරන්නේවත් නැත්තේ ඇයි ? අද දෙපැත්තෙන්ම ඒ ගැන වචනයක්වත් කියවෙන්නේ නැහැ. රාජාසන කථාවට විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සංශෝධනවලදී මේ දෙවැනි ලේඛනය පිළිබඳ ප්‍රශ්නය මතු කරතැයි මා කල්පනා කළා. ගරු අගමැතිතුමා කඳුකරය ඉන්දියානු ද්‍රවිඩයන්ට පාවා දෙන්නට ක්‍රියා කරනවාදැයි ප්‍රශ්න කරතැයි මා බලාපොරොත්තු වුණා. එහෙත් එවැන්නක් පෙනී යන්නේ නැහැ. විරුද්ධ පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද සංශෝධනවල මේ ගැන වචනයක්වත් සඳහන් වන්නේ නැහැ. මෙයින් පෙනෙන්නේ මේ පක්ෂ දෙකේ නායකයන් දෙදෙනාම තොන්ඩමන්ගේ උදව්වෙන් කඳුකරයේ ද්‍රවිඩ ඡන්ද ලබාගැනීමට අදහස් කරගෙන සිටින බවයි. ඒ දෙදෙනාම මේ ගැන උනන්දුවක් නොදක්වන්නේ ඒකයි. කෙසේ වේතත් මේ දෙවැනි ඡන්ද ලේඛනය ගැන මා ඉතා ඕනෑ කමින් මතක් කරනවා.

පුරවැසිකම් ලබන මේ මිනිසුන් අපේ භාෂාව දන්නේ නැහැ· අපේ සංස්කෘතිය ගැන දන්නේ නැහැ. අපේ රටට ලැදියාවක් නැහැ. ඔවුන්ගේ ගෙවල්වල තිබෙන්නේ ඉන්දියානු නායකයන්ගේ පින්තූරයි. නිදහස් දිනයේ අප සිංහ කොඩි එල්ලා සතුටු වන විට ඔවුන් කළු කොඩි ඔසවනවා. මේ අයයි, වෙනම ලැයිස්තුවකට ඇතුළත් කරන්නැයි මා ඉල්ලන්නේ. මේ විධියට හැසිරෙන අයට තමන් කැමති මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගන්නට හැකි වන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිදි ඔවුන්ගේ නම් දෙවැනි ඡන්ද ලේඛනයක ඇතුළත් කිරීම ඉතාමත් වැදගත් කටයුත්තක්. ඔවුන් මේ රටේ පුරවැසියන් වශයෙන් හැඩ ගැසෙන තුරු, මේ රටේ සංස්කෘතිය දැන ගන්නා තුරු, මේ රටේ භාෂාව දැන ගන්නා තුරු, මේ රටට ආදරය දක්වන තුරු ඔවුන් වෙනම ලැයිස්තුවක තැබීම සාධාරණයි. ඒ ඉහත කී තත්වය ඇති වන තුරු වෙනම මන්ත්‍රීවරුන් පස් දෙනකු හය දෙනකු හෝ හත් දෙනකු හෝ පත් කර ගෙන උඩරටට ඇඟිලි නොගසා ඔවුන්ගේ කම්කරු ප්‍රශ්න ගැන ක්‍රියා කරන්නට අවස්ථාව සලසා දුන්නාට කමක් නැහැ. ඔවුන්ට තිබෙන්නේ කම්කරු ප්‍රශ්න පමණයි. ඔවුන්ට ගැමි ප්‍රශ්න නැහැ. ඒ පත් කර එවන දෙමළ මන්ත්‍රීවරුන්ට කථා කරන්නට තිබෙන්නේ පුරවැසිකම් ලැබූ වතුකරයේ සිටින දෙමළ පිරිස වෙනුවෙන් පමණයි. එම නිසා ඒ උදවියගේ කම්කරු ප්‍රශ්න මෙහි ඇවිත් කියන්න තිබුණාම ඇති. වතුකරයේ සිටින කම්කරුවන්ට අධ්‍යාපන ප්‍රශ්නයක් නැහැ, සෞඛ්‍ය ප්‍රශ්නයක් නැහැ, පාරවල් ප්‍රශ්නයක් නැහැ, වතුර ප්‍රශ්නයක් නැහැ, ආහාර ප්‍රශ්නයක් නැහැ. මේවා සේරම තිබෙන්නේ දුප්පත් සිංහල ගැමියන්ටයි. ඒ අයට පාරක් නැහැ, ගෙයක් නැහැ, වතුර නැහැ, සෞඛ්‍ය පහසුකම් නැහැ, පාසල් නැහැ. එම නිසා ඒ අයගේ ප්‍රශ්නය මීට වඩා වෙනස්. වතු කම්කරුවා වෙනම ලැයිස්තුවකින් ඒ අයගේ මන්ත්‍රීවරයා වේනමත්, ගැමියා ඒ අයගේ මන්ත්‍රීවරයා වෙනමත් තෝරා ගත්තාම කඳුකරයේ ආයෙත් සිංහල බලයක් ඇති වෙන්න ඉඩ තිබෙනවා.

මට මතකයි එක් අවස්ථාවකදී අගමැතිතුමා කී කාරණයක්. උන්නැහේ උඩ රට භාර ගන්නවාය, උඩරට ආරක්ෂා කරනවාය දෙවැනි ඡන්ද ලැයිස්තුවක් මාර්ගයෙන් හෝ වෙනම ආසන බෙදන ක්‍රමයකින් හෝ වතු ඡන්ද ලැයිස්තු ක්‍රමයකින් හෝ මොන යම් ක්‍රමයකින් හෝ උඩ රට අයිතිවාසිකම් රකිනවාය කියා බොහෝම ගාම්භීර ලෙස ප්‍රකාශ කළා. මේ රාජාසන කථාවේ නම් ඒ කිසිවක් නැහැ. කෝ අපේ මැතිණිය රට ජාතිය වෙනුවෙන් මේ කාරණය ගැන නැගිට කථා කළා? ඒවා ගැන කථා කරන්න ගියොත් තොන්ඩමන්ගේ ඡන්ද ටික ලැබෙන්නෙ නැ නෙ. රටවැසියන් දෙස නොවෙයි, තොන්ඩමන් දෙසයි බලා ඉන්නෙ. මේක මහා භයානක දෙයක්.

රට සභා ගැන කියන්න එන කොට පෙඩරල් පක්ෂයේ චෙල්වනායගම් මහතා දෙස බලනවා. කඳුකර ප්‍රශ්නය එන විට තොන්ඩමන් දෙස බලා ඉන්නවා. අපේ සිංහල ජාතිය දෙස බලන්නේ කවද්ද කියා අපේ නායකයන්ගෙන් මා අහන්න කැමතියි. ඒ අනුව බලන විට කථානායකතුමනි, මේක මහා භයානක දෙයක්.

මැතිණිය කිව්වා, කිසියම්ම රට සභා ක්‍රමයකට කිසිසේත්ම කැමති නැත කියා. තමා එවැනි එකකට ඉඩ දෙන්නෙත් නැත කියා කිව්වා. මාත් ඒකට සහමුලින්ම එකඟයි. මාත් රට සභා ක්‍රමයකට සතුටු නැහැ. මැතිණිය ඒක පිට්ටනියේදී කිව්වා. මම පාර්ලිමේන්තුවේදී කිව්වා. පාර්ලිමේන්තුවේදී කිව්වාය කියා මාව අස් කළා. ඒ ප්‍රශ්නය ගැන තවත් උදවිය තවත් ක්‍රමවලට කියන බව මට පේනවා. සමහර උදවිය කියනවා, සමාජවාදී දිසා සභා ඇති කරනවාය කියා. මොනවද මේ සමාජවාදී දිසා සභා කියන්නේ? තවත් එක්කෙනෙක් කියනවා, තමා සියයට සියයක්ම රටසභාවලට කැමතියි, නමුත් පෙඩරල් පක්ෂය ඉල්ලන නිසා කැමති නැත කියා. මාවද කථානායකතුමනි, අස් කරන්න තිබුණෙ? මැතිණිය කියනවා කිසියම්ම ක්‍රමයකට රට සභා දෙන්නෙ නැත කියා. තවත් එක්කෙනෙක් කියනවා, රට සභා අපි දෙනවාය ඒත් පෙඩරල් පක්ෂයෙන් ඉල්ලන නිසා දෙන්නෙ නැත කියා.

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
කවුද?

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
ඒ උදවිය පක්ෂයේ ඉන්නවා. ඊ ළඟට කථානායකතුමනි, තමුන්නාන්සේට මතක ඇති 1966 ජනවාරි මාසෙ අටවෙනිදා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ජී. සේනානායක මයා.]

වූ සිද්ධියෙන් දුප්පත් කම්කරුවන් පහ ළොස් දහස් ගණනක් දඩුවම් ලැබූ බව. එදින පටන් තමන්ගේ වෘත්තිය අයිති වාසිකමක් වන සිංහලෙන් වැඩ කිරීමට බැරි තත්ත්වයක් ඇති වෙනවාය කියන හැඟීම උඩ ඒ උදවිය සංකේත වැඩ වර්ජන යක් කරන්න ඉදිරිපත් වුණා. ඒ වර්ජන යේ යෙදුණු 15,000 කට තරම දඩුවම් කළා. එම නිසා මේ සම්බන්ධයෙන් රජයේ ලිපිකරු සේවා සංගමය මගින් World Federation of Trade Unions නමැති සංවිධානයට ලියුමක් යවා අසා තිබෙනව, භාෂා ප්‍රශ්නය වෘත්තියට අයිති ප්‍රශ්නයක්ද, නැද්ද ? කියා. මට නම් පැහැ දිලි වශයෙන් හිතෙන්නෙ භාෂාව වෘත්ති යට අයිති ප්‍රශ්නයක් හැටියටයි. ඒ සංවිධා නයේ පඩිවරු සාකච්ඡා කරල එය වෘත්ති යට අයිති නැති ප්‍රශ්නයක් බවට තීන්දු කළා. එහෙත් තොන්ඩමන් I. L. O. නමැති සංවිධානයට ගිහින් දෙමළ භාෂාව ගැන සටන් කරන විට ඒ සංවිධානය තීර ණය කළා, දෙමළට සටන් කිරීම සාධාරණ යි කියා. අපේ රටේ තිබෙන්නෙ පුදුම තත්වයක් නේද ? දෙමළ උදවිය දෙමළට සටන් කරන විට අයි. එල්. ඕ. සංවිධානය කියනව, සටන සාධාරණයි කියා. සියයට 60ක් සිටින අපි සිංහලට සටන් කරන විට World Federation of Trade Unions අහනව, "ඇයි උඹල අයිති නැති ප්‍රශ්න යක් උඩ වැඩ වර්ජනය කළේ" කියා. සිංහල යට සටන් කිරීම අයුතුයි. ඒ තත්ත්වයටයි වැටී තිබෙන්නෙ. අපේ සමාජවාදය මට තෝරා ගන්ට බැරි ඔය නිසයි. දෙමළට කරන හැම දේම යුක්තිසහගත බව පෙනෙනව ; සිංහල වෙනුවෙන් සටන් කරන විට එය පිළිකුල් ජාතිවාදය කියා නම් කරනව. ඒකයි අපට සිදු වෙලා තිබෙන අපරාධය. මේ අනුව අපේ අයිතිවාසිකම් දිනෙන් දින අපට නැති වීගෙන යනව. සිංහල ජාතියට—සිංහල ජාතිය කියන්ට බැරි නම් "වැඩි ජාතියට" කියමු— ප්‍රජාතන්ත්‍රවාදය අනුව වැඩි ජාතියට හිමි කමක් තිබෙනවා. සිංහලය කියන්ට තැත නම් ලජ්ජ නම්, වැඩි ජාතිය යයි කියමු. ඒ වැඩි ජනතාවගේ අයිතිවාසිකම් පෑගී යන විට ඒවා ලබා ගැනීමට උත්සාහ දරණ ලෙස මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින් මගේ සංශෝධන ඉදිරිපත් කරනව.

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)

*(திரு. பேர்சி சமரவீர—வெலிமடை)*

(Mr. Percy Samaraweera—Welimada)

**විසින් ස්ථිර කරන ලදි.**

*அனுவதித்தார்.*

*seconded.*

**සංශෝධන මෙසේයි :**

*திருத்தங்கள் வருமாறு :*

The Amendments are follows :

V

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එතකුදු වුවත්, රට සහා පිළිබඳ විෂයෙහි,—

(අ) ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් (අපි දෙමළු) පක්ෂය වැනි ද්‍රෝහී දේශපාලන සංවිධානවල ශාඛා පිහිටුවීම සහ එම සංවිධානයේ බලය වැඩි දියුණු කරවීමට හා සංවිධානාත්මක ක්‍රියා මාර්ග ඉදිරියට ගෙන ඒමත් සහ ප්‍රචාරක කටයුතු දියුණු වීමට ඉඩ ප්‍රස්තාව දීමෙන් ද ඉහත කී සංවිධාන තහනම් නොකිරීමෙන් ද මේ රටේ ස්වෛරී භාවට තර්ජනයක් බවට පරිවර්තනය වී තිබියදීත්,

(ආ) ෆෙඩරල් පක්ෂයේ (දෙමළ රාජ්‍යයේ) එකම පරමාර්ථය වෙනම දෙමළ රාජ්‍යයක් පිහිටුවීමය යනුවෙන් ප්‍රසිද්ධ ප්‍රකාශන මැතිසබයේදී පවා කියා තිබියදීත් අද වනතෙක් එම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් සිංහලයාටද මේ රටේ ඒකීයතා වයට මේ තාක් කල් නොපැවතුන භයානක තර්ජනයක් ෆෙඩරල් පක්ෂ යෙන් එල්ල වී තිබියදීත්,

(ඇ) කාරතිව් සිට කිරින්ද දක්වා උතුරු නැගෙනහිර වෙරලේ මසුන් මැරීමේ යෙදී සිටින සිංහල ධීවර කාර්මිකයින් හට වෙරළින් 2/3 ප්‍රමාණයක් වාරකන් කාල යේදී අහිමි වී යෑමේ තර්ජනයක් පවතින නමුදු ද්‍රවිඩ ධීවරයන් හට වාරකන් කාලයේදී මෙන්ම අනික් කාලයේත් මසුන් මැරීමෙන් ජීවත් වීමට දෙපැත්ත කින් ඇති ඉඩකඩ ගැන සලකා සිංහල ධීවරයන්ගේ යහපත තකා ක්‍රියා මාර්ග යක් නොගැනීමෙන් ද,

(ඈ) සිංහල භාෂාවට හිමි විය යුතුව ඇති ප්‍රමුඛත්වය දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලට දීමෙන් 1956 අංක 33 දරණ රාජ්‍යභාෂා පනතට පටහැණිව උතුරු නැගෙනහිර දෙපළාතේ පාලන කටයුතුවලින් රාජ්‍ය භාෂාව තල්ලු කොට දමා ඇති හෙයින් ද,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(ඉ) උතුරු නැගෙනහිර ප්‍රදේශවල ඇති වගාවට සුදුසු ඉඩම් වගා කිරීම පිණිස ජනපද පිහිටුවීමට පෙඩරල් පක්ෂය විසින් පළ කළ විරෝධය මේ රජය පිළිගෙන තිබීමෙන් ද,

(ඊ) නාගදීප සේරුවාවිල වැනි උතුරේත් නැගෙනහිරේත් ඇති ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාවට තර්ජන එල්ල විය හැකි හෙයින් ද,

(උ) රටසභා ඇති කිරීමෙන් හෝ රටසභා ඇති කිරීමේ ප්‍රතිපත්තිය පිළිගෙන ක්‍රියාත්මක කිරීමෙන් හෝ මේතාක් කල් ජීවිත පරිත්‍යාගයෙන් ආරක්ෂා කළාවූත් සදාකල් හිම ආරක්ෂා කළ යුතුව ඇත්තා වූත් රටේ ඒකීය භාවය අහෝසි වී රට දෙකඩ වන බැවින් ද,

කිනම් අයුරකින් හෝ කිනම් නමකින් හෝ මින් ඉදිරියට රටසභා ඇති නොකරන බව උතුමාණන් වහන්සේගේ රජය අවංකව පළ කර නොතිබීම ගැන බලවත් කණගාටුව පළ කරන් නෙමු. "

" நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்கவேண்டும் :

' எனினும், மாவட்ட சபைகள் சம்பந்தப்பட்ட விடயத்தில்,

(அ) திராவிட முன்னேற்றக் கழக (நாம் தமிழர்) கட்சியைப் போன்ற தேசத்துரோகமான அரசியற் தாபனங்களின் கிளைகளை நிறுவவும், அத்தாபனத்தின் சக்தியை வலுப்படுத்தவும், தாபன ரீதியான நடவடிக்கைகளை எடுக்கவும், பிரச்சார வேலைகள் அபிவிருத்தி செய்யவும் சந்தர்ப்பம் அளித்ததனுலும், மேற்கூறிய தாபனத்தைத் தடைப்படுத்தாதனுலும், இந்நாட்டின் இறைமைக்கு ஆபத்துச் சூழும் தன்மை உருவாகியிருக்கின்ற பொழுதும்,

(ஆ) தமிழரசுக் கட்சியின் (தமிழ் இராச்சியத்தின்) ஒரே இலட்சியம், தனிப்பட்டதானதொரு தமிழ் அரசைத் தாபிப்பதாகும் எனப்பகிரங்கமாக பிரதிநிதிகள் சபையிலும் கூறியிருப்பதோடு, இது நாள் வரை அக்கொள்கையைக் கடைப்பிடிப்பதன் மூலம், சிங்கள மக்களுக்கும், இந்நாட்டின் ஒற்றையாட்சித் தன்மைக்கும், இது காலம் வரை ஏற்படாத பயங்கரமான ஆபத்து தமிழரசுக் கட்சியினுல் உருவாக்கப்பட்டிருக்கின்ற பொழுதும்,

(இ) காரைதீவிலிருந்து கிரிந்தை வரை வடக்கு, கிழக்குக் கரையிலே மீன்பிடித் தொழிலில் ஈடுபட்டுள்ள சிங்களக் கடற்றொழிலாளருக்கு, கடற்கரையின் $\frac{2}{3}$ பகுதியில், பருவ மழைக் காலத்திலே உரிமையில்லாமற்போகும் நிலையேற்படும் ஆபத்து இருக்கின்ற நேரத்திலேயே, தமிழ்க் கடற்றொழிலாளர்களுக்கு, பருவ மழைக் காலத்திலும், மற்றக்காலத்திலும், மீன்பிடித்துவாழ இருபக்கத்திலும் அமைந்



துள்ள வசதிகளைக் கவனத்திற் கொண்டு சிங்களக் கடற்றொழிலாளர்களின் நன்மையைக் கருதி நடவடிக்கை எடுக்காமலிருப்பதனுலும்,

(ஈ) சிங்கள மொழிக்கு உரித்தான முதலிடத்தைத் தமிழுக்கும், ஆங்கிலத்திற்கும் அளிப்பதன் மூலம், 1956 ஆம் ஆண்டு 33 ஆம் இலக்க அரகருமமொழிச் சட்டத்திற்கு முரணுக வடக்கு, கிழக்கு மாகாணங்களில் நிர்வாகத்திலிருந்து அரசகரும மொழியை ஒதுக்கியிருப்பதனுலும்,

(உ) வடக்கு, கிழக்கு மாகாணங்களிலுள்ள விவசாயத்திற்குத் தகுதியான காணிகளை, விவசாயத்திற்குட்படுத்துவதற்காக குடியேற்றத் திட்டங்களை நிறுவும் விடயத்தில் தமிழரசுக் கட்சியின் எதிர்ப்பை இவ்வரசாங்கம் ஏற்றுக் கொண்டிருப்பதனுலும்,

(ஊ) நயினுதீவு, சேருவாவிலை போன்ற வடக்கிலும், கிழக்கிலுமுள்ள சரித்திரப் பிரசித்தி பெற்ற பௌத்த புனிதத் தலங்களின் பாதுகாப்புக்கு ஆபத்து ஏற்படலாமென்பதனுலும்,

(எ) மாவட்ட சபைகளை நிறுவுவதன் மூலமோ, மாவட்ட சபைகளைத் தாபிக்கும் கொள்கையை ஏற்று நடவடிக்கை எடுப்பதன் மூலமோ, இது நாள்வரை உயிர் கொடுத்துக்காக்கப்பட்டு வந்ததும், எக்காலத்தும் பாதுகக்கப்படவேண்டியதுமான நாட்டின் ஒற்றையாட்சித் தன்மை மறைந்து, நாடு இரண்டு துண்டாகப் பிரியுமாகையினுலும்,

எவ்விதத்திலாவது, எப்பெயரிலாவது, எதிர்காலத்தில் மாவட்ட சபைகளை உருவாக்க மாட்டோமென மேன்மைதங்கிய தங்களது அரசாங்கம் உளத்தூய்மையுடன் வெளியிடாமலிருப்பது குறித்து ஆழ்ந்த கவலையைத் தெரிவிக்கின்ருேம்.' "

" As an Amendment to the Address at the end add the words :

' but, in the matter of District Councils—

(*a*) whereas the fact that the setting up of branch institutions of anti-national political organisations such as the (We Tamil) Dravida Munethra Kazagam and the opportunities afforded to them to pursue their activities in this country on an organised scale, and the fact that these institutions have not been proscribed, continue to constitute a threat to the sovereignty of this country ;

(*b*) whereas the Federal (Tamil State) Party which has publicly stated even in Parliament that its sole objective is the setting up of a separate Tamil State in this country, continues to follow that,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

policy and thus this party constitutes a hitherto non-existent and dangerous threat to the Sinhalese people and also to the unitary character of the country ;

(c) whereas steps have not been taken in furtherance of the interests of the Sinhalese fishermen who are engaged in fishing in the Northern and Eastern coasts from Karativu to Kirinda and who are in danger of losing their right to fish during the monsoon season in two-thirds the coast of Ceylon, while the Tamil fishermen continue to enjoy the right to earn a living both in the North and East as well as elsewhere in Ceylon ;

(d) whereas the official language has been pushed out of the work of administration in the Northern and Eastern Provinces, with the Tamil and English languages being given the primacy due to the Sinhalese language contrary to the provisions of the Official Language Act No. 33 of 1956 ;

(e) whereas the Government has given in to the opposition expressed by the Federal Party over the establishment of colonization schemes for the purpose of bringing arable land in the North and East under cultivation ;

(f) whereas the security of the historic Buddhist places of worship in the North and the East, such as Nagadipa and Seruvavila, can be endangered ;

(g) whereas the establishment of District Councils or the acceptance and implementation of the policy of establishing District Councils while destroying the unitary character of the country which to this day has been defended with the very lives of the people and which has to be defended for ever, will also divide the country ;

this House regrets that Your Excellency's Government has failed to state unequivocally that it will not establish District Councils in any form or name whatsoever '. "

VI

" සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

' එතකුදු වුවත්, ජීවන වියදම පිළිබඳ විෂයෙහි,—

(අ) දිනෙන් දින ඉහළ නගිමින් පවත්නා ජීවන වියදම නියත වශයෙන් පහත හෙළීමට ඇති එක් පියවරක් හැටියට පිළිගෙන, නිදහස් වූ ආර්ථික සංවර්ධන ක්‍රමයක් මෙරටෙහි ඇති කර ගනු පිණිසත්,

(ආ) විදේශික ජාවාරම්කාරයින් අතර පවත්නා වෙළඳ උපක්‍රම මැඩලීමෙන් සිංහල ජනතාවගේ නියම අයිතිවාසිකම් රැක දෙනු පිණිසත්,

(ඇ) මෙම දේශද්‍රෝහී ජාවාරම්කාරයන් හට ඔවුන්ගේ ඕනෑ එපාකම් අනුව අවශ්‍ය වූ අවස්ථාවලදී ජීවන අංකය ඉහළ පහළ යැවීමට බැරි වන පිණිසත්,

(ඈ) භයානක ලෙස පිට රටට ඇදෙන ජාතික ධනය මෙහිම රඳවාගනු පිණිසත්,

(ඉ) ඉන්දියානුවන් ප්‍රධාන අනිකුත් විදේශික ධන කුවේරයන් විසින් උදුරා ගෙන තිබෙන අපගේ වෙළඳ බලය යළිත් ආපසු ලබා ගැනීම පිණිසත්,

වෙළඳාම ලාංකික කිරීමට උතුමාණන් වහන්සේගේ රජය ක්‍රියා කොට නොතිබීම ගැන බලවත් ලෙස කණගාටුව පළකරන්නෙමු.' "

" நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்கவேண்டும் :

'எனினும், வாழ்க்கைச் செலவு பற்றிய விஷயத்தில்,

(அ) நாள்தோறும் ஏறிக்கொண்டேபோகும் வாழ்க்கைச் செலவை நிரந்தரமாகக் குறைப்பதை ஒரு நடவடிக்கையாக ஏற்றுக் கொண்டு சுதந்திரமான பொருளாதார அபிவிருத்தித் திட்டமொன்றை இந்நாட்டில் ஏற்படுத்துவதற்காகவும்,

(ஆ) வெளிநாட்டு வியாபாரிகளிடையே உள்ள வியாபாரச் சூழ்ச்சிகளை முறியடிப்பதன் மூலம் சிங்கள மக்களின் சரியான உரிமையைப் பாதுகாத்துக்கொடுக்கவும்,

(இ) இத்தேசத்துரோகி வியாபாரிகளுக்கு அவர்களின் விருப்பு வெறுப்பின்படி அவசியமான சந்தர்ப்பங்களில் வாழ்க்கைப் புள்ளியை மேலும் கீழுமாக்க இயலாமற் செய்யவும்,

(ஈ) பயங்கரமாக வெளியேறும் தேசிய செல்வத்தை இங்கேயே தங்கச் செய்யவும்,

(உ) பிரதானமாக இந்தியர் உட்பட, ஏனைய அந்நிய செல்வந்தர்களினால் பறிக்கப்பட்டுள்ள எங்களுடைய வர்த்தக அதிகாரத்தை மீண்டும் பெற்றுக் கொள்ளவும்,

வர்த்தகத்தை இலங்கையர் மயமாக்க மேன்மை தங்கிய தங்கள் அரசாங்கம் நடவடிக்கையெடுக்காததையிட்டு எமது மிகுந்த வருத்தத்தைத் தெரிவிக்கின்றோம்.' "

" As an Amendment to the Address at the end add the words :

' but regret that in the matter of the cost of living Your Excellency's Government has not taken measures to Ceylonise trade with a view to—

(a) recognizing an unfettered system of economic development as one of the steps which will definitely

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

bring down the steadily rising cost of living and ensuring the setting up of such an economic system in this country ;

(b) protecting the legitimate rights of the Sinhala people by eradicating the corrupt practices resorted to by the foreign businessmen ;

(c) preventing the fluctuations in the cost of living as a result of the manipulation of prices at the will and pleasure of these anti-national businessmen ;

(d) arresting the outflow of our national wealth, which has assumed dangerous proportions ;

(e) restoring the dominance in trade which has been wrested from us by foreign capitalists, principally the Indians'."

VII

"සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

'එතකුදු වුවත්, ඉන්දියානු ප්‍රශ්නය පිළිබඳ විෂයෙහි,—

(අ) සිංහලයාගේ රැකීරක්ෂා ප්‍රශ්නය දැඩි ලෙස උග්‍ර වී තිබෙන මෙම වකවානුවේ පුරවැසිකම් නොලත් ඉන්දියානුවන්ට හා තාවකාලික බල පත්‍ර යටතේ පදිංචිව සිටින අයට රැකීරක්ෂා සැපයීමට ඉඩකඩ යෙදීම සහ ඔවුනට නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය, හාල් සලාකය වැනි වර ප්‍රසාදත්, වෘත්තීය හා දේශපාලන අයිතිවාසිකම් දී තිබීමත් අසාධාරණයක් හැටියට අද වන තුරුත් නොසලකා මේ රටේ ජනතාවගේ අයිතියත් වෙනුවෙන් විධිමත් පියවරක් නොගැනීමෙන් ද,

(ආ) ඉන්දියානුවන් ඉන්දියාවට යැවීම සඳහා අවංක ක්‍රියා මාර්ගයක් අද වන තෙක් නොගැනීමෙන් ද,

(ඇ) කන්ද උඩරට සිංහලයාගේ ජන්ම උරුමයන් රැකෙන පරිදි පුරවැසිකම් ලබා තිබෙන ඉන්දියානුවන් වෙනම ඡන්ද ලේඛනයකට ඇතුළත් නොකිරීමෙන් ද,

(ඈ) මෙරට ජනතාවට ජීවත් වීමට පවා සෑහෙන බිම් ප්‍රමාණයක් නොමැතිව තිබියදී මිළයට ගැනීමෙන් මෙරට චංචල නිශ්චල දේපල සතු කර ගැනීමට විදේශිකයයින්ට ඉඩ සැලසීමෙන් ද, කර්මාන්ත, ගොවි කර්මාන්ත හා වෙනත් මුදල් උපයන ව්‍යාපාර පවත්වාගෙන යෑමට විශාල වශයෙන් ඉඩකඩ සැලසීමෙන් ද,

උතුමාණන් වහන්සේගේ රජය ඉන්දියානු ප්‍රශ්නය දිනෙන් දින උග්‍ර වීමට ඉඩ ප්‍රසතාව යෙදීම ගැණ කණගාටුව පළ කරන්නෙමු'."

"நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும் :

'எனினும், இந்தியர் பற்றிய விடயத்தில்,

(அ) சிங்களவர்களின் வேலையில்லாப் பிரச்சினை மிகவும் உக்கிரமடைந்திருக்கும் இச்சந்தர்ப்பத்தில் பிரஜா உரிமை பெறாத இந்தியர்களுக்கும் தற்காலிகமாக அனுமதிபெற்றுக் குடியிருக்கும் நாடற்றவர்களுக்கும் தொழில்வசதி அளித்தல், இலவசக் கல்வி, இலவச வைத்திய சேவை, பங்கீட்டரிசி போன்ற சலுகை, தொழில், அரசியலுரிமை கொடுத்திருப்பது அநீதியானதென்று இதுவரை கவனியாது இந்நாட்டு மக்களின் உரிமைகள் சார்பாகப் பல நடவடிக்கைகளை எடுக்காமையாலும்,

(ஆ) இந்தியர்களை இந்தியாவிற்கு அனுப்புவதற்காக நேர்மையான செயல் வழி வகைகளை இன்று வரை கைக்கொள்ளாமையாலும்,

(இ) மலைநாட்டு சிங்கள மக்களின் பிறப்புரிமைகள் பாதுகாக்கப்படக்கூடிய வகையில் பிரஜா உரிமை பெற்றுள்ள இந்தியர்களை வேறு தேர்தல் இடாப்பில் சேர்க்காமையாலும்,

(ஈ) இந்நாட்டு மக்கள் வாழ்வதற்குத்தானும் போதிய நிலமில்லாதிருக்கையில் நாடற்றவர் பணப்பலத்தினால் இந்நாட்டில் அசைவுள்ள, அசைவற்ற சொத்துக்களை உரிமையாக்கிக் கொள்ள இடமளித்தமையாலும், தொழில், விவசாயம், வேறு பணம் சம்பாதிக்கக்கூடியவற்றைச் செய்வதற்கு இடமளித்தமையாலும்,

மேன்மை தங்கிய தங்களுடைய அரசாங்கம் இந்தியப் பிரச்சினையை நாளுக்கு நாள் உக்கிரமடையச் செய்வதையிட்டு நாம் கவலையைத் தெரிவிக்கிறோம்.' "

"As an Amendment to the Address at the end add the words :

'but regret that as far as the Indian problem is concerned Your Excellency's Government has allowed it to become acute from day to day by—

(a) affording opportunities of employment to Indians who have not obtained citizenship and Temporary Resident Permit Holders at a time when the problem of unemployment is very acute among the Sinhalese ; and by not taking proper steps with regard to the rights of the people of this country as a result of not considering up to date the grant of privileges such as free education, free health service and rice ration, and trade union and political rights to the said Indians and T.R.P. holders to be an injustice ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(b) not taking an honest step up to date to repatriate Indians to India ;

(c)) not taking steps to safeguard the birthrights of the Kandyan Sinhalese by including in a separate electoral register the names of the Indians who have obtained citizenship ;

(d) affording opportunities on a large scale to foreigners to purchase and thereby gain ownership of movable and immovable properties at a time when sufficient land is not available even for the people of this country ; and by allowing them to engage in industries and agricultural activities and other money making concerns '. "

VIII

" සංශෝධනයක් වශයෙන් ස්තුති යෝජනාව අගට එකතු කිරීමට :

' එතකුදු වුවත්, භාෂාව පිළිබඳ විෂයෙහි,—

වැදගත් වෘත්තීය අයිතිවාසිකමක් වන භාෂාවේ අයිතිවාසිකම රැක ගැනීම සඳහා ඉදිරිපත්ව, 1966 ජනවාරි 8 වෙනිදා සිද්ධියේදී දඬුවම් ලැබූ භාෂා ප්‍රේමී රජයේ හා සංස්ථාවල සේවකයන් හට එම දඬුවම් ඉවත් කොට සහනයක් සැලසීමට උතුමාණන් වහන්සේගේ රජය ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් බලවත් කණගාටුව පළ කරන්නෙමු'. "

" நன்றியுரைக்குத் திருத்தமாக அதன் இறுதியிற் கீழ்க்காணும் சொற்களைச் சேர்க்க வேண்டும் :

' எனினும், மொழி சம்பந்தமான விடயத்தில்,

முக்கியமான தொழிற்சங்க உரிமையாகிய மொழியுரிமையைப் பாதுகாக்கும் நோக்கத்துடன் முன்வந்து, ஜனவரி 8 ஆம் திகதி நிகழ்ச்சியின் காரணமாகத் தண்டனை பெற்ற அரசாங்கத் திணைக்களங்கள், கூட்டுத் தாபனங்கள் ஆகியவற்றைச் சேர்ந்த மொழிப்பற்றுள்ள ஊழியர்களின் தண்டனைகளை அகற்றி சலுகை வழங்குவதற்கு, மேன்மை தங்கிய தங்கள் அரசாங்கம் நடவடிக்கை எடுக்காதது குறித்து ஆழ்ந்த கவலையைத் தெரிவிக்கின்றோம்.' "

" As an Amendment to the Address at the end add the words :

' but regret that as far as the language is concerned, Your Excellency's Government has not taken action to remove the punishments imposed on the language loving public servants and employees of corporations who by coming forward to safeguard the right of language which is an important professional right were concerned in the incident of 8th January 1966 ; and to grant them redress '. "

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ගරු කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයෙන් එක් මන්ත්‍රීතුමකුවත් කථා කළේ නැහැ. එම නිසා ඒ පැය ගණන විරුද්ධ පාර්ශ්වයටවත් ලබා දෙන්න ඕනෑ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

There is no such thing.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

එකම ඇමතිවරයෙකුවත් නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Here is a Member who has caught my eye, and I call upon him to speak.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

They would not get up.

අ. භා. 7.10

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

That is not my fault.

Order, please ! The Deputy Speaker will now take the Chair.

**අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *took the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*
(Mr. Lakshman Jayakody—Divulapitiya)

ගරු කථානායකතුමනි, මේ හත් හවුල් ආණ්ඩුවේ රාජාසන කථාවකට අපි පසුගියදා ඇහුම්කන් දුන්න. එහෙත් අප ගෙනෙන තර්කවලට, අප ඉදිරිපත් කරන අදහස් වලට පිළිතුරු දීමට ආණ්ඩුවට ශක්තියක් නැති බව කියන්ට කනගාටුයි. එපමණක් නොවෙයි, රාජාසන කථාවය කියන්නේ වර්ෂය තුළදී රජය රට පාලනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන වැඩ පිළිවෙළටයි. මෙය ඉදිරිපත් කිරීමෙන් කරන්නෙ රටට ඒ පිළිබඳව අවබෝධයක් ලබා දීමයි.

මේ අවස්ථාවේදි මට මතක් වෙනව, 1964 දී බණ්ඩාරනායක මැතිණියගේ රජය ඉදිරිපත් කළ අවසාන රාජාසන කථාව. ඒ රාජාසන කථාවෙන් ප්‍රතිඥා දෙකක් දී තිබුණා. පළමුවෙනි එක හැටියට තිබුණේ බෞද්ධාගම මේ රටේ රාජ්‍ය ආගම කළ යුතු බවයි. දෙවෙනි එක හැටියට තිබුණේ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කළ යුතු බවයි. මේ රටේ සමාජයීය ප්‍රශ්න, ආගමික ප්‍රශ්න, ආර්ථික ප්‍රශ්න, වැනි ඉතාමත් වැදගත් ප්‍රශ්න ගණනාවක් සම්බන්ධයෙන් කොයි තරම් ප්‍රාණවත්, බලවත්, ශක්ති සම්පන්න අදහස් මාලාවක් ඒ තරම් සුළු වචන සංඛ්‍යාවකින් සම්පිණ්ඩනය කර ඉදිරිපත් කරන ලද්දේද යන්න මේ කොන්දේසි දෙක ගැන කල්පනා කර බැලුවොත් තමුන්නාන්සේට පෙනී යනු ඇති. ඒ එදා අප බලයේ සිටි කාලයේ.

එහෙත් මේ රාජාසන කථාව දෙස බලන විට කියන්නට තිබෙන්නේ කුමක්ද? මෙය හොඳ රාජාසන කථාවකැයි කී කෙනෙක් නැහැ. වෙනදා නම් පුවත්පත් වල පළ වුණ කරුණු අනුවත් රාජාසන කථාව හොඳ එකකැයි කෙනකුට හිතන්නට ඉඩක් ලැබුණා. රාජාසන කථාව ඉතාමත් හොඳය යනුවෙන් ඇතැම් පුවත්පත්වලින් වෙනදා කියවුණා. එහෙත් මේ රාජාසන කථාවට නම් කිසිම කෙනකුගෙන් හොඳක් අහන්නට ලැබුණේ නැහැ. අප්‍රාණික, මලානික, කිසිම ශක්තියක් නැති දෙයක් හැටියටයි කාටත් එය පෙනී ගියේ. පසුගිය අවුරුදු හතරක් තුළ පවත්වන ලද රාජාසන කථා වලට ඇහුම්කන් දුන්නා නම් ඉතාමත් දුර්වල රාජාසන කථාව හැටියට මේ රාජාසන කථාව හඳුන්වන්නට ඕනෑම කෙනෙක් ඉදිරිපත් වෙනු නිසැකයි. ඒ නිසා මට එකක් ඉතාම පැහැදිලි ලෙස කියන්නට පුළුවනි. මේ රටේ ජනතාව තුළ මේ රාජාසන කථාව කෙරෙහි ඒ තරම් භක්තියක් නැහැ. ඒ තරම් විශ්වාසයක් නැහැ. මෙයින් රටට හොඳක් සිදු වෙතැයි හැඟීමක්වත් රටවාසීන් තුළ හැඟීමක්වත් නැහැ. මෙය කියවන ඕනෑම කෙනකුට එය කිසිම සැලැස්මක් ඇතිව ඉදිරිපත් කරන ලද්දක් නොවන බව කියන්නට පුළුවනි. ආණ්ඩුවට ලොකු කරදර රාශියකට මුහුණ පාන්නට සිද්ධ වෙලා තිබුණා වෙන්න පුළුවනි. අවසානයේදී සුළු පරිවර්තනයක් සමග—වචන එහාට මෙහාට වෙනස් කර—ඉදිරිපත් කිරීම පමණයි සිදු වී තිබෙන්නේ. මේ රාජාසන කථාවෙන් අපට පෙනී යන්නේ ඒ විධියටයි. එහි තිබෙන්නේ මේ විධියටයි. සිංහලෙන් කියා තිබෙන්නේ මේ විධියටයි. මම ඒ කොටස දැන් කියවන්නම්:

> " මහ ආණ්ඩුවේ මෙහෙයවීම සහ පාලනය යටතේ ක්‍රියා කරන දිස්ත්‍රික් සභා පිහිටුවාලීම පිළිබඳ බුධවල පත්‍රිකාවක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර එම ධවල පත්‍රිකාව පිළිබඳව ඇති වූ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂකාරීව සලකා බලනු ඇත."

මෙතැන ඉතාමත් වැදගත් අංශයක් තිබෙනවා. මොකක්ද ඒක? කොයිම අවස්ථාවකවත් ,කොයිම ආකාරයකටවත් මහජන විරෝධය නැඟ ආවත්, ෆේඩරල් පක්ෂයේ ඉල්ලීමට කවදාවත් ඉඩ නොදෙන්නැයි කොයි තරම් කීවත් මේ ආණ්ඩුව නම් රටසභා අදහස අත්හැර දමන්නේ නැහැ කියන අදහස දැන් පැහැදිලියි. එය මේ රාජාසන කථාවේ පැහැදිලි ලෙසම තිබෙනවා. මා එසේ කියන්නේ ඇයි? ව්‍යවස්ථා ඉදිරිපත් කරනවාය කියනවා නොවෙයිද? ව්‍යවස්ථා ඉදිරිපත් කරන බව පැහැදිලි කර තිබෙනවා. එහෙම නම් අපට එකක් කියන්නට පුළුවන්කම තිබෙනවා. මහජනයා තුළ—විශේෂයෙන්ම සිංහලයන් තුළ—යම් සැකයක් තිබුණා නම්, මෙය අයින් කර දමනු ඇතැයි හැඟීමක් ජනතාවගෙන් එක්තරා කොටසක් තුළ හෝ තිබුණා නම්, එය පුහු දෙයක් බව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

දැන් ඒත්තු යනවා. දැන් මේ කාරණය සම්බන්ධයෙන් ව්‍යවස්ථා ඉදිරිපත් නොකරනු ඇතැයි කාටවත් හිතා ගන්නට ඉඩක් නැහැ. ව්‍යවස්ථා ඉදිරිපත් නොකරනවාය කියන්නට කාටවත් බැහැ. ඒ ගැන පැහැදිලි ප්‍රකාශයක් කර තිබෙනවා. මෙතැනදී ඒ කාරණය තහවුරු වෙනවා. එය, ඉංගිරිසියෙන් තිබෙන කොටස කියෙව්වොත්, ඊටත් වඩා හොඳින් තහවුරු වෙනවා. හෙට උදේට ඉර පායනවාය කියන කියමන වාගේම මේ කාරණය ස්ථිරයි. මේ ආණ්ඩුව නම් කවදා හෝ ස්ථිර වශයෙන්ම රටසභා සම්බන්ධයෙන් ව්‍යවස්ථා ඉදිරිපත් කරනවා. මෙය ප්‍රජාතන්ත්‍රවාදයට කරන සැලකීමක්දැයි මා අහනවා. මේ රටේ සියේට සියයක් නැත්නම් සියේට අනූවක් තරම් වූ සිංහල පිරිසකුත්, සියේට අනූවක් තරම් වූ මුස්ලිම් පිරිසකුත්, ඊයෙ පෙරේදා පත්‍රවල පළ වුණු කරුණු අනුව බලන විට බර්ගර් ජනතාවත් මේ රටසභා සම්බන්ධ ව්‍යවස්ථා ඉදිරිපත් කිරීම ගැන විරුද්ධයි. මා භික්ෂුන්වහන්සේලා ගැන කියන්නේ නැහැ. පොදුවේ භික්ෂුන්වහන්සේලා මීට විරුද්ධද කියාත්, මහානායක ස්වාමීන්ද්‍රයන්වහන්සේලා මීට විරුද්ධද කියාත් මා කියන්නේ නැහැ. එහෙත් ඒ හැම දෙනාමත් මීට විරුද්ධ වන්නට පුළුවනි. ඒ කොයි හැටි වෙතත්, මේ ව්‍යවස්ථාවන් මේ සැසි වාරයේදීම එන්නට පුළුවන් බව නම් මට පෙනී යනවා. මෙය තාවකාලික වශයෙන්වත් නවතා දමා නැහැ. මෙය ටික කාලයකටවත් කල් දමලා නැහැ.

මේ කාරණය සම්බන්ධයෙන් යම්කිසි විධියක ප්‍රෝඩාවක් කර තිබෙන බව අපට පෙනී යනවා. මේ සම්බන්ධයෙන් ඡන්දයක් ගන්නට සිදු වන බව දන්නවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා එකට රැස් කර ඡන්දයක් ගන්නට සිද්ධ වන නිසා, ප්‍රෝඩාවකින්, ප්‍රතිපත්ති හැංගීමකින්, වචන හුවමාරුවකින් මුළා කරන්නට යන බවක් පෙනෙනවා. ගරු අගමැතිතුමා දැන් දැන් හැම තැනම කියන්නට පටන්ගෙන තිබෙනවා, මීට විරුද්ධ කිසිම කෙනෙක් කිසිම විශේෂ හේතුවක් ඉදිරිපත් කර නැත යනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රට සභා ඇති කිරීමෙන් පසුව ලංකාවෙන් තුනෙන් එකක පමණ ප්‍රදේශයේ තිබෙන කෘෂිකර්මාන්ත හා කර්මාන්තවලට සිංහලයාට කිසිම අයිතිවාසිකමක් කියන්න බැහැ. උතුරු නැගෙනහිර ප්‍රදේශයෙන් ගලා බසින මදුරු ඔය, යාන් ඔය, මල්වතු ඔය, කුඹුක්කන් ඔය, ගල්ඔය මහවැලි ගඟ ආදියේ මිටියාවත්හි සිංහල ගොවි ජනපද පිහිටුවන්නට ක්‍රමයක් ඇති වන්නේ නැහැ. අද උතුරු නැගෙනහිර ප්‍රදේශයට සම්පූර්ණයෙන්ම හතරැස් සැතපුම් 7,200 ගණනක් අයිති වන බව තමුන්නාන්සේ දන්නවා ඇති. මේ ප්‍රදේශවල සිටින ජනගහනය දෙස බලන විට තවත් ලක්ෂ 50 කට පමණ එහි ජනපදයන්හි පදිංචි වීමට ඉඩ තිබෙන බව පෙනෙනවා. ජනගහනය වැඩි ප්‍රදේශවලින් ජනගහනය අඩු ප්‍රදේශවලට ගොස් එම ප්‍රදේශ සශ්‍රීක කර දියුණු කරන්න අවස්ථාව තිබෙනවා. නමුත් රට සභා ඇති කළොත් එවැනි දේ කරන්න ඉඩක් ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ තවත් කරුණක් ගැන කල්පනා කර බලන්න. උතුරු නැගෙනහිර ප්‍රදේශය තමයි අද විශාල වශයෙන් ගොවිතැන් කළ හැකි ප්‍රදේශ වී තිබෙන්නෙ. අනික් ප්‍රදේශවල ගොවිතැන් කර අවසානයි. මේ ප්‍රදේශවල ගොවිතැන් කිරීම සම්පූර්ණයෙන්ම නතර කර දැමීමට සිදු වුණොත්, ඊළඟට උතුරු නැගෙනහිර ප්‍රදේශත් වෙන් වෙන්නට ගියොත් සිංහලයාට ගොවිතැන් කිරීමට ප්‍රදේශයක් ඉතිරි වන්නේ නැහැ. අද ලංකාවෙන් තුනෙන් දෙකක පමණ ප්‍රමාණයේ සිටින්නේ එක්කෝ ඉන්දියානුකාරයින් ; එහෙම නැත්නම් ලාංකික ද්‍රවිඩයින්. ඔවුන්ගේ පදිංචියටම සීමා වුණ කොටස් තිබෙනවා. යම් දවසක රට සභා ඇති කළොත් එම ප්‍රදේශවලටත් සිංහලයන්ට යන්න ලැබෙන්නේ නැහැ. ලංකාවෙන් තුනෙන් දෙකක් පමණ ඒ විධියට ඒ අයට අයත් වෙනවා.

මේ රටේ දෙස්තර මහත්වරුන් ඉන්නවා. ඉංජිනේරුවන් ඉන්නවා. මේ අයගෙන් සියයට 90ක් පමණ සිංහල ප්‍රදේශවල ඉඳගෙන හරි හම්බ කරනවා. 1952,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1953 ජනලේඛන අරගෙන බැලුවොත් තමුන්නාන්සේලාට පෙනී යාවි. කොළඹ ප්‍රදේශයෙන් වුණත් සිංහලයන්ට අයත් ඉඩම් තිබෙන්නේ කොයි තරම් සුළු ප්‍රමාණයක් ද කියා. කොළඹ ප්‍රදේශයේ සම්පූර්ණයෙන්ම තිබෙන අක්ක 9,166 න් අක්කර 3,055ක් පමණයි සිංහලයන්ට අයත් වී තිබෙන්නෙ. අක්කර 6,111ක් අයිති වී තිබෙන්නේ සිංහල නොවන සිරි සටයි. වැල්ලවත්ත දෙස බැලුවත්, කොළඹ තිබෙන අනික් ප්‍රදේශ දෙස බැලුවත් සම්පූර්ණයෙන්ම තුනෙන් දෙකක ප්‍රමාණයක් අයිති වී තිබෙන්නේ සිංහල නොවන අයට බව පෙනෙනවා.

ලංකාවට මුද්දර දෙකක් ගහන්න සිදු වෙනවා. මා මේවායේ ඉතිහාසය කියන්න අවශ්‍ය වන්නේ නැහැ. ලංකාවේ කච්චේරි ක්‍රමය ගැන මා මේ අවස්ථාවේදී කියන්න යන්නේ නැහැ. අපට කවදාවත් ශ්‍රී අකුර ගහන්න නම් ඉඩක් ලැබෙන්නේ නැහැ. එපමණක් නොවෙයි, තමුන්නාන්සේට මතක ඇති ජවහර් ලාල් නේරු තුමා පැහැදිලිව කරන ලද ප්‍රකාශයක් ගැන. කවදා හෝ ලංකාවට ඉන්දියාවේ තිබෙන පෙඩරල් රාජ්‍යය සමග සම්බන්ධ වෙන්න සිදු වෙනවා කියා එතුමා ප්‍රකාශ කර තිබෙනවා. අප්පදොරේ විසිනුත් ඔය වගේ ප්‍රකාශයක් කර තිබෙනවා. මේවා තර්ජන නොවේද? බිය විය යුතු දේ නොවේද? මන්නාරමේ සිට කිරින්ද දක්වා වූ මුහුදු වෙරළ සම්පූර්ණයෙන්ම වාගේ ද්‍රවිඩ ප්‍රදේශයට අයත් වෙනවා. මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක් පමණ ඒ අයට අයත් වෙනවා. සිංහල ප්‍රදේශවලට අයත් වන්නේ තලාවත දක්වා කොටස පමණයි. ඔය විධියට යම්කිසි විධියකින් සංග්‍රාමයක් ඇති වුණොත් පිටරටවලින් ලැබෙන යුද්ධායුධ සියල්ලම ලැබෙන්නේ ද්‍රවිඩයන්ටයි. මේ රටේ රට සහා ඇති කළොත් සමහර විට ද්‍රවිඩයන් හා සිංහලයන් අතර විශාල කල කෝලාහල ඇති වෙන්න පුළුවනි. ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයත් සමග පෙඩරල් පක්ෂයේ සම්බන්ධකම් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති. වවුනියාව ප්‍රදේශය ගැන තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ වාගේම පරණ මැදවච්චිය ප්‍රදේශය ගැනත් දන්නවා ඇති. රටසහා ඇති වුණොත් ත්‍රිකුණාමලයෙ ගොමරන් කඩවල, පානම්පත්තු, බඹරුකුමන, යාල අවට ප්‍රදේශ සම්පූර්ණයෙන්ම ද්‍රවිඩ ආධිපත්‍ය යට යට වී යනවා.

ඒ සමගම සඳහන් කරන්න ඕනෑ අපේ පැරණි සිද්ධස්ථාන ගැනත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධගයාවේ පවා බෞද්ධයින්ට වැඳ පුදා ගැනීමට අවසර නොතිබුණු යුගයක් තිබුණු බව තමුන්නාන්සේ දන්නවා ඇති. මහන්තාගේ පාලනය යටතේ තිබුණු ඒ කාලයේ ඔහුගේ අවසරය නොමැතිව එහි යන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. යම් දවසක මේ ප්‍රදේශ ඒ අයට ගියොත් ඇති වන තත්ත්වය ගැනයි දඹගස්ආරේ ස්වාමීන්වහන්සේ ප්‍රශ්න කරන්නෙ. එවිට සේරුවාවිල වැනි බෞද්ධ පූජණීය ස්ථානවලට බෞද්ධයින්ට යන්න පූසාරීන්ගෙන් අවසර ගන්න සිදු වෙයි. අන්න ඒ හැඟීමෙන් මේ රටේ සිංහල ජනතාව රටසහා පිහිටුවීමට විරුද්ධ වනවා පමණක් නොවෙයි, එය සම්පූර්ණයෙන්ම මේ රටට එපා කියන හැඟීම දැනටමත් තහවුරු කර අවසාන බව මතක් කරන්න කැමතියි.

ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය භාෂාවට සිදු වුණු දේ ගැනත් සිතා බලන්න. 1956 දී රාජ්‍ය භාෂා පනත ඉදිරිපත් කළා. ඒ පනත යටතේ නොයෙකුත් රෙගුලාසි 1964 දක්වා ඉදිරිපත් කරන්න පුළුවන්කම තිබුණා. චක්‍රලේඛ ගණනාවක්ම ඉදිරිපත් කළා. රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීමට අංක 425 දරණ චක්‍රලේඛය 1958 ජනවාරි 18 වැනිදා ද, අංක 430 දරන චක්‍රලේඛය 1963 මාර්තු 7 වනදාද, අංක 620 සහ 621 දරන චක්‍රලේඛ 1963 ඔක්තෝබර 18 වනදාද, අංක 623 දරණ චක්‍ර ලේඛය 1964 පෙබරවාරි 26 වනදාද නිකුත් කරනු ලැබුවා. ඒ සෑම චක්‍රලේඛයක්ම සිංහල භාෂාව ව්‍යාප්ත කිරීම සඳහා භාණ්ඩාගාරය මගින් රජයේ සේවකයන් සඳහා නිකුත් කරන ලද ඒවායි. 1964 දක්වා මේ සෑම දෙයක්ම ක්‍රියාත්මක වේගන ආවා.

නමුත් මේ ආණ්ඩුව බලයට පැමිණියාට පසු 1966 සැප්තැම්බර 4 වනදා අංක 700 දරණ චක්‍රලේඛයක් නිකුත් කළා. එම චක්‍රලේඛයෙන් රාජ්‍ය භාෂාව සම්බන්ධයෙන් ඊට කලින් නිකුත් කරන ලද සෑම චක්‍රලේඛයක්ම අවලංගු කර දමා තිබෙනවා. එහි දෙවන කොටසේ " ස්වකීය රාජකාරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

කටයුතු සඳහා සිංහල භාෂාව භාවිත කළ යුතුය වෙනුවට ආදි ප්‍රවේශක නිලධාරීන්ට බල නොකළ යුතුය" කියා වගන්තියක් තිබෙනවා. ඔන්න ඔය චක්‍රලේඛය නිකුත් කළාට පස්සෙ, අවුරුදු දහයකට පස්සෙ, සිංහලෙන් යම් පමණක් දෙපාර්තමේන්තු වල වැඩ කටයුතු කරගෙන ආවාද, සිංහල භාෂාව ව්‍යාප්ත වුණාද, ඒ සියල්ලක්ම අහෝසි වී ගොස් තිබෙනවා. එය අපට තර්ජනයක් නොවේද? භය විමට කරුණක් නොවේද? ඔය අංශවලින් අපට නිගමන යට බසින්න පුළුවනි, රටසභා ආවොත් අනාගතයේදී කොයි ආකාරයට රට ගමන් කරනවාද යන්න ගැන. එම නිසා, රටසභා පිහිටුවීම ගැන විරුද්ධත්වයක් දැක්වීම සම්පූර්ණයෙන්ම සාධාරණ නොවේද කියා අහන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සන්තෝෂ වෙනවා මෙම රාජාසන කථාව කියවාගෙන යන විට අපේ තරුණයින්ට තැනක් දෙනවාය කියන අදහස වචන මාත්‍රයකින් සඳහන් කර තිබීම ගැන. අද මේ රටේ සිටින තරුණ පෙළ මුහුණ පා තිබෙන කායික හා මානසික සිත් තැවුල් කොතරම් දුරට ව්‍යාප්ත වී තිබෙනවාද කිය තොත්, අද ගමකට ගියොත් තරුණයින් තුළ පවතින කලකිරුණු ස්වභාව—ක්න ගාවුදායක කියන වචනය පණ මදි—ඔවුන් මුහුණ පා ඇති දුක්ඛිත තත්ත්වය දැනගැනීමට පුළුවනි. ඔවුන් අද ජීවත් වන්නෙ ඒ තරම්ම සංවේගජනක තත්ත්ව යකයි. මේ තත්ත්වය ආණ්ඩුව හෙළි කරන්න කැමති නැහැ. තරුණයන් අමාරුවේ වැටී සිටිනවාය, ඔවුන්ට අනාගතයක් නැත, කියන හැඟීම රජය හෙළි කරන්න කැමති නැහැ. රජය සමහර තරුණයන් දෙස බලන්නෙ වපර ඇසින්. තරුණයකු නැගී සිට මොකක් හරි වේගවත් හැඟීමක් පළ කළොත්, ඔහු කඩාකප්පල්කාරයකු හැටියට, ඔහු කොමියුනිස්ට්වාදියකු ලෙස, ඔහු මාක්ස්වාදියකු ලෙස හඳුන්වනවා. නමුත් පැරණි රදලවරුන්ගේ ක්‍රමයට හැඩ ගැසී සිටිනවා නම්, දුබලයෙක් නම්, ඔහු නියම ශක්තිසම්පන්න තරුණයකු හැටියට සලකා රජය ක්‍රියා කරන බවත් පෙනී යනවා. එයට හේතුවක් තිබෙනවා. අද ඊයේ හේතුවක් නොවෙයි. මේ රටේ තිබෙන සංස්කෘතියත් සමාජ තත්ත්ව යත් දෙස බලා සමහර අය කිව්වා, මෙය පුංචි එංගලන්තයක් කරන්න ඕනෑය කියා. සමහර අය කිව්වා, මෙය සංස්කෘතික කාන්තාරයක් කළාම මේ ප්‍රශ්න විසඳන්න නට පුළුවන් වේය කියා. එහෙත් මේ රටට සිදු වී තිබෙන්නේ කුමක්ද? සිංහල සංස්කෘතියත් ඉංග්‍රීසි සංස්කෘතියත් යන දෙක තෙල් හා වතුර වගෙයි; කවදාවත් එක් වන්නේ නැහැ. එතන තමයි උපත. එතැනින් ඉපදි ක්‍රමානුකූලව රට ප්‍රපාතයට එන තුරු කිසිම අවස්ථාවක තරුණයින්ගෙන් ප්‍රයෝජන ගන්නට පුළුවන්කමක් ඇති වුණේ නැහැ.

අද රට ආර්ථික වශයෙන් පහළ වැටී ගෙන යන විට තරුණයින් සඳහා වැඩ හුරුව කියා එකක් මවාගෙන නැවත වරක් තරුණයින් වැඩවසම් ක්‍රමයකට පරිවර්තනය කිරීමේ වැඩ පිළිවෙළක් පාසැල් මගින් කරගෙන යනවා.

මීට කලින් තිබුණා ශ්‍රමදානය කියා එකක්. ශ්‍රමදානය කියන වචනය මරන්නට මේ ආණ්ඩුවට ඕනෑකම තිබුණා. ශ්‍රමදානය කීවිට ඕනෑම කෙනෙකුගේ සිත් ගිපහළ වන්නේ, හැම ළමයෙකුටම හිතෙන්නේ තමන්ගේ ශ්‍රමය දානය දීමක් වශයෙනුයි. ඒ හැඟීම සිත් තුළ ඇති වෙනවා.

එහෙත් වැඩ හුරුව කී විට ඇති වන්නේ ආත්මාර්ථකාමී හැඟීමක්. ඒ මගින් දරුවන් මොට්ට කිරීමේ වැඩ පිළිවෙළක් සමහර ඇමතිවරුන් අරගෙන ගොස් තිබෙනවා.

ගිලෙන්නට යන බෝට්ටුවේ සිටගෙන ගිලෙන්නේ නැත කියන අයත් සිටින බව තමුන්නාන්සේ දන්නවා. එමෙන්ම බෝට්ටුව ගිලෙන විට එකට ගිලෙමු කියන අයත් සිටිනවා. බෝට්ටුව ගිලෙන විට කවදාවත් ගිලෙන්නේ නැත කියන අය තමයි සමාජයේ සැලකියයුතු පුද්ගල යන්ට අපහාස කරමින් ගරහමින් කට යුතු කරන්නේ. රුස්වීම්වල කථා කරන හැටි බලන්න. ගුරුවරුන්ට පහර ගස නවා; ශිෂ්‍යයන්ට පහර ගසනවා; කාල කණ්ණීන්ය කියනවා. ඒවායින් ශිෂ්‍ය යන් සම්පූර්ණයෙන්ම මන්දෝත්සාහී වෙනවා පමණක් නොවෙයි, රටේ සිටින උගතුන් නිකමුන් හැටියට පරිවර්තනය කරන්ටත් කටයුතු කරනවා. රටක බුද්ධිමත් පිරිසක් වශයෙන් සිටින්නේ විශ්ව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විද්‍යාලවල කථිකාචාර්යවරුන් හා මහාචාර්යවරුන්. ඔවුහු තමන් පාලනය කරන අධ්‍යාපන ඇමතිවරයා කෙරෙහි විශ්වාසයක් නැත කියනවා නම් තත්ත්වය කුමක්ද? රටක සිටින ප්‍රධාන පෙළේ බුද්ධිමත් පිරිස කියනවා නම් අධ්‍යාපන ඇමතිවරයාට විරුද්ධයි, අධ්‍යාපන ක්‍රමය වැරදියි, මේ රට බේරා ගන්නට කිසිම අදහසක් හැඟීමක් නැති කිසිම විශ්වාසයක් නැති පුද්ගලයකුටයි මේ රටේ අධ්‍යාපනය බාර වී තිබෙන්නේ කියා, අධ්‍යාපනය කොතරම් ප්‍රපාතයකට වැටී තිබෙනවාද කියා තමුන්නාන්සේට හිතාගන්නට පුළුවන්.

විද්‍යාව දියුණු කරන්නට ඕනෑය කියා මේ රාජාසන කථාවෙනුත් කිව්වා. එහෙත් අවුරුදු 20 ක පමණ කාලයක් තිස්සේ පැවති හුණුමුල්ල මධ්‍ය මහා විද්‍යාලයේ විද්‍යා අංශය වසා දමා තිබෙනවා. මීරිගමත් වහන්නට යනවා. ගලහිටියාව මධ්‍ය මහා විද්‍යාලයේ විද්‍යා අංශයත් වසා ගෙන යනවා. පලන්නෝරුවේ විමල ධම්ම නායක ස්වාමීන් වහන්සේගේ කාලයේදී විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ විද්‍යා අංශයක් පිහිටුවා එහි සිංහලෙන් ඉගැන්වූ අතරම එය ඉතාමත්ම දියුණු තත්වයකටත් පත් වීගෙන ආවා. එයත් වසා දැම්මා.

ශිෂ්‍ය ගුරු පත්වීම් ගැන බලන්න. ශිෂ්‍ය ගුරු පත්වීම් කෙරෙහි කිසි කෙනෙකුට විශ්වාසයක් නැහැ. මගේ කොට්ඨාශයෙන් 2,500 කට වඩා විභාගයට ඉදිරිපත් වුණා. එහෙත් 30 කට වඩා සමත් වී නැහැ. අපට ආරංචි හැටියට ශිෂ්‍ය ගුරු පත්වීම් දෙන්න ලැයිස්තු හදා දෙන්නට ඕනෑලු. මා කියන්නේ මෙයයි: බුද්ධියට නිග්‍රහ කරන පිරිසක් සිටිනවා. තමන්ගේ පක්ෂග්‍රාහී වැඩවලදීත් ඥාති සංග්‍රහ වැඩවලදීත් යම් කෙනෙක් බුද්ධියට ගර හනවා නම් රටේ අධ්‍යාපනය දියුණු වේද කියා ටිකක් කල්පනා කර බලන්න ඕනෑ.

මේ රටේ ගොවියන්ට ආධාර කරනවාය කියමින් සමහරුන් කරන්නේ මොනවාද? සමහරුන් ගොවි මහතුන් කොළඹට ගෙන්නාගෙන, කාඩ් බෝඩ්වලින් තොප්පි හදා, ඒවාට සරුවපිත්තල ටිකක් අලවා, ඒවා ඔවුන්ට දමා එක්තරා විධියක රඟ දැක්වීමක් කළා. ගොවි මහතුන්ට තොප්පි දම්මා රජ කෙරෙව්වා. අපිත් කුඩා කාලයේ කොස් කොළවලින් ඔය වගේ තොප්පි හදා සෙල්ලම් කළා.

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

මේ, ඒවා නොවෙයි.

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

ගොවියන්ට ඕනෑ ඕවා නොවෙයි. "මෙන්න, ඔබට ඉඩම් අක්කර 5 ක්" කියා ඔවුන්ට ඉඩම් බෙදා දෙන්න.

**අතපත්තු මයා.**
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)

මගේ පළාතේ එක් ගොවි මහතකුට අක්කර 10 ක් දී තිබෙනවා.

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

අන්න ඒ විධියට දෙන්න. "මෙන්න ලාබෙට පෝර, කටු කම්බි" කියා ගොවි මහතුන්ට අවශ්‍ය ඒ දේවල් දෙන්න. අද කටු කම්බි හොණ්ඩරයක් රුපියල් 100 යි. සී සෑම සම්බන්ධ කටයුතුවලදී අය කළ යුතු ගාස්තු දක්වමින්, මේ ළඟදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් චක්‍ර ලේඛයක් නිකුත් කළ බව තමුන්නාන්සේලා දන්නේ නැතිව ඇති. මීට පෙර කවදාවත් මේ තරම් මිළ ගණන්වලට ඒ කටයුතු කළේ නැහැ. ඒ චක්‍ර ලේඛය අනුව, දැති නගුලින් හාන්න රුපියල් 60 ක් නියම කර තිබෙනවා. එහෙත් ඉස්සර ඒ වෙනුවෙන් අය කළේ රුපියල් 27.50 යි. පෝරු ගෑමට රුපියල් 60 ක් දැන් නියම කර ඇතත්, ඉස්සර නම් රුපියල් 30 යි. දැති පෝරුවෙන් දෙවරක් සකස් කිරීමට රුපියල් 55 ක් නියම කර ඇතත්, ඉස්සර ඒ සඳහා අය කළේ රුපියල් 27 යි. ගොයම් හුළං කිරීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

රුපියල් 80 ක් අය කරන්නට කියා ඇතත්, ඉස්සර නම් එය රුපියල් 40 කින් කර ගන්නට පුළුවන්කම තිබුණා. දිනකට පැය 8 ක් වතුර පොම්ප කිරීමට රුපියල් 96 ක් නියම කර ඇතත්, ඉස්සර නම් වියදම් වුණේ රුපියල් 46 යි.

1970 වන විට මේ රට, හාලින් ස්වයංපෝෂිත වෙනවාලු. කුවීන්ස් හෝටලයේ පැවති රැස්වීමකදී එක්තරා ඇමතිවරයකු කියා තිබෙනවා, "1970 වන විට ලංකාව හාලින් ස්වයංපෝෂිත වෙනවා" කියා. එසේ නොවන බව පසුගිය අප්‍රේල් 22 වැනි දින "දිනමිණ" පත්‍රයේ කතු වැකියෙනුත් කියා තිබෙනවා. ඒ ප්‍රකාශය මනස්ගාතයක් බව ඒ කතු වැකියෙන් කියනවා. ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් අර කතු වැකිය මේ විධියට විවේචනයක් කරනවා :

"...1970 දී රට, හාලින් ස්වයංපෝෂිත නොවෙයි. සත්‍ය එයයි. එසේ ස්වයංපෝෂිත කිරීමේ වැඩ පිළිවෙළක්ද නැත. නැති වැඩ පිළිවෙළක් උඩ මනස්ගාත දෙඩවන කපිකයා රටටත්, තම ආණ්ඩු පක්ෂයටත් කරන්නේ ලොකු හානියකි."

"ශ්‍රී ලංකා නිදහස් පක්ෂ යුගයේදී හාල් නිෂ්පාදනය වැඩි වුණේ නැතැයි" ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් රට හැම තැනම ගිහින් කියනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමුන්නාන්සේලා වාගේ පුහු ඝෝෂා කළේ නැති බව ඇත්ත. "වී නිෂ්පාදනය වැඩි වුණාය" කියමින් අප රට හැම තැන අණබෙර නොගැසූ බව ඇත්ත. තමුන්නාන්සේලාගේ අගමැතිතුමාත්, සෙසු ඇමතිවරුනුත් වාගේ අපේ ඇමතිවරුන් "වී නිෂ්පාදනය වැඩි වුණාය" කියමින් රට හැම තැනම කියා පෑවේ නැති බව ඇත්ත. එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ යුගයේදී ක්‍රමානුකූලව වී නිෂ්පාදනය වැඩි වී තිබෙන බව සංඛ්‍යා ලේඛන දිහා බලන විට පෙනෙනවා. මා හිතන්නේ, මේ සංඛ්‍යා ලේඛන ගෙන තිබෙන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාවලින්.

1963 දී අක්කරයකින් වී බුසල් 36.84ක් ලැබී තිබෙනවා. 1964 දී—අපේ අවසාන අවුරුද්දේ, තමුන්නාන්සේලා වාගේ කෑ නොගහා, තමුන්නාන්සේලා කියන විධියට නිකම් ඉඳගෙන—අක්කරයකින් වී බුසල් 40 ක් ලබාගෙන තිබෙනවා. එහෙත් තමුන්නාන්සේලා ආවා විතරයි, 1965 දී අක්කරයකින් ලැබුණු වී බුසල් ප්‍රමාණය 34.4 ට බැස්සා. 1966 දී 35.9 ක් වුණා. 1967 දී එය 41.9 ක් දක්වා ඉහළ නැග්ගා. මෙපමණ කරදර කර, මෙපමණ අණබෙර ගසා අක්කරයකින් වැඩිපුර ලැබී තිබෙන්නේ වී බුසල් 2 යි. ඒ කියන්නේ, බිත්තර වී ප්‍රමාණය පමණයි වැඩි වුණේ.

එහෙත් තමුන්නාන්සේලාගේ ආණ්ඩු කාලය තුළ අක්කරයකින් ලැබුණු වී බුසල් ප්‍රමාණය ඉතා අධික බව දැක්වෙන බොරු සංඛ්‍යා ලේඛන නිතරම පත්තරවල පළ වෙනවා. ඒ සංඛ්‍යා ලේඛන කොහෙන් සපයා ගන්නවාදැයි මා නම් දන්නේ නැහැ. අද "ඩේලි නිව්ස්" පත්‍රයේ මෙසේ සඳහන් වෙනවා :

"Self-Sufficient in rice by 1970 :

World food production could keep pace with the mammoth population explosion for at least 35 years with efficient farming methods, a leading agronomist claimed here today........

Dr. Constable supervised the five-year campaign demonstrating the use of fertilisers to Ceylonese farmers.

He said the fertilisers had lifted rice yields all over the island from 33 bushels an acre to between 80 and 110 bushels an acre."—

කොහෙන්ද මේක ගත්තෙ? කවුද මේව දුන්නෙ?

110 bushels an acre!

—"As a result, rice imports had fallen from 600,000 tons in 1964 to 250,000 tons this year.

Dr. Constable forecasts that by 1970 Ceylon would not not only be self-sufficient in rice but would be able to export it for the first time in history."

එතකොට 1970 වන විට තමුන්නාන්සේලාට හාල් පිටරට යවන්නටත් පුළුවනි. එහෙම නම් තත්ත්වය මෙයයි: මේ විධියට ස්වයංපෝෂිත කිරීම නම් ඒ තරම් වැඩක් නොවෙයි. ඉතිරි හාල් සේරුවත් කපන්න. එතකොට හාල් වුවමනා නැහැ. එහෙම කළාම ස්වයංපෝෂිතයි. මේ නිෂ්පාදනය ගැන අපට විශ්වාසයක් නැහැ. වී වපුරන ප්‍රමාණය ගැන හරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංඛ්‍යා ලේඛන නැහැ. යොදන පොහොර ප්‍රමාණය ගැන හරි සංඛ්‍යා ලේඛන නැහැ. නමුත් මනස්ගාත දෙඩවනවා. ගොයම් රෝග ගැන මොකක්ද නමුන්නාන්සේලා යොදා තිබෙන වැඩ පිළිවෙළ? තායිචුං, අයි. ආර්. ආර්. 8 කියන වී වර්ගවලින් "බ්ලාස්ට්" නමැති රෝගය මේ රටට බෝවූ බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවා පිළිගෙන අවසානයි. අඩු වශයෙන් ඒ වී වර්ග වපුරා තිබෙන කුඹුරුවලට බෙහෙත් ඉසින්නටවත් කට යුතු නොකළේ ඇයි? මේ රටේ හොඳ වී වර්ග තිබෙනවා. එච් 4, එච්, 7 එච් 8 ආදී වී වර්ග තිබෙනවා. එච් 11 නමින් තවත් දියුණු කළ හැකි අළුත්ම වර්ගයක් තිබෙනවා. නමුත් අද තිබෙන තත්ත්වය කුමක් ද? මා දැන් මොහොතකට කලින් සඳහන් කළ "බ්ලාස්ට්" නමැති රෝගයෙන් අපේ ප්‍රදේශවල පමණක් නොවෙයි අනුරාධපුරය, කුරුණෑගල, මාතර, හම්බන්තොට, මහනුවර ආදී ප්‍රදේශවලත් ගොයම සම්පූර්ණයෙන්ම විනාශ වී ගෙන යනවා.

ගොවි හමුදාවෙන් නියම තත්ත්වය දැන ගන්නට පුළුවන්ය කියා නමුන්නාන්සේලා කෑගසනවා. නමුත් ගොවි හමුදාවේ කටයුතු ගැන සොයා බලන්නට කොමිෂන් සභාවක් පත් කළ යුතු බව මගේ හැඟීමයි. මා එසේ කියන්නේ හේතු ඇතිවයි. විශාල ජාවාරම්වලින් පමණක් නොවෙයි නොයෙකුත් දූෂණ වැඩ වලින් ගොවි හමුදාව දූෂිත වී තිබෙනවා. සමහරුන් ගොවි හමුදාව විශාල වශයෙන් මුදල් හම්බ කිරීමේ ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරගෙන තිබෙනවා. ගොවි හමුදාවේ මධ්‍යස්ථානය ඇයි කොළඹට ගෙනෙන්නට බැරි? ගොවි හමුදාවේ අග්‍ර නායකයා ඉන්නෙත් කුරුණෑගල. කොන්ත්‍රාත්කාරයා ඉන්නෙත් කුරුණෑගල. ට්‍රැක්ටර් දෙන මිනිහ ඉන්නෙත් කුරුණෑගල. කුරුණෑගල අද ජාවාරම් මධ්‍යස්ථානය හැටියට පරිවර්තනය වී තිබෙනවා. අද එහි රුපියල් 47,000 ක වියදමින් කඳවුරක් සෑදීමට පාවිච්චි කරන ලී ගැන බලන විටත්, එහි පොල් අතුවලින් සාදන ගෙවල් දෙස බලන විටත්, එහි පාවිච්චි කරන ලොරිවල බොඩි දෙස බලන විටත්, පොදුවේ එහි වැඩ කටයුතු කෙරෙන ආකාරය දෙස බලන විටත් අපට පෙනෙන්නේ එය සම්පූර්ණයෙන්ම දූෂණයට පත් වී තිබෙන බවයි. එපමණක් නොවෙයි. ගොවි භටයින්ට දෙන පඩියත් ගසා කනවා. ගොවි භටයින්ට රුපියල් 6ක් ගෙවනවාය කියා පොත්පත්වල සඳහන් කරනවා. නමුත් ඇත්ත වශයෙන්ම ගොවි භටයකුගේ අතට ලැබෙන්නේ රුපියල් 2.30 යි. නැත්නම් 2.70 යි. ගමනාගමනයටය කියා පඩියෙන් 1.30 ක් අඩු කරනවා. කෑමටය කියා 2.70 ක් අඩු කරනවා. අවසානයේදී අතට ලැබෙන පඩිය රුපියල් 2 යි. නමුන්නාන්සේලා තවත් වරදක් කරනවා. අර්ථසාධක අර මුදලටත් කපනවා. නමුත් රුපියල් 2 ටයි කපන්නෙ. ඇත්ත වශයෙන්ම රුපියල් 6කට අර්ථසාධක මුදල් කැපිය යුතුයි. ඒක නීති විරෝධී වැඩක්. ගොවි හමුදාවේ තත්ත්වය ඒකයි.

ඊළඟට රැකීරක්ෂා ප්‍රශ්නය ගැන බලමු. රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා නමුන්නාන්සේලා කුමන වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා ද? රැකී රක්ෂා ප්‍රශ්නය පිළිබඳව මැතිනියගේ කාලයේ තිබුණු තත්ත්වය පිළිබඳවත් නමුන්නාන්සේලා බලයට පත්වූ 1965 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ තිබෙන තත්ත්වය පිළිබඳවත් මා සොයා බැලුවා. අපේ කාලයේ රැකී රක්ෂා ප්‍රශ්නය උග්‍ර වූවාය කියා අගමැතිතුමා දොස් කියනවා. නමුත් මා මහා බැංකුවේ වාර්තාවලින්ම සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කර ඒකට පිළිතුරු දෙන්නම්. මේ අවස්ථාවේදී කම්කරු ඇමතිතුමාත් සිටීම ගැන මා සතුටුයි. මැතිනිය මේ රට අවුරුදු හතරක් පාලනය කළා. නමුන්නාන්සේලාත් අවුරුදු හතරක් පාලනය කර තිබෙනවා. මැතිනිය පාලනය කළ අවුරුදු හතර තුළදී මේ රටේ රැකී රක්ෂා නැති අය වැඩිවී තිබෙන්නේ 14,000 කිනුයි. නමුත් නමුන්නාන්සේලාගේ අවුරුදු හතර තුළදී මේ රටේ රැකී රක්ෂා නැති අයගේ ගණන 1,00,000කින් වැඩිවී තිබෙනවා. මැතිණිය බලයේ සිටින කාලයේදී රක්ෂාව නැති පුහුණු අය හිටියේ 1,000 යි. නමුන්නාන්සේලාගේ කාලයේදී ඒ ගණන හැට ගුණයකින් වැඩි වී තිබෙනවා. අද පුහුණු කම්කරුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

60,000ක් රක්ෂා නැතිව සිටිනවා. මැතිණියගේ කාලයේ අර්ධ පුහුණු කම්කරුවන් 3,500 ක් පමණයි, රක්ෂාව නැතිව සිටියේ. අද රක්ෂාව නැතිව සිටින අර්ධ පුහුණු කම්කරුවන්ගේ ගණන 30,000 කට නැග තිබෙනවා. ඒ නිසා වන්නට ඇති තමුන්නාන්සේලා රාජාසන කථාවේ, රැකීරක්ෂා ප්‍රශ්නය ගැන සඳහන් කරලවත් නැත්තේ. මැතිණියගේ කාලයේදී උපාධිධාරීන් සෑම කෙනකුම රජයේ තනතුරුවලට හෝ පාසල්වලට හෝ සීනි සංස්ථාව, ටයර් සංස්ථාව වැනි සංස්ථාවලට පත් කළා. 1965 සිට අද දක්වා ඒ අය පිළිබඳ සංඛ්‍යා ලේඛන නැහැ. මේ අවුරුද්ද අවසාන වන විට රැකීරක්ෂා නැති උපාධිධාරීන් 20,000 ක් පමණ සිටිනවලු. ඔය තත්ත්වයට මේ රටේ වැඩි කරගෙන යන අතර මේ රාජාසන කථාවට සම්පූර්ණ සහයෝගය දෙන ලෙස ආණ්ඩුව අපෙන් ඉල්ලා සිටිනවා.

මේ රාජාසන කථාවේ ජීවන වියදම ගැන කිසි දෙයක් සඳහන් කර නැහැ. මැතිණියගේ කාලයේදී ජීවන වියදම් අංක ගැනත් මා වචනයක් කියන්නට කැමතියි. බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයත් ගණන් ගත් විට, 1956 සිට 1964 දක්වා අවුරුදු 9 තුළ ජීවන වියදම අංක 12 කින් නැංගා. එහෙත් තමුන්නාන්සේලාගේ අවුරුදු හතරේ කාලය තුළ දැනටම ජීවන වියදම අංක 8 කින් නැගලා තියෙනවා. ඒ අනුව මේ ආණ්ඩුව අවුරුදු 9 ක් මේ රට පාලනය කළොත් අවුරුදු 9 අවසානයේදී ජීවන වියදම 130 දක්වා නැගීමට ඉඩ තිබෙනවා. මේ රට දැන් ස්වයම්පෝෂිත වෙලාලු. එහෙම නම් ජීවන වියදම නැගීමට හේතුව මොකක්ද? ස්වයම්පෝෂිත වෙලා තියෙන රටක රට ඇනු නැතිලු, රතුඇනු නැතිලු, මාලු, මස්, පරිප්පු, අර්තාපල් ආදී සෑම දේකම මිළ ඉහළ ගිහින්. මිරිස් මිළ අඩු වුණාය කියා කෑගහනවා. එහෙත් අනික් ද්‍රව්‍ය වල මිළ ඉහළ ගිහින් තිබෙන ප්‍රමාණය ගැන සලකන විට මිරිස් මිළ අඩු වීම සුළු වශයෙන්වත් බලපාන්නෙ නැතිලු. ඇයි ඒවා ගැන කථා කරන්නෙ නැත්තෙ? ජීවන වියදම් ප්‍රශ්නය ගැන අල්පමාත්‍ර සඳහනක්වත් මේ රාජාසන කථාවේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඉතිහාසය ගැන කල්පනා කරන විට නැවත් කාවන්තිස්ස යුගයක් බිහි වී තිබෙන බව අපට කියන්නට පුළුවන්. කාවන්තිස්ස යුගයේදීත් මෙහෙම අභේනි ඇති වුණා; මෙහෙම ද්‍රෝහිකම්වලට ඉඩ දුන්නා. කාවන්තිස්ස රජ්ජුරුවන් බයෙන් තමාගේ පුටුව රැක ගත්තා මිසක්, ජාතිය බේරා ගන්නට ඕනෑය කියා සටනක්වත් කළේ නැහැ. සමගිය එකක්. නිවටකම තවත් එකක්. ගරු අගමැතිතුමා මේ කරන්නේ පුටුව තබා ගන්නට කරන වැඩක්ය කියා රටේ මහජනතාවට කියනවා නම් ඒක වෙනම දෙයක්. පුටුව එකක්. ජාතිය රැක ගැනීම තවත් දෙයක්. නිවටකම, පුටුව රැක ගැනීමේ අභිලාෂය යන මේ දෙකෙන් කොයි එකද තෝරා ගන්නේ කියා තීරණයක් කිරීමට අගමැතිතුමාට සිදු වෙනවා. ඒ තීරණය ගැනීමට වැඩි කාලයක් නැහැ. එසේ නොකළොත් අවසානයේදී මේ රටේ සිටින ජාතීන් ඇණ කොටා ගැනීමෙන් මේ තත්ත්වය අවසාන වෙනවා මිස කවදාවත් මේ රටේ ජාතික සමගියක් නම් ඇති නොවන බව සක්සුදක් සේ පැහැදිලිව තියෙනවා. අද මේ ආණ්ඩුව කෙරෙහි ජනතාවගේ විරෝධය බුර බුරා නගින බව, පාර්ලිමේන්තු අතුරු මැතිවරණවලින් පමණක් නොව පළාත් පාලන මැතිවරණවලිනුත් පෙනෙනවා. මහජනයා ඡන්දය දෙන ආකාරයෙන් ඔවුන් මේ ආණ්ඩුවට සතුටුද නැද්ද යන්න පැහැදිලිව පෙනෙනවා. දෙහිවල-ගල්කිස්ස නාගරික මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය පැරදුණේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ අදක්ෂභාවය නිසාය කියා සමහරුන් කියනවා. ඇවෙන ප්‍රශ්න නිසා තවත් මේ ආණ්ඩුව එපා, මේ ආණ්ඩුව වෙනස් කළ යුතුයි යන අදහසයි එයින් ප්‍රකාශ වන්නේ. එම නිසා, මේ කාවන්තිස්ස යුගයෙන් අයින් වී දුටුගැමුණු යුගයක් උදා කර ගැනීමට නැවත වරක් ජනතාවට අවස්ථාවක් දෙන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.47

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මිත්‍ර දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාගෙන් පසු, මේ විවාදය සම්බන්ධයෙන් වචන සවල්පයක් කථා කරන්නට මට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ඒ ගරු මන්ත්‍රීතුමා රට සභා පණත හෙවත් යෝජිත රට සභා පණත සම්බන්ධව බොහෝ දුරට කථා කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හෝ සමසමාජ පක්ෂයේ හෝ කොමියුනිස්ට් පක්ෂයේ හෝ කිසිම ගරු මන්ත්‍රීවරයකුට රට සභාවලට විරුද්ධව කථා කරන්නට කිසිම අයිතිවාසිකමක් තිබෙනවා යයි මා හිතන්නේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

පුළුවනි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

කට තිබෙන නිසා පුළුවනි.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

තිබෙන තත්ත්වයේ හැටියට පුළුවනි.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ඔය තත්ත්වය තේරුම් ගන්න තමයි ටිකක් කල් යන්නේ. බණ්ඩාරනායක අගමැතිතුමා රට සභා ඇති කරන්නට සූදානම් වුණු අවස්ථාවේදී ඒ ගැන කථා කළ එක්තරා සිංහල වීරයෙක්, දුටු ගැමුණු රජතුමාටත් කරන්නට බැරි වුණු දෙයක් බණ්ඩාරනායක අගමැතිතුමා එක පෑන් පහරකින් කළා යයි කිව්වා. අද මේ රට සභා පණත ගැන කථා කරන එක් විශේෂඥයකු, බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම ඉදිරිපත් වුණු දව සේ ඒ පිළිබඳ ගුණදොස් විවේචනයක යෙදෙමින් කී කථාවයි මා ඒ කිව්වේ. අද රට සභා ගැන විශාල උද්ඝෝෂණයක් කරන මේ උදවිය 1964 වනතුරු ඔවුන්ගේ හැම රාජාසන කථාවකම රට සභා ඇති කරන බව සඳහන් කළා. නැතැයි කියන්නට පුළුවන් ද?

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ඇත් නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

ආ! ඉස්සර තිබුණා, දැන් නැහැ. ඒක තමයි අපත් කියන්නේ. රටසභා පණත ගැන ගුණදෝෂ විවේචනයක් කරන්නට තමුන්නාන්සේලා කිසිම කෙනකුට කිසිම අයිතිවාසිකමක් නැහැ. හේතුව, පසු ගිය අවුරුදු 9 ක් තිස්සේ රට සභා ගැන යම් අදහසක් මතු වුණා නම් තමුන්නාන්සේලා එහි පෙරමුණ ගැනීමයි.

යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධව පුදුම විධියේ අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. එතුමා රටසභාවලට සියයට සියයක්ම කැමතිලු. හැබැයි, ෆේඩරල් පක්ෂය සිටින නිසා රට සභා පිහිටුවන්නට ඉඩ දෙන්න බැරිලු. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යම් දවසක රට සභා ගැන සතුට ප්‍රකාශ කළා නම් එදාත්, බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම යම් දවසක ඇති වුණා නම් එදාත්, ඔය ෆේඩරල් පක්ෂය මේ රටේ තිබුණා. මා හිතන හැටියට, රට සභා කථාව පටන් ගත්තේත් ෆේඩරල් පක්ෂයයි. ඒ එක් අවස්ථාවකදීවත් ඊට විරුද්ධ නොවුණු මේ පිරිස, අපේ පක්ෂයෙන්, අපේ අගමැතිතුමාගෙන් රටසභා ගැන යෝජනාවක් ආ නිසාම ඊට විරුද්ධව ලොකු උද්ඝෝෂණයක් පටන් ගෙන තිබෙනවා. මා මේ අදහස් ප්‍රකාශ කරන්නේ මේ අවස්ථාවේදී රට සභා ගැන ගුණදෝෂ විවේචනයක් කිරීමේ බලාපොරොත්තුවක් ඇතිව නොවෙයි. මා විවේචනය කරන්නේ විරුද්ධ පාර්ශ්වයේ ක්‍රියා මාර්ග යයි.


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අතපත්තු මයා.]

දිවුලපිටියෙ ගරු මන්ත්‍රීතුමාගෙන් යස කථාවක් මට අසන්නට ලැබුණා. රටසභා ධවල පත්‍රිකාව සම්බන්ධයෙන් ඇති වුණු විරුද්ධකම් ගැන කල්පනා කර බලන බව ගරු අගමැතිතුමා රාජාසන කථාවෙහි සඳහන් කර තිබීමෙන් සම්පූර්ණයෙන්ම අදහස් වන්නේ රටසභා පිහිටුවීම යයි ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒ පාඨයෙන් එවැනි අදහස් කියවෙන්නේ මොන සිංහලයෙන්දැයි මට නම් තේරෙන්නේ නැහැ. දිවුලපිටියෙ ගරු මන්ත්‍රීතුමා සිංහල පිළිබඳව ලොකු පණ්ඩිතයකු වෙන්න ඇති. මාත් ඒ පාඨය කීපවරක්ම කියෙව්වා. රට සභා පිහිටුවන බව අගමැතිතුමා කියා තිබෙන බවක් මට නම් එයින් මොන විධියකින්වත් හැඟෙන්නේ නැහැ. මහජනයාගේ ගුණදොස් විවේච නය සඳහා ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. එහෙත් දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) කියන්නේ මේ ආණ්ඩුව කෙසේ හෝ රටසභා දෙන බවයි. මොකක්ද මේ කථාවේ තේරුම? රාජාසන කථාවේ සඳහන් වී තිබෙන දේ දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාට නොතේරෙනවා විය හැකියි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

රටසභා දෙන බව රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා. මම ඒ කොටස කියවන්නම්:

"The views expressed during its discussion will be given careful consideration by My Government before presenting legislation."

That means he has decided on presenting legislation.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

I am very sorry about the knowledge of English that gentleman possesses—[*Interruption*].

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

I will read that in Sinhalese.

"......ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර එම ධවල පත්‍රිකාව පිළිබඳව ඇති වූ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂකාරීව සලකා බලනු ඇත."

මෙයින් කියවෙන්නේ ව්‍යවස්ථා ඉදිරිපත් නොකරන බව නොවෙයි. ව්‍යවස්ථා ඉදිරිපත් නොකරන බව නොකියන්නේ ඇයි?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

තමුන්නාන්සේට සිංහලවත් ඉංග්‍රීසිවත් නොතේරීම ගැනයි, මා කනගාටු වන්නේ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தண)*
(Mr. de Zoysa Siriwardena)

දෙපැත්තට කැපෙන විධියට ඒ කොටස ලියා තිබෙනවා.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමා (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) මේකට පටලැවෙන්න වුවමනා නැහැ. දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාටයි මටයි මේක බේරා ගන්නට පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටසභා ගැන මහජනයාගේ අදහස් දැන ගැනීම සඳහා ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉතින් මේ ධවල පත්‍රිකාව පිළිබඳව මහජනයා දක්වන අදහස් උදහස් අනුව ගරු අගමැතිතුමා නියම අවබෝධයක් ඇති කරගෙන සුදුසු පරිදි ක්‍රියා කරනවා ඇති. රටේ වැඩි දෙනා රටසභාවලට විරුද්ධ බව පෙනී ගියහොත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමා ඒ සඳහා ව්‍යවස්ථා ඉදිරිපත් කරන එකක් නැහැ. ඒ නිසා දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා කලබල වන්නට වුව මනා නැහැ. අගමැතිතුමා තීරණයක් ගන්නවා ඇත්තේ ඔහේලාගේ බොරු ප්‍රචාර වලට රැවටිලා නොවන බව නම් මතක් කරන්නට ඕනෑ. ඔහේලාට නම් අප ඉදිරිපත් කරන එකම පනතක්වත් හරි යන්නේ නැහැ.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
තමුන්නාන්සේ නම් විරුද්ධ බව මා දන්නවා.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
මිනුවන්ගොඩ ගරු මන්ත්‍රීතුමාට මගේ අදහස් වලින් ඇති වැඩක් නැහැ. අපේ වැඩ ගැන අප වග බලාගන්නවා. විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් එදා බලයේ සිටියදී රටසභා දෙන බව රාජාසන කථා මාර්ගයෙන් පොරොන්දු වුණා. 1964 වන තුරුම මේක වැව්වා. බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම අනුව දෙන රටසභාවලට අපේ පක්ෂය එදා විරුද්ධ වුණේ ඇත්තෙන්ම ඒ රටසභා ක්‍රමය අනුව රට දෙකට බෙදෙනවාට කිසිම අවිස්වාසයක් නොමැති නිසයි. මහ ආණ්ඩුවට කිසි සේත් ඇඟිලි ගසන්නට බැරි කාරණා ඒ ගිවිසුම අනුව දෙන්නට පොරොන්දු වුණු රටසභාවලට පවරන්නට බලාපොරොත්තු වුණා. තමුන්නාන්සේලා මේ ගැන දැන් මොනවද කියන්නේ? [බාධාකිරීමක්] තමුන්නාන්සේලාගේම වචන ගිලිනවා. තර්කයට මුහුණ දෙන්නේ නැතුව කලින් ප්‍රකාශ කළ වචන ගිලින්නේ මොකද?

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
රටසභා දෙනවාද නැද්ද? මේ කියා ඇති දෙයින් තේරෙන්නේ රටසභා දෙන බවයි.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
නිකම් හිතට විරුද්ධව කථා කරන්නේ මොකටද? දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා හැම වේලාවේම ආගම ගැන සංස්කෘතිය ගැන කථා කරනවා. කොළඹ කුරුඳුවත්තේ පදිංචි වී සිටින සමහර මහතුන් මෙහි පැමිණියාම රඳල වාදයට විරුද්ධව කථා කරනවා. සංස්කෘතිය අගේ කරමින් කථා කරනවා.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
මා පදිංචිව ඉන්නේ දිවුලපිටියේ.

අතපත්තු මයා.
(திரு. அத்தபத்து)
(Mr. Atapattu)
තමුන්නාන්සේගේ දිවුලපිටියේ පදිංචිය ගැනත් මා දන්නවා. තමුන්නාන්සේ උපදින්නට ඉස්සර වෙලත් මා තමුන්නාන්සේ ගැන දන්නවා. සිංහල භාෂාව ගැන, සංස්කෘතිය , ගැන, බෞද්ධාගම රාජ්‍යාගම ගැන—State Religion—කථා කරන උදවියගෙන් කී දෙනකු ආගම අනුව ජීවත් වෙනවාද? කී දෙනෙක් අද මේ රටේ බෞද්ධයන් වශයෙන් ජීවත් වෙනවාද? කී දෙනෙක් අද බුද්ධාගමේ තිබෙන පන්සිල් පද පහ ආරක්ෂා කරනවාද? එහෙම ආරක්ෂා කරගෙන කථා කරනවා නම් මට කමක් නැහැ. අපේ රට බෞද්ධ රටක්. ඒ ආණ්ඩුවේ අදහසක් තිබුණලු බුද්ධාගම රජයේ ආගම කරන්න. අද තත්ත්වය මොකක්ද? හදිසියෙන් එහෙම හරක් මස් රාත්තලක් 1.50ක් වුණොත් අපේ බුද්ධාගම්කාර නෝනා මහත්වරු කියනවා හරක් මරනව මදිය කියා. අපේ මේ කුරුඳුවත්තේ නෝනා මහත්වරු මා සමග කී දේවල් මම කියන්නේ. ඌරෝ මරනව මදිලු.

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
කොළඹ හතේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

කොළඹ හතේ පමණක් නාවෙයි, ඕක නැතුව බැරි අය කොයි පැත්තෙත් ඉන්න වා. අපි මේ සංස්කෘතිය ගැන කථා කිරීමෙන් ප්‍රයෝජනයක් නැහැ. පුළුවන් නම් ඒ කථා කරන සංස්කෘතිය අනුව ජීවත් වෙන්න මහන්සි ගනිමු. දිවුලපිටි යේ මන්ත්‍රීතුමා තමාගෙ කථාවෙ අවසාන භාගයේදී මොකක්දෝ වචනයක් කිව්වා. උන්නැහේ කවදත් එහෙම තමයි. මට ඒ වචනෙ හරියට මතක නැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මටත් මතක නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)

එහෙත් අපේ උප නායකතුමා නම් ඊයෙ පෙරේදා කර තිබුණ බොහෝම ලක්ෂණ ප්‍රකාශයක් "ඩේලි නිවුස්" පත්‍රයේ පළ වී තිබුණා. අගමැතිතුමාට ඒ වචනය ඉංගිරිසියෙන් පාවිච්චි කර තිබුණේ. මොකක්ද වචනෙ? blatant hypocrite. මට ඒක සිංහලට පරිවර්තන ය කරන්න අමාරුයි. ඉංග්‍රීසි පත්‍රය ගෙනා වානම් මට ඒක හොඳින් පැහැදිලි කරන් න තිබුණා. මට හිතෙන හැටියට ඒ වචන ය පාවිච්චි කර තිබුණේ වැඩිය කල්පනා කර නොවෙයි. යම් දවසක සිට මා මේ පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙනවා නම් එදා සිට අද දක්වාම මට මතකයක් නැහැ අගමැතිතුමාට blatant hypocrite වැනි වචනයක් පාවිච්චි කළාය කියා. විරුද්ධ පක්ෂය බොහෝම අවස්ථාවල විරුද්ධ වුණා. එසේ විරුද්ධ වන අතරම, "තමුන්නාන් සේගේ ක්‍රියා මාර්ගය අප පිළිගන්නෙ නැහැ, නමුත් මේ කාරණය මෙහෙමයි, මේ කාරණය මෙහෙමයි" කියා කාරණා පෙන්වා දෙනවා. එහෙත් මේ අවස්ථාවේ කියනවා. blatant hypocrite කියා. මට තේරෙන්නෙ නැහැ මොන විධියේ සංසන් දනයක් කරන්න යනවාද කියා. යම් යම් දේවල් කියන කොට කියන්න බොහොම ලෙහෙසියි. ඒ බව අප කවුරුත් තේරුම් ගන්න ඕනෑ.

අපේ රටේ දැනට කරගෙන යන ආහාර වගාව ගැන නොයෙක් විධියේ චෝදනා ඉදිරිපත් කර තිබෙනවා. මෙසේ කථා කරන උදවිය රටේ තත්ත්වය ගැනත් නියම අවබෝධයක් ඇතුව කථා කරනවා නම්, මා හිතනවා, අපට විරුද්ධව මේ තරම් වේගවත් විවේචන ඉදිරිපත් කරන්නට ඉඩක් නැත කියා. 1965 දී මිරිස් මෙපමණ යි ; 1965 දී අසුවල් දේ මෙපමණයි, අද මෙපමණයි ; කියා නොයෙකුත් විවේචන කරනවා. එහෙත් නියෝජ්‍ය කථානායක තුමනි, අපට ආරංචි වී තිබෙන හැටියට ආහාරවලින් ලංකාව පමණ සැප විඳින රටක් මුළු ආසියාවේම නැත කියා වාතීා වී තිබෙනවා.

මා පෞද්ගලික වශයෙන් දන්නවා නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියාවෙ රුපියල් 4ක් නැතුව හාල් සේරුවක් ගන්න බැරි බව. එය ඉතාමත්ව අඩු ගණනයි. සලාකයට දෙන්නෙ සේරුවයි ; එහි මිල රු. 1.75යි. අපේ කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා ආහාර සම්බන්ධව හොඳ ගණන් ඉලක්කම් වගයක් හදා ඉදිරිපත් කළා. අපි ආහාර ප්‍රමාණයෙන් දෙකෙන් පංගුවක් නිකම් දී අනික් දෙකෙන් පංගුව ලොකු ගණනකට විකුණනවාලු. ඒ කියන් නේ, රුපියල් 1.25කට හාල් සේරුවක මිල නැග තිබෙනවාය කියා. අපි හාල් අරගෙන වැඩි ගණනට විකුණනවාද ? එහෙම ගන්න හාල් නැහැ. පිටරටින් ගන්න හාලුත්, මේ රටින් ගන්න හාලුත් අපි සලාකයට පමණයි දෙන්නේ. ලෝක වෙළඳපොළ ගැන කල්පනා කර බලන විට එහි මිළට වඩා අඩුවෙන් අද මේ රටේ හාල් ලබා ගන්ට පුළුවන්කම තිබෙනව. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලා කථා කරන විට පෙන්වා දෙන්ට උත්සාහ කරන්නෙ අපි හාල් සේරු දෙකෙන් එකක් කපල අනික් සේරුව රු. 1.25 ට විකුණන බවයි. අද අපි හාල් විකුණන්නෙ ම නැහැ. දෙන සේරුවත් දෙන්නෙ නො මිළයේ යි.

දැන් සිංහල ජාතිය නැගිට ගෙන එනව ය, සිංහල ජාතිය දැන් ගහගන්ට සූදානම් ය, ඔවුන් දැන් මැරෙන්ට වුණත් ලැහැස්ති ය ආදී වශයෙන් දිවුලපිටියේ ගරු මන්ත්‍රී තුමා (ජයකොඩි මයා.) ප්‍රකාශ කළා. ඒ විධියේ අදහස් ප්‍රකාශ කරන කාරණය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මොකක්ද කියා අපි දන්නව. රට දෙකට බෙදෙනවාය, යාපනයේ අපේ සිද්ධස්ථාන වලට යන්ට බැරි වෙනවාය, කියන අදහස් ඉදිරිපත් කළා. ඒ විධියේ දෙයක් ධවල පත්‍රිකාවේ තිබෙනවාදැයි මා දන්නෙ නැහැ. එහෙත් දැන් දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමාත් ඒ කථාව කළා. ඒවා එක්තරා ප්‍රයෝජනයක් තකා කියන දේවල් මිස හිතට එකඟව කරන ප්‍රකාශ නොවෙයි. මගේ හැඟීමේ හැටියට මේ රටේ ඉතාම ලොකු පටලැවිල්ලක් ඇති කරන අදහසින් ගෙන යන ව්‍යාපාරයක් මේක.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)
ගම්පහ මන්ත්‍රීතුමාගේ කථාව ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
ඒක ගැන විශේෂත්වයක් අපේ නැහැ නෙ. ඒ ගැන කථා කිරීම කිට්ටුව සිටින මිනුවන්ගොඩ මන්ත්‍රීතුමාට (ද සොයිසා සිරිවර්ධන මයා.) භාරයි. එහෙත් නොයෙක් අවස්ථාවලදී අවංකව සාධාරණ ලෙස කල්පනා කරන මන්ත්‍රීවරුන් පෞද්ගලික වාසිය තකා නොයෙක් බොරු රටේ වපුරනව නම් ඒක ඉතාම ලොකු වරදක්. සමහර විට තමුන්නාන්සේලා නොයෙක් කරුණු නිසා ධවල පත්‍රිකාවටත් දිසා සභා පනතටත් විරුද්ධ ඇති. ඒක වැරදි යයි මා කියන්නෙ නැහැ. ඒ ගැන මගේ අදහස් මොනවද කියා තමුන්නාන්සේලා දන්නෙත් නැහැ. ප්‍රශ්නය ඒක නොවෙයි. යම්කිසි නීතියක් හෝ යෝජනාවක් ඉදිරිපත් වුණාම රටේ නොයෙක් විධියේ වුවමනා නැති ජාතිභේද වැනි පටලැවිලි ඇති නොවන අන්දමට ක්‍රියා කරන්ට අපි බොහොම මහන්සි ගන්ට ඕනෑ. මේක බොහොම සුළු රටක්.

**ආර්. ජී. සේනානායක මයා.**
*(திரு. ஆர். ஜீ. சேனநாயக்க)*
(Mr. R. G. Senanayake)
පෙඩරල් පක්ෂය ජාති භේදය අවුස්සන්නෙ නැද්ද ?

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
ඒක ඇත්ත. මම පිළිගන්නව. පෙඩරල් පක්ෂය "පෙඩරල් වාදය" සමග සම්බන්ධයක් තිබෙනව. හොඳයි ඒ උදවිය ජාතිවාදය අවුස්සනව යයි කියමු. අපිත් මොකටද අවුස්සන්නෙ ? ඕනෑම පට ලැවිල්ලක් ඇති වන්ට නම් දෙපැත්තක් ඉන්න ඕනෑ. ඒ උදවිය ජාති භේදය අවුස්සන නිසා අපිත් ජාති භේදය අවුස්සන එකද යුතුකම ? අප විසින් කළ යුතුව තිබෙන්නෙ ඒ උදවිය තුළත් ජාති භේද හැඟීම් නැති වී යන ආකාරයට ඥානාන්විතව කථා කිරීමයි. අපට කිසිම අයිතිවාසිකමක් නැහැ, වැරදි අදහස් ප්‍රකාශ කරල රටේ විප්ලව ඇති කරන්න. දේශපාලන පක්ෂ ක්‍රමය ඇති වෙන්ට කලින් සිංහල සහ දෙමළ දෙවගීයා බොහොම කාලයක් ඉතාම කිට්ටුවෙන් හටපු දෙවගීයක්. ඒ දවස්වල මේ රටේ යම් දේශපාලන සටනක් ගෙන ගියා නම් ගෙන ගියේ ජාතින් සියල්ලම එකතු වෙලයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මීට වැඩිය දීර්ඝ ලෙස කථා කරන්ට යන්නෙ නැහැ. මා ධවල පත්‍රිකාව පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කරන්ට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නොයෙක් වැරදි මධ්‍යයේ ජීවත්වන අපගේ ඔළුවල නොයෙක් විධියේ කුණු තිබෙන අවස්ථාවෙදී අපට වඩා ටිකක්වත් හොඳ අදහස් තිබෙන උදවියට පරිභව කිරීමෙන් අපට සෙතක් නොසිදුවන බව මා මතක් කරනව. ඒ නිසා මෙවැනි කාරණා ගැන කල්පනා කරන විට පෞද්ගලික දේවල් ඈදීම පැත්තක තබා මෙය සාමූහික දෙයකැයි කල්පනා කරනවා නම් මීට වඩා හොඳ අනාගතයක් අප කාටත් ඇති කර ගත හැකි වන බව කියන්නට කැමතියි.

අ. භා. 6.7

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා නියෝජනය කරන ආසනයට අල්ලපු ආසනය නියෝජනය කරන බෙලිඅත්තේ මන්ත්‍රීතුමා කම්පත් රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දු මැල් මයා.]

ධුරය දරන අතපත්තු මැතිතුමාගේ කථාවෙන් අනතුරුව වචන ස්වල්පයක් කථා කරන්නට මට අවස්ථාව ලැබීම ප්‍රීතිදායක දෙයක් හැටියට මා කල්පනා කරනවා. ඇත්ත වශයෙන්ම අද අප ඉදිරියේ විවාදයට භාජන වෙමින් තිබෙන මේ රාජාසන කථාව ගැන කල්පනා කර බලන විට එය විශාල ජල ගැල්මකට අසු වී ගලා යන රොඩු රැල්ලකට සමාන කරන්නට පුළුවනි. මා ඒ විධියට කියන්නේ ඇයි? එහෙන් මෙහෙන් එන රොඩු එකතු වී රොඩු රැල්ලක් සැදෙන්නාක් මෙන් කෑබැලි කෑබැලි වශයෙන් එකතු කොට පැලැස්තර දමා—කිසිම නියමිත වැඩ පිළිවෙළක් නැතිව, නියම සංවර්ධන සැලැස්මක් නැතිව—සකස් කරන ලද රාජාසන කථාවක් හැටියට අප කාටත් මෙය පෙනී යන නිසයි. ඇත්තෙන්ම දේශපාලන වශයෙනුත්, රාජාසන කථාවක් වශයෙනුත් සලකා බලන ඕනෑම කෙනකුට මෙය දේශපාලන මැල්ලුමක් නැත්නම් අච්චාරුවක් හැටියට පිළිගන්නට පුළුවනි. මේ රටේ හැම අංශයකටම අයත් පුද්ගලයන් කෙරෙහි පොදුවේ බල පාන ඉතාමත් වැදගත් ආර්ථික ප්‍රශ්නත්, ජීවන වියදම අධික වීම සහ බඩු මිල ඉහල යෑම පිළිබඳ ප්‍රශ්නත්, අවශ්‍ය බඩු වර්ග සම්බන්ධයෙන් පවතින උග්‍ර හිඟය පිළිබඳ ප්‍රශ්නත් සම්බන්ධයෙන් වචන මාත්‍රයකින්වත් මේ රාජාසන කථාවේ සඳහන් වෙලා නැහැ. අදූරදර්ශී ක්‍රියා මාර්ගයන් හෙවත් වැඩ පිළිවෙළවල් රාශියක් අනුව සකස් කර තිබෙන මෙයින් මට මේ ආණ්ඩුවේ එක් දූර්දර්ශී ක්‍රියාවක් පමණක් ඉදිරිපත් කර තිබෙන බව දැන් පැහැදිලිවම පෙනී යනවා. ඒ දූරදර්ශී ක්‍රියාව කුමක්ද? මම එය කියන්නම්, මේ කථාවේ "............ ජාතික වනෝද්‍යාන දියුණු කිරීමේ වැඩ කටයුතු පුළුල් කර ඇත." යනුවෙන් සඳහන් කර තිබෙනවා. බොහොම හරි. ලෑස්ති වෙලා ඉන්න එක බොහොම හොඳයි කියලා මේ ආණ්ඩුවට මා දැන්ම කියන්නට කැමතියි. මේ රටේ ජනතාව එක් වී වැඩි කල් යෑමට මත්තෙන් ඒ පිළිබඳව තීරණයක් ගන්නවා ඇති. මහජනතාවට දුන් පොරොන්දු සියල්ලක්ම කඩ කර ඇමූ, මේ රටේ ආර්ථික ප්‍රශ්නවලින් එකක්වත් නොවිසඳූ මේ ආණ්ඩුව කෙරෙහි කලකිරී සිටින ජනතාව මේ ආණ්ඩුව දේශපාලන වනෝද්‍යානයට පිටත් කර යවන්නට කටයුතු කළාම—ඒ අනුව පිටත් කර දැම්මාම—ඔය දේශපාලන වනෝද්‍යානයේ සැපසේ විශ්‍රාම කාලය ගත කිරීමට ලැබේවා යි මා මුලින්ම ප්‍රාර්ථනා කරනවා.

මේ වතාවේ ඉදිරිපත් කරන ලද රාජාසන කථාව කල්පනාවට ගන්නා විට මට අපේ ගරු අගමැතිතුමාගේ තරුණ කාලය ගැන මතක් වෙනවා. තරුණ කාලයේදී අපේ ගරු අගමැතිතුමා ඉතාමත් හොඳ ක්‍රිකට් ක්‍රීඩකයකුව සිටියා. එතුමා බොහොම හොඳට ක්‍රිකට් ගැහැව්වා. ඇත්ත වශයෙන්ම මේ රාජාසන කථාවෙනුත් එතුමාගේ ඒ දක්ෂකම කැපී පෙනෙනවා. අවසානයේදී එතුමා මේ රාජාසන කථාව මඟිනුත් හොඳ දක්ෂ ක්‍රීඩකයකු හැටියට "ලෙග් ග්ලාන්ස්" එකක් ගහලා තියෙනවා. රාජ්‍ය කටයුතු පිළිබඳ ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ ගැන සඳහන් කළ නිසා වචන ස්වල්පයක් කථා කිරීම අවශ්‍ය දෙයකැයි මා කල්පනා කරනවා. මා සඳහන් කළ ඒ "ලෙග් ග්ලාන්ස්" එක කැයි කී දෙය මොකක්ද? මෙන්න ඒක:

> "...............ව්‍යවස්ථා ඉදිරිපත් කිරීමට පෙර එම ධවල පත්‍රිකාව පිළිබඳව ඇති වූ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලද අදහස් ගැන මාගේ ආණ්ඩුව සුපරීක්ෂාකාරීව සලකා බලනු ඇත."

අපේ ගරු අගමැතිතුමාගේ කොළොඹ හතේ ආධාරකරුවන් දැන් තමන්ට පුරුදු ඉංගිරිසි භාෂාවෙන් neatly put away කියනවා ඇති. හොඳ "ලෙග් ග්ලාන්ස්" එකක් ගහල තියෙනවා. බෝලය නිකම් ලක්ෂණ පිළිවෙලට අයින් කර තිබෙනවා කියාවි. neatly put away on the leg side යනුවෙන් මේ රටසභා ප්‍රශ්නය සම්බන්ධයෙන් කියාවි. ඇත්ත වශයෙන්ම මේ බෝලය ඉස්සරහට වීසි කරනවාද, නැත්නම් පස්සට වීසි කරනවාද, එහෙමත් නැත්නම් සම්පූර්ණයෙන්ම ක්‍රීඩා පිට්ටනියෙන් ඉවත් කරනවාද කියා අපට මේ රාජාසන කථාවෙන් තේරුම් ගන්න බැහැ. ඒ නිසා මා ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා —මේ රජයෙන් ඉල්ලා සිටිනවා—ඔය තමුන්නාන්සේලාගේ කොළඹ 7 ක්‍රිකට් කාරයින්ට කියන්නාක් මෙන් "neatly put away, neatly put away" යනාදි කියමින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර අවංක අදහසක් ඉදිරිපත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නය කියා. මෙවැනි කථාවලින් කවදාවත් මහජනතාව රවටන්න පුළුවන් වන්නේ නැහැ. ඒ නිසා මේ රටසභා පනත ඉදිරිපත් කරනවාද නැද්ද කියා පැහැදිලි ප්‍රකාශයක් කරන්න. එහෙම නැතිව leg glance හරි යන්නේ නැහැ.

**අතපත්තු මයා.**
*(திரு. அத்தபத்து)*
(Mr. Atapattu)
අවස්ථාව ලැබුණාම කියාවි.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
එතුමා නම් කියනවා අවස්ථාව ලැබුණාම කියනවාය කියා. නමුත් මේ රාජාසන කථාවේ හැටියට නම් රට සභා පනත ඉදිරිපත් කරනවාද නැද්ද කියා තේරුම් ගන්න බැහැ. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් අපට චෝදනා කළා අපි මේ ගරු සභාවෙන් පැන ගියා කියා. ස්ටැන්ලි කල්පගේ සෙනෙට් මන්ත්‍රීතුමා සෙනෙට් සභාවේදී කියා තිබෙනවා, පුළුවන් නම් වගන්තියක් වගන්තියක් ගැන සලකා බලා මේ රට සභා පනත වාද විවාද කරන්න එන්නය කියා. මම ඒ අභියෝගය සම්පූර්ණයෙන්ම පිළිගන්න කැමතියි. වගන්තියක් වගන්තියක් පාසා නොවෙයි, දේශපාලන මූල ධර්ම අනුව දේශපාලන ප්‍රතිපත්ති අනුව, දේශපාලන න්‍යාය ධර්ම අනුව, මේ රටසභා පනතට විරුද්ධව කරුණු ඉදිරිපත් කරන්න අද වුණත් මම ලැහැස්තියි. තමුන්නාන්සේලා පනත ඉදිරිපත් කළොත් වගන්තියක් වගන්තියක් පාසා කරුණු ඉදිරිපත් කරන්න අපි ලැහැස්තියි. අපි ඒ අභියෝගය පිළිගන්නවා. තමුන්නාන්සේලා තවම පනත ඉදිරිපත් කළේ නැහැ. නමුත් අද මා මේ අවස්ථාවේදී දේශපාලන මූල ධර්ම—Fundamental Principles—උඩ මෙම රටසභා පනතට සම්පූර්ණ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. තමුන්නාන්සේලා පනත ඉදිරිපත් කළොත් වගන්තියක් වගන්තියක් පාසා කරුණු ඉදිරිපත් කරනවා. නමුත් ඉදිරිපත් නොකළ පනතක් ගැන අපි කථා කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප මේ සම්බන්ධයෙන් සම්පූර්ණ තත්ත්වය සොයා බැලිය යුතුයි. අපි පළමුවෙන්ම සොයා බලන්න ඕනෑ, මේ රටට ගැළපෙන්නේ මධ්‍යගත කළ පාලනයක්ද විමධ්‍යගත කළ පාලනයක් ද කියා. ඉංග්‍රීසියෙන් කියනවා නම්, centralized administration or decentralized administration. අන්න එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නෙ. මා මේ අවස්ථාවේදී වේදිකාවට සීමා කළ කථාවක් කරන්න කැමති නැහැ. දේශපාලන මූල ධර්ම අනුව, ආණ්ඩු ක්‍රම මූල ධර්ම අනුව, දේශපාලන ප්‍රතිපත්ති අනුව සම්පූර්ණයෙන්ම මේ රටසභා පනතට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. අපේ රට ඉතාමත් කුඩා රටක්. ප්‍රශ්නය වී තිබෙන්නේ, දැන් රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව මධ්‍යගත පාලන ක්‍රමයක් ගැළපෙනවාද, එහෙම නැත්නම් විමධ්‍යගත පාලන ක්‍රමයක් ගැළපෙනවාද කියන එකයි. ඒ කියන්නේ "for the economic development of this country, for the economic development of this State." එයයි මෙතන තිබෙන ලොකුම වැදගත් ම ප්‍රශ්නය. අද ලංකාවේ තිබෙන ආර්ථික තත්ත්වය අනුව, සංවර්ධන ක්‍රමය අනුව, ලංකාවේ වර්තමාන දේශපාලන තත්ත්වය අනුව, වර්තමාන ලංකාවේ වර්තමාන සමාජ තතත්වය අනුව, අධ්‍යාපන ක්‍රමය අනුව, වර්තමාන සංස්කෘතික තත්ත්වය අනුව, සම්පූර්ණයෙන්ම මේ රටට ගැළපෙන්නේ විමධ්‍යගත කළ පාලන ක්‍රමයක් නොවෙයි, මධ්‍යගත කළ ආණ්ඩු ක්‍රමයකුයි. Is a centralized administration better or, is a decentralized administration better for the economic development of this country? දේශපාලන න්‍යාය ධර්ම අනුව නොයෙක් රටවල දේශපාලන විශේෂඥයෝ—පොලිටිකල් තියරිස්ට්ස්—ස්වාධීන ප්‍රාදේශීය පාලනය වැඩි දියුණු කළ යුතු බව ප්‍රකාශ කර තිබෙනවා. මහජනතාවගේ සම්බන්ධකම් පාලන ක්‍රමයට යා කර ගන්න ඕනෑය කියා දේශපාලන න්‍යාය ධර්මයන් ගැන පොත් ලියූ විශේෂඥයෝ කියා තිබෙනවා. අප පිළිගන්නවා, 19 වන ශතවර්ෂයේ එංගලන්තයෙ තිබුණු තත්ත්වය අනුව, 19 වන ශතවර්ෂයෙ යුරෝපයෙ තිබුණු තත්ත්වය අනුව පාලනය විමධ්‍යගත කිරීම—ඩිසෙන්ට්‍ර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
ලයිස් කිරීම—අවශ්‍යව තිබුණු බව. එදා, එංගලන්තයෙ තිබුණු දේශපාලන තත්ත්වයත්, සමාජ තත්ත්වයත්, ආර්ථික තත්ත්වයත් අනුව එබඳු වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න සිදු වුණා. එදා ජෙරමි බෙන්තම්, ටොම් පේන්, ජෝන් ස්ටුවර්ට් මිල් වැනි පුද්ගලයන් කීවා, ස්වාධීන ප්‍රාදේශීය පාලන ක්‍රමයක් හෙවත් "ලෝකල් සෙල්f්ප් ගවර්න්මන්ට්" දියුණු කරන්න ඕනෑය කියා. ඒ කාලයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා ගැන පොත් ලියූ බැජට්, ඩයිසි, යන අය කීවා ස්වාධීන පාලන ක්‍රමයක් ඇති කරන්න ඕනෑය කියා. ඒ වාගේම එදා පොත් ලියූ ජෙනිංස්, ලැස්කි. fපයිනර් යන අය කීවා, ස්වාධීන ප්‍රාදේශීය පාලන ක්‍රමයක් ඇති කරන්න ඕනෑය කියා. එදා ඩොනමෝර් වාර්තාවෙන්, ආචාර්ය ඩ්‍රමන්ඩ් ෂීල්ස්, ඩොනමෝර් සාමි කීවා මේ රටේ ස්වාධීන පළාත් පාලනයක් ඇති කරන්න ඕනෑය කියා. එදා චොක්සි වාර්තාවෙන් ඉදිරිපත් කළා, ස්වාධීන ප්‍රාදේශීය පාලන ක්‍රමයක් ඕනෑය කියන අදහස. එදා, දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමා පිළිගත්තා පළාත් පාලන ආයතන දියුණු කර ස්වාධීන ප්‍රාදේශීය පාලන ක්‍රමයක් ඇති කරන්න ඕනෑය කියන අදහස. අප කවුරුත් පිළිගන්නවා එදා තත්ත්වය අනුව එතුමන්ලා අවංකවම ඒ ප්‍රතිපත්තිය පිළිගත් බව.

ඒත් අද තත්ත්වය එදාට වඩා වෙනස්.

**ගාමණී ජයසූරිය මයා.** (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)
*(திரு. காமனி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

1964 මහතන්තිල වාර්තාවෙන් කියා තිබෙන්නෙ මොකක්ද?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

බොහොම හොඳයි, අධ්‍යාපන උප ඇමතිතුමා ඒ ප්‍රශ්නය මතු කිරීම. ඒ ප්‍රශ්නයට මා පිළිතුරක් දෙනවා. මහතන්තිල වාර්තාවෙන් ඉදිරිපත් කළා අදහසක්, ස්වාධීන ප්‍රාදේශීය පළාත් පාලන ක්‍රමය දියුණු කරන්න ඕනෑය කියන. හැබැයි, එක් රහසක් තිබෙනවා. ඒ රහස ගරු අගමැතිතුමාවත්, ආණ්ඩු පක්ෂයේ එක් මන්ත්‍රීවරයකුවත් මේ ගරු සභාවට හෙළි කළේ නැහැ. ඒ රහස නම් සේරසිංහ මහතා, මහතන්තිල වාර්තාවට විරුද්ධත්වය දක්වීමයි—සේරසිංහ " ඩිසෙන්ට් ". මේ සේරසිංහ මහත්මයාය කියන්නෙ කාටද? සේරසිංහ මහත්මයාය කියන්නෙ මේ රටේ ඉඩම් කොමසාරිස්වරයකු වශයෙන් වැඩ කළ මහත්මයෙකුට. සේරසිංහ මහත්මයා, මේ රටේ ගුවන්විදුලි අධ්‍යක්ෂ ජනරාල්වරයකු හැටියට වැඩ කළා. සේරසිංහ මහත්මයා මේ රටේ දිසාපතිවරයකු හැටියට ප්‍රදේශ කීපයකම වැඩ කළා. සේරසිංහ මහත්මයා, එදා ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශයෙ සියලුම පළාත් පාලන කටයුතුවල නිරතව සිටි, මුළු කච්චේරි ක්‍රමයම පාලනය කළ මහත්මයෙක්. එතුමා කීවෙ මොකක්ද? රටසභා ඇති කළොත් මේ රට සම්පූර්ණයෙන්ම දෙකට කැඩෙනවායයි එතුමා ප්‍රකාශ කර එයට විරුද්ධත්වය දක්වූවා. ඒ විරුද්ධත්වය ගැන තමුන්නාන්සෙලා—

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

කොයි අවුරුද්දේදීද සේරසිංහ මහත්මය කීවෙ?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

1964-65 අවුරුද්දෙ වෙන්න ඇති.

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)

1963 රාජාසන කථාවෙනුත්, 1964 රාජාසන කථාවෙනුත් ඒ අදහස ඉදිරිපත් කළ බව මන්ත්‍රීතුමා දැනගන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද මැල් මයා.**
(திரு. டி மெல்)
(Mr. de Mel)

පැරණි රාජාසන කථා ගැන මේ අවස්ථාවේදී විවාද කරන්න ඕනෑකමක් නැහැ. මා කථා කරන්නෙ දැන් තිබෙන තත්ත්වය අනුව, දැන් අනුගමනය කරන ප්‍රතිපත්තිය අනුව, මේ රටේ ආර්ථික සංවර්ධනය අනුව, දියුණුව ගැන——

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)
(Mr. T. B. Tennekoon—Dambulla)

උප ඇමතිතුමා තමන්ගෙ ආසනයෙ සිට නොවෙයි ප්‍රශ්න නගන්නෙ.

**ද මැල් මයා.**
(திரு. டி மெல்)
(Mr. de Mel)

1964 අවුරුද්දෙදී නොවෙයි සමහරු ඊයෙ පෙරේදත් කිව්වා. අපට ඒ කථාවලින් කමක් නැහැ. අප රටසභා පිහිටුවීමට කෙලින්ම විරුද්ධයි. අදත් විරුද්ධයි, හෙටත් විරුද්ධයි, හැමදාමත් විරුද්ධයි, අනාගතයේදීත් විරුද්ධයි. ඒ කාලයෙ, මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් සිටියෙ නැහැ. ඒ කාලයේ කළ දේවල් ගැන මා වගකිව යුත්තෙක් නොවෙයි.

ඊළඟට දැන් මේ ලෝකයේ තිබෙන දේශපාලන තත්ත්වය අනුව ලොකු රටවල් පවා—මීට පෙර පෙඩරල් ක්‍රමය ඇති කළ රටවල් පවා, එනම් සෝවියට් දේශය, චීන දේශය, ඉන්දියාව ආදී රටවල්පවා දැන් පිළිගෙන තිබෙනවා ආර්ථික සංවර්ධනය වේගවත් ලෙස කරන්නට ඕනෑ නම්, කෘෂිකාර්මික දියුණුව, කර්මාන්ත දියුණුව, වාරිමාර්ග දියුණුව, ආහාර වගාකිරීම වැනි දේවල් වේගවත් ලෙස කරන්නට ඕනෑ නම්, පාලනය මධ්‍යගත කරන්නට නැත්නම් සෙන්ට්‍රලයිස් කරන්නට ඕනෑය කියා. මධ්‍යගත ක්‍රම සම්පාදනය—central planning—මධ්‍යගත ආර්ථික සංවර්ධනය—central economic development—මධ්‍යගත පාලන ක්‍රම ආදිය විශාල රටවලත් ඇති වී තිබෙනවා. ප්‍රාදේශීය ස්වාධීන පාලනය නැත්නම් local self-government දියුණු කරන්නට ඕනෑය කී එංගලන්තය පවා දැන් සමහර අංශ මධ්‍යගත පාලනය කරතට ගෙන ඒම ඉතාම අවශ්‍යයි කියා පිළිගෙන තිබෙනවා. මධ්‍යගත පාලනයක් නැතිව කවදාවත් ප්‍රංශය දියුණු කරන්නට බැරිය කියා ප්‍රංශය පිළිගෙන අවසානයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු නාද කිරීමට නියෝග කරන ලදී.**

පසුව ගණපූරණයක් තුබූයෙන්—

*சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்படவேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ද මැල් මයා.**
(திரு. டி மெல்)
(Mr. de Mel)

එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව වැනි පුංචි රටක, ආර්ථික සංවර්ධනය ඉතාමත් වේගවත් පිළිවෙළට ගෙන යන්නට අවශ්‍ය රටක, මේ රටසභා ක්‍රමයක් ඇති කර, පාලනය විමධ්‍යගත කර මේ කුඩා ලංකාව, මේ පරමාණුව, තවත් පොඩි පොඩි කෑලිවලට පුපුරවන්නද හදන්නේ කියා මා අහන්නට කැමතියි. මේ කුඩා වැලි කැටය තවත් කුඩා වැලිකැටවලට පුපුරවන්නටද හදන්නේ කියා මා අහනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාව ගැන කල්පනා කරන විට ලොකු රටක ෆෙඩරල් කොටසකටත් වඩා පොඩි මේ ලංකාව—ඉන්දියාවේ ෆෙඩරල් කොටසකටත් වඩා පොඩි මේ කුඩා ලංකාව : සෝවියට් දේශයේ ෆෙඩරල් කොටසකටත් වඩා පොඩි මේ කුඩා ලංකාව ; චීන දේශයේ ෆෙඩරල් කොටසකටත් වඩා පොඩි මේ කුඩා ලංකාව ; ලෝකයේ අනික් රට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
වල තිබෙන ෆේඩරල් කොටස් දෙස බලන විට ඒ හැම ෆේඩරල් කොටසකටම පාගේ කුඩා වූ මේ ලංකාව—තවත් කෑලි 22 කට කඩන්නද හදන්නේ කියා මා අහනවා. මේ වර්තමාන ලෝකයේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම පිණිස හැම රටක්ම පාගේ පාලනය මධ්‍යගත කරන මෙවැනි අවස්ථාවක මෙවැනි මෝඩකමක් කරන්නේ මක්නිසා ද කියා දේශපාලන ප්‍රතිපත්ති හා දේශපාලන මූලධර්ම අනුව මා අහන්නට කැමතියි. ඊළඟට අපට පෙනී යනවා මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති පරස්පර විරෝධී බව. ගරු අගමැතිතුමාගේ ප්‍රතිපත්ති පරස්පර විරෝධියි. සමහර වැඩ කටයුතුවලට එතුමා පාලනය මධ්‍යගත කරනවා. එතුමා දැන් විශාල වශයෙන් කරන්නේ ආහාර වගාවයි. කවුද ඒ ආහාර වගාව කරන්නේ ? කච්චේරිවල දිසාපතිවරුන්ට විශේෂ බලතල දී පාලනය තවදුරටත් මධ්‍යගත කර තමයි, ආහාර වගා කටයුතු කරගෙන යන්නේ. අද කච්චේරි ක්‍රමය පාවිච්චි කර පාලනය තවත් මධ්‍යගත කර—centralize කර—තමයි ආහාර වගාව ගෙනයන්නේ. අනික් පැත්තෙන් එතුමා කියනවා ; "I am for decentralization. I am for the association of the people in the country" කියා.

මොකක්ද මෙහි තේරුම ? එක පැත්තකින් decentralize කියන අතර අනික් පැත්තෙන් centralize කියනවා. මොකක්ද ඒ පරස්පර විරෝධී කියමන ? මේ ආණ්ඩුව ගෙන යන්නේ සම්පූර්ණයෙන්ම පරස්පර විරෝධී ප්‍රතිපත්තියක්.

ඊළඟට, කච්චේරි ක්‍රමය ගැනත් වචන කීපයක් කථා කිරීම ඉතාමත් අවශ්‍යයි. මේ කච්චේරි ක්‍රමය සම්බන්ධයෙන් නොයෙකුත් දෝෂාරෝපණ ඉදිරිපත් වී තිබෙනවා. කච්චේරි පාලනයේ යෙදුණු පුද්ගලයකු හැටියට මාත් එක්තරා අවධියක කච්චේරි ක්‍රමය ගැන සම්පූර්ණයෙන්ම කලකිරී හිටියා. එහෙත් දැන් මා ටිකක් වයසට ගිහින් තිබෙනවා. කච්චේරිවල වැඩ කළ තරුණ කාලයේ වාගේ නොවෙයි, දැන් ඒ ගැන නියම අවබෝධයක් ලැබී තිබෙනවා. එදා මා කලකිරුණු කච්චේරි ක්‍රමය ගැන අද කල්පනා කර බලන විට, ඒ තරම් කල කිරෙන්නට වුවමනාවක් නැති බව මට පෙනෙනවා. අනික් අතට, කච්චේරි ක්‍රමය යටත් විජිත යුගයේ ස්මාරකයක් relic of colonialism හැටියට හඳුන්වනවා. කච්චේරි ක්‍රමය යටත් විජිත යුගයේ ස්මාරකයක්ය කියන එක අද හැමෝම කියන දෙයක්, shibboleth එකක්, sham එකක් බවට පත් වෙලා. අද ඒ කීමේ කිසිම තේරුමක්, අර්ථයක් නැහැ. අප තේරුම් ගන්නට ඕනෑ, දැන ගන්නට ඕනෑ, කච්චේරි ක්‍රමයෙන් වැඩ කරවා ගන්නට පුළුවන්ද, බැරිද කියන එකයි. නවීන යුගයට ගැලපෙන පරිදි මේ කච්චේරි ක්‍රමය සංශෝධනය කළොත්, එයින් අපට නිසි ප්‍රතිඵල ලබා ගන්නට පුළුවන් බව සඳහන් කරන්න කැමතියි.

තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් හැම දේකටම වාගේ කච්චේරි ක්‍රමය ප්‍රයෝජනයට ගන්නවා. ආහාර වගාවට දුවන්නෙත් දිසාපති ළඟටයි. වාරිමාර්ග වැඩි දියුණුව සම්බන්ධයෙන් දුවන්නෙත් දිසාපති ළඟටයි. දිසාපතිවරුන් සෑම අංශයකම නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන් කරන්න, මා හිතන හැටියට යෝජනාවක් තිබෙනවා. ඒ අනුව දිසාපතිවරයා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනවා ; නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනවා. මට ලැබී තිබෙන ආරංචි අනුව, කර්මාන්ත හා ධීවර ඇමතිතුමා දිසාපතිවරුන් නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරුන් කරන්නට යනවා. වැඩි කල් යන්නට මත්තෙන් සමහර විට දිසාපතිවරුන් නියෝජ්‍ය ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් වේවි. මා ඒ වැඩ පිළිවෙළට සම්පූර්ණයෙන්ම එකඟයි. මේ රටේ නියම සංවර්ධන වැඩ පිළිවෙළක් ගෙන යන්නට නම්, මේ රටේ නියම ආර්ථික දියුණුවක් ඇති කරන්නට නම්, පාලනය මධ්‍යගත කර කච්චේරිවල ඉන්න දිසාපතිවරුන්ට නියම බලතල දෙන්න ඕනෑ. අගමැතිතුමා ඒ බව සම්පූර්ණයෙන්ම පිළිගෙන තිබෙනවා. එහෙම නොවෙයි නම්, දිසාපතිවරුන්ට විශේෂ බලතල දී ආහාර වගාවට යොදවා තිබෙන්නේ ඇයි ? වාරිමාර්ග දියුණු කරන්නට යයි ඔවුන්ට කියන්නේ ඇයි ? තමුන්නාන්සේලා එක පැත්තකින් මධ්‍යගත කරනවා ; තව පැත්තකින් විමධ්‍යගත කරනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති පරස්පර විරෝධියි. අපේ ආණ්ඩුවත් පිළිගන්නා,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් පිළිගන්නවා, වැඩක් කරවා ගන්නට ඕනෑ නම් දිසාපතිවරුන්ට ඒ වැඩය භාර කරන්නට ඕනෑ බව. ගම් සභාපතිවරයකුට වඩා දක්ෂ පිළිවෙළකට දිසාපතිවරයා මාර්ගයෙන් වැඩ කරවා ගන්නට පුළුවන් බව අප දෙගොල්ලම පිළිගන්නවා. එහෙම නම් මේ දිසා සභා ප්‍රශ්නයේ තේරුම මොකක්ද? කච්චේරි ක්‍රමය මේ සංවර්ධන යුගයට ගැලපෙන විධියට සංශෝධනය කර, සංවර්ධනයට හිතැති දක්ෂ තරුණ දිසාපතිවරුන් ලවා රට දියුණු කරනවා විනා, දිසා සභා ක්‍රමය අනුව නම් මේ රට දියුණු කරන්නට බැරි බව මා මේ ගරු සභාවට මතක් කරන්න කැමතියි.

අනෙක් අතට, පාලනය විමධ්‍යගත කිරීමෙන් සිදු වන්නේ මොකක්ද? දූෂණය වැඩි වෙනවා විනා—අදක්ෂ පාලනය වැඩි වෙනවා විනා—දැන් තිබෙන තත්ත්වය අනුව පාලනය විමධ්‍යගත කිරීමෙන් කවදාවත්ම නියම ප්‍රතිඵල ලබා ගන්නට බැරි බව මේ ගරු සභාවට පෙන්නා දෙන්නට කැමතියි. ප්‍රතිපත්ති අනුව නම් අප රට සභාවලට කැමතිය කියා සමහරුන් කියනවා. හැබැයි, දෙන්නට බැහැ. මා නම් කෙලින්ම කියනවා, ප්‍රතිපත්තිය අනුව වුණත් වෙන මොන ධර්මයක් අනුව වුණත් මා නම් රටසභාවලට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අප රටසභාවලට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මක්නිසාද? දැනට තිබෙන සංවර්ධන ක්‍රමයට, දැනට තිබෙන ආර්ථික ක්‍රමයට රට සභා නොගැළපෙන බව අපට පැහැදිලිවම පෙනෙන නිසයි.

සේරසිංහ මහත්මයාගේ විරුද්ධත්වය ගැනත් වචන ස්වල්පයක් කියන්නට ඕනෑ. මහතන්තිල වාර්තාවට තමන්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කළ සේරසිංහ සිවිල් නිලධාරිතුමා විශේෂ වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාර්තාව ගැන මේ ගරු සභාවේ කවුරුවත් කථා කර නැහැ. ගරු අගමැතිතුමා මහතන්තිල වාර්තාව ගැන කථා කළා. නමුත් එතුමා සේරසිංහ මහතා දක්වා තිබෙන විරුද්ධත්වය ගැන නම් කථා කළේ නැහැ. සේරසිංහ මහත්මයා නොයෙක් හේතු උඩ තමාගේ විශේෂ විරුද්ධත්වය ප්‍රකාශ කළා. ඒවා මොනවාද කියා සොයා බැලීම මේ අවස්ථාවේදී ප්‍රයෝජනවත් වෙනවා. මේ රටේ දැන් තිබෙන දිස්ත්‍රික් සීමා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඇති කළ දිස්ත්‍රික් සීමායි. නමුත් මේ රටේ නියම දිස්ත්‍රික් සීමා විය යුත්තේ ගංගා නිම්නයි. ගංගා නිම්න අනුවයි මේ රටේ දිස්ත්‍රික් වෙන් කළ යුතුව තිබෙන්නෙ. මේ රටේ ආර්ථික සංවර්ධනයක් ඇති කරගත යුතු නම් ගංගා නිම්න අනුව දිස්ත්‍රික් කඩන්නට ඕනෑ. බ්‍රිතාන්‍යයින් ඇවිත් මෙහෙ සබරගමුව, අරහෙ ඌව, මෙතැන හැම්බැන්ටොට, මෙතැන කර්නිගෝල් කිව්වා. ඒවා මේ රටේ ආර්ථික ක්‍රමය ගැන සලකා ඇමූ මායිම් නොවෙයි. They are not viable economic units in the context of this country.

එපමණක් නොවෙයි, අධිරාජ්‍යවාදීන් සකස් කළ මේ දිස්ත්‍රික් සීමා වෙනස් නොකර දිස්ත්‍රික් සභා ඇති කළොත් විශාල ගැටලු ප්‍රශ්න ඇති වෙනවා. අද මේ මායිම් යොදා තිබෙන හැටි බලන්න. වඩ්ඩුක්කොඩෙයිහි ගරු මන්ත්‍රීතුමාත් (අමිර්තලිංගම් මයා.) මා කියන දේ පිළිගන්නවා ඇති. වවුනියා දිස්ත්‍රික්කයේ තිබෙනවා දකුණු වවුනියාව. ඒක සම්පූර්ණයෙන්ම සිංහල ප්‍රදේශයක්. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තිබෙනවා කච්චකුලම්පත්තුව. ඒත් සිංහල ප්‍රදේශයක්. ඒ වාගේම මඩකලපුවේ තිබෙනවා වැව්ගම්පත්තුව. ඒකත් සිංහල ප්‍රදේශයක්. අම්පාරේ පොතුවිල පාලමපත්තුව තිබෙනවා. ඒකත් සිංහල ප්‍රදේශයක්. එම නිසා විශාල ගැටලු ප්‍රශ්න මතු වෙනවා. අධිරාජ්‍යවාදීන් මේ ප්‍රාදේශීය සීමා දමා තිබෙන්නේ අර—*divide et impera*: divide and rule—කියන ප්‍රතිපත්තිය අනුවයි. මේ සියලු දෙයක්ම කර තිබෙන්නේ අන්න ඒ ප්‍රතිපත්තිය උඩයි. එම නිසා එදා අධිරාජ්‍යවාදීන් ඇති කළ මේ ප්‍රාදේශීය සීමාවන් උඩ දැන් රටසභා පිහිටෙව්වොත් දැනට තිබෙනවාටත් වඩා විශාල ගැටලු ප්‍රශ්න මේ රටේ ඇති වන බව මා නැවතත් මතක් කරනවා.

ජාතිවාදය උඩ මා කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ වාගේම දිස්ත්‍රික් සභා පිළිබඳව වගන්තියක් වගන්තියක් ගෙන කථා කරන්නේ නැහැ. පනතක් ඉදිරිපත් කළොත් අපි වගන්තියෙන් වගන්තිය ගෙන කථා කරන්නට ලෑස්තියි. හැබැයි, අපේ මූලික ප්‍රතිපත්තිය අනුව,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

දිස්ත්‍රික් සභා පිහිටුවනවාට අප විරුද්ධ බව මා නැවතත් ප්‍රකාශ කරනවා. එය නිර්භයව ඕනෑම අවස්ථාවක කියන්නට ලෑස්තියි.

සේරසිංහ මහත්මයා "geo-political reasons" උඩ විරුද්ධත්වය ප්‍රකාශ කර තිබෙනවා. "geo-political reasons" කියන එක සිංහලෙන් මට කියන්නට බැහැ. එය භූගෝල දේශපාලන විද්‍යාව යනුවෙන් හඳුන්වනවාද කියා මා දන්නේ නැහැ. මොනවාද මේ "geo-political reasons" කියන්නෙ? සේරසිංහ මහතා ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබෙනවා. සමහර විට ලංකා ඉතිහාසයත් ඉන්දියානු ඉතිහාසයත් දන්න වඩ්ඩුක්කොඩෙයි ගරු මන්ත්‍රීතුමාත් මේ කාරණය පිළිගන්නවා ඇති. දැන් මදුරාසියේ ද්‍රවිඩ මුන්නේත්‍ර කලහම් පක්ෂයේ ආණ්ඩුවක් තිබෙනවා. නමුත් දැන් තිබෙන ඉන්දියාව කවදා හෝ කැඩී බිඳී ගියොත් මොකද වෙන්නෙ? මා සිතන හැටියට ඉන්දියාව ඉන්දියාව හැටියට තිබුණේ තුන් වාරයයි. අශෝක යුගයේ ඉන්දියාව හැටියට තිබුණා. ගුප්ත යුගයේ ඉන්දියාව හැටියට තිබුණා. අක්බාර් යුගයේ ඉන්දියාව හැටියට තිබුණා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් යටතේ ඉන්දියාව හැටියට තිබුණා. දැන් නේරු පාලනය යටතේ ඉන්දියාව හැටියට තිබෙනවා. ඒත් නේරු පාලනයෙන් පසු ඉන්දියාවක් තියෙයිද, නැත්නම් මදුරාසියක් තියෙයිද යන්න කාටද කියන්නට පුළුවන්? එක පැත්තකින් මදුරාසියක්, අනිත් පැත්තෙන් හින්දුස්ථානයක්, අනික් පැත්තෙන් පන්ජාබයක්, අනික් පැත්තෙන් බෙංගාලයක්, ඔය විධියට රාජධානි කීපයක්, රටවල් කීපයක්, පාලන කීපයක්, ආණ්ඩු කීපයක් ඇති වෙයිද කියන්න කාටවත් බැහැ.

එක්තරා අවස්ථාවකදී දකුණු ඉන්දියාවේ සොලී අධිරාජ්‍යයක් ඇති වුණු බව තමුන්නාන්සේලා දන්නවා. ලංකාව සම්පූර්ණයෙන්ම ඒ සොලී අධිරාජ්‍යයට එකතු වුනා. අනාගතයේදී සොලී අධිරාජ්‍යයක් ඇති වන්නේ නැත කියා හිතන්නට පුළුවන්ද? අපි බය වන්නේ නිකම්ද? අපේ බය සාධාරණ බයක් නේද? කවදා නමුත් නැවත වරක් සොලී අධිරාජ්‍යයක් ලංකාවේ ඇති වුණොත් ඉස්සෙල්ලා උතුරත්, නැගෙනහිරත් ඒකට යටත් වී ඊට පසු මේ කුඩා ලංකාව සම්පූර්ණයෙන්ම ඒකට යටත් වේය කියා සිතීම සාධාරණ නේද? ඒ ගැන සිංහලයන් අතර තිබෙන බය සාධාරණ නේද? ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් පක්ෂයේ අන්නාදොරේ මහත්මයා නම් දැන්, නේරු ආණ්ඩුවේ බලපෑමක් උඩ, එයාගේ පෑන්-ටැමිල් එම්පයර් එක පිළිබඳ ප්‍රතිපත්තිය—මැලේසියාවත්, ලංකාවත්, දකුණු ඉන්දියාවත් යන රටවල් සියල්ලක්ම ද්‍රවිඩ අධිරාජ්‍යයකට යටත් කිරීමේ ප්‍රතිපත්තිය—ටිකක් යටපත් කර තිබෙනවා. හැබැයි මැඩ්‍රාස් පාර්ලිමේන්තුවේ කථානායක ආදිත්‍ය මහත්මයා නම් ඊයේ පෙරේදා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කර තිබෙනවා, මැලේසියාවේ කොටසුත්, ලංකාවේ උතුර සහ නැගෙනහිරත් ඓතිහාසික වශයෙන් බලන විට මදුරාසියට අයත්ය කියා. එවැනි අවස්ථාවක අර සේරසිංහ මහතා භූගෝල දේශපාලන විද්‍යාව අනුව ඉදිරිපත් කළ විරුද්ධත්වය සාධාරණ විරුද්ධත්වයක් බව අපට පිළිගන්නට පුළුවන්.

ඊ ළඟට මේ රටට ගලා එන කල්ලතෝනින් ගැන කල්පනා කර බලමු. කව්ද දන්නේ, මේ කල්ලතෝනින් පිළිබඳ සංඛ්‍යා ලේඛන? මේ රටේ කල්ලතෝනින් කී දෙනෙක් ඉන්නවද, රටක් නැති අය කී දෙනෙක් ඉන්නවද කියා මා ගරු අගමැතිතුමාගෙන් ඇහුවා. ඒ ප්‍රශ්නයට පිළිතුරු කව්රුත් දන්නෙ නැහැ. මේ රටට කල්ලතෝනින් ගලාගෙන එන ආකාරය ගැන කල්පනා කරන විටත්, සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම අනුව 3,25,000 කට පුරවැසිකම් ලැබුණු විට ඇති වන තත්ත්වය ගැන කල්පනා කළ විටත් මේ රටේ දිස්ත්‍රික් සභා ඇති කිරීමෙන් සිංහලයාට වන හානිය පිළිබඳව මා මේ ගරු සභාවට මතක් කරන්නට කැමතියි.

අපේ ගරු අගමැතිතුමා—ආණ්ඩු පක්ෂය—නිතරම කියනවා, අපි හොඳ ප්‍රජාතන්ත්‍රවාදීන්ය කියා. "We are good democrats. What we want is democratization" අපේ අදහස ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කිරීමය කියනවා. ප්‍රජාතන්ත්‍රවාදය මේ රටේ දියුණු කරන්නට ඕනෑ නම් පළාත් පාලන ආයතනවල තත්ත්වය දියුණු කරන්නට ඕනෑ. මේ රටේ ගම්සභා නැද්ද? ගම් සභා දියුණු කරන්නට ඕනෑ. මේ රටේ නගර සභා නැද්ද? නගර සභා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

දියුණු කරන්නට ඕනෑ. මේ රටේ සුළු නගර සභා නැද්ද? සුළු නගර සභා දියුණු කරන්නට ඕනෑ. මුදල් හිඟය නිසා, ඒවාට මුදල් බලතල නැති නිසා, පාලන බලතල නැති නිසා, දේශපාලන බලතල නැති නිසා අද ගම් සභා, සුළු නගර සභා, නගර සභා ඉතා මත් අබලන් තත්ත්වයකට වැටී තිබෙනවා. මේ රටේ නියම පිළිවෙළට පාලනය විමධ්‍යගත කිරීමට නම්, නියම විධියට ප්‍රජාතන්ත්‍රවාදය දියුණු කිරීමට නම්, මේ රටේ ජනතාව ආණ්ඩු පාලනයත් සමග සම්බන්ධ කරන්නට ඕනෑ නම් මේ රටේ දැනට තිබෙන ගම් සභා, සුළු නගර සභා, නගර සභා පළමුවෙන්ම දියුණු කරන්නට ඕනෑ. බොරු රට සභා පනතක් ඉදිරිපත් කර, අළුතෙන් රට සභා ඇති කර, කවදාවත් සවාධීන පළාත් පාලන ආයතන මේ රටේ ඇති වන්නෙ නැති බව මා මතක් කරන්නට කැමතියි. රට සභා වුවමනා නම් ඩී. ආර්. ඕ. කොට්ඨාශයකට රට සභාවක් දෙන්නට පුළුවන්. ආදායම් පාලක කොට්ඨාශයකට රට සභාවක් දුන්නොත් සාධාරණයි. එතකොට කට්ටුකුලම් පත්තුවට සිංහල රට සභාවක් තබා ගන්නට පුළුවන්. එතකොට වැව්ගම් පත්තුවට සිංහල රට සභාවක් තබා ගන්නට පුළුවන්. එතකොට පානවෙයි පත්තුවට සිංහල රට සභාවක් තබා ගන්නට පුළුවන්. මේ කච්චේරි සීමා අනුව—බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් ඇති කළ දිස්ත්‍රික් සීමා අනුව—රට සභා ඇති කළොත් මේ රට කෑලි 22 කට කැඩී, අවසානයේදී ජාතියක් ජාතියකට විරුද්ධව නැගී සිටිමෙන්, කුලයක් කුලයකට විරුද්ධව නැගී සිටීමෙන්, ආගමක් ආගමකට විරුද්ධව නැගී සිටීමෙන්, ගරු අගමැතිතුමා ප්‍රාර්ථනා කරන ජාතික සමගිය නැත්තටම නැති වන බව මා මේ ගරු සභාවට ප්‍රකාශ කරන්නට සතුටුයි. ඇත්ත වශයෙන්ම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය නියම විධියට දියුණු කරන්නට නම් ඉන්දියාවේ මෙන් "පංචායාත්" මෙහිත් ඇති කරන්නට ඕනෑ. ගම් සභා ලොකු වැඩි නම් ඊට වඩා කුඩා පළාත් පාලන ආයතන ඇති කරන්නට ඕනෑ. "ඩිරෙක්ට් ඩිමොක්‍රසි" හෙවත් නියම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් ඇති වන්නේ ඒ අන්දමටයි. රටසභාවලින් කවදාවත් ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණුවක් ඇති වන්නේ නැහැ. රට සභා යනු කෘත්‍රිම, ස්වභාව ධර්මයට කිසි සේත් [illegible]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෙන අලුත් දෙයක්. "පංචායත්" ක්‍රමය අනුව හැම ගම්මානයකම පාලන ආයතන ඇති කොට ඒ ඒ ප්‍රදේශවල පාලනය ඒවාට බාර දිය යුතුයි. එය තමයි නියම ප්‍රජාතන්ත්‍රවාදය. රට සභා නමින් හැඳින්වෙන්නේ වංචාවක්, කපටිකමක්, කෛරාටිකකමක්, ප්‍රෝඩාවක්, මුසාවක්. ඉංග්‍රීසියෙන් කියනවා නම් සම්පූර්ණයෙන්ම "හිපොක්‍රසි". එම නිසා, අප රට සභා ධවල පත්‍රිකාවටත් රට සභා පණතටත් සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The half hour allotted to the hon. Member is over. How much more time will he take?

**ද මෙල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

I should like to have time till 7 p.m., because, I think, there are no other speakers today.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Nikaweratiya wants to speak.

**ද මෙල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

He has agreed to allow me to continue.

අ. භා. 6.45

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා [ජී. ජේ. පාරිස් පෙරේරා මයා.] මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் [திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா] தலைமை தாங்கினார்கள்.*

*Whereupon* MR. DEPURY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. G. J. PARIS PERERA] *took the Chair.*

ද මැල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)

ඊළඟට මෙම රාජාසන කථාවෙහි තේ සම්බන්ධව ඉතා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කර තිබෙනවා.

"ඒකාබද්ධ සහවාසී මණ්ඩලයක් පිහිටුවීම සඳහා ව්‍යවස්ථාවලියක් කෙටුම්පත් කිරීම පිණිස ක්‍රියාකාරී කණ්ඩායමක් ඇති කිරීමට දැනටමත් තීරණය කර ඇත."

ක්‍රියාකාරී මණ්ඩලයක් හෙවත් "වර්කිං ගෲප්" එකක් ඇති කිරීම මෙහි අදහසයයි මා කල්පනා කරනවා. තේ කොමිෂන් සභාව දැන් වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. එහි අතුරු වාර්තාවක්, ඉන්ටෙරිම් රිපෝට් එකක් අපට කියවන්නට ලැබුණා. මගේ කල්පනාවේ හැටියට නම්, මේ තේ ප්‍රශ්නයට නියම පිළිතුරක් එම වාර්තාවෙන් ඉදිරිපත් වී නැහැ. සම්පූර්ණ වාර්තාව පිට වුණු විට එය මෙම ගරු සභාවට ඉදිරිපත් කොට ඒ පිළිබඳව වාද විවාද කරන්නට අපට අවස්ථාවක් දෙන ලෙස මා රජයෙන් ඉතා ආදරයෙන් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අපට පෙනෙන හැටියටත්, අප නිතරම කියන හැටියටත්, "ටී මොනොපොලි" හෙවත් තේ ඒකාධිකාරිත්වය කඩනතුරු අපට මේ ප්‍රශ්නයෙන් සහනයක් ලැබෙන්නේ නැහැ. ක්‍රියාකාරී මණ්ඩල ඇති කළත්, ඒකාබද්ධ සහවාසී මණ්ඩල ඇති කළත් තේ ඒකාධිකාරය නැති කරනතුරු අපට සහනයක් නැහැ. මධ්‍යම බැංකුව මේ සම්බන්ධව මාර්තු "බුලෙටින්" වාර්තාවෙහි වැදගත් කරුණක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වැදගත් වාර්තාව සකස් කරනු ලැබ තිබෙන්නේ මහ බැංකුවේ විශේෂඥයන් දෙදෙනකු වන නාලිනී ජයපාලන් සහ ඒ. එස්. ජයවර්ධන යන මහතුන් දෙදෙනා විසිනුයි. පසුගිය අවුරුද්ද තිස්සේ අප මෙම ගරු සභාවේදී සඳහන් කළ දේ මෙම වාර්තාවෙන්ද අනුමත වී තිබෙනවා. අප එදා කී දේ ආණ්ඩුවේ විශේෂඥයන්ද ඒත්තු ගෙන ඉවරයි; ඔප්පු කරලත් ඉවරයි. මේ වාර්තාවේ මෙසේ සඳහන් කර තිබෙනවා :

"The growth of firms such as James Finlay & Co. Ltd., Brooke Bond & Co. Ltd., Allied Suppliers Ltd., and Twinning and Crosfield Co. Ltd., clearly shows their wide ramifications within and without the world tea industry. Their tentacles have often spread from tea production, distribution and sales to finance, insurance, shipping and transport. This close co-operation (or some form of vertical integration) has been achieved also by means of inter-locking directorates, ownership of a majority of stocks in several companies, or by both. It appears that a small group of men such as the Earl of Inchcape, Sir Charles Miles, H. C. Bannerman, and Sir John Muir have acquired a very influential position in the world's trade in tea. While these may be 'natural' developments in the normal expansion of business, certain problems may arise where their firms' interests diverge from those of producing countries. One such instance may be the moratorium on the remittance abroad of profits and dividends of tea companies which was imposed by the Ceylon government to meet a national foreign exchange problem in 1964. It is possible for these firms to use their power to depress profits at the local producer's level and recoup the loss by means of higher transport charges and higher profit margins in retailing, where-ever they own or control the transport and retail firms. Incidentally, of the major tea producing countries, Ceylon is the only country which had had to impose such a temporary embargo on remittances of dividendts and profits. Of these countries, Ceylon is most vulnerable, as she depends for over two-thirds of her foreign exchange earnings on tea.

...... It is thus possible for these firms to develop rival sources of supply ...... and deal a crippling blow to the Ceylon economy."

ජේම්ස්ෆින්ලේ, බෲක් බොන්ඩ්, ලිප්ටන්ස්, ට්වයිනින් ඇන්ඩ් ක්‍රොස්ෆීල්ඩ් වැනි කොම්පැනි හතරක් පහක් වෙළෙඳ ඒකාධිකාරියක් තබාගෙන තේ වෙළෙඳාම අතින් ලංකාවට බලවත් පහරක් ගසන බව මේ වාර්තාවෙන් පෙනී යනවා. තේ මිළ අඩු කිරීමෙන් ඇති වන පාඩුව එංගලන්තයේ සිල්ලර වෙළෙඳාමෙන්, නැත්නම් නැව් ගාස්තුවලින්, එසේත් නැත්නම් ඉන්ෂුවරන්ස් ගාස්තුවලින් අල්ලන්නට පුළුවනැයි ඒ අය කල්පනා කරනවා. මේ රටේ තිබෙන ඒජන්සි හවුසස් සමාගම්, බ්‍රෝකර්වරුන්ගේ සමාගම්, බඩු පිටරට පටවන්නවුන්ගේ සමාගම් ඇඩි ලෙස පාලනය කෙළේ නැත්නම් කවදාවත් මේ වෙළෙඳ ඒකාධිකාරයෙන් බේරෙන්නට බැහැ. තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වෙන්දේසිය ගැන, වෙළෙඳ ද්‍රව්‍ය වෙන්දේසිය ගැන ඇමෙරිකාවේ ආර්ථික විශේෂඥයකු වන ආචාර්ය ගැල්බ්රේත් තුමා කියා තිබෙන්නේ, "Auction prices and market prices have become the entrenched folk myths of our times." කියලයි. වෙළෙඳ පොළේ මිළ ගණන් බොරු කථා වස්තුවකට අයත් දෙයක්ය යනු මෙහි අදහසයි.

ඉතින් මේ තරම් බොරුවක් වෙළෙඳ පොළේ තිබෙනවා. මේ ප්‍රෝඩාව ගැන, මේ බොරුව ගැන මහ බැංකුවේ අර ඉහත කී වාර්තාවේත් සඳහන් කර තිබෙනවා. ඒ විශේෂඥයන් දෙදෙනා ඉතාමත්ම වැදගත් යෝජනා කීපයක් ඉදිරිපත් කර තිබෙන බව මතක් කරන්නට ඕනෑ. ඒ වැදගත් යෝජනාවලින් දෙකක් පමණක් මම මේ අවස්ථාවේදී ඉදිරිපත් කරනවා. මේ රටේ තේ කර්මාන්තයට නියම පිළියමක් ප්‍රතිකාරයක් දෙන්නට නම් කළ යුතු දේ කුමක්ද යන්න එතුමන්ලා කියා තිබෙනවා.

"Developing Ceylon's instant tea independently"—

ඒකයි වචනය 'Independently'

—"and without the 'help or the 'co-operation' of the 'giants' who control the world's tea trade.

As we have mentioned earlier, the future of the tea industry appears to be linked with the development of instant or 'soluble' teas which are more convenient in preparation. It would not be wise therefore to trade away any formulae for instant or 'soluble' teas developed by the Ceylon Tea Research Institute."

නියෝජ්‍ය සභාපතිතුමනි, මා මෙම ගරු සභාවට ප්‍රශ්න රාශියක් ඉදිරිපත් කළා, ක්ෂණික තේ සම්බන්ධව. එම ප්‍රශ්න රාශිය අනුව අපට ආරංචි වී තිබෙනවා තේ පර්යේෂණාගාරයේ අධ්‍යක්ෂතුමා ඉල්ලා අස් වී තිබෙනවාය කියා. මොකක්ද මෙහිදී සිදු වී තිබෙන්නේ? මම හොඳින් දන්නවා මේ ගැන. තාවකාලික බලපත්‍රයක් ලබා ගෙන වැඩ කළ ඉන්දියානු සේවකයෙක් මගින් අපේ ක්ෂණික තේ ෆේෂ්මියුලා එක ටාටා fපින්ලේ කොම්පැනියට ගිහින් තිබෙනවා. ටාටා fපින්ලේ කොම්පැනිය දැන් ඉන්දියාවේ ක්ෂණික තේ හදනවා පමණක් නොව, පිට රට පවා පටවනවා. අපේ ෆේෂ්මියුලා එකෙන් සාදනු ලබන ක්ෂණික තේ ඇමෙරිකාවට පටවනවා. මෙවැනි දේවල් අපේ රටේ සිද්ධ වී තිබෙනවා.

මහා බැංකුවේ වාර්තාව අනුව, instant tea නොහොත් ක්ෂණික තේ ව්‍යාපාරය ඇති කරන විට දැනට තේ වෙළඳාමේ යෙදී සිටින ලොකු ලොක්කන්—බෲක් බොන්ඩ්, යුනිලිවර්, ලිප්ටන් ආදී සමාගම්—සමග ඔය වැඩේ කළොත් කවදාවත් එහි නියම ප්‍රතිඵල ලැබෙන්නෙ නැති බව අපි මේ ආණ්ඩුවට ඉතාමත් ආදරයෙන් සහ කරුණාවෙන් මතක් කරනවා. මේ වාර්තාවේ සඳහන් කර තිබෙන හැටියට ක්ෂණික තේ සෑදීම පිණිස සවාධීනව ලාංකික තේ කර්මාන්ත ශාලාවක් ඇති කළොත් පමණයි එහි නියම ප්‍රතිඵලය ලබා ගන්නට පුළුවන් වන්නේ. ඒ සඳහා කොපමණ මුදලක් ගියත් කමක් නැහැ. අපේ කර්මාන්ත ඇමතිතුමා යකඩ සහ වානේ කර්මාන්ත ශාලාවක් ඉදි කර තිබෙනවා. ඒ වාගේම ඛනිජ තෙල් සංස්ථාවක් ඇති කර තිබෙනවා. ඒවාට මුදල් වියදම් වන අතර ඒවා අවශ්‍යම දේවල් හැටියට අප පිළිගන්නවා. ඒ වාගේම ලංකාවේ තේ කර්මාන්තය දියුණු කිරීමේ කර්මාන්තයටත් කොපමණ මුදලක් ගියත් කමක් නැහැ, එය කළ යුතුයි. කෝටි තුනක් යනවාය කියා එක වරක් ජර්මන් කොම්පැණියකට විකුණුවා. රටක් දියුණු කරන්න නම් කෝටි තුනක් ප්‍රශ්නයක්ද ? රටක නොම්මර එකේ කර්මාන්තයක් වන ක්ෂණික තේ කර්මාන්තය දියුණු කිරීමට කෝටි තුනක් ප්‍රශ්නයක් නොවෙයි. ජර්මන් කොම්පැනිවලට විකුණන්නෙ නැතුව, යුනිලිවර් ලිප්ටන් සමාගම්වලට විකුණන්නේ නැතුව අප විසින්ම එය කරන්න ඕනෑ.

ඊ ළඟට එතුමන්ලා තවදුරටත් මෙසේ කියා තිබෙනවා :

"Developing new marketing outlets which would help to modify the influence of those forces controlling the world's trade in tea."

මා විශේෂයෙන්ම කල්පනා කරනවා දකුණු අප්‍රිකාවේත් දැන් අලුත් රටවල් රාශියක් තිබෙනවා කියා. ඒ වාගේම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

දැන් ඉන්දියාව විසින් විශාල ව්‍යාපාරයක් ගෙන යමින් උතුරු අප්‍රිකාවේත් තේ ප්‍රචාරය කරනවා. අරාබි එක්සත් ජනරජයත් සමග සම්බන්ධ වී මිසරයේ පෝට් සයිඩ් එකේ තේ කර්මාන්තශාලාවක් ආරම්භ කර තේ පැකට් කිරීම, බ්ලෙන්ඩ් කිරීම සඳහා කටයුතු කරගෙන යන නිසා මුළු උතුරු අප්‍රිකාවේම, ඇල්ජීරියා, ටියුනීසියා වැනි රටවල ඉන්දියාවෙ තේ ඉතාම ශීඝ්‍ර ලෙස පැතිරී යනවා.

ඒ වාගේම බටහිර අප්‍රිකාවෙ, ඝානා, නයිජීරියා, ටෝගෝ, අයිවරි කෝස්ට් ආදී රටවලත්, එමෙන්ම කෝපි බොන රටවල් වුණත් දකුණු ඇමෙරිකාවෙ ලතින් ඇමෙරිකාව ආදි රටවලත් අපේ තේ විකිණීම පිණිස නියම වැඩ පිළිවෙළක් ඇති කළොත් මේ ප්‍රශ්නය සාමාන්‍ය වශයෙන් නිරාකරණය කරගන්නට පුළුවන් වෙනවා ඇති.

තමුන්නාන්සේගේ අවසරය ඇතුව, ධීවර කර්මාන්තය ගැනත් වචනයක් කිව යුතුව තිබෙනවා. ගරු ධීවර ඇමතිතුමා ඉතාමත් හොඳ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර තිබීම ගැන අපි එතුමාට කෘතඥ වෙනවා. මේ රටේ කෘෂි කර්මාන්තය දියුණු කිරීම පිණිස සෑම ප්‍රදේශයකම සෑම දිස්ත්‍රික්කයකම කෘෂිකාර්මික කාරක සභා තිබෙන්නා වාගේ දැන් සෑම ධීවර දිස්ත්‍රික්කයකම ධීවර අනුකාරක සභාවක් ඇති කර තිබෙනවා. එම ධීවර අනුකාරක සභාවලින් නියම ප්‍රතිඵල ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරනවා. තම තමන්ට අවශ්‍ය යාන්ත්‍රික බෝට්ටු, තවත් ධීවර වරායවල්, ණය පහසුකම් ආදිය සලස්වා දෙනවාය කියා එම කාරක සභාවලට කියා තිබෙනවා. කොයි තරම් යාන්ත්‍රික බෝට්ටු දුන්නත්, කොයිතරම් ධීවර යාත්‍රා දුන්නත්, කොයිතරම් ණය පහසුකම් ඇති කළත්, කොයිතරම් ධීවර යාත්‍රා අළුත්වැඩියා කිරීමේ කම්හල් ඇති කළත්, ධීවර කර්මාන්තයට නව මුහුණුවරක් නොදී මේ රටේ ධීවර කර්මාන්තය දියුණු කරන්ට පුළුවන්කමක් නැහැ. මේ රටේ සිටින ජන කොටස්වලින් ඉතාම දුගී දුප්පත් ජීවිතයක් ගත කරන කොටසක් තමයි, ධීවර කාර්මිකයන්. ඔවුන් ජීවත්වන්නෙ ඉතාම අබලන් පැල්පත්වලයි. බොන්නටවත්, නාන්නටවත් වතුර නැතිව ඉතා දුකසේ ජීවත්වන පිරිසක් බොහෝ ප්‍රදේශවල සිටිනව. දෙවිනුවර, ගන්දර, කෝට්ටෙගොඩ වැනි ප්‍රදේශවල ජනයාට බොන්නට වතුර ලබා ගන්න හැතැප්ම ගණනක් යන්ට සිදුවී තිබෙනව. මන්ත්‍රීවරයා වන මටත් නාගන්න හැතැප්ම 4 ක් ගමන් කරන්ට සිදු වෙනව. මොකද, නාගන්න ළිඳේ වතුර නැහැ. මන්ත්‍රීවරයාටත් ඒ තරම් තත්ත්වයක් ඇති වී තිබෙනව නම් ධීවර කාර්මිකයන්ට කොයිතරම් උග්‍ර තත්ත්වයක් ඇද්ද කියා හිතන්න. මේ ප්‍රශ්න ඔක්කොම එකවර විසඳන්න බැහැ.

ගරු කර්මාන්ත ඇමතිතුමා 1957-58 මේ රටේ කුඹුරු පනතක් ඉදිරිපත් කරල ගොවි ජනතාවට නව ජීවනයක් ලබා දුන්න. විවිධ සේවා සමුපකාර ව්‍යාපාරයත්, සමුපකාර සංවර්ධන බැංකු කෙටුම්පතත් ඉදිරිපත් කළේ එතුමායි. ඒ වගේම මේ රටේ ධීවර කාර්මිකයන්ටත් නව ජීවනයක්, නව පණක් ලබා දෙන්නට නම් ඒ කුඹුරු පනත වගේ ධීවර පනතකුත් ඉදිරිපත් කරන්න ඕනෑ. ධීවර කාර්මිකයන්ට මුදලාලිලාගෙන් බේරිලා නිවිහල් සාධාරණ ජීවිතයක් ගත කරන්ට පුළුවන් වන අන්දමේ ධීවර පනතක් ඉදිරිපත් කර මේ රටේ ධීවර කාර්මිකයන්ට නව ජීවනයක් ලබා දෙන්ට ක්‍රියා කරන ලෙස ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් ඉතා ආදරයෙන් සහ කරුණාවෙන් මා ඉල්ලා සිටිනව. එමෙන්ම එදා විවිධ සේවා සමුපකාර සමිති ව්‍යාපාරය ඇති කළා වගේ ධීවර සමුපකාර සමිති ව්‍යාපාරයකුත් ඇති කර ඒවාට ණය පහසුකම්, ඇම්පන්න, යාත්‍රාවලට අවශ්‍ය අමතර කොටස් ආදි සියල්ලක්ම සපයා දුන්නොත් මීට වඩා ක්‍රමවත් පිළිවෙළට මේ වැඩ කටයුතු ගෙන යන්ට පුළුවන් වෙයි.

ඊළඟට ධීවර අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙනුත් කාරණයක් කියන්ට ඕනෑ. ධීවර කාර්මිකයන් අධ්‍යාපනය අතින් ඉතාම දුර්වල කොටසක්. තමන්ගේ කර්මාන්තය ගැන නියම අවබෝධයක් ඔවුන්ට නැහැ. එම නිසා ධීවර අධ්‍යාපන අංශය දියුණු කරන්ට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එදා තමුන්නාන්සේ 1957-58 කෘෂිකම් දෙපාතීමේන්තුවේ ව්‍යාප්ති අංශය දියුණු කරල කුඹුරු පනත ඉදිරිපත් කළ නිසා තමයි, අද ආහාර වගාවෙන් මේ ආණ්ඩුවට සාර්ථක ප්‍රතිඵල ලබා ගන්ට පුළුවන් වෙලා තිබෙන්නෙ. මම කෙලින්ම කිය නව, එදා ඒ ආරම්භ කළ ව්‍යාපාරය අවුරුදු 10 ක් ගෙන යාමෙන් පසුව තමයි, එහි ප්‍රතිඵල ලබා ගන්ට පුළුවන් වුණේ කියා. එම නිසා අද තමුන්නාන්සේ ධීවර කාර්මිකයන් වෙනුවෙන් පනතක් ඉදිරිපත් කරල ධීවර සමුපකාර ව්‍යාපාර යක් ඇති කරල, ධීවර ණය පහසුකම් දීමේ නියම වැඩ පිළිවෙලක් ක්‍රියාවේ යෙදුවොත් සමහරවිට තව අවුරුදු 10 කින්වත් අපට අනාගතයේදී ධීවර කර්මාන්තයේ නියම ඵල බුක්ති විඳින්නට පුළුවන් වෙයි.

ඊළඟට කෘෂිකම් අංශය ගැනත් ඉතා කෙටියෙන් වචන ස්වල්පයක් කියන්ට කැමතියි. කෘෂිකම් දියුණුව ගැන කථා කරන විට පිලිපීන් දූපත්, හවායි දූපත, කියුබාව ආදිය ගැන නිතරම කථා කර නව. අපේ කෘෂිකම් දෙපාර්තමේන්තුවේ ලාංකික විශේෂඥයින් කීප දෙනකු සිටීම ගැන අපි සන්තෝෂ වෙන්ට ඕනෑ. ආචාර්ය අර්නස්ට් අබේරත්න, ආචාර්ය පානබොක්කෙ, ආචාර්ය ජේ. ඩබ්ලිව්. ඒ. පිරිස් වැනි විශේෂඥයන් ගෙන ගිය ව්‍යාපාර ගැන, ඒ මහත්වරුන්ගේ පර්යේෂණවලින් ලැබී තිබෙන ප්‍රතිඵල ගැන කල්පනා කර බලන විට ඒ අපේ විශේෂඥයන් ගැන අපි ආඩම්බර වෙන්ට ඕනෑ.

සමහර උදවිය ආචාර්ය පොන්නම් පෙරුම ගැන කථා කරනවා. ඒ මහත්මයා ඉන්නේ පිලිපීනයේ. උන්නැහේ එහේ වැඩ කරනවා ඇති. එහෙත් මේ රටේ ඉන්න උදවියගේ වැඩ ගැන මා දන්නවා. අයි. ආර්. අයි. එක ගැන කථා කරන අයත් ඉන්නවා. නොයෙක් වර්ගවල වී, දැන් මේ රටට ගෙනැවිත් තිබෙනවා. කොළ රෝගයක් සෑදී තිබෙනවා. ඒවා ගැන සැලකිල්ලක් දක්වන්නට ඕනෑ. බස්නායක මහත්මයා ගෙනා තයිවාන් වී ගැන නොයෙක් දෙනා කථා කරනවා. එය සුදුසු වියලි කලාපයට පමණයි. තෙත් කලාපයේ වගාව වොත් විනාශ වෙනවා. බස්නායක වී තෙත් කලාපයට සුදුසු නැහැ. එක් එක් වර්ගයේ වී දැනටමත් අපේ රටේ උදවිය විසින් ඉදිරිපත් කර තිබෙනවා. එච් 4, එච් 7 සහ එච් 8 යන නම්වලින් හඳුන්වන වී ගැන මට කියන්නට පුළුවනි. මුළු ලෝකයේම ඕනෑම තැනක ඇති වුණු වී වර්ග ගැන කල්පනා කරන විට අපේ විශේෂඥයන් විසින් ඉදිරිපත් කර තිබෙන එච් 4, එච් 7 සහ එච් 8 ගැන අපට ආඩම්බර වන්නට පුළුවනි.

මේවායින් රටට නියම ප්‍රයෝජනයක් ලබා දීමට නම් හැකි තාක් ඉක්මණින් කෘෂිකම් දෙපාතීමේන්තුව නව අංශයක් පිහිටුවන්නට ඕනෑ. නව ක්‍රම අනුව නොයෙක් ආහාර ද්‍රව්‍යයන් මේ රටේ වවන්නට ඕනෑ. කෝපිවලට වෙනම අංශයක් තිබිය යුතුයයි මා කල්පනා කරනවා. ඒ මගින් කෝපි පිළිබඳව පර්යේෂණ පවත්වන්නට ඕනෑ. කොකෝ, කුරුඳු, කර්දමුංගු ගම්මිරිස්, කජු, ලෙමන්, සීඩ් ඔයිල් ආදී එක් එක් වර්ගය නගා සිටුවීම සඳහා විවිධ පර්යේෂණ අංශ ඇති කළ යුතුව තිබෙනවා. ඒ කාර්යය මනාව ඉටු කළ හැකි වන ආකාරයට කෘෂිකර්ම දෙපාතීමේන්තුවට අයත් වැඩ කටයුතු දැනට පවතිනවාට වඩා පුළුල් කරන්නට ඕනෑ. පුළුල් වශයෙන් පර්යේෂණ කටයුතු කරගෙන යා යුතුයි. එසේ කළොත් මීට වඩා හොඳ ප්‍රතිඵල අපට ලබා ගන්නට පුළුවනි. මීට වඩා හොඳ වැඩ පිළිවෙළක් යටතේ විධිමත් පර්යේෂණ ආදිය පැවැත්වීමෙන් වඩ වඩා හොඳ ප්‍රතිඵල අපට ලබා ගන්නට පුළුවන් වන බව කල්පනාවට ගෙන ඒ අනුව වැඩ කරන්නට ඕනෑ. තේ, රබර්, පොල් සහ කුඹුරුවලට පමණක් මෙය සීමා කරන්නට බැහැ. එසේ සීමා නොකර වැඩ කරගෙන ගියොත් අපට දැනට වඩා අමු ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නට පුළුවන් වනු ඇති. අපේ කර්මාන්තවලටත් ඒවා යොදා ගන්නට පුළුවන් වනු ඇති.

ගරු මුදල් ඇමතිතුමා මේ අවස්ථාවේ මෙතැන නැහැ. එතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරන්නට කැමතියි. විදේශ විනිමය පාලනය කිරීමේ වැඩ පිළිවෙළ හෙවත් FEECS ක්‍රමය අනුව ගොවියාට අවශ්‍ය [illegible]ක, අත් යන්ත්‍ර, අත් ට්‍රැක්ටර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

ආදිය, පැලෑටිවල ඇති වන කෘමීන් විනාශ කිරීමට පාවිච්චි කරන කෘමිනාශක බෙහෙත් වර්ග, බෙහෙත් ඉසින යන්ත්‍ර ආදිය සම්බන්ධයෙන් ගොවි ජනයාට දැනටමත් කරදරවලට මුහුණ පාන්නට සිදු වී තිබෙනවා. "ඉන්සෙක්ටිසයිඩ්, වීඩ් සයිඩ්, ස්ප්‍රේයර්" ආදිය ඉතාම අවශ්‍ය යි. කුඹුරු වගාවෙන් නියම ප්‍රයෝජනය ගැනීමට නොයෙක් දේ නවීන ක්‍රමයේ ගොවිතැනට අවශ්‍යයි. ඒවා අපහසුවක් නොමැතිව ලබා ගන්නට ඉඩ තිබෙන්නට ඕනෑ. රසායනික පෝර ආදිය කලට වේලාවට පහසු මිලට ලබා ගැනීමට ඉඩකඩ තිබෙන්නට ඕනෑ. මෙතෙක් කල් එවැනි වැඩ පිළිවෙළක් ගෙන ගොස් තිබෙන නිසා තමයි දැන් ඔය හොඳ අස්වැන්නක් ලැබෙන්නේ. හොඳ අස්වැන්නක් ලබා ගන්නට පුළුවන් වුණේ නවීන ක්‍රමානුකූලව ගොවිතැන් කිරීමට අවශ්‍ය දේවල් උපයෝගි කර ගැනීමට පුළුවන් වීම නිසා බව කල්පනා කර බලා ඒ අනුව වැඩ කරන්නට ඕනෑ. විදේශ විනිමය පාලනය කිරීම හා සම්බන්ධ වැඩ පිළිවෙළ නිසා මේවායේ මිල දැන් පෙරට වඩා සියයට 45 කින් නොවෙයි, සියයට සියයකින් පමණ වැඩි වී තිබෙනවා. මේ තත්ත්වය දිගින් දිගටම පැවතුණොත් අපේ ආහාර වගාවල විශාල පාඩුවක් ඇති වෙනවා. ගොවිතැනට අවශ්‍ය රසායනික පෝර, කෘමිනාශක, වල්පැලෑටි නාශක බෙහෙත් වැනි වෙනත් දේවල් ඔය Foreign Exchange Entitlement Certificates හෙවත් විදේශ විනිමය පාලන ක්‍රමයෙන් නිදහස් කරන්නැයි ඒ නිසා අපි මේ ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. ඉස්සර මිලටම මේවා ලබා ගන්නට වැඩ පිළිවෙළ ඇති කරන්නැයි අපි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

වාරිමාර්ග අංශය ගැනත් විචිනයක් කියන්නට ඕනෑ. වළවේ ව්‍යාපාරය ගැනත්, මල්වතු ඔය හරවන ව්‍යාපාරය ගැනත් අපි සතුටු වෙනවා. ඒවා ගැන මේ රාජාසන කථාවේ සඳහන් වී තිබෙනවා. නමුත් දකුණු පළාතේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ගැන එක වචනයක්වත් සඳහන් වී නැහැ. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ කුඹුරුවලින් සියයට 50 ක් පමණ ජල ගැලීම්වලින් යට වෙනවා. මාතර දිස්ත්‍රික්කයේ කුඹුරුවලින් ඉතාම හොඳ අස්වැන්නක් ලබා ගැනීමට පුළුවනි. ඉතාමත් සාරවත් පොළොවක් තිබෙන බැවින් හොඳ අස්වැන්නක් ලබා ගන්න පුළුවනි. නමුත් මේ කුඹුරුවලින් සියයට 50 ක පමණ ප්‍රමාණයක්ම නිල්වලා ගඟේ ජල ගැල්මෙන් යට වෙනවා. එසේ ජල ගැලීම ඇති වන විට ජලය බැස්සවීමේ ව්‍යාපාර නැති නිසා "reclamation or drainage" නැති නිසා මාතර දිස්ත්‍රික්කයේ කුඹුරු වගාවට විශාල හානියක් සිදු වෙනවා. ඒ නිසා අර නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ වාර්තාව ඉක්මණින්ම ඉදිරිපත් කරන්න. නිල්වලා ගඟ තංගල්ල, බෙලිඅත්ත, හම්බන්තොට යන ප්‍රදේශ පැත්තට හරවා මාතර කුඹුරු ටික ආරක්ෂා කර දෙන ලෙස මා මේ ආණ්ඩුවෙන් ඉතා ආදරයෙන් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනවා. එයින් ප්‍රයෝජන දෙකක් ලැබෙනවා. ජල ගැලීමෙන් වන හානිය නැවැත්වුව හොත් මාතර කුඹුරුවලින් අපට නියම අස්වැන්න ලබා ගන්න පුළුවනි. මාතර කුඹුරුවලින් නියම ප්‍රයෝජන ලබා ගන්න පුළුවනි. අනික් ප්‍රයෝජනය නම් මේ ගඟ ගැලීමෙන් ලැබෙන වැඩි වතුර ප්‍රමාණය වතුර නැති ප්‍රදේශවලට යවන්න පුළුවන් වෙනවා. ඒ නිසා මාතර දිස්ත්‍රික්කය, විශේෂයෙන්ම තංගල්ල, බෙලිඅත්ත, හම්බන්තොට යන ප්‍රදේශ දියුණු කරන්න නම් මේ නිල්වලා ගඟ යෝජනා ක්‍රමය ඉතා ඉක්මණින්ම ඉදිරිපත් කරන්නය කියා මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට වෙළඳ සමාගම් ගැනත් ඉතාමත් වැදගත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා :

"දැනට ඇති සමාගම් ආඥපනත නවීන තත්ත්වයට ගැළපෙන අයුරු සකස් කිරීම සඳහාත්, සමාගම්වල කළමනාකාරිත්වය පිළිබඳව කොටස්කරුවන්ට දැනට වැඩි ප්‍රමාණයකින් පාලන බලතල හිමි කිරීම සඳහාත් ප්‍රමාණවත් නීති සහන ද ඇතුළත් කරමින් සංශෝධනය කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා ඉදිරිපත් කරනු ලැබේ."

මෙය ඉතාමත් වැදගත් යෝජනාවක්. මේ රටේ තිබෙන වෙළඳ සමාගම් ආඥපනත 1938 දී ඇති කරන ලද ආඥපනතක්. මා දන්න හැටියට 1938 දී මේ රටට ඉදිරිපත් කළ වෙළඳ සමාගම් ආඥපනත 1911 දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බ්‍රිතාන්‍යයේ ඉදිරිපත් කරන ලද වෙළඳ සමාගම් ආඥපනතේ සම්පූර්ණ කොපිය තමයි. මේ රටේ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව නිතරම පනතක් ඉදිරිපත් කරන විට හොඳ කොපියක් ගැසීමට පුරුදු වී සිටිනවා. බ්‍රිතාන්‍යයේ ඉදිරිපත් කරන ලද පනතක් සම්පූර්ණයෙන්ම කොපි කර නවා. ඔය ව්‍යාපාරය තමයි නිතරම ගෙන යන්නෙ. මේ නිසා සමහර විට ප්‍රයෝජන ලැබෙන අතර සමහර විට විශාල හානියක් සිදු වෙනවා. 1911 දී බ්‍රිතාන්‍යයේ වෙළඳ සමාගම් ආඥ පනත ඉදිරිපත් කළා. 1938 ඒ පනතම මේ රටටත් ඉදිරිපත් කළා. මා දන්න හැටියට, 1911 න් පසු බ්‍රිතාන්‍යයේ වෙළඳ සමාගම් ආඥ පනත් කිහිපයක්ම ඉදිරිපත් කර තිබෙනවා. 1911 දී ඒ රටේ ඉදිරිපත් කළ ආඥ පනත දැන් සම්පූර්ණයෙන්ම වෙනස් කරලයි තිබෙන්නෙ. ඒ පනත දැන් සම්පූර්ණයෙන්ම අහෝසි කර ලයි තිබෙන්නෙ. ඒ පනත අහෝසි කර දමා නවීන පනතක් දැන් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් මේ රටේ තවමත් තිබෙන්නෙ 1938 දී ඉදිරිපත් කළ පනත මයි. 1938 දී බ්‍රිතාන්‍යයෙන් කොපි කර ගත් ආඥ පනත තමයි තවමත් මේ රටේ තිබෙන්නෙ. ඒ අනුව මේ රටේ කොම්පැනිවල කොටස්කරුවන්ට කිසිම සහන යක් ලැබෙන්නෙ නැහැ. අධ්‍යක්ෂවරුන් කිහිප දෙනෙක් අධ්‍යක්ෂ මණ්ඩලයට පත් වුණාට පසු කොටස්කරුවන් සම්පූර්ණයෙන්ම අයින් කරනවා. මේ රටේ තිබෙන කොම්පැනි ක්‍රමය සකස් වී තිබෙන්නෙ ඒ ආකාරයටයි.

අධ්‍යක්ෂවරුන් විසින් "Benz 220" ගෙන්වනවා; "Carpets" ගෙන්වනවා; "Chandeliers" ගෙන්වනවා. අපේ ගරු කර්මාන්ත ඇමතිතුමා මේ ගැන හොඳට දන්නවා ඇති. ආණ්ඩුවත් Elephant-lite Company එක් කොටස්කාරයෙක්නේ. ආණ්ඩුව ඒ සමාගමේ ලක්ෂ 3 ක පමණ කොටස්කාරයෙක්. ඒ අය ගෙන යන ව්‍යාපාරය ගැන මා හොඳට දන්නවා. කර්මාන්ත ඇමතිතුමාත් දන් නවා ඇති. "එලිෆන්ට්-ලයිට් කෝපරේෂන්" කොම්පැනියෙන් සුද්ධ ලාභයක්— ඩිවිඩන්ඩ් එකක්—ඇති වෙන්ට පෙර අධ්‍යක්ෂවරු කාමර වායු සමීකරණය— එයාර් කන්ඩිෂන්—කරන්න පටන් ගත්තා. චයිනීස් කාපට් ගේන්න පටන් ගත්තා. චැන්ඩලියර්ස් ගන්න පටන් ගත්තා. ඒ ආකාරයෙ දේවල් සිද්ධ වුණා. ආණ්ඩුවට අයත් ලක්ෂ තුනක කොටස් තිබෙන සමාගමක ඔය වැනි දේවල් සිද්ධ වෙනවා නම් සාමාන්‍ය කොම්පැනියක කොයි අන්දමේ තත්ත්වයක් තිබෙනවාද කියා මැන ගන්න පුළුවනි. මා විශේෂයෙන්ම සඳහන් කරන්න කැමතියි "ඒජන්සි හවුසස්" මගින් පාලනය කරන තේ කොම්පැනි, රබර් කොම්පැනි, තේ සහ රබර් කොම්පැනි ගැන. මේ කොම්පැනි වල වැඩ කටයුතු ගැන සොයා බලන විට කොයි තරම් ප්‍රෝඩාවක් ගෙන යනවාදැයි කෙනෙකුට පැහැදිලි වෙනවා. මේ ඕනෑම කොම්පැනියක අධ්‍යක්ෂ මණ්ඩලයක් ඉන්නවා.

අප දැන් ගෙන බලමු, ද එස්ටේට් කොම්පැනි ඔෆ් ඌව ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින්නෙ කව්ද කියා. ආර්. එල්. හාවි, ඩී. ඊ. මාටිනස්, අයි. එල්. පර්ඩිනන්ඩ්ස්, ඊ. වී. ආර්. සමරවික්‍රම, ඒ. ජී. ෂාප් පෝල් යන මහත්වරු අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අතර ඒජන්තවරු වශයෙන් වැඩ කරන්නෙ විටෝල් බවුස්ටඩ් ලිමිටඩ් සමාගමයි. මෙහි කොටස්කාරයින් දෙලක්ෂයක් සිටිනවා. කොම්පැනියේ මූල ධනය නැතිනම් කැපිටල් එක රුපියල් කෝටි 2යි. ආර්. එල්. හාවි මහත්මයාට තිබෙන්නෙ එක කොටසයි. අයි. එල්. පර්ඩිනැන්ඩ්ස් මහත්මයාට තිබෙන්නෙ එක කොටසයි. ඒ. ජී. ෂාප් පෝල් මහත්මයාටත් තිබෙන්නෙ එක කොටසයි. නමුත් මේ අය සමාගමේ අධ්‍යක්ෂවරු. මේ හැම කොම්පැනියකම තිබෙන්නෙ ඒ තත්ත්වයයි. ඒජන්ත සමාගමේ පවතින ඒකාධිකාරී පාලන ක්‍රමය අනුව එක කොටසක් ඇති අය තමයි අධ්‍යක්ෂවරුන් වශයෙන් පත් වෙන්නෙ. කොටස් රාශියක් ඇති අයට තැනක් නැහැ. එම අධ්‍යක්ෂවරුන්ට ගාස්තු ගෙවනවා.

ඊයෙ පෙරේදා නිකුත් කළ අප්ලන්ඩ් ටී එස්ටේට් ඔෆ් සිලෝන් ලිමිටඩ් සමාගමේ වාර්තාව බලන්න. කොටස්කාරයින්ට සියයට හයක ලාභයක්—ඩිවිඩන්ඩ් එකක්—බෙදා දෙනවා. නමුත් අධ්‍යක්ෂ මණ්ඩලයට, එක කොටසක් ඇති අධ්‍යක්ෂවරුන්ට, කොපමණ ගාස්තුවක් ගෙවා තිබෙනවාද ? එක කොටස බැගින් ඇති අධ්‍යක්ෂවරුන් පස් දෙනෙක් සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
ඒජන්සි සමාගම් මගින් පාලනය වන සෑම කොම්පැනියකම පවතින තත්ත්වය ඔකයි. එම අධ්‍යක්ෂවරු කොම්පැනිවලට මුදල් වියදම් කරන්නෙ නැහැ, කොටස් ලබා ගන්නෙ නැහැ. මෙන්න අප්ලන්ඩ් කොම්පැනියෙ අධ්‍යක්ෂ මණ්ඩලය: ජේ. ඒ. නයිඩු, ජේ. එල්. ඩී. පීරිස්, එස්. ජී. සල්ගාඩු, එම්. බී. හෝර්ස්ෆේපල්, ඒ. ජී. ෂාප් පෝල්. මේ හැම දෙනාටම කොටස බැගින් තිබෙන්නෙ. නමුත් පස් දෙනාම ගාස්තු වශයෙන් රුපියල් 12,500 ක් අර ගෙන තිබෙනවා. ඒ අනුව එක කොටස බැගින් ඒ අයට සියයට 250ක ලාබයක්—ඩිවිඩන්ඩ්—ලැබී තිබෙනවා. නමුත් කොටස් කාරයින්ට ලැබී තිබෙන්නෙ සියයට 6 යි. 250 per cent to the Directors and 6 per cent to the shareholders.

ඔවැනි තත්ත්වයකුයි සෑම කොම්පැනියකම පවතින්නෙ. මේ සියල්ලම මහා විශාල ප්‍රෝඩාවල්. මෙම රුපී බුක් එකේ එබඳු ප්‍රෝඩාවල් සියල්ලක්ම ගැන සඳහන් වී තිබෙනවා.

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු හා රැකීරක්ෂා ඇමති)**
*(கௌரவ எம். எச். முகம்மது—தொழில் தொழில் வசதி அமைச்சர்)*
(The Hon. M. H. Mohamed—Minister of Labour and Employment)

They are working directors.

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

Not all of them. I know this game a little bit. J. A. Naidoo works in Julius & Creasy. He does not work for Uplands. The partners of Julius & Creasy are in the directorate of many companies.

ගරු එම්. එච්. මොහමඩ්
*(கௌரவ எம். எச். முகம்மது)*
(The Hon. M. H. Mohamed)

They are paid a nominal sum for attending meetings.

ද මැල් මයා.
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

Rs. 2,500 for one share is a very good return. That is a nominal share given to them by the agency house 250 Per cent is a very good return. It is not bad. But the shareholders get a 6 per cent return.

මේවා තමයි මේ රටේ තිබෙන දූෂණ. මේ රටේ තිබෙන කොම්පැණිවල කෙරෙන දූෂණ ගැන කථා කරන්න ගියොත් මට පැය 12 ක් වුණත් කථා කරන්න පුළුවනි. සිලෝන් බල්බ්ස් සහ ඉලෙක්ට්‍රිකල්ස් සමාගම ගැන ගරු කර්මාන්ත ඇමතිතුමා දන්නවා ඇති. මේ සමාගමේ රජයට අයත්, රුපියල් ලක්ෂ තුනක කොටස් තිබෙනවා. ඒ වාගේම එලිෆන්ට් ලයිට් කෝපරේෂන් සමාගමේ රජයට අයත්, රුපියල් ලක්ෂ තුනක කොටස් තිබෙනවා. අප දන්නවා ඒවායේ සිදු වන දේවල් ගැන. කිසිවෙකුගෙ නම් සඳහන් කරන්න යන්නෙ නැහැ. එතුමන්ලා වැදගත් තනතුරු දරන අය. එම නිසා මා කැමති නැහැ නම් සඳහන් කරන්න. හැබැයි, ඒවා වුණත් ජාවාරම්. මේ රටේ පවතින මේ අන්දමේ ජාවාරම් ගැන කල්පනා කර බලන විට, කොම්පැනි ආඥා පනත සංශෝධනය කිරීමට නොවෙයි, අලුතෙන්ම කොම්පැණි ආඥා පනතක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවක් ඇති බව මතක් කරන්න ඕනැ. මේ රටේ පිරිසිදු කොම්පැණි පාලනයක් ගෙන යන්න ඕන නම්, සාමාන්‍ය වශයෙන් කොම්පැණිවල කොටස්කරුවන්ට සහනයක් දෙන්න ඕනැ නම්, මේවා සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න ඕනැ. මේවා සියල්ලක්ම ජාවාරම්. මෙහි තිබෙන කොම්පැණි සියයට 75 ක සිටින්නේ නොමිනල් ඩිරෙක්ටර්ස්ලායි. එක කොටසක් තිබෙන ඩිරෙක්ටර්ස්ලායි. හොඳ ප්‍රයෝජන තිබෙන වැඩේ. කොම්පැනි 20 ක ඩිරෙක්ටර් මණ්ඩලවලට පත් වුණොත් හොඳට ප්‍රයෝජනයි. කිසි ප්‍රශ්නයක් නැහැ. මුදල් යොදවත් නැහැ. විටෝල් බවුස්ටඩ්, කාසන් කම්බබැච්, ජෝර්ජ් ස්ටුවට් ආදී ඒජන්සි හවුසස් තිබෙනවා. අධ්‍යක්ෂවරුන් පත් කරන්නේ ජෝර්ජ් ස්ටුවට් කොම්පැණිය නැත්නම් විටෝල් බවුස්ටඩ් කොම්පැණිය. පන්දම් ඇල්ලුවොත් අධ්‍යක්ෂක. ඒ අයට ගැතිකම් කළොත් අධ්‍යක්ෂක. අධිරාජ්‍යවාදීන්ගේ වෙළඳ ව්‍යාපාරවලට ගැතිකම් කළොත් අධ්‍යක්ෂක. අධිරාජ්‍යවාදීන්ගේ වෙළඳ ව්‍යාපාරවලට පහර ගැසුවොත් සියයට 75 ක් කොටස් තිබුණත් අධ්‍යක්ෂක නොවෙයි. මේ රටේ එවැනි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වයක් තිබෙනවා. කොටස්කරුවන්ට කිසිම සහනයක් නැහැ. එම නිසා මේ කොම්පැනි ආඥාපනත සංශෝධනය කිරීමක් නොවෙයි ඕනෑ කරන්නේ, මේ පනත අයින් කර අලුත් පනතක් ඉදිරිපත් කිරීමයි.

අනික් කරුණ ගරු කර්මාන්ත ඇමතිතුමාගේ සැලකිල්ලට ඉදිරිපත් කරන්නට කැමතියි. දැන් අලුතින් කොම්පැනි ඇතිවන්නේ කර්මාන්තවලටයි. වතු කොම්පැණි ආදිය දැන් යල්පැන ඉවරයි. හැමෝම ඉක්මණින් සල්ලි හම්බ කරන්න නම් අලුත් කර්මාන්තයක් පටන් ගන්නයි දඟලන්නේ. එසේ අලුතින් හදන, ලියාපදිංචි කරන, රජය අනුමත කරන කර්මාන්ත කොම්පැණි නියම පබ්ලික් කොම්පැණි වන්නට ඕනෑ. ඒවායේ කොටස් කොළඹ කොටස් වෙළඳ පොළෙන් ලබා ගන්නත්, විකුණන්නත් පුළුවන් කොම්පැණි බවට පත් කළොත් මේ තිබෙන ජාවාරම් හුඟක් අඩු කරන්නට පුළුවන් වේය කියා මා හිතනවා. දැන් තිබෙන කර්මාන්ත හුඟක්ම පෞද්ගලික කොම්පැණි. පෞද්ගලික කොම්පැණියේ අධ්‍යක්ෂවරුන් කීපදෙනෙක් බලය අල්ලා ගත්තට පසුව කොටස්කාරයින්ට කිසිම සහනයක් නැහැ. මා පෞද්ගලික කර්මාන්ත කොම්පැණියක අසරණ කොටස් කාරයෙක්ය කියා හිතමු. අධ්‍යක්ෂවරයෙක් නොවෙයි. මට ඒ කොටස් විකුණා ගන්නත් බැහැ ; වෙන යමක් කරන්නත් බැහැ. අවසාන වශයෙන් ජාවාරම්කාරයින්ට මගේ රුපියල් 10 යේ කොටස රුපියල් 2 වත් ගන්නට පුළුවන් වෙනවා. කොළඹ කොටස් වෙළඳ පොළේ ක්වොටේෂන් එකක් නැහැ. මේ රටේ තිබෙන කර්මාන්ත කොම්පැණි ස්වල්පයකට පමණයි කොළඹ කොටස් වෙළඳ පොළේ නැත්නම් ෂෙයාර් මාර්කට් එකේ ක්වොටේෂන් එකක් ලබා ගන්නට පුළුවන්කම ඇත්තේ. ඒ නිසා අනාගතයේදී අනුමත කරන ලිමිටඩ් ලය බිලිටි කොම්පැණි සහ පබ්ලික් කොම්පැණි කොළඹ ෂෙයාර් මාර්කට් එකේ ක්වොටේෂන් එකක් ලබාගන්නට පුළුවන් කොම්පැණි හැටියට නීතිගත කරනවා නම් පෞද්ගලික කොටස්කාරයින්ට මීට වඩා සහනයක් නැත්නම් නිදහසක් ලැබෙයි කියා මා හිතනවා.

ගරු කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කොම්පැනි සමාගම් ගැන කොමිෂන් එකක් මා හිතන හැටියට 1951 දී පත් කළා. ඒ කාලයේ සැටියට එය හොඳ වැදගත් වාර්තාවක් නිකුත් කළා. ඒ යුගයට ගැලපෙන වාර්තාවක්. හැබැයි කවුරුවත් පනතක් ඉදිරිපත් කළේ නැහැ. මා හොඳටම දන්නවා පනතක් නම් කෙටුම්පත් කර තිබුණා. යූ.එන්.පී. ආණ්ඩුවත් පනතක් කෙටුම්පත් කර තිබුණා ; අපේ ආණ්ඩුවත් පනතක් කෙටුම්පත් කර තිබුණා. එහෙත් කවදාවත් ඒ පනත මේ ගරු සභාවට නම් ඉදිරිපත් වුණේ නැහැ. ඒ නිසා මේ වතාවේදීවත් මේ වෙළඳ සමාගම් ආඥාපනත සුළු කොටස්කරුවන්ට නියම ප්‍රයෝජනයක් ලබාගන්නට පුළුවන් වන ආකාරයට මේ ගරු සභාවට ඉදිරිපත් කර මේ රටේ කොම්පැනිවල සිටින සුළු කොටස් කාරයින්ට නියම සහනයක්, නියම නිදහසක්, ලබා දෙන ලෙස මා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට කර්මාන්ත අංශය ගැන මතක් කරන්නට ඕනෑ. ඒ ගැන වැඩිදුරට කථා කරන්නට බලාපොරොත්තුවක් නැහැ. එක ප්‍රශ්නයක් පමණයි ඉදිරිපත් කර තිබෙන්නේ. එය නම් ප්‍රමිති සකස් කිරීමේ ප්‍රශ්නයයි. මා හිතන්නේ තමුන්නාන්සේලා මේ රටේ බියුරෝ ඔෆ් ස්ටෑන්ඩඩ්ස් එකක් ඇති කර ප්‍රමිති සකස් කිරීමේ වැඩ ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා. එය මේ රාජාසන කථාවෙනුත් කියා තිබෙනවා.

> " ...............ප්‍රමිති සකස් කිරීමේ කටයුතු දැනට අවසන් කර ඇති අතර ඒ පිළිබඳ ප්‍රකාශන නිකුත් කර තිබේ."

ඒ අතරම කියනවා කාර්මික නිෂ්පාදන 10ක ප්‍රමිති සකස් කර තිබෙනවාය කියා. මා ගරු කර්මාන්ත ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා මෙය 10 කට පමණක් සීමා නොකර ඉතා ඉක්මණින් අනික් ඒවාටත් සකස් කරන්නය කියා. දැන් අපට ලොකුම ප්‍රශ්නය වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

තිබෙන්නේ, මේ ප්‍රමිතිය නැත්නම් standard එක, quality එක හා මිළයි. මේ රටේ නිපදවන සෑම දෙයක්ම අද විකුණන්නේ, කළුකඩේ මිළටයි. මා ඒවා නිෂ්පාදනය කිරීමට යන වියදම පිළිබඳව ගණන්-හිලව් බලා තිබෙනවා. මේ රටේ බ්ලේඩ් එකක් නිපදවන්නට පුළුවන්, සත 3 කට. මා ඒ ගණන්-හිලව් බැලුවේ රුපියලේ අගය අඩු කරන්නට කලිනුයි. FEECS ක්‍රමයත්, රුපියලේ අගය අඩු වීමත් යන දෙකම ගැන සලකා බැලුවත්, ඕනෑ නම් ඊට වඩා සත 5ක් වැඩිපුර වියදම් වෙයි, බ්ලේඩ් එකක් නිපදවන්නට. එහෙත් බ්ලේඩ් එකක් අද විකුණන්නේ සත 18 කටයි. සත 18 කට ගන්නා ඒ බේල්ඩ් එකෙන් වුණත් නියම විධියට රැවුල බාන්න බෑ ; මුහුණ කැපෙනවා ; බෙල්ල කැපෙනවා. එහෙත් ලාංකික ව්‍යාපාරයකට ආධාර කිරීමක් වශයෙන්, බෙල්ල කැපුණත් කමක් නැත යන අදහසින් සමහර විට මා ඒ බ්ලේඩ් ගන්නවා. ඒ වුණත්, "මෝඩිලාගේ" බ්ලේඩ් පාවිච්චි කළොත්, අපේ බෙල්ල කැපෙන්නේ ඉන්දියානුවන් අතින් බව අප මතක තබා ගන්නට ඕනෑ. I do not mind my throat getting cut every morning by the blade of a Ceylonese industrialist, but my throat is getting cut every morning by a distinguished citizen's, and we have to pay the penalty for this. අද මේ රටේ තිබෙන්නේ එවැනි තත්ත්වයක්. "මෝඩිලාගේ" බ්ලේඩ් වලින් හැමදාම අපේ බෙල්ල කැපෙනවා.

එපමණක් නොවෙයි. දත් බුරුසු හදන්නට වියදම් වන්නේ කීයක්ද ? දත් බුරුසුවක් සාමාන්‍යයෙන් මෙරට විකුණන්නේ රුපියල් 1.20 ගණනේයි. එහෙත් සත 10 කින් දත් බුරුසුවක් නිපදවන්නට පුළුවනි. ප්‍රමිතිය ගැනත්, මිළ ගැනත් දැඩි සැලකිල්ල යොමු කොට, ගරු කර්මාන්ත හා ධීවර ඇමතිතුමා අවශ්‍ය කටයුතු කරනවා ඇතැයි මා බලාපොරොත්තු වන නිසා, ඒ ගැන වැඩි විස්තර කරන්නට යන්නේ නැහැ.

ඊළඟට merchant shipping නැත්නම් වෙළඳ නැව් පන්තියක් පිහිටුවාලීම සම්බන්ධයෙනුත් වචන කීපයක් ප්‍රකාශ කළ යුතුයි. ඒ ගැන රාජාසන කථාවේ මෙසේ සඳහන් වෙනවා:

"............වෙළඳ නැව් කණ්ඩායමක් පිහිටුවාලීම සඳහා කටයුතු කරනු ඇත."

මේ අදහස මීට පෙර පැවති නොයෙක් ආණ්ඩුවලිනුත් ඉදිරිපත් වුණා. අපේ ආණ්ඩුවත් වෙළඳ නැව් කණ්ඩායමක් පිහිටුවාලීම සඳහා වැඩ කටයුතු ආරම්භ කළා. හැබැයි, එය ක්‍රියාත්මක වුණේ නැහැ. මා හිතන හැටියට ඉස්සර තිබුණු යූ. එන්. පී. ආණ්ඩුවලින් පවා ඔය අදහස ඉදිරිපත් වුනා. එහෙත් එය කවදාවත්ම ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ, ඇයි ?

අපි මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ විශේෂඥයන්—U.N. Experts—ගෙන්වනවා නෝර්වේ රටින්, ඩෙන්මාර්කයෙන්, එංගලන්තයෙන්, ජපානයෙන්, පෝලන්තයෙන්. ඒ අය අපට කියනවා, "අපොයි ලංකාවේ නම් කවදාවත්ම ඔය වැඩය පටන් ගන්නට එපා ; ඒවා කළොත් පාඩු වෙයි" කියා. ඒ අය එසේ කියන්නේ ඇයි ? ඒ අය කවුරුත් කැමතියි ජපානයේ නැව්වලින් බඩු ගෙන්වනවාට, එංගලන්තයේ නැව්වලින් බඩු ගෙන්වනවාට, ග්‍රීක් නැව්වලින් බඩු ගෙන්වනවාට, පෝලන්ත නැව්වලින් බඩු ගෙන්වනවාට. අද නැව් වෙළඳ පොළේ වෙළඳ හිඟයක් තිබෙනවා. අද නැව්වලට වැඩ නැහැ.

මා ස්කොට්ලන්තයට ගිය අවස්ථාවේ එහේ "ක්ලයිඩ් ෂිප් බිල්ඩිං යාඩ්" එකේ කම්කරුවන්ගෙන් සියයට 80 කගේ විතර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩ නවත්වා තිබුණා. ඒ, ඇයි ? නැව්වල ඉල්ලුමට වඩා සැපයුම—demand එකට වඩා supply එක—වැඩියි. මා සමඟ අධ්‍යාපන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් ගියා. අපි ගිය අවස්ථාවේ දැක්කා, "ක්ලයිඩ් බෑන්ක්" එකේ කොම්පැණි සම්පූර්ණයෙන්ම බංකොලොත් වී තිබෙන බව. මේ, අපට නැව් ටිකක් සපයා ගැනීමට කදිම අවස්ථාවක්. හොඳ ණය පහසුකම් ඇතිව—deferred payment terms අනුව—පෝලන්තයෙන් හෝ වේවා, ජපානයෙන් හෝ වේවා, යුගෝස්ලාවියාවෙන් හෝ වේවා, එංගලන්තයෙන් හෝ වේවා, වෙනත් ඕනෑම රටකින් හෝ වේවා අපට අද නැව් ලබා ගන්නට පුළුවනි. ඊට කිසිම බාධකයක් නැහැ. ආනයන හා අපනයන ආර්ථික ක්‍රමයක් රටේ පවතින අවස්ථාවක, අපට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, රෙදි-පිළි, යන්ත්‍ර-සූත්‍ර හා අමතර කොටස් සියල්ලක්ම නැව් මාර්ගයෙන් ගෙන්වා ගන්නට තිබෙන අවස්ථාවක, වෙළඳ නැව් කණ්ඩායමක් ඇති කිරීම ඉතාමත් අවශ්‍යයි. ඒක අමාරු දෙයක් නොවෙයි. හැබැයි, නැව් සාදන රටවලින් විශේෂඥයින් ගෙන්වුවහොත් කවදාවත් මේ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගත හැකි වේවිය කියා මා සිතන්නේ නැහැ.

වරායේ කොමසාරිස් හැටියට වැඩ කළ මා සිතන හැටියට දනට රේගු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අධ්‍යක්ෂවරයකු හැටියට වැඩ කරන විට්ටාච්චි මහතා මේ ප්‍රශ්නය පිළිබඳව ඉතාමත් හොඳ වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාර්තාවේ පිටපතක් මට ගෙනෙන්නට බැරි වුණා. නැව් කණ්ඩායමක් ඇති කර ගැනීම පිළිබඳව ඉතාමත් වැදගත් කරුණු ඒ වාර්තාවට ඇතුළු කර තිබෙනවා. ඒ වාර්තාවේ තිබෙන කරුණු අනුවත් ඒවාගේම ඊට කලින් පිළියෙළ කළ අල්වාපිල්ලේ මහත්මයාගේ වාර්තාවේ තිබෙන කරුණු අනුවත් නැව් කණ්ඩායමක් ඇති කිරීම ඉතාමත් ඉක්මණින් කළයුතු වැඩක්. මේ සම්බන්ධයෙන් කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළොත් තමයි මේ යෝජනාවෙන් ප්‍රයෝජනයක් ලබාගත හැකි වෙන්නෙ. නැව් කණ්ඩායමක් පිහිටුවනවාය කියන මේ යෝජනාව සෑම රාජාසන කථාවකම වාගෙ තිබුණා. අපේ ආණ්ඩුව තිබුණු කාලයේ ඉදිරිපත් කළ රාජාසන කථාවලත් මේ යෝජනාව තිබුණා. නමුත් මේ දක්වා ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියා මාර්ගයක් ගෙන නැව් කණ්ඩායමක් ඇති නොකර ලංකාව හැමදාම කොන්ෆරන්ස්වලට; යු. කේ., කොන්ටිනෙන්ටල් කොන්ෆරන්ස් එකට, ජපන් කොන්ෆරන්ස් එකට, ඔස්ට්‍රේලියන් කොන්ෆරන්ස් එකට යටත් වී සිටින වාද කියා මා ප්‍රශ්න කරනවා. සූවස් ඇල වැහුවාම ඔන්න නැව් ගාස්තු වැඩි කරනවා. තවත් මොකක් හරි වුණොත් තවත් "සර්චාජ්" එකක් දමනවා. මමත් වරායේ වැඩ කර තිබෙනවා. කිසිම හේතුවක් නැතිව, කිසිම කාරණයක් නැතිව "සර්චාජ්" එකක් දමූ අවස්ථාවක් ගැන මා දන්නවා. එක්තරා අධිරාජ්‍යවාදී ආණ්ඩුවක ප්‍රතිපත්තිවලට සාමාන්‍යයෙන් විරුද්ධ වූ අවස්ථාවේ දී ලංකාවේ බෙල්ල හිර කරන්නට නම් කරන්නට තිබෙන ලොකුම දේ නැව් ගාස්තු වැඩි කිරීමය කියා "සර්චාජ්" එකක් දැම්මා. කොන්ෆරන්ස්කාරයො විතරක් නොවෙයි මේ ඊයෙ පෙරේද තුත්තුකුඩියෙ බෝට්ටු කණ්ඩායමකුත් ලංකාවට තර්ජනයක් කළා. හොර බඩු ජාවාරමක යෙදුණු පරිප්පු බෝට්ටුවක් ඇල්ලුවාය කියා තුත්තුකුඩියේ සිට ලංකාවට එන සියලුම බෝට්ටු නතර කළා. ලංකාවට මිරිස්, රතුලූනු, පරිප්පු, උම්බලකඩ, කරවල යනාදිය එවීම නතර වන විධියට ක්‍රියා කළා. මේ රට ඒ අයගේ තර්ජනවලටත් යටත් කරන්නට ලෑස්ති වුණා. ඇත්ත වශයෙන්ම සවාධීන රටකට ලජ්ජා විය යුතු තත්ත්වයක් මේක. ග්‍රීසිය යුරෝපයේ තිබෙන ඉතා කුඩා රටක්; ආර්ථික අතින් ඉතාම දුර්වල රටක්. නමුත් ග්‍රීසියටත් නැව් කණ්ඩායමක් තිබෙනවා. ඒවාගේම පනාමා රටටත් නැව් කණ්ඩායමක් තිබෙනවා. නෝර්වේ, ස්වීඩන්, ඩෙන්මාර්ක්, යුගෝස්ලාවියාව, පෝලන්තය යන රටවලටත් නැව් කණ්ඩායම් තිබෙනවා. එහෙම නම් මොකද අපේ රටෙත් නැව් කණ්ඩායමක් ඇති කරන්නට බැරි? ලංකාවට කිසිම දෙයක් කරන්නට බැරිය කියායි අධිරාජ්‍යවාදීන් උගන්වා තිබෙන්නෙ. සිංහලයන්ට, ලාංකිකයන්ට නැව් යාත්‍රා කරවන්න බැහැ කියා ඔවුන් කියනවා. ඒක බොරු මතයක්. ඔය මත සම්පූර්ණයෙන්ම අහෝසි කර දමා මේ රටේත් නැව් කණ්ඩායමක් ඇති කිරීමට පියවර ගත යුතුයි. අපේ තේ, රබර්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හා පොල්වලට නියම මිලක් ලබා ගැනීමට පුළුවන් වන්නේත්, ඒවාගේම මේ රටට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය, රෙදිපිළි ආදී අනිකුත් බඩු සාධාරණ මිළකට ලබා ගෙන මේ රටට ගෙන්වන්නට පුළුවන් වන්නේත් නැව් කණ්ඩායමක් ඇති කළහොත් පමණයි.

**එකල්හි වේලාව අ. භා. 7.30 වූයෙන් කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1968 ජූලි 18 වන බ්‍රහස් පතින්දා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 7.30 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.*

*1968 ஜூலை 18, வியாழக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.*

*It being 7.30 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Thursday, 18th July 1968.*



# කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**එවේලාවේදී කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදී.**

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 7.31 ට, අද දින සභාසම්මතිය අනුව, 1968 ජූලි 18 වන බ්‍රහස්පතින්දා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன் பின்னர் குழு உப அக்கிராசனர் அவர்கள் வினா விடுக்காமலேயே சபையை ஒத்திவைத்தார்கள்.*

*அதன்படி, பி. ப. 7.31 க்கு சபை, அதனது இன்றைய தீர்மானத்துக் கிணங்க 1968 ஜூலை 18, வியாழக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Thereupon, MR. DEPUTY CHAIRMAN OF COMMITTEES adjourned the House without Question put.*

*Adjourned accordingly at 7.31 P.M. until 2 P.M., on Thursday, 18th July 1968, pursuant to the Resolution of the House this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் : தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1